MBSL

පරිවර්තනීය හෙට දිනක්

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

වාර්ෂික වාර්තාව 2016

මාර්ගගත වාර්ෂික වාර්තාව
www.mbslbank.com

2016
වාර්ෂික වාර්තාව

Merchant Bank of
MBSL Sri Lanka & Finance PLC

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 ශ්‍රී ලංකාව
දුරකථනය : 4 711711
ඊමේල් : mbslbank@mbslbank.com
www.mbslbank.com

පරිවර්තනීය හෙටදිනක්

2016 වසර තුළ, MBSL ඒකාබද්ධ කිරීමේ ධනාත්මක බලපෑම අත්විඳි අතර, ආයතනික අනන්‍යතාව වැඩිකරන ලදී. ආදායම් සහ ලාභදායිත්වය පසුගිය වසරේ මට්ටම් ඉක්මවායාමත් සමඟ වෙළෙඳපොල තුළ අපගේ පැවැත්ම ශක්තිමත් වී ඇත.

පරිවර්තනය වූ ආයතනයක් සඳහා අත්‍යවශ්‍ය කොටස් වන ප්‍රධාන තීරණාත්මක සාධකවල සාර්ථක මුසුවක් සඳහා අපි උත්සාහ කළ බැවින් ඉහළ සාර්ථකත්වයක් අත්කර ගැනීමට අපිට හැකි වී ඇත. අපගේ දැක්ම වන නව්‍යකරණ මූල්‍ය විසඳුම් සපයන්නෙක් වීම කරා අප දියුණු වෙමින් ඉදිරියට යන අතර, අපගේ ක්‍රමෝපායික මෙහෙයවීම අපගේ බුද්ධිමත් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට අපගේ තොරතුරු සන්නිවේදන යටිතල පහසුකම් ගොඩනැඟීම කරා යොමු කරන ලදී.

මෙය MBSL නව මානයකින් අඛණ්ඩව වර්ධනය වී පරිනාමය වීමට මාර්ගය පාදනු ලබන අතර එය අපගේ පාර්ශවකරුවන්ගේ හෙට දිනය පරිවර්තනය කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

පටුන

දැක්ම, මෙහෙවර සහ සාර්ධර්ම | **3**
අපගේ ගමන්මඟ | **4**
සභාපතිතුමාගේ සමාලෝචනය | **6**
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය | **8**
මෙම වාර්තාව පිළිබඳව | **10**
කාර්යසාධන විශේෂ සිදුවීම් | **11**

අපගේ ව්‍යාපාරය
කොටස්හිමිකාර ව්‍යුහය | **13**
සංවිධාන ව්‍යුහය | **14**
නිෂ්පාදන හා සේවා | **15**
අපගේ කලාපීය ව්‍යාප්තිය | **16**

මෙහෙයුම් සන්දර්භය සහ ක්‍රමෝපාය
වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය | **18**
අපගේ මෙහෙයුම් පරිසරය | **19**
අපගේ පාර්ශවකරුවන් සමඟ සහභාගීත්වය | **23**
ප්‍රමාණාත්මක ක්‍රමෝපායික රාමුව නිර්වචනය | **24**
ක්‍රමෝපායික වැඩපිළිවෙල | **26**
තිරසාරත්වය කරා අපගේ ප්‍රවේශය | **27**

ක්‍රමෝපායික කාර්යසාධනය
ව්‍යාපාර මාර්ග සමාලෝචනය
කල්බදු | **28**
ආයතනික සහ පාරිභෝගික ණය | **30**
ආයතනික උපදේශන සහ
ප්‍රාග්ධන වෙළෙඳපොල | **32**
ආර්ථික අගය වැකතුකිරීම් | **33**

කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ
මූල්‍ය ප්‍රාග්ධනය | **36**
නිෂ්පාදිත ප්‍රාග්ධනය | **44**
මානව ප්‍රාග්ධනය | **46**
සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය | **54**
ස්වභාවික ප්‍රාග්ධනය | **57**

කළමනාකාරිත්වය
අධ්‍යක්ෂ මණ්ඩලය | **62**
ආයතනික කළමනාකාරිත්වය | **68**
ආයතනික යහපාලනය | **72**
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | **106**
විගණන කමිටු වාර්තාව | **113**
පාරිශ්‍රමික කමිටු වාර්තාව | **116**
සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව | **118**
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව | **120**
අවදානම් කළමනාකරණය | **122**

මූල්‍ය තොරතුරු
මූල්‍ය දින දර්ශනය | **133**
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය | **134**
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය | **136**
ස්වාධීන විගණකගේ වාර්තාව | **137**
ලාභාලාභ ප්‍රකාශනය | **140**
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | **141**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | **142**
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | **144**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | **145**
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | **146**

අමතර තොරතුරු
කාර්තුමය විශ්ලේෂණ | **240**
දශකයක් දෙස බැලීම | **242**
ස්වාධීන සහතික කිරීමේ වාර්තාව | **250**
GRI පිරික්සුම් ලැයිස්තුව | **252**
අනුපාතවල පදනම | **264**
ශබ්ද කෝෂය | **266**
ඇමතුම් තොරතුරු | **270**
ආයතනික තොරතුරු | **277**
රැස්වීමේ නිවේදනය | **278**
පෙරකලාසි පත්‍රය | **279**

අපගේ දැක්ම

G4-56

ජාතියට නව්‍යකරණ
ව්‍යාපාර විසඳුම් සපයන්නා
බවට පත්වීම

අපගේ මෙහෙවර

ව්‍යවසායකත්වය සංවර්ධනය කරමින් නව්‍යකරණ හා තිරසාර විසඳුම් මගින් අපගේ ගනුදෙනුකරුවන්ගේ ධනය වැඩි කිරීම

ආයතනික යහපාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති දරමින් කොටස්හිමි අගය වැඩි කිරීම

සේවා විශිෂ්ඨත්වය අත්කර ගැනීම සඳහා සේවකයින් වෙත ත්‍යාග ප්‍රදානය කරමින් ඔවුන්ගේ දැනුම සහ දක්ෂතාව වැඩි කිරීම

අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සම්බන්ධතා පෝෂණය කිරීම

ආයතනික සමාජ වගකීම පිළිබඳ මූලධර්මය පවත්වා ගනිමින් ජාතියට සේවය කිරීම මගින් සමාජය කරා අපගේ වගකීම් ඉටු කිරීම

අපගේ සාරධර්ම

අපගේ සියලුම උත්සාහයන්හීදී සදාචාරවත්, සම්මත සහ මනා පරිචයන්හි උසස්ම සම්ප්‍රදායන් පිලිගැනීම

විශිෂ්ඨත්වය සෙවීමේදී දැනුම හා ප්‍රඥාව සමඟ අපගේ මූලධර්ම මෙහෙයවීම


ආරක්ෂක, හුවමාරු සහ අවංක පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින් අතර ව්‍යවසායකත්වය පෝෂණය කිරීම


යහපාලනය සහ විනිවිදභාවය සහතික කිරීම

සේවා විශිෂ්ඨත්වය, වෙනස්කිරීම සහ නව්‍යකරණය තුළින් අපගේ ගනුදෙනුකරුවන් සතුටු කිරීම

අභියෝගවලට මුහුණදීමට එකතුවීම සහ දිරිමත්වීම

අපගේ ගමන්මඟ


1980
2000
1982
සීමිත වගකීම් සමාගමක් ලෙස ආරම්භය, ශ්‍රී ලංකාවේ පළමු වණික් බැංකුව
1991
කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම
2000
කල්බදු සමාගමක් ලෙස ක්‍රියාත්මකවීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රය ලබාගැනීම - ටයිකි අකිමොටෝ එස් 5 සම්මානය*
2005
ඉන්දියාවේ එස් බී අයි කැපිටල් මාර්කට් ලිමිටඩ් සමඟ හවුල්වීම
1980
ලංකා බැංකුවේ කළමනාකරණ උපදේශන අංශයක් ලෙස ක්‍රියාත්මක විය
1989
ශ්‍රී ලංකාවේ පළමු තැරැව්කාර සමාගම වන ලංකා සිකියුරිටීස් පුද්ගලික සමාගම ආරම්භය
1992
කොළඹ ක්‍රෙඩිට් සමාගම අත්කරගැනීම


2006
ISO 9001-2000 සහ ජාතික ඵලදායිතා සම්මානය දිනා ගැනීම
2007
වාර්ෂික වාර්තා සම්මානය
2008
AA ආයතනික ශ්‍රේණිගතකරණය
මූල්‍ය ආයතන සඳහා
“රිදී සම්මානය - හවුල්”
2009
MBSL ඉතුරුම් බැංකුව සහ MBSL රක්ෂණ සමාගම පවරා ගැනීම
ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී හි කළමනාකාර නියෝජිත ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් MBSL පත්කිරීම
මූල්‍ය ආයතන සඳහා
“ලෝකඩ සම්මානය”
2012
30 වැනි සංවත්සරය. නව ශාඛා 16ක් විවෘත කිරීම
2014
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ලෙස නම වෙනස් කිරීම
කල්බදු අංශය තුළ 2013 වාර්ෂික වාර්තාව සඳහා රන් සම්මානයෙන් පිදුම් ලැබීම
2015
MBSL, MCSL හා MSB ඒකාබද්ධ කිරීම හා ලියාපදිංචි මූල්‍ය සමාගමක් ලෙස මෙහෙයුම් ආරම්භ කිරීම
කල්බදු අංශය තුළ 2014 වාර්ෂික වාර්තාව සඳහා රන් සම්මානයෙන් පිදුම් ලැබීම
සමහර ශාඛාවල ඉස්ලාමීය මූල්‍ය සහ උකස් මෙහෙයුම් පුළුල් කිරීම
2016
“ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සේවා යෝජක සම්මානය”
“වසරේ නැගී එන මූල්‍ය ආයතන සම්මානය”
2008
2016



සභාපතිතුමාගේ සමාලෝචනය

G4-01

"සමූහය පෙර වසරේ රු.මිලියන 56ක ලාභයට සාපේක්ෂව රු. මිලියන 246.8 ක බදු පෙර ලාභයක් අත්කර ගැනීමේ කාර්යසාධනය තුළ සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී."

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය MBSL සමූහයේ වර්ධන ගමන් මගේ හැරවුම් ලක්ෂය සනිටුහන් කළ අතර, සමූහයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ අපගේ වටිනා කොටස්හිමියන් වන ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මට ඉමහත් සතුටකි.

ඒකාබද්ධ ආයතනයක් ලෙස දෙවන වසරේ මෙහෙයුම් සිදුකරමින්, සමූහය පෙර වසරේ පැවති රුපියල් මිලියන 56ට සාපේක්ෂව රුපියල් මිලියන 246.8ක බදු පෙර ලාභයක් අත්කර ගැනීම සඳහා කාර්යසාධනය තුළ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමූහය ශක්තිමත් දෙවැදෑරුම් වර්ධනයට පහසුකම් සලසන සාකල්‍ය හා සක්‍රීය ක්‍රමෝපායක් තුළින් වෙළෙඳපොල තුළ නැඟීවන වර්ධන අවස්ථාවන් මත ඵලදායී අයුරින් ප්‍රාග්ධනීයකරණය කරන ලදී. සමාගමේ විශිෂ්ඨත්වය වෙනුවෙන් මැදපෙරදිග ආසියා නායකත්ව සමූළුවේදී සම්මානයෙන් පිදුම් ලැබූහ. එහිදී වසරේ නැඟීවන මූල්‍ය ආයතනය යන ගෞරව නාමයෙන් පිදුම් ලැබිය. වසර තුළදී, මානව සම්පත් භාවිතය, ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන්හී විශිෂ්ඨත්වය හඳුනාගනිමින් පාට්නර්ෂිප් සමිට් ඇන්ඩ් බිස්නස් එවෝර්ඩ්ස් විසින් සංවිධානය කළ ලෝක මානව සම්පත් සංවර්ධන කොන්ග්‍රසයේදී විශිෂ්ඨතම සේවා යෝජක සන්නාමවලින් එකක් ලෙස MBSL සමාගම නම්කරන ලදී.

මෙහෙයුම් පරිසරය

වසර තුලදී මෙහෙයුම් පරිසරය මගින් විවිධ අභියෝග සහ අවස්ථාවන් ඉදිරිපත් විය. නියාමක විසින් යොදා ගත් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වය වසරේ වැඩි කොටසක් තුළ වෙළෙඳ පොල පොලී අනුපාත ඉහළ යාමකට හේතු විය. මේ මගින් ක්ෂේත්‍රයේ ශුද්ධ පොලී ආන්තිකවලට පීඩනය ගෙන දුන්හ. රටේ සුළු හා මධ්‍ය පරිමාණ අංශය ශක්තිමත් කිරීම කරා ප්‍රතිපත්ති ප්‍රගාමක ණය පුළුල් කිරීම සඳහා විවිධ අවස්ථාවන් ඉදිරිපත් කර ඇති බව ඉන් කියවේ. මේ අතරම කල්බදු පහසුකම් අනුපාත සඳහා 70:30 නීතිය ක්‍රියාත්මක කිරීම තුළ කල්බදු සඳහා ඉල්ලුම අඩංගු වී ඇති අතර ඒ තුළින් බැංකු නොවන මූල්‍ය අංශය ණය කළඹ තුළ වර්ධිත විවිධත්වය අත්කර ගැනීමට සම්ප්‍රදායික ව්‍යාපාර රටාවෙන් බැහැරවීමට යොමුකරන ලදී.

ශක්තිමත් නායකත්ව කණ්ඩායම

විවිධ දක්ෂතා, අත්දැකීම් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් නව අධ්‍යක්ෂ මණ්ඩලය 2016 ජූලි පත්කරන ලදී. අධ්‍යක්ෂවරු ව්‍යවසායකත්ව, වෘත්තීමය සහ අධ්‍යාපනික පළපුරුද්ද නියෝජනය කරන අතර ගැඹුරු සාකච්ඡාවන් සහ වඩාත් ඵලදායී තීරණ ගැනීමට එය හේතු විය. කොළඹ කොටස් හුවමාරුවේ අවශ්‍යතාවන්ට අනුව, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුවක් වසර තුළදී පිහිටුවන ලදී. සමූහය ඉහළම ආයතනික චර්යාවන් සහ සදාචාර පිළිබඳ ප්‍රතිති අඛණ්ඩව පවත්වා ගන්නා අතර සමාලෝචිත වසර තුළ අදාළ රෙගුලාසි සහ මාර්ගෝපදේශ සියල්ලටම සම්පූර්ණයෙන් අනුකූලතාවය දැක්විය.

ක්‍රමෝපාය සහ කාර්යසාධනය

වසර තුළදී, වර්ධනය පිළිබඳ අපගේ මූලික ප්‍රමුඛතාවන්, ගනුදෙනුකාර සම්බන්ධතා, මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ තිරසාරත්වය පිළිබඳ අවධානය අපි පවත්වා ගත්තෙමු. කාරක ප්‍රාග්ධන ණය සහ දෙනිකව රැස්කරන ණය වැනි නව නිෂ්පාදන ක්ෂේත්‍ර කිහිපයක ආක්‍රමණශීලී ව්‍යාප්තිය තුළින් කල්බදු වෙළෙඳපොලේ පහළ වැටීම හමුවේ වුවද, අපගේ ණය කළඹ තුළ ශක්තිමත් වර්ධනයක් අත්කර ගැනීමට අපිට හැකිවිය. අපගේ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් ඉලක්ක කරමින් විවිධ සහභාගිත්ව යාන්ත්‍රණ සහ මූල්‍ය පුහුණු වැඩසටහන් තුළින් ගනුදෙනුකාර සම්බන්ධතා ශක්තිමත් කිරීම අපි තවදුරටත් කරන්නෙමු. අපගේ සේවක අගය කොටස සංවර්ධනය කිරීම වසර තුළ මූලික ප්‍රමුඛතාවක් වූ අතරම, ඉහළ කාර්යසාධනය කරා ගමන් කරන සංස්කෘතියක් පෝෂණය කිරීමේ පරමාර්ථයෙන් ආයතනයේ සේවක උසස්වීම් සහ වේතන ප්‍රතිපත්තිය අපි ශක්තිමත් කළෙමු. වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අපගේ දෛනික මෙහෙයුම් තුළ තිරසාරත්වය කා වැද්දීමට අපි උත්සාහ ගන්නෙමු. අපගේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන මගින් තරඟකාරී අනුපාතවලට මුදල් කරා ප්‍රවේශය ලබාදීම තුළින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින් 17,000කට වැඩි පිරිසක් සවිබල ගැන්වීමට හා සංවර්ධනය කිරීමට අපිට හැකි විය. එමෙන්ම වසර තුළදී විවිධ ප්‍රජා සත්කාරක සේවා තුළින් අප ක්‍රියාත්මක ප්‍රජාවන් සමඟ සක්‍රීය සහභාගිත්වය අපි පවත්වා ගෙන යන්නෙමු. අපගේ ක්‍රමෝපායේ අදාළත්වය හා නිපුනත්වය වසර තුලදී අපගේ සැලකිය යුතු කාර්යසාධනය තුළ පිළිබිඹු කරයි. අපගේ මෙහෙයුම් තුළ හැරවුම් ලක්ෂයක් සලකුණු කරමින් සහ ඉදිරි වසර තුළ වර්ධනය සඳහා ශක්තිමත් අවස්ථාවක් අපට ලබාගනිමින් සමාග මේ බදු පෙර ලාභය පෙර වසරේ රුපියල් මිලියන 35.4ක අලාභයට සාපේක්ෂව රුපියල් මිලියන 239.9ක ලාභයක් වාර්තා කරන ලදී.


ඉදිරි ගමන් මඟ

2017 පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති දර්ශක තුළින් වෙළෙඳපොල පොළී අනුපාත තවදුරටත් වැඩි කිරීමකට මඟපෑදීම අපේක්ෂා කරයි. රටේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශවල වර්ධනය කරා එකී ප්‍රතිපත්තිවලින් ණය සඳහා ඉල්ලුම පවත්වා ගැනීමට අපේක්ෂා කරන අතර මෙම ප්‍රගමනයෙන් ප්‍රතිලාභ ලැබීම සඳහා අපි මනාව ස්ථාන ගත වී ඇත. ඉදිරි වසර තුන සඳහා වන ක්‍රමෝපාය වෙළෙඳපොල අංශ සහ ගනුදෙනුකරුවන් සඳහා වඩාත් දියුණු ප්‍රවේශයක් තහවුරු කරන අතර අපගේ සම්ප්‍රදායන් ව්‍යාපාර මාර්ගයන්ගෙන් වෙනස්වීම පිණිස උසස් ඵලදාවක් සහිත නිෂ්පාදන වර්ග කරා ගමන් කිරීමට අපි අපේක්ෂා කරමු. සමස්ත ලාභදායකත්වයට සහය වෙමින්, සැලකිය යුතු මෙහෙයුම් කාර්යක්ෂමතාවන් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් ඇති කර ගැනීම සඳහා 2017 දෙවන අර්ධය තුළ නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

පිළිගැනීම

අවස්ථාවන් සහ ප්‍රගතිය පිළිබඳ තවත් එක් ශුභදායි වසරක් මම බලාපොරොත්තු වන අතර, රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ අමාත්‍යාංශයේ ඇමතිතුමා, ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයට, මහ භාණ්ඩාගාරයේ කාර්ය මණ්ඩලයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට මම කෘතඥතාව පළකිරීමට කැමැත්තෙමි. MBSL ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහයකයින්ට ස්තූතිවන්ත වන අතර ඔබත් සමඟ තවදුරටත් කටයුතු කිරීමට මම අපේක්ෂා කරමි. අවසාන වශයෙන්, MBSL කළමනාකාරිත්වයට සහ සියලුම සේවකයින්ට ඔවුන්ගේ බැඳීම සහ කැපවීම වෙනුවෙන් සහ අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාව පළකරමි.

ස්තූතියි.



ආචාර්ය සුජීව ලොකුහේවා
සභාපති

2017 අප්‍රේල් 28
කොළඹ



ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

“පෙර වසරේ රු. මිලියන 35.4ක අලාභයක සිට සමාගමේ සමස්ථ බදු පෙර ලාභය රු. මිලියන 239.9 දක්වා වැඩිවිය. සමාගම පෙර වසරේ රු.මිලියන 78.3ක ශුද්ධ අලාභයක සිට රු.මිලියන 85.6 දක්වා ශුද්ධ ලාභය වැඩිකර ගනිමින් වසර තුළ ලාභදායත්වය කරා ප්‍රවේශ විය.”

සමූහය 2015 දී සංකීර්ණ සහ අභියෝගාත්මක ඒකාබද්ධකිරීමෙන් පසු ශක්තිමත් පරිවර්තනයක් අත්කරගත් බැවින් සමාලෝචනයට ලක්වන වසර MBSL සමූහයට අර්ථවත් වසරක් විය. අවධානය යොමුකළ ක්‍රමෝපායක් නිවැරදිව ක්‍රියාත්මක කිරීම තුළින් සමූහයට එහි ඉහළ සහ පහළ මාර්ගයන්හී ශක්තිමත් වර්ධනයක් අත්කර ගැනීමට හැකි වූ අතර, එය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා සමූහයේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට ඉමහත් සතුටක් මා වෙත ගෙන දෙන්නකි.

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක්

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිත වර්ධනය වසර තුළ 4.4% (2015 : 4.8%) දක්වා අඩු වූ අතර එයට අහිතකර කාලගුණ තත්ත්වයන් යටතේ කෘෂිකාර්මික අංශයේ පහළ වැටීම මූලිකවම හේතු විය. මෙම වසර තුළ කර්මාන්ත සහ සේවා අංශය පිළිවෙලින් 6.7% සහ 4.2% කින් වර්ධනය විය. මේ අතර, වසර තුළ යොදාගත් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය වසරේ දෙවන අර්ධය තුළ පොළී අනුපාත ඉහළ යාමකට හේතුවිය. වටිනාකමට ණය අනුපාත නීතිය 70% සහ අඛණ්ඩව වාහනවල මිල ඉහළ යාම කල්බදු ණය කළඹට බලපානු ලැබුවද වසර තුළදී මූල්‍ය නොවන බැංකු අංශය ප්‍රශංසනීය ලෙස කටයුතු කරන ලදී. සමස්තයන් ලෙස, ක්ෂේත්‍රයේ මුළු වත්කම් වසරේ පළමු මාස නවය තුළ 16% කට ආසන්න අගයකින් වර්ධනය වූ අතර එය ණය කළඹ, ක්ෂුද්‍ර මූල්‍යකරණය සහ කර්මාන්තවල පුළුල්වීමකට හේතු විය.

ලාභදායිත්වය සඳහා සක්‍රිය ක්‍රමෝපායක්
වසර තුළ අපගේ මෙහෙයුම් අවධානය යොමුකළ ක්‍රමෝපායක් මඟින් මෙහෙයවන ලද අතර ඉන් ඉලක්ක කරනු ලැබුවේ ලාභ වර්ධනය සහ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවයි. ක්‍රමෝපාය අවධානය, ණය එකතු කිරීම කෙරෙහි සහ ණයවල ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා සහතික කරන යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි යොමු කරන ලදී. සම්පත් සේවයේ යොදවනු ලැබූමෙන් නියාමනය සහ නැවත අයකර ගැනීම් ශක්තිමත් කිරීම වූ අතර ඒ තුළින් සමූහයේ දළ අක්‍රීය ණය අනුපාතය 4.2% කින් පහත වැටිණ. එහි ප්‍රතිඵලය වූයේ වසරේ හානිකරණ වියදමද සමස්ත ලාභදායිත්වය දරාගනිමින් පෙර වසරේ පැවති රුපියල් මිලියන 462.15 සිට රුපියල් මිලියන 24.24 දක්වා පහළ වැටීමයි. එමෙන්ම අපි තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීම, නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීමට මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා කාලය සහ ශ්‍රමය කැප කළෙමු. 2017 දෙවන අර්ධය තුළ එම පද්ධතිය දියත් කිරීමට අපි අපේක්ෂාවෙන් සිටින අතර ඵලදායිතාව, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණය තුළ විවිධ ප්‍රතිලාභ එකතු කර ගැනීමට අපේක්ෂා කරමු. මෙම පද්ධතිය මඟින් සමස්ත ගනුදෙනුකාර අගය කොටස වැඩි කිරීම සඳහා දියත් කෙරෙන ණය/හර කාඩ්, අන්තර්ජාල බැංකුකරණය, සහ ජංගම බැංකුකරණය ඇතුළුව විවිධ මූලිකාරම්භයන් සමඟ අනාගතයට සූදානම් මූල්‍ය ආයතනයක් ලෙස සමාගම ස්ථාන ගත කරනු ඇත. බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස පරිවර්තනය මඟින් පොදු තැන්පතු, අපගේ අරමුදල් කළඹ තුළ වර්ධිත විවිධත්වය පහසුකිරීම කරා ප්‍රවේශය සමාගමට ලබාදී ඇත. වසර තුළ, තැන්පතු බලය වර්ධනය කරමින් සමාගමේ තැන්පතු පදනම රුපියල් මිලියන 18.52 දක්වා 16.86% කින් වැඩි කිරීමට හැකි වූ අතර තැන්පතු සේවයේ යෙදවීම් තුළ මානව සම්පත් හැකියාවන් අපි ශක්තිමත් කළෙමු.

අසමසම සේවක කොටසක්
වසර සඳහා අපගේ සේවක ක්‍රමෝපාය යොමු වූයේ ඉහළ නිපුනතාවක් සහිත, කාර්යසාධනය කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් සංවර්ධනය කිරීම කෙරෙහි වන අතර, එය අපගේ අපේක්ෂිත ක්‍රමෝපායික න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කරන දක්ෂතාවන්ගෙන් යුත් සේවකයින් බිහි කරනු ඇත. එහිදී නායකත්ව සංවර්ධනය, ණය ආපසු අයකරගැනීම් සහ තැන්පතු සේවයේ යෙදවීම තුළ සේවක හැකියාවන් වර්ධනය පිණිස අපි රුපියල් මිලියන 14.63 ක් ආයෝජනය කළෙමු. ව්‍යුහගත කාර්යසාධනය මත ප්‍රතිලාභ ලබාදෙන ක්‍රමයක්, ඉහළ කාර්යසාධනය සහිත සේවකයින් හඳුනාගැනීම සහ ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහා දියත් කරන ලදී. 2017 ජනවාරි වසර තුනක සාමූහික එකඟතාවයක් සඳහා වෘත්තීය සංගම් සමඟ සාර්ථකව කටයුතු කළ අතර ඒමඟින් සේවකයින්ට අදාළ ගැටළු හඳුනාගනිමින් මෙහෙයුම්වල අවම බාධාවක් සහතික කරයි. වසර තුළදී, අපගේ සේවක වටිනාකම් කොටස වැඩි කිරීම සඳහා වන අපගේ උත්සාහයන් හඳුනාගනිමින් පාට්නර්ෂිප් සමිටි ඇන්ඩ් බිස්නස් එවෝර්ඩ්ස් විසින් සංවිධානය කළ ලෝක මානව සම්පත් සංවර්ධන කොන්ග්‍රසයේදී විශිෂ්ඨතම සේවා යෝජකයෙක් ලෙස MBSL සමාගම පිළිගනු ලැබීය. එමෙන්ම සමාගම මැදපෙරදිග ආසියා නායකත්ව සමූළුව සහ ප්‍රදානයේදී වසරේ නැගීවන මූල්‍ය ආයතනය ලෙස පිදුම් ලැබීය.

වාර්තාගත ලාභදායිත්වය
වසර තුළ සමූහයේ සුවිශේෂී කාර්යසාධනය අපගේ ක්‍රමෝපාය පිළිබඳ මෙන්ම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අපගේ කණ්ඩායමේ බැඳීම පිළිබඳ සාක්ෂියකි. සමූහයේ සහ සමාගමේ ශුද්ධ පොළී ආදායම පොළී අනුපාතවල සීඝ්‍ර වැඩිවීම හමුවේ වුවත් පිළිවෙලින් 5.55% සහ 4.55% මට්ටමේ පැවති අතර මෙය ශුද්ධ පොළී ආන්තික කෙරෙහි පීඩනය ඇති කරන ලදී. අපගේ ණය පදනම විවිධාංගීකරණය කිරීමට අප උත්සාහ කළ බැවින් ආයතනික සහ පාරිභෝගික ණය කළඹ (+28.67%) සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය (+59.41%) ලෙස ශක්තිමත් වර්ධනයක් සමඟින් 16.29% කින් වර්ධනය විය. ණයවල ගුණාත්මකභාවය වර්ධනයෙන් පසු හානිකරණ වියදම් තුළ තියුණු පහතවැටීමක් මඟින් මූලිකවම ලාභදායිත්වය දරාගන්නා ලදී.

පෙර වසරේ රුපියල් මිලියන 35.4ක බදු පෙර අලාභයේ සිට රුපියල් මිලියන 239.9 දක්වා සමාගමේ බදු පෙර ලාභය වැඩි කිරීමට එය හේතු විය. එමෙන්ම පෙර වසරේ රුපියල් මිලියන 78.31 ක ශුද්ධ අලාභයක සිට රුපියල් මිලියන 85.6 ක ශුද්ධ ලාභ වැඩිවීමත් සමඟ වසර තුළ ලාභදායිත්වය කරා සමාගම නැවත පැමිණියේය.

ඉදිරි ගමන්මඟ
බැංකු නොවන මූල්‍ය අංශයේ වර්ධනය සඳහා සැලකියයුතු අවස්ථාවන් ලබාදීම පිණිස මෙරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය ශක්තිමත් කිරීම රජය අපේක්ෂා කරන අතර සමූහය මෙවැනි නැගීවන අවස්ථාවන්හි ප්‍රාග්ධනීයකරණය සඳහා සුදුසු පරිදි ස්ථාන ගත කෙරේ. බිලූ ඕෂන් ක්‍රමෝපාය මත පදනම් ක්‍රමෝපායික වැඩසටහනක් ඉදිරි වසර තුන සඳහා ක්‍රියාත්මක කරනු ලබන අතර සමූහය එහි සම්ප්‍රදායික නිෂ්පාදන හා වෙළෙඳපොල විවිධාංගීකරණ කිරීම අපේක්ෂා කරයි. අපගේ සන්නාම ප්‍රතිරූපය ශක්තිමත් කිරීමට සහ වෙළෙඳපොල පිළිගැනීම වැඩිකිරීම සඳහා සක්‍රීය ප්‍රචාරණ සහ අලෙවිකරණ වැඩසටහනක් ද මෙයට සමගාමීව දියත් කරන ලදී. සමාගම භූගෝලීයමය පුළුල් කිරීමක නිරතව සිටින අතර ඊලඟ මූල්‍ය වර්ෂය තුළ අමතර ශාඛා 10 සමඟින් උතුරු සහ නැගෙනහිර මෙන්ම දකුණු පළාත්වල අපගේ ව්‍යාප්තිය ශක්තිමත් කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

පිළිගැනීම
මා වෙත ලබාදෙන මඟ පෙන්වීම සහ මා කෙරෙහි තබන ලද අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මම ස්තූතිය පළ කරමි. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ අමාත්‍යංශයේ ඇමතිතුමා, ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයට, මහාභාණ්ඩාගාරයේ කාර්ය මණ්ඩලයට, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මගේ කෘතඥතාව පළකරමි. එමෙන්ම කොළඹ කොටස් හුවමාරුව, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ස්තූතිය පළකිරීමට ලැබීම මට සතුටකි. මෙවැනි සේවයකට කැප වූ සේවක කණ්ඩායමක් මෙහෙයවීම පිළිබඳ මම සාධම්බරයට පත් වන අතර MBSL පවුල වෙත ඔවුන්ගේ බැඳීම සහ සහයෝගය සඳහා කෘතඥතාව පළ කරමි. අවසාන වශයෙන් සමූහයේ වර්ධන අපේක්ෂාවන් හා අඛණ්ඩව හවුල්කාරත්වය දැක්වූ අපගේ ලෙන්ගතු ගනුදෙනුකරුවන් සහ පාර්ශවකරුවන් වෙත මගේ කෘතඥතාව පළකරමි.



ටී. මුතුගල
ප්‍රධාන විධායක නිලධාරී

2017 අප්‍රේල් 28 දින
කොළඹ

මෙම වාර්තාව පිළිබඳව

මෙය අපගේ 3 වැනි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව වන අතර ඒ තුළින් අපගේ ක්‍රමෝපාය, මෙහෙයුම් ආදර්ශය, අවස්ථා සහ අවදානම්, පාලනය සහ අගය නිර්මාණය, මූලිකවම ඉලක්කගත වර්තමාන සහ අනාගත ආයෝජකයින් පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක් ලබාදීමට අපි බලාපොරොත්තු වෙමු. සමූහයේ ක්‍රමෝපාය සහ මෙහෙයුම් මගින් අපගේ සම්පත් හා සම්බන්ධතාවන්ගෙන් අපි ඇතිකරගන්නා අගය සහ අගය නිර්මාණය කිරීම සඳහා අපි දරන උත්සාහය පිළිබිඹු කරන අතර ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ ඒකාබද්ධ වාර්තාකරණ වැඩපිළිවෙල මගින් නියම කරන ලද ප්‍රාග්ධන යෙදවුම්වලට යොමු වී සමූහයේ අගය නිර්මාණය පිළිබඳ තුළනාත්මක ඇගයීමක් ලබාදීම මෙම වාර්තාව තුළින් අපි අරමුණු කරමු.

විෂයපථය සහ සීමාව

G4-3, G4-15, G4-17, G4-18, G4-28,G4-29,G4-30

මෙම වාර්තාව තුළින් 2016 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව තුළ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී එහි පරිපාලිත සමාගම වන MBSL රක්ෂණ සමාගමේ ආශ්‍රිත සමාගම වන ලංකා සිකියුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ් හී මෙහෙයුම් හා සාරාංශ විමර්ශනය ආවරණය කෙරේ. අපි වාර්ෂික වාර්තාකරණ රටාවක් අනුගමනය කරන අතර, මෙම වාර්තාව 2015 වසර සඳහා සමූහයේ පෙර වාර්ෂික වාර්තාව මත ගොඩ නැගේ.

එමෙන්ම මෙම වාර්තාව තිරසාරත්ව වාර්තාකරණය සඳහා ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) G4 මධ්‍ය නිර්ණායකය මගින් නියමිත මූලධර්ම අනුගමනය කරයි. අපගේ වාර්තාවේ අර්ථවත්භාවය සහ විශ්වාසනීයත්වය අඛණ්ඩව වර්ධනය කිරීමේදී, ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) මගින් නියම කරන ලද අංශ පිළිබිඹු කිරීම සඳහා අපගේ විෂයාත්මක අංශවල සහ අපගේ ක්ෂේත්‍රයට විශේෂිත විෂයපථය සහ අගය නිර්මාණ ක්‍රියාවලිය අපි ශක්තිමත් කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව වාර්තාකරණ විෂයපථය හෝ වැදගත් නැවත ප්‍රකාශයන්හි කිසිදු ප්‍රමාණාත්මක වෙනසක් සිදු වී නොමැත. GRI අන්තර්ගත දර්ශකය පිටු අංක 252 සිට 263 දක්වා වාර්තාව අවසානයේ දක්වා ඇත.

වාර්තාකරණ මූලධර්ම සහ සහතික කිරීම

G4-32, G4-33

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරණ සමාගම් පනතේ සහ 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනතේ අවශ්‍යතා, සහ ශ්‍රී ලංකා මහ බැංකුව අනුව ලියාපදිංචි මූල්‍ය කල්බදු ආයතන යොදාගතයුතු වන අදාළ දුරදර්ශී රෙගුලාසි සහ උපදෙස්වලට අනුකූලව මෙම වාර්තාවේ 140 සිට 238 දක්වා පිටුවල ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත. ආයතනික යහපාලන සහ අවදානම් කළමනාකරණ වාර්තා ලියාපදිංචි මූල්‍ය කල්බදු ආයතන සඳහා අදාළ නියමයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත අවශ්‍යතාවන්ට අනුකූල වේ. මූල්‍ය ප්‍රකාශ සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳ සහතික කිරීම ශ්‍රී ලංකා විගණකාධිපති විසින් ලබාදී ඇත.

ප්‍රතිචාර

G4-31

ඉදිරිපත් කරන තොරතුරුවල තත්ත්වය සහ අර්ථවත්බව වැඩි කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරමින් සිටින බැවින් අපගේ වාර්තාව පිළිබඳ යෝජනා, ප්‍රතිචාර සහ විමසීම් අපි පිළිගනිමු. ඒ සඳහා කරුණාකර පහත ලිපිනය අමතන්න.

මූල්‍ය ප්‍රධානී

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
BOC මර්චන්ට් කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03
දුරකථනයක: 011 47111749
purnak@mbslbank.com

අපගේ වාර්තාව තරණය කිරීම

නායකත්ව සමාලෝචනය

සභාපතිවරයා (පිටුව 06) සහ ප්‍රධාන විධායක නිලධාරී (පිටුව 08) විසින් ඉදිරිපත් කරන පරිදි 2016 දී ක්‍රමෝපාය කාර්යසාධනය, පාලනය, අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ සමාලෝචනයක්

නායකත්වය

ආයතනික යහපාලනය (පිටුව 72) සහ අවදානම් කළමනාකරණය පිටු අංක 122)

අපගේ මෙහෙයුම් සඳහා සමගාමී පසුබිම

විෂයාත්මක අවදානම් සහ අවස්ථාවන් (පිටු අංක 24)

ක්‍රමෝපාය නිර්ණය කරන ආකාරය

අපගේ පාර්ශවකාර අවශ්‍යතා, අගය නිර්මාණ ආදර්ශය සහ විෂයාත්මක අංශ පිළිබඳ සමාලෝචනයක් මගින් අපගේ ක්‍රමෝපාය දැනුම් දේ. (පිටුඅංක 18)

අපගේ කාර්යසාධනය

අපගේ ප්‍රාග්ධන යෙදවුම්වලට අප නිර්මාණය කරන අගයට යොමු වී කාර්යසාධනය පිටු අංක 36 - 59)

කාර්යසාධන විශේෂ සිදුවීම්


G4-09

මූල්‍ය සිදුවීම්

		සමාගම	
	2016	2015	වෙනස (%)
මෙහෙයුම් කාර්යසාධනය (රු.මිලියන)			
ශුද්ධ පොලී ආදායම	2,028.17	1,939.83	5
දළ ආදායම	4,888.16	4,216.99	16
බදු පෙර ලාභය	239.87	(35.43)	අ/නැ
වර්තන බදු	62.84	31.68	98
බදු පසු ලාභය	85.62	(78.31)	අ/නැ
රඳවාගත් ඉපයීම්	853.17	747.41	14
මූල්‍ය තත්ත්වය (රු.මිලියන)			
මුළු වත්කම්	31,933.73	28,274.55	13
ශුද්ධ ණය කළඹ	27,052.00	23,225.78	16
මුළු තැන්පතු	18,518.42	15,846.31	17
කොටස්කරුවන්ගේ අරමුදල්	3,113.49	3,008.06	4
මෙහෙයුම් අනුපාත (%)			
ස්කන්ධය මත ඉපයීම්	2.80	(2.54)	අ/නැ
පිරිවැයට ආදායම් අනුපාතය	72.06	66.89	8
සාමාන්‍ය වත්කම් මත ඉපයීම්	0.28	(0.28)	අ/නැ
තැත්පතු අනුපාතයට ණය	146	147	(1)
සමස්ත ප්‍රාග්ධන අනුපාතය	10.69	11.68	(1)
මධ්‍ය ප්‍රාග්ධන අනුපාතය	10.66	11.91	(1)
කොටස් හිමි අනුපාතය (රු.)			
කොටසකට ඉපයීම්/(අලාභය) (රු)	0.52	(0.47)	අ/නැ
කොටසකට ශුද්ධ වත්කම් අගය (රු)	18.77	18.13	4
මිල ඉපයීම් අනුපාතය	26.35	(31.77)	අ/නැ
කොටසකට වෙළෙඳපොල අගය (රු)	13.60	15.00	(9)

මූල්‍ය නොවන සිදුවීම්

	2016	2015	වෙනස (%)
නිෂ්පාදිත ප්‍රාග්ධනය			
ගනුදෙනුකාර ප්‍රවේශ ස්ථාන	49	49	0
විවෘත කළ රන් ණය මධ්‍යස්ථාන	6	13	(54)
මානව ප්‍රාග්ධනය			
සේවකයින් ගණන	917	866	6
සේවකයින්ට ගෙවීම් (රු.මිලියන)	818	707	16
පුහුණුව සඳහා ආයෝජන (රු.මිලියන)	14.62	7.09	106
පුහුණු පැය ගණන	18,395	11,100	66
සේවකයෙකුට පුහුණු පැය	20.06	12.82	56
සේවකයෙකුට ලාභය (රු.මිලියන)	0.09	(0.09)	අ/නැ
රඳවාගැනීම් අනුපාතය (%)	85	84	1
සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය			
ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	198,824	138,895	43
ගෙවූ පොළී (රු.මිලියන)	2,709.60	2,133.33	27
ලබාදුන් ණය (ගණන)	33,725	19,033	77
උත්පාදනය කළ තැන්පතු (ගණන)	45,170	31,576	43
ස්වාභාවික ප්‍රාග්ධනය			
බලශක්ති පරිභෝජනය (ඒකක)	1,269,818	1,138,679	12
ජල පරිභෝජනය (ඒකක)	17,616	18,153	(3)
කඩදාසි භාවිතය (ඒකක)	315,960	369,624	(15)
ප්‍රතිචක්‍රීය කළ කඩදාසි (කි.ග්‍රෑ)	720	390	85


සන්නාම අගය
වැඩිවීම
63%
රු.මි.774
ආයෝජනය
රු.මි. 81
නවීනතම හරයාත්මක
බැංකුකරණ පද්ධතිය
පුහුණු පිරිවැය
රු.මි.14.62
සේවක පුහුණු පැය
18,395
මුළු සේවකයින්
ගණන
917
කඩදාසි භාවිතය
15%
ජල පිරිවැය
22%
අඩුකිරීම
සේවකයින්
රඳවාගැනීම
85%
වෙළෙඳ පොල
ප්‍රාග්ධනීකරණය
රු.බි.2.25
සේවකයින්ට
ප්‍රදාන සහ ප්‍රතිලාභ
රු.මි.818

අපගේ ව්‍යාපාරය

අප ගැන

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරයි. දශක 4කට ආසන්න විශිෂ්ඨ ගමන් වාර්තාවක් සහිතව, රටපුරා පුද්ගලයින් වෙත මූල්‍ය ප්‍රවේශය සහ සවිබලගැන්වීම සඳහා දායක වෙමින් ගනුදෙනුකරුවන් 190,000කට අධික සංඛ්‍යාවක් සමඟ සම්බන්ධතා ගොඩනගා ඇත. දිස්ත්‍රික්ක 22ක් තුළ ගනුදෙනුකාර ප්‍රවේශ ස්ථාන 49ක ජාලයක්, ක්‍රියාශීලි සහ දක්ෂතාව සහිත සේවකයින් 917ක් අපි මෙහෙයවන්නෙමු. 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 2.25ක වෙළෙඳපොල ප්‍රාග්ධනකරණයක් සමඟ, මෙම සමාගම කොළඹ කොටස් වෙළෙඳ පොළේ ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත කර ඇත. MBSL සමාගමට සම්පූර්ණයෙන් අයත් පාලිත සමාගමක් වන MBSL රක්ෂණ සමාගම සාමාන්‍ය සහ පීවිත රක්ෂණ විසඳුම් ලබාදීමේ නිරත වේ. ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙක් වන ලංකා සිකියුරිටීස් පුද්ගලික සමාගම, සමාගමේ ආශ්‍රිත සමාගම වන අතර එය ස්කන්ධ වෙළෙඳාම, ණය වෙළෙඳාම සහ ආන්තික වෙළෙඳාමේ යෙදී සිටී. MBSL වත්කම්, තැන්පතු සහ ශාඛා ජාලය අනුව ශ්‍රී ලංකාවේ විශාලතම බලපත්‍රලාභී වාණිජ බැංකුව වන රජයට අයත් ලංකා බැංකුවට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමකි.

MBSL මැදපෙරදිග නායකත්ව සමුළුව සහ තිළිණ ප්‍රදානයේදී (2016/17) වසරේ ඉදිරියට එන මූල්‍ය සමාගම් සඳහා වූ සම්මානය දිනා ගනු ලැබිය. වර්ල්ඩ් වයිඩ් ලීඩර්ස් ෆෙඩරේෂනය (World Leadership Federation) ආයතනික සාර්ථකත්වයන් සමරනු ලබන ගෝලීය වේදිකාවක් වන අතර, එහිදී ලොවපුරා නායකයින් සහ විශිෂ්ඨ ආයතන විසින් ඉහළ ජයග්‍රහණ සහ අතිවිශේෂ ඉලක්ක අත්කර ගැනීමේදී ඔවුන්ගේ උත්සාහයන් හඳුනාගෙන, අගය කරමින් සම්මාන ලබා දේ.

මුළු වත්කම්
රු.මිලියන **31,934**
(2015: රු.මි.28,275)

මුළු තැන්පතු
රු.මිලියන **18,518**
(2015: රු.මි.15,846)

පොළී ආදායම
රු.මිලියන **4,738**
(2015: රු.මි.4,073)

වෑයමේ ලාභය
රු.මිලියන **85.62**
(2015: රු.මි.(78.31))

කොටසක ඉපැයීම
රු. **0.52**
(2015: රු.(0.47)

සේවකයින්
917
(2015: 866)


අප කරන දෑ

පුද්ගලයින්, සුළු හා ක්ෂුද්‍ර ව්‍යවසාය සහ ආයතනික ගනුදෙනුකරුවන් වෙත ණය සහ ආයෝජන විසඳුම් ගණනාවක් අපි ලබා දෙමු.




කොටස්හිමිකාර ව්‍යුහය

G4-07




සංවිධාන ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
විගණන කමිටුව
පාරිශ්‍රමික කමිටුව
සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව
මාණ්ඩලික අනු කමිටු
සමාගම් ලේකම්
ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන මෙහෙයුම් නිළධාරී
කළමනාකරණ අනුකමිටුව
ආයතනික කළමනාකරණ කමිටුව
ණය කමිටුව
ආයෝජන කමිටුව
වත්කම් හා වගකීම් කමිටුව
තොරතුරු තාක්ෂණ කමිටුව
දේපල වෙළෙඳාම් කමිටුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- 1 කලාපය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 2 කලාපය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 3 කලාපය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ණය පරිපාලන/ අනුකූලතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නීති
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - රන් ණය හා උපකාරක සේවා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- වෙළෙඳ පොල නිෂ්පාදන සංවර්ධනය, හැන්පතු හා ඉතුරුම්
සහකාර සාමාන්‍යාධිකාරී සමූහ අභ්‍යන්තර විගණන
සහකාර සාමාන්‍යාධිකාරී- මානව සම්පත
තොරතුරු තාක්ෂණ ප්‍රධානී
මූල්‍ය ප්‍රධානී
සහකාර සාමාන්‍යාධිකාරී - ණය අයකරගැනීම්
ප්‍රධාන කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
ප්‍රාදේශිය කළමනාකරු
වැඩබලන ප්‍රධාන කළමනාකරු - ආයතනික උපදේශන සහ ප්‍රාග්ධන වෙළෙඳාම

නිෂ්පාදන හා සේවා

G4-04



අපගේ කලාපීය ව්‍යාප්තිය

G4-06



MBSL එහි පාර්ශවකරුවන්ගේ විවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන ආකාරයකින් එහි ව්‍යාපාර කළමනාකරණය කිරීම කෙරෙහි බැඳි සිටින අතර, තිරසාර පාර්ශවකාර වටිනාකම ඇති කිරීම සඳහා මෙවැනි තරඟකාරී අවශ්‍යතා තුලනය කිරීමට අපගේ ක්‍රමෝපාය ඉතා සැලකිල්ලෙන් සකස් කරනු ලැබ ඇත.

මෙහෙයුම් සන්දර්භය සහ ක්‍රමෝපාය

වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

අපගේ මෙහෙයුම් පරිසරය

අපගේ පාර්ශවකරුවන් සමඟ සහභාගිත්වය

ප්‍රමාණාත්මක ක්‍රමෝපායික රාමුව නිර්වචනය


තිරසාරත්වය කරා අපගේ ප්‍රවේශය

ක්‍රමෝපායික කාර්යසාධනය

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

- කල්බදු
- ආයතනික හා පාරිභෝගික ණය
- ආයතනික උපදේශනය සහ ප්‍රාග්ධන වෙළෙඳපොල
- ආර්ථික වටිනාකම් එකතු කිරීම

වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය



අපගේ මෙහෙයුම් පරිසරය


සමූහයේ ක්‍රමෝපායික වැඩසටහන ඇතිවන අවදානම් සහ අවස්ථාවන්ට අදාළව පවත්නා බව සහතික කිරීම හේතු කොට ගෙන සමූහයේ මෙහෙයුම් සන්දර්භය තුල ප්‍රවනතාවන් ක්‍රමෝපාය සකස් කිරීම තුළ අත්‍යවශ්‍ය යෙදවුමක් වේ. MBSL සක්‍රීයව සමූහයේ අනාගත ගම්‍යාර්ථයන් තීරණය කිරීමේදී මෙම ඇතිවන ප්‍රවනතාවන් සක්‍රීයව නියාමනය කරයි.

ආර්ථික වර්ධනය

2016 ප්‍රවනතා

රටේ කර්මාන්ත (6.7%) සහ සේවා අංශ (+4.2%) තුළ වර්ධනය තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) 2016 වසර තුළ 4.4%කින් පුළුල් වූ අතර කෘෂිකාර්මික අංශය පෙර වසරට සාපේක්ෂව සංකෝචනය විය. දළ දේශීය නිෂ්පාදිතය සහ එහි වර්ධනයට විශාලම දායකයා ලෙස තවදුරටත් සේවා අංශයේ 57%ක කොටස සඳහා මූල්‍ය සහ රක්ෂණ සේවා (+8.4) සහ තොරතුරු සහ සන්නිවේදන උප අංශය (+8.0) පුළුල්වීම මගින් සහය විය. රජයේ හා පුද්ගලික අංශයේ ව්‍යාපෘති නැවත ආරම්භයත් සමඟ ඉදිකිරීම් අංශය ජවයෙන් ඉදිරියට යාමත් සමඟ කර්මාන්ත ක්ෂේත්‍රය 5.7%කින් වර්ධනය විය. (2015 වසරේ අනුරූප කාලසීමාවේ 2.1ට සාපේක්ෂව) කෘෂිකාර්මික අංශය ප්‍රධාන බෝග කීහිපයක සැපයීමට බලපාන කාලගුණ තත්ත්වයන් අහිතකර වූ බැවින් 4.2%ක සංකෝචනයකට මුහුණුපාන ලදී.

ද.දේ.නි වර්ධනය



මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

මූල්‍ය සේවා අංශයේ වර්ධනය 11.4%

අපගේ ක්‍රමෝපායේ ගම්‍යාර්ථයන්


විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ අංශය තුළින් ආර්ථික වර්ධනය ඇති කිරීම කරා රජයේ ප්‍රතිපත්තිය අනුව යමින් රටේ වෙළෙඳ අංශය තුළ වර්ධනයට අවස්ථාවන් ලබාදීම. කෘෂිකාර්මික අංශයේ දුෂ්කරතා ඉහළ හානිකරණ අයකිරීමට හේතු වෙමින් මෙම අංශය තුළ ණය කළඹ දුර්වල කිරීමට මඟ පෑදිය හැකිය.

මූල්‍ය ප්‍රතිපත්තිය සහ පොළි අනුපාත

2016 ප්‍රවනතා

උද්ධමන පීඩනය වැලැක්වීමේ සහ ගෙවුම් ශේෂයට සහයවීමේ පරමාර්ථය ඇතිව මෙම වසර තුළ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයක් යොදා ගන්නා ලදී. ඒ අනුව, ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය සහ ස්ථාවර ණය පහසුකම් අනුපාතය 2016 පෙබරවාරි සහ ජූලි පදනම් ලක්ෂ්‍ය 50 කින් වැඩිකරන ලැබූ අතර වසර අවසානයට පිළිවෙලින් 7.0% සහ 8.5% ක් විය. මේ අතර, බැංකු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2016 ජනවාරි 6.0% සිට 7.5% දක්වා වැඩි කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාරාත්මකව, වෙළෙඳපොල පොලී අනුපාත වසරේ වැඩි කොටසක් තුළ ඉහළයාමක් පෙන්නුම් කරන ලදී.

පොළි අනුපාත ප්‍රවනතා



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ ක්‍රමෝපායේ ගම්‍යාර්ථ

ඉහළ පොළි අනුපාත තුළින් වසරේ දෙවන අර්ධයේදී ණය ඉල්ලුම අඩුවීමකට හේතු වූ අතර, පොළී ආන්තික කෙටිකාලීන තැන්පතු වගකීම් වේගයෙන් ප්‍රතිමිලකරණය නිසා සංකෝචනය විය.

අපගේ මෙහෙයුම් පරිසරය

උද්ධමනය


2016 ප්‍රවනතා

ඉල්ලුම කරා ගමන් කරන උද්ධමනීය පීඩන, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සැපයුම් සංරචක සහ බදු ව්‍යුහයට සංශෝධන පෙන්නුම් කරමින්, වසරේ පළමු අර්ධය තුළ ශීර්ෂ සහ මධ්‍ය උද්ධමනය ඉහළට ගමන් කරමින් පැවතියේය. එම නිසා, කොළඹ පාරිභෝගික මිල දර්ශනය (NCPI) විසින් අඟය කළ උද්ධමනය 2016 ජූනිවල ඉහළම මට්ටමක පැවති අතර ඉන්පසු ක්‍රමානුකූලව පහත වැටී වසරේ අවසාන කොටසේදී ස්ථාවර විය.

අපගේ ක්‍රමෝපායේ ගමකාර්ථ

2016 අවසාන කොටසේදී උද්ධමනය ස්ථාවරවීම මගින් විශේෂයෙන් 2017 ණය ඉල්ලුම ඉදිරියට ගෙන යාම අපේක්ෂා කෙරේ.

උද්ධමනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය


2016 ප්‍රවනතා

රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයට සහය වෙමින්, දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි) ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය වසර තුළ (පෙර වසරේ 7.4% සිට) 5.4% දක්වා පහත වැටුණි. බදු පදනම පුළුල් කිරීම පිළිබඳ සහ බදු වංකතු කිරීමේ පරිපාලන කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිළිබඳ අයවැය යෝජනාවලින් මූල්‍ය ස්ථාවරත්වයට සහ මධ්‍ය කාලීනව වඩාත් ස්ථාවර සාර්ව ආර්ථික තත්ත්වයක් අපේක්ෂා කරනු ලබයි.

අපගේ ක්‍රමෝපායේ ගමකාර්ථ

වසර තුළ වාහන මිල ගණන් ඉහළ යාමට හේතු වූ තීරු බදු සමාගමට එහි වර්ධනය කරා යාමට සහ ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට බලපෑම් කරමින් වාහන සඳහා ඉල්ලුමෙහි විශාල පහළ වැටීමත් ඇති කරන ලදී.

රජයේ මූල්‍ය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළෙඳ ද්‍රව්‍ය මිල


2016 ප්‍රවනතා

2016 දෙවන අර්ධයේදී ඉන්ධන මිල වැඩිවීමත් සමඟ වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් වැඩිවන මට්ටමක පැවතින. චීනයෙහි ශක්තිමත් යටිතල ආයෝජනවලින් සහ එක්සත් ජනපදයේ මූල්‍ය ප්‍රතිපත්තිය සැහැල්ලු කිරීමේ අපේක්ෂාවන් තුළින්, බැර ලෝහවල මිලද වසර තුළ ශක්තිමත් විය.

අපගේ ක්‍රමෝපායේ ගමන්මාර්ග

ගෝලීය මිල ප්‍රවනතාවන්ට සරිලන පරිදි වටිනාකම් තුළ ඇප ලෙස දරන ලද රත්‍රන් ඉහල ගිය බැවින් රන් මිල ගණන් ඉහළයාම සමාගමේ ණය කළඹ මත හිතකර බලපෑමත් තිබුණි.

ලෝක රන්මිල රන් රිදි මිනුම් ඒකකයකට



මූලාශ්‍රය : ලෝක රන් කවුන්සිලය

පුද්ගලික අංශයේ ණය වර්ධනය


2016 ප්‍රවනතා

ශ්‍රී ලංකා මහ බැංකු විසින් යොදාගනු ලැබූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වය හමුවේ වුවත්, පුද්ගලික අංශයේ ණය වර්ධනය වසර තුළ ශක්තිමත්ව පැවතින. ඒ අනුව, වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට දුන් ණය 2016 දී 21.9% වූ අතර, රජයේ ආර්ථික වර්ධනය හා උද්ධමන ඉලක්ක සමඟ සමාන කිරීම සඳහා 2017 තුළ මෙය ක්‍රමානුකූලව වෙනස් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

අපගේ ක්‍රමෝපායේ ගමන්මාර්ග

නව නිෂ්පාදන සහ වෙළෙඳපොල අංශ වෙත සමාගමේ ව්‍යාප්තිය මගින් වර්ධනය සඳහා විවිධ අවස්ථාවන් ලබා දීමට අපේක්ෂා කළද, පොළී අනුපාත අවස්ථා වැඩිවීමත් සමඟම ණය ඉල්ලුමෙහි අපේක්ෂිත පහත වැටීම මගින් සමාගමේ වර්ධන හැකියාව කෙරෙහි බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා කෙරේ.

පුද්ගලික අංශයේ ණය වර්ධනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ මෙහෙයුම් පරිසරය

බැංකු නොවන මූල්‍ය අංශයේ අංශයේ කාර්යසාධනය

2016 ප්‍රවනතා

- මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් 7%ක් පමණ ඇතුළත් වන ශාඛා 1,313ක ජාලයක් මෙහෙයවන LFCs 46 ක් සහ SLCs 7 කින් මෙම අංශය සමන්විත වේ.
- අංශයේ වත්කම් වර්ධනය 2015 දී 21.7%කින් ශක්තිමත් විය.
- කාලීන ණය, ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළත් සුරැකුම් ණය සහ වසර තුළ වර්ධනය අඩුකරන ලද කල්බදුවල සාධකමය වර්ධනය මගින් ඉදිරියට ගෙන ගිය කාලසීමාව තුළ ණය වර්ධනය 21.0%ක් විය.
- වත්කම්වල ගුණාත්මකභාවය 2016 දෙසැම්බර් අවසානයට 5.4%ක දළ අක්‍රීය ණය අනුපාතයක් සමඟ සාපේක්ෂව නොවෙනස්ව පැවතින.
- ස්කන්ධය මත ඉපයීම සහ වත්කම් මත ඉපයීම පිළිවෙලින් 23.0% සහ 4.0%ක් වාර්තා කරමින් වසර තුළ ලාභදායිත්වය යහපත් විය. කාලසීමාව තුළ මුළු ලාභය 2015 දී රු.බි. 31.5 දක්වා දෙගුණ විය.
- 2015 දෙසැම්බර් සමස්ත RWCAR 11.2% සිට 11.7% දක්වා වැඩිවීමත් සමඟ ලාභ උත්පාදනය මගින් සහය ඇතිව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව ශක්තිමත් විය.

	2016 රු.බි.	2015 රු.බි.	වාර්ෂික (%)
වත්කම්	1,211.9	995.8	22
ණය හා ලැබීම්	962.7	795.8	21
තැන්පතු	531.0	480.6	11
දළ අක්‍රීය ණය අනුපාතය (%)	5.3	5.7	-
ශුද්ධ අක්‍රීය ණය අනුපාත (%)	1.2	1.6	-
වත්කම් මත ඉපයීම ROA (%)	4.0	3.0	1
ස්කන්ධය මත ඉපයීම ROE (%)	23.1	12.4	11

නියාමන සංවර්ධනයන්

පහත සඳහන් නියාමන සංවර්ධන මගින් වසර තුළ සමූහයේ මෙහෙයුම් මත බලපෑමක් තිබුණි.

- 2015 සැප්තැම්බර්, රටතුළට වාහන ආනයන සීමා කරමින් මූල්‍ය ආයතනවල අවදානම් පැතිකඩ වැඩි කිරීමේ පරමාර්ථය ඇතිව මෝටර් වාහන කල්බදු පහසුකම්වල වටිනාකමට ණය අනුපාතය මත 70%ක උපරිමයක් ශ්‍රී ලංකා මහ බැංකු විසින් හඳුන්වා දෙන ලද අතර ඉන් මෑතකාලීන වසරවල ගෙවුම් ශේෂය මත සැලකිය යුතු බලපෑමක් තිබුණි.
- ආනයන තීරු බදුවලට විවිධ ප්‍රතිශෝධන සහ ගණනය කිරීමේ ක්‍රමවේද වසර තුළ වාහන මිලගණන්වල ඉහලයාමකට හේතු විය.

අපගේ ක්‍රමෝපායේ ගමන්මාර්ථ

ධාරිතාව මත සැලකිය යුතු බලපෑමක් සහිතව, ඉහත සාකච්ඡා කළ රෙගුලාසිමය සංවර්ධනවල ද්විත්ව බලපෑම සහිතව සමස්ථ කල්බදු කර්මාන්තය පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දුන්හ.


මෑත වසරවල කල්බදු සමූහයේ ණය කළඹ තුළ සැමට ඉහළින් පැවති අතර මෙම ආපදාවන් සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළ වර්ධන අවස්ථාවන් ඇතිකිරීම තුළින් අපගේ කළඹ තුළ විවිධාංගීකරණයක් කිරීමට අපව පොළඹවන ලදී.

ගනුදෙනුකාර මනාප

ගනුදෙනුකරුවන් මූල්‍ය ගනුදෙනුවල යෙදීම සඳහා පහසු සහ නම්‍යශීලී අවස්ථාවන් වැඩි වශයෙන් සොයමින් සිටින අතර, මූල්‍ය සේවාවන් හී ඩිජිටල් පරිනාමය තමන්ගේ ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය ආයතන සම්බන්ධවන ආකාරය වෙනස් කරමින් සිටී. ස්වයං-සේවා සහ ඩිජිටල් මාර්ග සඳහා මනාප වෙනස්වීම ගෙවීම් කාඩ්පත්, අන්තර්ජාල සහ ජංගම බැංකුකරණ භාවිතය අබණ්ඩව වැඩිවීම සහ ගනුදෙනුකාර සහභාගිත්වය සඳහා වේදිකාවක් ලෙස සමාජ ජාල භාවිතය වැඩිකිරීම මගින් පෙන්නුම් කෙරේ.

අපගේ ක්‍රමෝපායේ ගමන්මාර්ථ

විශේෂයෙන්, අපි තැන්පතු භාරගන්නා ආයතනයක් වන බැවින්, සමූහයේ ඩිජිටල් කොටස වැඩි කිරීමේ තීරණාත්මක වැදගත්කම අපි අවබෝධකර ගනිමු. 2017 ජූනි දියත් කිරීමට අපේක්ෂිත සමූහයේ නවීනතම හරයාත්මක බැංකුකරණ පද්ධතියෙන් පසුව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය තුළ ආයෝජනය සිදුකරමින් මංගත සහ ජංගම බැංකුකරණය දියත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ඒ අතරම, මෙම වාර්තාවේ පසු කොටස්වල සාකච්ඡා කරන පරිදි ගනුදෙනුකරුවන් සමඟ සමාජ ජාල සහභාගිත්වය අපි ශක්තිමත් කර ඇත.



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ පාර්ශවකරුවන් සමඟ සහභාගිත්වය

G4-24,G4-25,G4-26,G4-27

අපගේ සියලුම පාර්ශවකරුවන්ගේ දිගුකාලීන අවශ්‍යතා සපුරාලීමට අපගේ ක්‍රමෝපාය සැලසුම් කරන බැවින් පාර්ශවකරුවන් සක්‍රීයව හඳුනා ගැනීමේ අවශ්‍යතාව අපගේ ක්‍රමෝපාය සකස් කිරීමේ වැදගත් සංරචකයකි. අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ඉහළ මට්ටමක සහභාගිත්වයක් සහ අපගේ ක්‍රමෝපායික වැඩසටහන හැඩගැස්වීමට ලබාගත් ප්‍රතිචාර අපි පවත්වා ගන්නා අතර අපගේ ව්‍යාපාර මෙහෙයුම් මෙහෙයවන්නෙමු.

කුමන පාර්ශවකරුවන් සහභාගි කරගන්නේද යන්න තෝරමේදී, අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි ඔවුන්ට කළහැකි බලපෑම පිළිබඳ සහ අපගේ ක්‍රියාවන් තුළින් වඩාත් බලපෑමට ලක්වන පුද්ගලයින් පිළිබඳ නිසි සැලකිල්ල ලබා දෙමු. පහත දක්වන පරිදි අපගේ පාර්ශවකරුවන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාවලියක් අපි යොදා ගන්නෙමු.

	කොටස්හිමියන් සමූහයේ විශාලතම කොටස් හිමියා වන්නේ ලංකා බැංකුවයි.	**ගනුදෙනුකරුවන් දිවයින පුරා ගනුදෙනුකරුවන් 190,000කට අපි සේවය කරමු.**	**සේවකයින්/වෘත්තීය සමිති සමූහ පුද්ගලයන් 917ක මුළු දක්ෂතා සංචිතයක් සේවයේ යොදවයි.**
අපි ඔවුන් සමඟ කටයුතු කරන ආකාරය	• වාර්ෂික මහ සභා රැස්වීම • වාර්ෂික වාර්තාව • කාර්තුමය මූල්‍ය ප්‍රකාශන • ආයතනික වෙබ් අඩවිය (දැනට පවත්නා) • මාධ්‍ය නිවේදන හා පුවත්පත් • සාකච්ඡා (දැනට පවත්නා)	• සියලුම ගනුදෙනුකාර සේවා ස්ථානයන්හි දී මුහුණට මුහුණ සම්බන්ධතා (දැනට පවත්නා) • ගනුදෙනුකාර සමීක්ෂණ (අවශ්‍ය අවස්ථාවලදී) • පැමිණිලි නිරාකරණය (දැනට පවත්නා) • ගනුදෙනුකාර වැඩමුළු (දැනට පවත්නා • වාර්ෂික වාර්තා • ආයතනික වෙබ් අඩවිය (දැනට පවත්නා • විද්‍යුත් ලිපිනය (දැනට පවත්නා) • සමාජ ජාල (දැනට පවත්නා)	• කාර්යසාධන ඇගයීම් (වාර්ෂික) • මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහය (දැනට පවත්නා) • මාසික පදනමක් මත කාර්ය මණ්ඩල රැස්වීම් (මාසිකව) • වෘත්තීය සමිති රැස්වීම් (අවශ්‍ය විට) • සමාජයීය අවශ්‍යතා (දැනට පවත්නා) • MBSL අභ්‍යන්තර ජාලය (දැනට පවත්නා) • උපදෙස් හා චක්‍රලේඛ වැනි ලිඛිත සන්නිවේදනය (ඉදිරියට යන) • අවශ්‍ය විට මුහුණට මුහුණ සාකච්ඡා (ඉදිරියට යන) • මාධ්‍ය නිවේදන (දැනට පවත්නා) • ආයතනික වෙබ් අඩවිය (දැනට පවත්නා)
වසර තුළ මතු වූ ප්‍රධාන මාතෘකා සහ අදහස්	• පවරා ගන්නා අවදානමට සුදුසු ප්‍රමාණවත් ප්‍රතිඵල • ඉපයීම්වල තිරසාර වර්ධනය • ඵලදායී පාලනය සහ අවදානම් කළමනාකරණ වැඩපිළිවෙල • ව්‍යාපාර පුළුල්කිරීම • සන්නාම හඳුනාගැනීම • සදාචාර සහ සමාජයට වගකීම් සහගත ව්‍යවහාර	• තරඟකාරී මිලට මූල්‍ය විසඳුම් • අරමුදල්වල ආරක්ෂාව (විශේෂයෙන් තැන්පත්කරුවන්) • සුපිරි ගනුදෙනුකාර සේවා • පහසුව සහ ප්‍රවේශ හැකියාව • අඟය චිකතුකළ සේවා • මූල්‍ය දැනුම, අධ්‍යාපනය සහ උපදෙස් • අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව	• ආකර්ශනීය මූල්‍ය සහ මූල්‍ය නොවන • පියවර • සදාචාර සේවක ව්‍යවහාර • වෘත්තීය ප්‍රගතිය සඳහා අවස්ථා • පුහුණු සහ සංවර්ධනය • රැකියාවේ ආරක්ෂාව • රැකියා-ජීවිත තුලනය • අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව
අපගේ ප්‍රතිචාර / කළමණාකරණ ප්‍රවේශය	අපගේ ක්‍රමෝපාය, කාර්යසාධනය පිළිබඳ අබණ්ඩ නියාමනය සහ සක්‍රීය අවදානම් කළමනාකරණය ඉතා සුපරීක්ෂාකාරීව ක්‍රියාත්මක කිරීම තුළින් තිරසාර කොටස්හිමිකාර වටිනාකමක් ඇති කිරීමට අපි උත්සාහ ගනිමු. (පිටු අංක 122 සිට 131 දක්වා බලන්න)	අප හැකිතරම් කාර්යක්ෂමව සේවය කිරීම මගින් අපගේ ගනුදෙනුකරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීමට අපි අරමුණු කරමු. (පිටු අංක 52 සිට 56 දක්වා බලන්න)	අපගේ සේවකයින් වෙත අගනා ප්‍රතිඵල ලබාදෙන, ක්‍රියාශීලී සහ අභියෝගාත්මක පරිසරයක් අපි ලබා දෙන්නෙමු (පිටු අංක 46 සිට 52 දක්වා බලන්න)


ප්‍රමාණාත්මක ක්‍රමෝපායික රාමුව නිර්වචනය


G4-02, G4-19, G4-20, G4-21, G4-23

අපගේ පාර්ශවකරුවන්ට වඩාත් වැදගත්කමක් ඇති සාධක අපි සාකච්ඡා කරන බව සහතික කිරීම සඳහා මෙම වාර්තාවට ඇතුළත් කර ඇති අන්තර්ගතය ප්‍රමාණාත්මක විශ්ලේෂණය පිළිබඳ ක්‍රමානුකූල ක්‍රියාවලියකින් පසු තීරණය කරන ලදී. මෙම කරුණු ප්‍රමාණාත්මක කරුණු ලෙස නිර්වචනය කරනු ලබන අතර මෙම වාර්තාවේ 23 වැනි පිටුවේ විස්තර කරන පාර්ශවකාර සහභාගිත්ව ක්‍රියාවලිය තුළින් හඳුනාගත් වටිනාකම සහ පාර්ශවකාර සැලකිල්ල නිර්මාණය කිරීමට සමාගමේ හැකියාව මත සැලකිය යුතු බලපෑමක් ඇතිවිය හැකි අංගයන්ගෙන් සමන්විත වේ. ප්‍රමාණාත්මක කරුණු අපගේ ක්‍රමෝපාය සහ ව්‍යාපාරික කටයුතු තීරණය කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

මෙම වසර, අපගේ ක්ෂේත්‍රය සහ වටිනාකම් නිර්මාණය සඳහා සමාගමේ ප්‍රවේශයට විශේෂයෙන් අදාළ වන අංශ ඇතුළත් කිරීම සඳහා GRI විසින් නිර්දේශිත අංශයන්ගෙන් ඔබ්බට සොයා බලමින් අපගේ ප්‍රමාණාත්මක ඇගයීමේ විෂයපථය අපි පුළුල් කර ඇත. එමෙන්ම තෝරාගත් ප්‍රමාණාත්මක අංශ සහ අනුරූප GRI අංශ අතර සම්බන්ධතාවය සහ සබැඳුම් පැහැදිළිව අපි හඳුනාගෙන ඇත.

ප්‍රමාණාත්මක අංශ හඳුනා ගැනීම මඟින් ශක්තිමත් පාර්ශවකාර සහභාගිත්වය (පිටු අංක 23), අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය ඇගයීමක් (පිටු අංකය 18), සහ මෙහෙයුම් පරිසරය තුළ ඇතිවන ප්‍රවණතා (පිටු අංක 19) අනුගමනය කරයි. ඉන්පසුව, හඳුනාගත් අංශ පාර්ශවකරුවන්ට වැදගත්කම සහ බලපෑම්වල වැදගත්කම මත පදනම් වී ශ්‍රේණි ගත කෙරේ.







අංකය	ප්‍රමාණාත්මක අංශය	අදාළ GRI අංශය	අංශයේ සීමාව	වැදගත්කමේ වෙනස්වීම් (ඇත්නම්)
	ක්‍රමෝපායික අවධාන ක්ෂේත්‍ර වර්ධනය			
1	මූල්‍ය කාර්යසාධනය	ආර්ථික කාර්යසාධනය	අභ්‍යන්තර	-
2	වෙළෙඳ පොලට ලඟාවීම	වත්‍ර ආර්ථික බලපෑම්, නිෂ්පාදන කළඹ	බාහිර	
3	ක්‍රියාවලි කාර්යක්ෂමතාව	-	අභ්‍යන්තර	
	ක්‍රමෝපායික අවධාන ක්ෂේත්‍ර : ප්‍රශස්ථ ගනුදෙනුකාර සම්බන්ධතා			
4	සේවා ලබාදීම		අභ්‍යන්තර සහ බාහිර	-
5	කළඹ විවිධාංගීකරණය		අභ්‍යන්තර සහ බාහිර	▲
6	වගකීම් සහගත ණයදීම	නිෂ්පාදන ලේබල් කිරීම, අලෙවිකරණ සන්නිවේදනය අනුකූලතාව	අභ්‍යන්තර සහ බාහිර	-
7	ගනුදෙනුකාර රහස්‍යතාව	ගනුදෙනුකාර රහස්‍යතාව	අභ්‍යන්තර	-
	ක්‍රමෝපායික අවධාන ක්ෂේත්‍ර : විවිධ දක්ෂතාවන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් ගොඩ නැගීම			
8	පුහුණුව සහ සංවර්ධනය	පුහුණුව සහ සංවර්ධනය	අභ්‍යන්තර	▲
9	සේවක සහභාගිත්වය	-	අභ්‍යන්තර	-
10	කම්කරු ව්‍යවහාර	විවිධත්වය සහ සමාන අවස්ථා, සමාන පාරිශ්‍රමික, ශ්‍රම සහ යහපත් රැකියා, මැසිවිලි නිරාකරණය, කළමනාකරණ සබඳතා	අභ්‍යන්තර	-
11	සෞඛ්‍ය හා ආරක්ෂාව	වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව	අභ්‍යන්තර	-
	ක්‍රමෝපායික අවධාන ක්ෂේත්‍ර : පාලනය සහ අවදානම් කළමනාකරණය			
12	අවදානම් කළමනාකරණය	විගණනය	අභ්‍යන්තර	-
13	යහපාලනය ව්‍යවහාර	දූෂණ විරෝධය	අභ්‍යන්තර	-
14	අනුකූලතාව		අභ්‍යන්තර	-
	ක්‍රමෝපායික අවධාන ක්ෂේත්‍ර : තිරසාරත්වය සහ ආයතනික සමාජ වගකීම			
15	අපගේ පාරිසරික බලපෑම් අවම කිරීම	බලශක්තිය, අපද්‍රව්‍ය සහ අපවාහන, ජලය, ඉවත්කිරීම් සක්‍රීය අයිතිය	අභ්‍යන්තර සහ බාහිර	-
16	ප්‍රජා සහභාගිත්වය	-	බාහිර	-

ක්‍රමෝපායික වැඩපිළිවෙල

වසර සඳහා සමාගමේ ක්‍රමෝපාය පුළුල් පාර්ශවකාර සහභාගීත්වය සහ සමාගමේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය තුළ විශේෂ ශක්තීන් ඇගයීමෙන් පසුව සකස් කරන ලදී. වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අපගේ හැකියාවට බලපෑම් කළහැකි අවස්ථා සහ අවදානම් ඉදිරිපත් කරන මෙහෙයුම් වටපිටාව තුළ ඇතිවන ප්‍රවනතා මගින් ක්‍රමෝපාය දැනුවත් කරයි.




2016 දී සමාගමේ ක්‍රමෝපායික කටයුතු එහි 2015 ක්‍රමෝපායික වැඩසහනේ ඉදිරියට යාමක් වූ අතර, පහත පැහැදිලි කරන පරිදි ප්‍රධාන ස්ථර හතරක් මත කේන්ද්‍ර කෙරේ. අපගේ නිෂ්පාදන කළඹ පුළුල් කිරීම කෙරෙහි සහ නව වෙළෙඳ පොල අංශයන් තුළ වර්ධනය හඹායාම කෙරෙහි අවධානය යොමු කිරීමත් සමඟ වසර තුළ වර්ධනය ප්‍රධාන ප්‍රමුඛතාවක් විය. ගනුදෙනුකාර සහභාගීත්වය සහ ගනුදෙනුකරුවන් අතර වැඩි කිරීම සඳහා සමාගමට හැකිවන පරිදි අඛණ්ඩව ගනුදෙනුකාර සේවා කෙරෙහි සේවක අධ්‍යාපනය සහ දක්ෂතා ඔපනැංවීම තුළ ආයෝජනය තුළින් ප්‍රශස්ත ගනුදෙනුකාර සම්බන්ධතා පෝෂණය කරන ලදී. සේවකයින් අපගේ ක්‍රමෝපාය ඉදිරියට ගෙන යාමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. සැලකිය යුතු ආයෝජන ඉලක්කගත, දක්ෂතා ඉදිරියට ගෙන යන පුහුණු තුල සිදු කරනු ලැබූ අතර වෘත්තීය ප්‍රගතිය සහ අනුප්‍රාප්ත සැලැසුම් අපගේ ඉහලම දක්ෂයින් රඳවා තබා ගැනීමට සංශෝධනය කරන ලදී. වෙළෙඳ පොල තුළ අඩුවෙන් සේවා ලද අංශ සඳහා මුදල් ලබාදීම සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවගේ තිරසාර සංවර්ධනයට දායක වීම කෙරෙහි විශේෂ අවදානයක් සහිතව අපගේ ව්‍යාපාරයේ සෑම අංශයක් තුළම තිරසාරත්වය පිළිබඳ සැලකිලිමත් වීම ඇති කිරීමට අපි උත්සාහ ගනිමු. මෙම ක්‍රමෝපායික පරමාර්ථයන්ට අනුව සමාගමේ කාර්යසාධනය මෙම වාර්තාවේ පසු කොටස් තුළ සාකච්ඡා කරනු ලබයි.



තිරසාරත්වය කරා අපගේ ප්‍රවේශය

ගනුදෙනුකරුවන්, සේවකයින්, පාර්ශවකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, ජාතික ආර්ථිකය සහ අප ක්‍රියාත්මක ප්‍රජාවන් ඇතුළුව අපගේ පාර්ශවකරුවන්ට දිගුකාලීන වටිනාකමක් ඇති කරන ඒකාබද්ධ ආර්ථික, සමාජීය සහ පාරිසරික ව්‍යවහාරයන් මත තිරසාරත්වය කරා MBSL' ප්‍රවේශය පදනම් වේ. එමනිසාම, තිරසාරත්වය කරා සැලකිලිමත්වීම් අපගේ ක්‍රමෝපායික ක්‍රියාවලිය සහ ව්‍යාපාරික කටයුතු සඳහා වැදගත් යෙදවුමකි. <IR> වැඩපිළිවෙලේ මූලධර්ම අනුගමනය කිරීමේදී, වසර තුළ පාර්ශවකරුවන්ට අපගේ වටිනාකම් නිර්මාණය කිරීම පිළිබඳ විස්තර මෙම වාර්තාවේ පසු කොටස් තුළ විස්තරාත්මකව සාකච්ඡා කරනු ලබයි.




ක්‍රමෝපායික කාර්යසාධනය

ව්‍යාපාරික මාර්ග සමාලෝචනය

කල්බදු

සමූහයේ ණය කළඹ විවිධාංගීකරණය කිරීම කරා සමූහයේ ක්‍රමෝපායික අවධානය පිළිබිඹු කරමින්, සමූහයේ වීකාබද්ධ ඉපයීම්වලට කල්බදු දායකත්වය අබණ්ඩව පහල වැටුනද, සමූහයේ ප්‍රධාන ආදායම් උත්පාදක ලෙස තව දුරටත් කල්බදු පැවතිණ. MBSL දිස්ත්‍රික්ක 22ක් පුරා පැවැත්මක් සහිතව කල්බදුවල ක්ෂේත්‍රයේ පුරෝගාමියෙක් වන අතර ත්‍රී රෝද සහ අනිකුත් වාහන සඳහා පහසුකම් සැපයීමේ මූලික වශයෙන් නිරත වේ.

සමූහයට දායකත්වය



2016 වැදගත් සිදුවීම්

- වෙළෙඳපොළ තත්වයන්ට අභියෝග කිරීමේදී ශක්තිමත් හැඩගැස්ම පෙන්නුම් කිරීම
- අයකරගැනීමේ අවධානය, ශක්තිමත් වීකතු කිරීම් සහ කළඹේ යහපත් ගුණාත්මකභාවය මගින් ගෙනගිය 32%ක මෙහෙයුම් ලාභ තුළ වර්ධනය
- අපහායන අයකිරීම් 89%කින් පහත වැටීම
- දළ අක්‍රීය ණය අනුපාතය 2015 දී 9.81% සිට 7.07% දක්වා වර්ධනය වීම
- කළඹේ වර්ධනය 5%

සමූහය/සමාගම		2016	2015	වාර්ෂික %
ආදායම	රු. මි.	2,511.33	2,327.76	8
ශුද්ධ පොළී ආදායම	රු. මි.	1,230.60	1,260.78	(2)
අපහායන අයකිරීම්	රු. මි.	23.84	221.46	(89)
මෙහෙයුම් ලාභය	රු. මි.	508.06	385.23	32
වත්කම්	රු. මි.	14,991.75	14,235.40	5
වගකීම්	රු. මි.	12,843.26	4,840.39	165
දළ අක්‍රීය ණය අනුපාතය	%	7.07	9.81	(3)
පිරිවැයට අදායම් අනුපාතය		58	54	4
ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	අංකය	21,188	18,726	13
බස්නාහිර පළාතින් බැහැර කළඹ	%	67	68	(1)
සේවකයෙකුට මෙහෙයුම් ලාභය	රු. මි.	0.55	0.44	25

මෑතකාලීන ඉතිහාසය තුළ කල්බදු කර්මාන්තය වඩාත් අභියෝගාත්මක වසර කිහිපය වාර්තා කළ අතර එයට වටිනාකමට ණය අනුපාතය 70:30 ක්‍රියාත්මක කිරීම සහ ඒ අනුව වාහන මිල ගණන් වසර තුළ ඉහළයාම බලපාන ලදී. වාහන සඳහා ආනයන තීරු බදුවලට විවිධ සංශෝධන සහ ගණනය කිරීමේ ක්‍රමවේද වසර තුළ මගී වාහන මිල ගණන් තියුණු ලෙස ඉහල යාමකට හේතු විය. මෙහෙයුම් කොන්දේසි පොළී අනුපාත ඉහළ යාම මගින් තවදුරටත් අභියෝගයට ලක් වූ අතර එය ආන්තික සංකෝචනයකට මඟ පාදන ලදී.

ප්‍රධාන අභියෝග

- ආනයන තීරු බදු ප්‍රතිශෝධන හේතු කොට ගෙන වාහන මිල ගණන් තියුණු ලෙස ඉහළ යාම
- වටිනාකමට ණය අනුපාතය 70:30 වසර පුරාම ක්‍රියාත්මක වීම.
- පොළී අනුපාත ඉහළයාම


ක්‍රමෝපාය සහ කාර්යසාධනය

ඉහළ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළ MBSL හි කල්බදු ව්‍යාපාරය 2016 දී 32%ක මෙහෙයුම් ලාභ වර්ධනයක් අත්කර ගැනීම සඳහා ශක්තිමත්ව දරාසිටීම පෙන්නුම් කළේය. පොළී ආදායම් වර්ධනය කළඹ තුළ 5%ක පුළුල්වීම මගින් 8%ක මධ්‍යස්ථව පැවති අතර වසර තුළ අරමුදල් පිරිවැය තුළ නොනැවතී වැඩිවීම 2015 ට සාපේක්ෂව 2%කින් ශුද්ධ පොළී ආදායම හැකිලීමකට හේතු විය. එසේවුවත්, වසරේ ලාභදායිතාව කළඹ තුළ ගුණාත්මකභාවය කෙරෙහි ශක්තිමත් අවධානයක් මගින් දරාගනු ලැබූ අතර විය 2015 ට සාපේක්ෂව හානිකරණ අයකිරීම් තියුණු ලෙස පහත වැටීමට මඟ පාදන ලදී.


අහිතකර වෙළෙඳපොල තත්ත්වයන් නිසා කල්බදු පහසුකම් සඳහා ඉල්ලුම පහත වැටුණු බැවින්, MBSL සක්‍රීය නියාමනය තුළින් ආපසු ණය අයකරගැනීම් සහ එකතු කිරීම් ශක්තිමත් කිරීම කෙරෙහි ක්‍රමෝපායික අවධානය යොමු කරන ලදී. ශාඛාවල ඉලක්ක පදනම් එකතු කිරීමේ යාන්ත්‍රණ මෙන්ම ප්‍රධාන කාර්යාලයේ දැඩි නියාමනය වඩාත් ආක්‍රමණශීලීව එකතු කිරීම් ලුහු බැඳීමට ශාඛා සේවකයින් බලහත්කාරයෙන් යොමු කරවන ලදී. අනාගත අක්‍රීය ණය මුලින් හඳුනාගත හැකි වන විශ්ලේෂක එකතු කිරීම් සහතික කිරීම සඳහා විශේෂ පහසුකම් අනුව ඉදිරියට යාමට ශාඛාවන්ට ඉඩ දුන්හ. ණය ඇගයීම් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම තුළින් නව අක්‍රීය ණය ගලා ඒම අඩු කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, කල්බදු අංශයේ දළ අක්‍රීය ණය අනුපාතය 2015 දී පැවති 9.81% සිට 2016 දී 7.07% දක්වා පහත වැටුණ අතර වසර සඳහා අපහායන අයකිරීම් පෙර වසරේ රු.මිලියන 221.46ට සාපේක්ෂව රු. මිලියන 23.84ක් විය.

මූල්‍ය ප්‍රවේශය සහ සවිබලගැන්වීම් කරා දැඩි බැඳීමක් සහිත ආයතනයක් ලෙස, අපගේ කල්බදු ලබාදීමේ බහුතරය බස්නාහිර පළාතෙන් බැහැරව සිදුකිරීම තවදුරටත් සිදු කරයි. බස්නාහිර පළාතෙන් බැහැරව ශාඛා 29 කට වැඩි ජාලයක් සහිතව, MBSL කල්බදු කළඹෙන් 67%ක් බාහිර ස්ථානවලින් හටගනී. මේ අතර, ත්‍රී රෝද කල්බදු ප්‍රවේශ මට්ටමේ නිෂ්පාදනයක් ලෙස සලකනු ලබන අතර අනෝන්‍ය අපේක්ෂාවෙන් ස්ථාවර ආදායම් මූලාශ්‍රයක් ලබාදීම තුළින් අඩු ආදායම් පවුල්වල සමාජ ආර්ථික ප්‍රගතියට විය ඵලදායීව පහසුකම් ලබා දේ. ත්‍රී රෝද කල්බදු සමාගමේ මුළු කල්බදු කළඹින් 16% ක් පමණ අඩංගු වූ අතර අපගේ ආකර්ශනීය ත්‍රී රෝද කල්බදු කොටස තුළින්, දිවයින පුරා දිස්ත්‍රික්ක 22 ක් තුළ පුද්ගලයින් 3,172කට වැඩි සංඛ්‍යාවකට සෘජුව සවිබලගන්වා සහය ලබා දී ඇත.


ලාභදායිත්වයට අනුව පොළී ආදායම



ණය කළඹේ ගුණාත්මකභාවය තුළ ප්‍රවනතා



කළඹ විස්තර කිරීම



ව්‍යාපාරික මාර්ග සමාලෝචනය


ඉදිරි ගමන්මඟ

කල්බදු කර්මාන්තය තුළ පවත්නා අභියෝග අපගේ කළඹ විවිධාංගීකරණය කිරීමට සහ අනෙකුත් ණය කළඹ තුළ වර්ධනය හඹායාමට උත්සාහ කිරීමට අපව පොළඹවා ඇත. එකී කල්බදු සමූහයේ මූලික නිෂ්පාදනයන්ගෙන් එකක් ලෙස තවදුරටත් පැවති අතර මධ්‍යම කාලයේ සිට දිගු කාලය දක්වා භාවිතා නොකල භූගෝලීය ප්‍රදේශයන් සහ නව වෙළෙඳපොල අංශ තුළ කළඹේ වර්ධනය ඉදිරියට ගෙන යන්නෙමු. යහපත් කළඹක් පවත්වා ගැනීම කෙරෙහි අඛණ්ඩ අවධානය මඟින් ව්‍යාපාර මාර්ගවල ලාභදායීතාවට සහයවීම අපේක්ෂා කරන අතර 2017 මැද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නවීනතම හරයාත්මක බැංකුකරණ පද්ධතිය මඟින් කළඹ කළමනාකරණය සහ නියාමනය තුළ සැලකිය යුතු වර්ධනයන්ට පහසුකම් ලබා දෙනු ඇත.

ආයතනික සහ පාරිභෝගික ණය

2016 දී සමූහයේ වේගයෙන් වර්ධනය වන අංශය වන ආයතනික සහ පාරිභෝගික ණය පුද්ගලික ණය, කාලීන ණය සහ පුද්ගලයින්ට ලබාදුන් වට්ටම්කළ බිල්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආයතනවලින් සමන්විත වේ. මෙම ව්‍යාපාර මාර්ග හරහා, සමූහය රන් ණය සහ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දේ. වසර තුළ කල්බදු කර්මාන්තය තුළ අභියෝග සමූහයේ කළඹ විවිධාංගීකරණය දැඩි කිරීමට පෙළඹ වූ අතර එය ආයතනික සහ පාරිභෝගික ණය මුළු අත්තිකාරම්වල 6%ක වැඩිවීමක් සඳහා හේතු වී ඇත.

සමූහයට දායකත්වය



සමූහය/සමාගම		2016	2015	වාර්ෂික%
ආදායම	රු. මි.	1,876.35	1,437.75	31
ශුද්ධ පොළී ආදායම	රු. මි.	955.30	803.86	19
අපහායන අයකිරීම්	රු. මි.	0.40	235.85	(100)
මෙහෙයුම් ලාභය	රු. මි.	430.99	106.83	303
වත්කම්	රු. මි.	12,156.04	8,863.00	37
වගකීම්	රු. මි.	10,413.94	2,871.04	263
දළ අක්‍රිය ණය අනුපාතය	%	17.42	24.95	(8)
පිරිවැයට අදායම්	%	55	58	(3)
ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	අංකය	48,159	32,097	50
බස්නාහිර පළාතින් බැහැර කළඹ	%	40	38	2
සේවකයෙකුට මෙහෙයුම් ලාභය	රු. මි.	0.47	0.12	292

2016 වැදගත් සිදුවීම්

- නව නිෂ්පාදන සංවර්ධනය හා උසස් මට්ටමේ ගනුදෙනුකාර සහභාගීත්වය මඟින් කළඹ 33%කින් වර්ධනය වීම
- කළඹ වල ඵලදායී විවිධාංගීකරණය
- ගුණාත්මකභාවය පවත්වා ගැනීම කෙරෙහි අඛණ්ඩ අවධානය හානිකරණ අයකිරීම්වල දැඩි අඩුකිරීමට හේතු වීම
- මෙහෙයුම් ලාභය රු.මිලියන 430.99 දක්වා 30.3%කින් වැඩිවීම

මෙහෙයුම් පරිසරය

මූල්‍ය ප්‍රතිපත්ති කොන්දේසි දැඩි කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පොළී අනුපාත වැඩිවීමට ප්‍රතිචාරාත්මකව වේගය අඩුවීමට පෙර ආයතනික සහ පාරිභෝගික ණය සඳහා ඉල්ලුම වසරේ බොහෝ කාලයක් ශක්තිමත්ව පැවතින. වසරේ අවසාන කොටසේදී අරමුදල් පිරිවැය ඉහළයාම කර්මාන්තය අතර ආන්තික හැකිලීමකට හේතු වුවද, බැංකු නොවන මූල්‍ය ආයතන (NBFI) අංශය සුළු හා මධ්‍ය පරිමාණ අංශය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශයන්ගෙන් ණය සඳහා වර්ධිත ඉල්ලුමක් දැකගත හැකි විය.


ප්‍රධාන අභියෝග

- පොළී අනුපාත ඉහලයාම සහ ඒ අනුව ආන්තික හැකිලීම
- වසරේ අවසාන කොටසේදී ණය ඉල්ලුමෙහි අඩුවීම

ක්‍රමෝපාය සහ කාර්යසාධනය

මුළු වත්කම් සහ පොළී ආදායම පිළිවෙලින් 37%කින් සහ 31%කින් වර්ධනයක් සමඟ ආයතනික සහ පාරිභෝගික ණය අංශය වසර තුළ ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. නව නිෂ්පාදන සංවර්ධනය තුළින් ඉහල ආදායම් උපයන වෙළෙඳපොල අංශවල වර්ධනයේ ක්‍රමෝපායික ලුහුබැඳීම සමස්ත ලාභදායීත්වය දරාගනිමින් එහි ශුද්ධ පොළී ආන්තික පුළුල් කිරීමට අංශයට හැකියාව ඇති කරන ලදී. එකතු කිරීම ශක්තිමත් කිරීම සහ අයකර ගැනීම් වර්ධනය කෙරෙහි සමූහයේ අවධානය යොමු කිරීම අංශයේ අපහායන අයකිරීම පෙර වසරේ පැවති රු. මිලියන 235.85 සිට රු. මිලියන 0.40 දක්වා අඩු කිරීමට හේතු විය. ඒ අනුව, අංශයේ මෙහෙයුම් ලාභය පෙර වසරට සාපේක්ෂව තුන් ගුණයකට වඩා වැනම් පෙර වසරේ පැවති රු. මිලියන 106.83 සිට රු. මිලියන 430.99 ක් වාර්තා කිරීමට හැකිවිය.


ලාභදායීත්වයට අනුව පොළී ආදායම



කළඹේ ගුණාත්මකභාවය තුළ සැලකිය යුතු වර්ධනයන්

ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය සහ ප්‍රතිරක්ෂණ නිර්ණායක කෙරෙහි පවත්නා අවධානය පිළිබිඹු කරමින්, කළඹේ ගුණාත්මකභාවය තුළ ආයතනික සහ පාරිභෝගික ණය කළඹ සැලකිය යුතු වර්ධනයන් අත්පත් කර ගත්හ. අංශයේ අපහායන අයකිරීම් පෙර වසරේ රු. මිලියන 235.85 සිට රු. මිලියන 0.40 දක්වා අඩුවිය. මේ අතර, එහි දළ අක්‍රීය ණය අනුපාතයද 2015 දී පැවති 24.95% සිට 17.42% දක්වා පහත වැටිණි. සක්‍රීය පරීක්ෂාව සහ ශක්තිමත් ආපසු අයකර ගැනීමේ උත්සාහයන් වසර තුළ විශාල ණය කිහිපයක් ආපසු අයකර ගැනීමට හේතු වූ බැවින් අංශයේ පූර්ණ දළ අක්‍රීය ණය 8%කින් අඩුකිරීමට හේතු විය. ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය ණය කළමනාකරණ දක්ෂතා පිළිබඳ අවධානය යොමු කළ පුහුණු, පූර්ව නීති සම්බාධක කඩිනම් කිරීම සහ ගනුදෙනුකරුවන් ආපසු ගෙවීමේ නම්‍යශීලි නියමයන් පිරිනැමීම තුළ සහභාගි කිරීම තුළින් ශක්තිමත් කරන ලදී. මේ අතර, මධ්‍යම අයකිරීමේ ඒකකය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලි විධිමත් කිරීම සහ ප්‍රමිතිගත කිරීමේදී ශාඛා සමඟ සහභාගිත්වය සහ සම්බන්ධීකරණය වැඩි කරන ලදී. බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස, සමූහයද ණය ආපසු අයකිරීමේ විධිවිධානවල සාරාංශ ක්‍රියාපටිපාටි යටතේ ආපසු අයකර ගැනීම් ලුහු බැඳීම සඳහා එහි හැකියාවෙන් ප්‍රතිලාභ ලබන ලදී.

කළඹේ ගුණාත්මකභාවය



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය (SME)

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීම කරා ජාතික ප්‍රතිපත්ති ප්‍රගමක ලබාදෙමින් මෙම අංශය සමාගමට ප්‍රධාන වර්ධන ක්ෂේත්‍රයක් වේ. වෙළෙඳ අංශය ඉලක්ක කරමින් නව නිෂ්පාදන සාර්ථකව දියත් කිරීම මගින් සමාගමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කළඹ 2016 දී රු. මිලියන 262.47 දක්වා වර්ධනය විය. ක්ෂණික ව්‍යාපාරික ණය මගින් වෙළෙන්දුන්ට ඇප නොමැතිව ඵලදායීව සහ කාර්යක්ෂමව කෙටි කාලීන පහසුකම් ලබා ගැනීමට හැකිවිය. දෛනිකව එකතු කිරීම සහ ගනුදෙනුකරුවන් සමඟ සක්‍රීය සහභාගිත්වය මගින් සාපේක්ෂව මෙම ඉහළ ආදායම් උපයන නිෂ්පාදන අංශය තුළ යහපත් ගුණාත්මක කළඹක් පවත්වා ගැනීමට සමාගමට හැකි වී ඇත. මෙම නිෂ්පාදනයේ පහසුව සහ නම්‍යතාව වෙළෙන්දන් අතර ජනප්‍රිය පිරිනැමීමක් බවට පත්ව ඇත.

රන් ණය

වසර තුළ සමාගම රන් ණය ආක්‍රමණශීලීව ව්‍යාප්ත කිරීමට අඛණ්ඩව කටයුතු කළ අතර කළඹ රු. මිලියන 499.86 දක්වා 154% කට වැඩියෙන් වැඩි වී ඇත. රටෙහි උතුරු කලාපය තුළ ශක්තිමත් පැවැත්මක් සහිතව දිවයින පුරා ශාඛා 34ක් තුළින් දැනට උකස් අත්තිකාරම් කටයුතු සිදු කරයි. රන් ණය තුළ පූර්ව පළපුරුද්ද සහ හැකියාවන් සහිත පුද්ගලයින් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, එය උකස් කරනු ලබන නිෂ්පාදන අනුල්ලංඝනීය තක්සේරු කිරීමකට හේතු විය. මෙය කළඹ වැඩිවීමේදී අවදානම සහ ආපසු ලැබීමේ ගතිකතාවන් අතර යෝග්‍ය සමබරතාවක් ඇති කරයි. කළඹ තුළ පැහැර හැරීම් 1%ට වඩා අඩු මට්ටමක පැවති අතර එයට අනුල්ලංඝනීය තක්සේරු කිරීම් සහ එකතු කිරීමේ යාන්ත්‍රණ සහය විය.

ව්‍යාපාරික මාර්ග සමාලෝචනය



ක්ෂුද්‍ර මූල්‍ය

සමාගම එහි මූල්‍ය අන්තර්ගහන පරමාර්ථ සහ ග්‍රාමීය ආංශ සවිබලගැන්වීමට ගැලපෙන පරිදි 2010 දී එහි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන වන සියත් සවිය ආරම්භ කරන ලදී. මෙම නිෂ්පාදන මාර්ගය තුළින්, සමාගම ණය ඉතිහාසය සහ ප්‍රමාණවත් ලියවිලි නොමැතිවීම හේතුවෙන් විධිමත් මූල්‍යකරණයට නියමානුකූලව ප්‍රවේශය අහිමි පුද්ගලයින්ට ව්‍යාපාර අරමුණු සඳහා කෙටි කාලීන ණය පහසුකම් ලබාදේ. MBSL ණය පහසුකම ආපසු ගෙවීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වගකියන පර්ෂදයක් තුළ ණයගන්නන් තුළින් පර්ෂද පදනම් ණයදීමක යෙදී සිටී. ආරම්භයේ සිට, සමාගම ව්‍යවසායකයින්ට ඔවුන්ගේ සමාජ, ආර්ථික ප්‍රගතිය කරා සෘජුවම දායක වෙමින් දිස්ත්‍රික්ක 22 ක ආසන්න වශයෙන් 25,000කට පමණ සහය ලබා දී ඇත. මූල්‍ය සහයට අමතරව, ඉදිරියට යන පදනමක් මත පවත්වනු ලබන ව්‍යුහගත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් මූල්‍ය විනය සහ ව්‍යාපාරික දක්ෂතා පෝෂණය කිරීමටද අපි උත්සාහ ගනිමු. (වැඩිදුර විස්තර සඳහා පිටු අංක 50 සහ 51 බලන්න). වසර තුළදී, උතුරු, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වලින් ඇතිකළ ශක්තිමක් වර්ධනය සමඟ ශාඛා ප්‍රවේශය හරහා මෙම කළඹ ආක්‍රමණශීලීව පුළුල් කරමින් අපි ඉදිරියට ගෙන ගියෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ කළඹ 59%කින් රු. මිලියන 993.19 දක්වා වැඩිවිය.

ඉදිරි ගමන්මඟ

මෙම අංශය තුළ ඇතිවන අවස්ථා ග්‍රහනය කර ගැනීමට හැකියාව ඇති කරමින් සමූහයේ විවිධාංගීකරණ ක්‍රමෝපායට අනුව යමින් ආයතනික සහ පාරිභෝගික ණය කළඹ වර්ධනය කිරීම කෙරෙහි අපි තවදුරටත් අවධානය යොමු කරන්නෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, වඩාත් සමබර වූ සහ ස්ථාවර කළඹක් අපි අත්කර ගෙන ඇති බැවින් මුළු කළඹට මෙම අංශයේ දායකත්වය කෙටි කාලීන සිට මාධ්‍ය කාලීන දක්වා ක්‍රමයෙන් වැඩි කිරීමට අපේක්ෂා කරයි. ණයවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම මූලික අවධානයක් වන අතර අපි අඛණ්ඩව ව්‍යුහය පිරිසිදු කරමින් සංවිධානය තුළ ශක්තිමත් අයකරගැනීම සහ එකතු කිරීම පෝෂණය කිරීම සඳහා ක්‍රියාවලිය ක්‍රමවත් කරන්නෙමු.

ආයතනික උපදේශනය සහ ප්‍රාග්ධන වෙළෙඳපොල

මෙම අංශය උපදේශන සහ ප්‍රාග්ධන වෙළෙඳපොලට අදාළව සේවාවන්හී පුළුල් පරාසයක් පිරිනමන අතර එයට කළඹ කළමනාකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොලට අදාළව සේවාවන්හී විධිවිධාන (ස්කන්ධ ව්‍යුහගත කිරීම සහ කළමනාකරණය, ණය ගැනීම් සහ පුද්ගලික ස්ථාපනයන් වැනි), සහ ආයතනික උපදේශන සේවා ඇතුළත්ය. අහිතකර ස්කන්ධ වෙළෙඳපොල තත්ත්වයන් මැතකාලීන වසරවල අංශයේ කාර්යසාධනයට අඛණ්ඩව අහිතකර ලෙස බලපා ඇත.

2016 වැදගත් සිදුවීම්

- වසර තුළ 9%කින් ASI පහත වැටීමත් සමඟ කොටස් වෙළෙඳපොල තුළ කොන්දේසි මැඩ පැවැත්වීම.
- ආයෝජන කළඹ මත වෙළෙඳපොල අලාභ සලකුණු කිරීම හේතු කොට ගෙන මෙහෙයුම් අලාභ වැඩිවීම

සමූහය/ සමාගම		2016	2015 %	වාර්ෂික
ආදායම	මි.	18.47	17.52	5
ශුද්ධ පොළි ආදායම	මි.	(30.74)	(35.44)	13
අනෙකුත් ආදායම	මි.	(21.84)	(6.77)	(223)
මෙහෙයුම් ලාභය	මි.	(142.18)	(86.08)	(65)
වත්කම්	මි.	372.90	750.14	(50)
වගකීම්	මි.	319.46	238.44	34
ගනුදෙනුකරුවන් සංඛ්‍යාව (ආන්තික වෙළෙඳාම)	අංකය	66	53	25

කොළඹ කොටස් හුවමාරුවේ කාර්යසාධනය, පාලනය වූ ආයෝජක අභිප්‍රායන් සහ එක්සත් ජනපදයේ ඉහළ පොළි අනුපාත අපේක්ෂාවෙන් විදේශීය අරමුදල් පිටතට ගලායාම විසින් තවදුරටත් බලපෑමට ලක් විය. මේ අතර, වසරේ දෙවන අර්ධය තුළ ශ්‍රී ලංකාවේ පොළි අනුපාත ඉහළයාම මගින් ආයෝජකයින්ට වඩාත් ආකර්ශනීය ස්ථීර ආදායම් සුරැකුම්පත්වලට විතැන්වීමකට හේතු විය.

ඒ අනුව, සමස්ත කොටස් මිල දර්ශකය වසර තුළ 9%කින් පහත වැටුන අතර දෛනික සාමාන්‍ය පිරිවැටුමද 30%කින් පහත වැටුණි. මෙය වසර තුළ වෙළෙඳපොල තත්ත්වයන් ආරම්භක පොදු පිරිනැමීම් සඳහා අහිතකර විය.

ප්‍රධාන අභියෝග

කොටස් වෙළෙඳ පොල පහත වැටීම

පොළී අනුපාත ක්‍රියාදාම ඉහළයාම

කාර්යසාධනය

පැහැදිළිවීම, වසර තුළ අංශයේ කාර්සාධනයට අහිතකර වෙළෙඳ පොල තත්ත්වයන් බලපෑම් කරනු ලැබූ අතර, 2016 දී සමූහයේ කොටස් කළඹ මත වෙළෙඳපොල අලාභයන් රු. මිලියන 58.23ක් විය. පොළී ආදායම තුළ 5%ක මධ්‍යස්ථ වර්ධනයක් හමුවේ වුවද, ඉහලයන පොළී අනුපාත ක්‍රියාදාමය රු. මිලියන 30.74ක ශුද්ධ පොළී අලාභයක් ඇති කරමින් පොළී ආදායම අංශයේ ආදායම ඉක්මවීමත් සමඟ සමූහයේ ආන්තික වෙළෙඳාම් ව්‍යාපාරයට බලපාන ලදී. ඒ අනුවම, අංශයේ මෙහෙයුම් අලාභ පෙර වසරේ පැවති රු. මිලියන 86.08 සිට රු. මිලියන 142.18 දක්වා පුළුල් විය.

ඉදිරි ගමන්මඟ

උපකාරී නොවූ වෙළෙඳපොල තත්වයන් MBSL ට එහි ආයතනික උපදේශන සහ ප්‍රාග්ධන වෙළෙඳපොල අංශය දෙස නැවත සොයා බැලීමට සහ සමූහයේ අනාගත ක්‍රමෝපායික උපදෙස් තීරණය කිරීමට පෙළඹවීම් සිදු කර ඇත. රටෙහි කොටස් වෙළෙඳපොලේ දිගටම පැවති පරිහානියත් සමඟ, මෙම අංශයේ මෙහෙයුම් මගින් ආපසු අයකර ගැනීම් නතර කිරීමට ක්ෂණිකවම අපේක්ෂා නොකළ අතර සමූහයේ ආයෝජන කළඹ නැවත තුළනය කිරීම මගින් අලාභ අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.


ආර්ථික අගය එකතුකිරීම - සමාගම

	2016 රු.මි.	2015 රු.මි. *නැවත සඳහන්
දළ එකතුකළ අගය		
මුළු ආදායම	4,888	4,217
බොල් ණය සහ ආයෝජන සඳහා වෙන්කිරීම	(3,738)	(2,914)
බොල් ණය සහ ආයෝජන සඳහා වෙන්කිරීම	(24)	(462)
	1,126	841
වෙන් කළ අගය		
සේවකයින්ට ගෙවීම්	782	671
රජයේ බදු	266	100
ක්ෂයකිරීම්	78	70
	1,126	841

ආදායම් මූලාශ්‍ර සහ භාවිතය

	2016 රු. මි.	2015 රු. මි. නැවත සඳහන්
ආදායම් මූලාශ්‍ර		
පොළී ආදායම	4,738	4,073
ගාස්තු හා කොමිස් ආදායම	41	43
ලාභාංශ ආදායම	13	17
වෙනත් ආදායම්	96	84
	4,888	4,217
ආදායම් භාවිතය		
ණයකරුවන්ට ගෙවීම්	2,710	2,133
සේවකයින්ට ගෙවීම්	782	671
සහය සේවා	1,028	781
ක්ෂයකිරීම් හා ක්‍රමක්ෂය	78	70
ණය හා අනෙකුත් අලාභ සඳහා අපහායන අයකිරීම්	24	462
රජයේ බදු	266	100
	4,888	4,217

අගය වෙන්කිරීම





විවිධාංගීකරණය කළ නිෂ්පාදන හා සේවා රාශියක් සමඟ ඒකාබද්ධ ආයතනකයක් ලෙස වෙළෙඳපොල තුළ අපගේ පැවැත්ම ශක්තිමත් කිරීම

අපගේ වටිනාකම් පරිනාම ක්‍රියාවලිය පිළිබඳ සමබර සාකල්‍ය තක්සේරුවක් ලබාදෙමින්, සමාලෝචිත වසර තුළ අපගේ ප්‍රාග්ධන යෙදවුම්වලට අපි අගය එකතු කරන ආකාරය පෙන්වා දීමට වෙළෙඳපොල අංශය සැලකිලිමත් අයුරින් ව්‍යූහගත කර ඇත.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ස්වභාවික ප්‍රාග්ධනය

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය

සමූහය ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව වසර තුනක ඒකාබද්ධ අලාභයෙන් පසුව 2016 නැවතත් සාර්ථකව ලාභ උත්පාදනය කරා ආපසු පැමිණ ඇත. වසර තුළ කාර්යසාධනය ණය කළඹ, ණය සහ අත්තිකාරම් විවිධාංගීකරණය, ඵලදායී පිරිවැය කළමනාකරණය සහ ණය ගුණාත්මකභාවය තුළ සැලකිය යුතු වර්ධනයන්හි යහපත් වර්ධනය මගින් නැවත තහවුරු කර ඇත. මෙවැනි සාධක සමූහයට 2015 දී රු. මිලියන 3.28ක ශුද්ධ ලාභයට සාපේක්ෂව රු. මිලියන 81.14ක ශුද්ධ ලාභයක් වාර්තා කිරීමට හේතු විය.

සමූහය

රු. මී	2016	2015	වාර්ෂික %
යෙදවුම්			
කොටස්හිමි අරමුදල	3,146.56	3,054.78	3
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	18,518.42	15,846.31	17
වෙනත් ණය	8,722.79	7,883.32	11


වටිනාකම් නිර්මාණය කිරීමේ කටයුතු

- රු. මිලියන 3,395.69ක ණය ලබාදීම
- රු. මිලියන 2,465.62ක නව තැන්පතු උත්පාදනය
- කළඹ විවිධාංගීකරණය කෙරෙහි අවධානය සහ ඉහළ ආදායම් උපයන අංශ ආක්‍රමණය
- ණයවල ගුණාත්මකභාවය සහ ආපසු අයකරගැනීම් කෙරෙහි දැඩි අවධානය

සමූහය

රු. මී	2016	2015	වාර්ෂික %
නිමවුම්			
ශුද්ධ පොළී ආදායම	2,142.45	2,029.71	6
බදු පසු ලාභය	81.14	3.28	2,374
කොටසක ඉපයීම (රු)	0.71	0.13	446

මූල්‍ය ප්‍රාග්ධනය




වෙනත් ආදායම්

වෙනත් ආදායම් තුළ මූලිකවම ගාස්තු සහ කොමිස් ආදායම, වෙළෙඳ ආදායම සහ රක්ෂණ වාරික හා ගාස්තු සහ කොමිස් ආදායම සමන්විත වේ. වසර තුළ ගාස්තු සහ කොමිස් ආදායම රු. මිලියන 97.76 සිට රු. මිලියන 35.02 දක්වා පහත වැටුන අතර එයට ප්‍රධාන වශයෙන් MBSL රක්ෂණ සමාගමේ ප්‍රතිරක්ෂණ කොමිස් ආදායමෙහි අඩුවීම හේතු විය. ඒ අතරම, සමූහයේ ආයෝජන කළඹ මත වෙළෙඳපොල අලාභ පිළිබිඹු කරමින්, වසර සඳහා ශුද්ධ වෙළෙඳ අලාභ රු. මිලියන 58.23ක් (2015 දී රු. මිලියන 55.34) වූ අතර මෙයට ස්කන්ධ වෙළෙඳපොල තුළ කල්පවත්නා පරිහානිය මගින් අහිතකරව බලපාන ලදී.

ණය හා අත්තිකාරම් මත හානිකරණය

ණයවල ගුණාත්මකභාවය



සමූහයට එහි අපහායන අයකිරීම් දැඩි ලෙස අඩු කර ගැනීම හේතු වූ එහි ණයවල ගුණාත්මකභාවයෙහි සැලකිය යුතු වර්ධනයන් වසර තුළ ලාභ වර්ධනයට ප්‍රධාන වශයෙන් සහය විය. ඒ අනුව, කල්බදු සහ ආයතනික සහ පාරිභෝගික ණය යන කළඹ දෙකෙන්ම ඇති වූ රු. මිලියන 462.15ට සාපේක්ෂව වසරේ අපහායනය රු.මිලියන 24.24ක් විය. පිටු අංක 28 සිට 33 දක්වා ව්‍යාපාර මාර්ග සමාලෝචනවල විස්තර කර ඇති පරිදි, විකතු කිරීමේ හා නියාමන ක්‍රියාපටිපාටි සහ ණය තක්සේරු කිරීම සහ කළමනාකරණය පිළිබඳ දැනට කරගෙන යන පුහුණු විධිමත් කරමින් ආපසු අයකර ගැනීම් සම්බන්ධයෙන් ශක්තිමත් අවධානය වසර තුළ ණයවල ගුණාත්මකභාවයෙහි වර්ධනයට හේතු විය.


පිරිවැය කළමනාකරණය

සමූහයේ අවධානය සේවක ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි යොමු කරනු ලැබූ බැවින් වසර තුළ පොදු කාර්ය පිරිවැයෙහි වැඩිවීම් 5%ක් ඇතුළත් විය. පොදු කාර්ය පිරිවැයෙහි තනි විශාලතම සංරචකය වන කාර්ය මණ්ඩල වියදම් වසර තුළ 16% කින් වැඩි වූ අතර මින් කණ්ඩායමට නව දක්ෂයින් එකතු කර ගැනීම සහ ක්ෂේත්‍රයේ ඉහළම දක්ෂයින් ආකර්ශණය කර රඳවා තබා ගැනීම සඳහා සමූහයේ හැකියාව වැඩි කිරීමට අපේක්ෂිත වැටුප් ව්‍යුහ සංශෝධනය කිරීම් පිළිබිඹු කරයි. මේ සමඟම, අනෙකුත් වියදම් (විශ්‍රාම ප්‍රතිලාභ, ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂය සහ අනෙකුත් මෙහෙයුම් වියදම් ඇතුළුව) වසර තුළ 3% කින් පහත වැටුණි. වසර තුළ වැඩිවූ සමූහයේ සමස්ත පිරිවැයට අදායම් අනුපාතය පෙර වසරේ පැවති 60% සිට 62% දක්වා ඉහල වැටුණි. සමාගම මට්ටමේදී, පිරිවැයට අදායම් අනුපාතය වසර තුළ 13%කින් මුළු මෙහෙයුම් වියදම් වැඩි වූ බැවින් පෙර වසරේ 67%ට සාපේක්ෂව 72% වාර්තා කළේය.

ලාභදායිතාව

සමූහයේ බදු පෙර ලාභය, ඉහළ අංශයේ යහපත් වර්ධනය, ණයවල ගුණාත්මකභාවයෙහි මෙන්ම පිරිවැය කාර්යක්ෂමතාවන් හි සැලකිය යුතු සහ පවත්වා ගනු ලැබූ වර්ධන මගින් නැවත තහවුරු කරමින් වසර තුළ ආසන්න වශයෙන් තෙගුණයකින් ඉහළ ගියේය. වර්තන ආදායම් බදු වියදමද රජයට සමූහයේ වර්ධිත වටිනාකම් එකතු කිරීම පිළිබිඹු කරමින් රු. මිලියන 74.25 දක්වා 79%කින් වැඩි වී ඇත. ඒකාබද්ධ කිරීමෙන් පසු සම්පූර්ණ දෙවන මූල්‍ය වර්ෂය වන 2016 දී රු. මිලියන 81.14ක ලාභයක් උත්පාදනය කිරීමට සමූහයට හැකි වූ අතර, වෙන් වෙන්ව පැවති විවිධ ආයතන තුනක් ඒකාබද්ධ කිරීම හා බැඳුණු සංකීර්ණතා සහ අභියෝග හමුවේ මෙය ප්‍රශංසනීය ජයග්‍රහනයකි. සමාගමද පෙර වසරේ රු. මිලියන 78.31ක ශුද්ධ අලාභයක සිට රු. මිලියන 85.62 දක්වා ශුද්ධ ලාභය වැඩිකර ගැනීමත් සමඟ වසර තුළ නැවත ලාභදායිත්වය කරා පැමිණ ඇත. මෙම ලාභදායිතාව හේතු කොට ගෙන මෙම වසර තුළ ශුද්ධ වත්කම් මත සමූහයේ ඉපයීම් පුළුල් වී ඇත.

ශුද්ධ ලාභය




ශේෂ පත්‍ර විශ්ලේෂණ

වත්කම් වර්ධනය

සමූහයේ මුළු වත්කම් 2016 දෙසැම්බර් අවසානය වන විට රු. මිලියන 33.64 දක්වා ලඟා වෙමින් 12.5%කින් වැඩි වූ අතර මේ සඳහා අන්‍යෝන්‍ය වශයෙන් 16%ක ශක්තිමත් ණය වර්ධනය හේතු විය. ඒ අතරම, සමාගමේ ණය වර්ධනය 17%ක යහපත් මට්ටමක වූ බැවින් වත්කම් පදනමද 13%කින් පුළුල් විය. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල තුළ වැඩිවන ප්‍රතිලබ්ධි මගින් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙත සමූහයේ නිරාවරණය පුළුල්වීම පෙන්නුම් කරන අතර, විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් රු. බිලියන 3.13 දක්වා 57%ට වැඩි ප්‍රමාණයකින් වැඩිවීමට හේතු වී ඇත. ණය සහ අත්තිකාරම් තුළ ශක්තිමත් වර්ධනයෙන් පසු, ද්‍රවශීල වත්කම් ණය වර්ධනයට යොමු කරන ලද බැවින් වත්කම් කළඹ ණය වත්කම් කරා වඩාත් නැඹුරු විය. ඒ අනුව, ණය කළඹ පෙර වසරේ 78%ට සාපේක්ෂව සමූහයේ වත්කම්වලින් 81%ක් සඳහා දායක වී ඇත.

පුද්ගල ණය, වෙළෙඳ ණය, ක්ෂුද්‍ර මූල්‍යකරණය සහ රන් ණය ඇතුළුව ව්‍යාපාරයේ සම්ප්‍රදායික නොවන ක්ෂේත්‍රයන් හි වර්ධනය හඹායාමට ක්ෂේත්‍රයේ වාතාවරණයන් සමූහය බලාත්කාරයෙන් යොමු කළ බැවින් වසර තුළ කළඹ විවිධාංගීකරණය උපායමාර්ගික ප්‍රමුඛතාවක් විය. ඒ අනුව, කල්බදු මත විශ්වාසය අඛණ්ඩව හීන වූ අතර 2015 දී 61%ට සාපේක්ෂව මෙම වසර තුළ 55%ක් වූ සමූහයේ ණය කළඹ සඳහා දායක විය.


වත්කම් සංයුතිය



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය


ණය සංයුතිය



වගකීම්

සමූහයේ වත්කම් පදනමට ආසන්න වශයෙන් 58%ක් අරමුදල් සපයමින් සහ මුළු අරමුදලට 61%ක් දායක වෙමින් සමූහයේ ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වන්නේ ගනුදෙනුකරුවන්ගේ තැන්පතුය. සමාගමේ තැන්පතු අධිකාරිය අබන්ඩව ශක්තිමත් කළ බැවින්, ආයතනික සහ පාරිභෝගික තැන්පතු වසර තුළ රු. බිලියන 18.52 දක්වා 17%කින් වර්ධනය විය. එමෙන්ම තැන්පතු යෙදවීම පිළිබඳ ශාඛා සේවකයින්ගේ දක්ෂතා වැඩිකිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. වැඩිවන පොළී අනුපාත ක්‍රියාදාම මගින් ඉතුරුම් ගිණුම්වල සිට කාලීන තැන්පතු කරා අරමුදල් විතැන් කිරීමට තැන්පත්කරුවන් ක්‍රමානුකූලව මෙහෙය වුවත්, සක්‍රීය අලෙවිකරණ උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, MBSL එහි අඩු පිරිවැය ඉතුරුම් කළඹ 5% කින් සාර්ථකව වර්ධනය කරගෙන ඇත. ඒ සමඟම වසර තුළ මුළු අරමුදල්කරණය සඳහා 29%ක් දායක වෙමින් ණය නිරාවරණය රු. බිලියන 8.72 දක්වා 11%කින් වැඩිවීය. අරමුදල්වල සංයුතිය පසුගිය වසරට සාපේක්ෂව අනෙන්‍යන්‍ය වශයෙන් නොවෙනස්ව පැවතින.

අරමුදල් සංයුතිය



මෙයට පෙර, විශේෂ කල්බදු සමාගමක් වූ MBSL 2015 දී ඒකාබද්ධ කිරීමෙන් පසු තැන්පතු සේවයේ යෙදවීම සඳහා හැකියාව ලබාගන්නා ලද අතර එතැන් සිට එහි තැන්පතු කොටස ශක්තිමත් කිරීම තුළ ආයෝජනය කර ඇත. සමාගමේ අඩු පිරිවැය තැන්පතු පදනම තවමත් සාපේක්ෂව අඩු මට්ටමක පවතින අතර බාලවයස්කාර ඉතුරුම් ඉදිරියට ගෙන යාමට වැඩසටහනක් 2016 දී සිදුකරන ලදී. වසර තුළ, සමාගම ඉලක්කගත පුහුණු තුළින් එහි ශාඛාවල සේවකයින්ගේ තැන්පතු යෙදවීම පිළිබඳ දක්ෂතා වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

සමාගමේ පුළුල් ශාඛා පැවැත්ම, විශිෂ්ඨ සේවා වාර්තා සහ රජයේ හිමිකාරත්වය හා බැඳුණු විශ්වාසනීයත්වය සමඟින් මෙවැනි ආයෝජනවලින් 2017 දී ප්‍රතිඵල ලබා ගැනීම අපේක්ෂා කරයි. තැන්පතු කොටස විශේෂිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයක් මගින් තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර එය 2017 දෙවන අර්ධයේදී මධ්‍ය බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව දියත් කිරීමට නියමිතය.

ප්‍රාග්ධනීයකරණය


මුළු ස්කන්ධය රු. බිලියන 3.11 දක්වා 4% කින් වැඩි වූ අතර එයට ප්‍රධාන වශයෙන් වසර තුළ ලාභ රඳවාගැනීම හේතු විය. ඒ අතරම, ණය වර්ධනයෙන් පසු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම පහත වැටුනද, වසර තුල පළමු පෙළ ප්‍රාග්ධනය සහ මුළු ප්‍රාග්ධනය පිළිවෙලින් 10.66% සහ 10.69% ක් වාර්තා කරමින් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට වඩා යහපත් අයුරින් ඉහළ මට්ටමක පැවතුණි.

කොටස් හිමියන්ට වටිනාකම් එකතු කිරීම

සමූහය එහි කොටස් හිමියන් වෙත අබණ්ඩව වටිනාකම් එකතු කිරීම පෙන්නුම් කරමින් කොටසක මූලික ඉපයීම පසුගිය වසරේ පැවති රු. 0.13 සිට රු. 0.71 දක්වා වැඩි විය. කොටසකට ශුද්ධ වත්කම්ද වසර තුළ රු.18.88 දක්වා 4%කින් වැඩිවිය. මේ සමඟම, වසර තුළ 9%ට ආසන්නව ASI පහත වැටීමක් පෙන්නුම් කළ පුළුල් වෙළෙඳපොලේ පහත වැටීම පිළිබිඹු කරමින් MBSL කොටස් මිල රු. 13.60ට ආසන්න වෙමින් 9%කින් පහත වැටුණි. ඒ අනුව. වෙළෙඳපොල ප්‍රාග්ධනකරණයද 2015 පැවති රු. බිලියන 2.49 සිට රු. බිලියන 2.25 දක්වා පහත වැටුණි.

සමූහය/සමාගම	**2016**	2015
කොටසක ඉපයීම් (රු)	0.71	0.13
කොටසකට ශුද්ධ වත්කම් (රු)	18.88	18.10
කොටස් මිල (රු)	13.60	15.00
වෙළෙඳපොල ප්‍රාග්ධනීයකරණය (රු. බිලියන)	2.25	2.49
CSE හි මුළු පිරිවැටුමට MBSL පිරිවැටුම (%)	4	5

කොටස් මිල කාර්යසාධනය - 2016



වෙළඳ පොල කොටස් තොරතුරු

	2016	කා4	කා3	කා2	කා1	2015
කොටස් මිල (රු.)						
උපරිම මිල	16.50	16.50	16.00	14.80	15.20	20.50
අවම මිල	10.10	13.20	11.60	10.10	10.20	14.20
අවසාන ගනුදෙනුවේ මිල	13.60	13.60	15.50	12.00	10.20	15.00
ගනුදෙනු සංඛ්‍යාව	4,392.00	1,092.00	1,731.00	976.00	593.00	5,424.00
අලෙවිකළ කොටස් සංඛ්‍යාව (මිලියන)	8.41	2.06	4.46	1.17	0.71	10.86
මුළු කොටස්වලට අලෙවිකළ කොටස් (%)	0.13	0.52	0.20	0.07	0.03	0.13
පිරිවැටුම (රු. මිලියන)	119.30	31.35	63.99	15.44	8.53	191.24
මුළු වෙළෙඳපොල පිරිවැටුමට සමාගමේ (MBSL) පිරිවැටුම	4.00	5.00	8.00	2.00	1.00	5.00
අලෙවිකළ දින ගණන	234	61	60	58	55	237
සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන)	737.56	681.16	787.00	708.71	773.37	896.73
වෙළෙඳ පොල ප්‍රාග්ධනීයකරණය- සමාගම (MBSL) (රු. බිලියන)	2,745.41	2,745.41	2,785.68	2,677.63	2,586.15	2,938.00
වෙළෙඳපොල ප්‍රාග්ධනීයකරණය- සමාගම (MBSL) (රු. බිලියන)	2.25	2.25	2.57	1.99	1.69	2.49
වෙළෙඳපොල ප්‍රාග්ධනීයකරණයට සමාගමේ ප්‍රාග්ධනීයකරණය (%)	0.08	0.08	0.09	0.07	0.07	0.08
සමාගමේ (MBSL) වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණ ශ්‍රේණිගත කිරීම	135	135	131	147	158	136

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය

කොටස් 1,000ට අඩු සංඛ්‍යාවක් දරන කොටස් හිමියන් 80%කට වැඩි සංඛ්‍යාවක් සහිතව කොටස් හිමියන්ගේ මුළු සංඛ්‍යාව 2016 දෙසැම්බර් අවසානයට 11,434 ක් විය. ඒ අනුව. පාලක සමාගම වන ලංකා බැංකුවේ කොටස් හිමිකාරත්වය 2016 දෙසැම්බර් අවසානයට 74.49% ක් වූ අතර මහජන කොටස් හිමිකාරත්වය 25.50% මට්ටමේ නොවෙනස්ව පැවතින. කොටස් හිමියන්ගේ සංඛ්‍යාවට අනුව, පහත පෙන්වා දෙන පරිදි සමාගමේ මුළු කොටස් හිමිකාර පදනමින් 99.94% ක් සඳහා පොදු කොටස් හිමියන් දායක වේ.

පොදු හිමිකාරත්වය

	2016	2015
ජනතාව විසින් දරන කොටස් සංඛ්‍යාව	42,302,815 (25.50%)	42,306,898 (25.51%)
ජනතා කොටස් හිමියන්ගේ සංඛ්‍යාව	11,427 (99.94%)	11,684 (99.92%)

විදේශීය කොටස් හිමිකාරත්වය වාසිකයින් විසින් කොටස්වලින් 99.35%ක් දරන බැවින් අඛණ්ඩව පහත මට්ටමක විය.

සාමාන්‍ය කොටස්හිමියන් බෙදා දැක්වීම

	2016 දෙසැම්බර් 31 දිනට				2015 දෙසැම්බර් 31 දිනට			
	කොටස්හිමියන් ගණන	කොටස්හිමියන් ගණන %	කොටස් ගණන	කොටස් ගණන %	කොටස්හිමියන් ගණන	කොටස්හිමියන් ගණන %	කොටස් ගණන	කොටස් ගණන %
1 - 1,000	9286	81.21	1,690,172	1.02	9,465	80.95	1,758,916	1.06
1,001 - 10,000	1734	15.17	6,037,485	3.64	1,829	15.64	6,258,308	3.77
10,001 - 100,000	363	3.17	10,050,987	6.06	352	3.01	9,870,865	5.95
100,001 - 1,000,000	48	0.42	11,104,996	6.69	43	0.37	9,368,745	5.65
over 1,000,000	3	0.03	136,990,901	82.59	4	0.03	138,617,707	83.57
Total	11,434	100.00	165,874,541	100.00	11,693	100.00	165,874,541	100.00

සාමාන්‍ය කොටස්හිමියන්ගේ සංයුතිය

		2016 දෙසැම්බර් 31 දිනට				2015 දෙසැම්බර් 31 දිනට			
		කොටස්හිමියන් ගණන	කොටස්හිමියන් ගණන %	කොටස් ගණන	කොටස් ගණන %	කොටස්හිමියන් ගණන	කොටස්හිමියන් ගණන %	කොටස් ගණන	කොටස් ගණන %
වාසික	පුද්ගල	10,427	91.19	19,785,711	11.93	10,664	91.20	18,743,022	11.31
	සමාගම	955	8.35	145,015,408	87.42	976	8.35	145,694,055	87.83
නිවාසික	පුද්ගල	50	0.44	905,939	0.55	50	0.43	883,745	0.53
	සමාගම	2	0.02	167,483	0.10	3	0.02	553,719	0.33
එකතුව		11,434	100.00	165,874,541	100.00	11,693	100.00	165,874,541	100.00

අධ්‍යක්ෂවරුන්ගේ කොටස්හිමිකාරත්වය

අධ්‍යක්ෂවරුන්ගේ නම්	2016 දෙසැම්බර් 31 දිනට කොටස් ගණන	මුළු කොටස්වල % ලෙස	2015 දෙසැම්බර් 31 දිනට කොටස් ගණන	මුළු කොටස්වල % ලෙස
සී.එන්. විජේවර්ධන මහතා	4,235	0.0026%	අ/නැ	0%

විශාලතම කොටස්හිමියන් විසිදෙනා පහත දැක්වේ.

		2016 දෙසැම්බර් 31 දිනට			2015 දෙසැම්බර් 31 දිනට	
		කොටස් ගණන	හිමි ප්‍රතිශතය	සමුච්චිත හිමි ප්‍රතිශතය %	කොටස් ගණන	හිමි ප්‍රතිශතය (%)
1	ලංකා බැංකුව අංක 1 හිණුම	123,562,267	74.49%	-	123,562,267	74.49%
2	ලංකා බැංකුව හිණුම සී බෑන්ක් ඒකක භාරය	10,796,141	6.51%	81.00%	10,757,541	6.49%
3	ෆීනික්ස් වෙන්චර් ප්‍රයිවට් ලිමිටඩ්	2,632,493	1.59%	82.59%	2,632,493	1.59%
4	රුවඩ් පීරිස් ෆිනෑන්ෂියල් සර්විසස් (පුද්ගලික සමාගම)/එම්.ඒ.ඒ.කරීම්	556,651	0.34%	82.92%	-	-
5	මෙරිල් පේ ප්‍රනාන්දු සහ පුත්‍රයෝ පුද්ගලික සමාගම	526,165	0.32%	83.24%	526,165	0.32%
6	පීපල්ස් ලිසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී /ඩී.එම්.පී. දිසානායක මහතා	428,450	0.26%	83.50%	425,450	0.26%
7	සෙලාන් බෑන්ක් පීවිල්සී/ ස්පයිස් ඔෆ් ලයිෆ් පුද්ගලික සමාගම	387,934	0.23%	83.73%	251,895	0.15%
8	හැටන් නැෂනල් බෑන්ක් පීවිල්සී /දිනේෂ් නාගේන්ද්‍ර සෙල්ලමුත්තු	386,301	0.23%	83.96%	286,301	0.17%
9	එන්. බාලසිංහම් මහතා	381,400	0.23%	84.19%	381,400	0.23%
10	ප්‍රයිම් ලෑන්ඩ් පුද්ගලික සමාගම	375,000	0.23%	84.42%	1,665,406	1.00%
11	බී.ටී. ප්‍රතාපසිංහ මහතා	345,000	0.21%	84.63%	345,000	0.21%
12	ඒ. වෙල්ලයියා (මියගිය)	333,800	0.20%	84.83%	333,800	0.20%
13	වල්ඩි ෆිනෑන්ස් / කේ.ටී.ආර්.පී. සමරතු.ග මහතා	312,401	0.19%	85.02%	-	-
14	එම්.එම්. ෆාඩ් මහතා	310,114	0.19%	85.21%	-	-
15	ඒ.එම්. වීරසිංහ මහතා	305,583	0.18%	85.39%	305,583	0.18%
16	බාර්ට්ලිට් ප්‍රොඩක්ට්ස් මාකටින් ප්‍රයිවට් ලිමිටඩ්ග	300,000	0.18%	85.57%	300,000	0.18%
17	පීපල්ස් ලිසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී/එල්. පී. හපන්ගම	300,000	0.18%	85.75%	300,000	0.18%
18	ඩබ්. එල්.ටී. ආනන්දවංශ	282,039	0.17%	85.92%	-	-
19	ආශා ෆිනෑන්ෂියල් සේවා සමාගම/ සී.එන්. පාකියා මහතා	275,200	0.17%	86.09%	264,250	0.16%
20	ඩී.එස්. ඉන්වෙස්ට්මන්ට් පුද්ගලික සමාගම	269,603	0.16%	86.25%	269,603	0.16%
විශාලතම කොටස්හිමියන්ගේ එකතුව		143,066,542	86.25%			
අනෙකුත් කොටස්හිමියන්ගේ එකතුව		22,807,999	13.75%			
මුළු කොටස්හිමියන්		165,874,541	100.00%			

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මූල්‍ය ප්‍රාග්ධනය

ණයකර තොරතුරු

සමාගමේ දැනට පවත්නා ණයකරවලට අදාලව ගනුදෙනු/වෙළෙඳපොල තොරතුරු පහත දැක්වේ.

ණයකර - වෙළෙඳ පොල

	2016								
වර්ගය	වර්ගය A13 මාර්තු	වර්ගය B13 මාර්තු	වර්ගය C13 මාර්තු	වර්ගය D13 මාර්තු	වර්ගය A13 දෙසැ	වර්ගය C13 දෙසැ	වර්ගය D13 දෙසැ	වර්ගය A14 නොවැ	වර්ගය B14 නොවැ
කාලය	වසර 5	වසර 4	වසර 5	වසර 5	වසර 4	වසර 4	වසර 4	වසර 5	වසර 5
නිකුත්කළ දිනය	13 මාර්තු 28	13 මාර්තු 28	13 මාර්තු 28	13 මාර්තු 28	13 දෙසැ 17	17-දෙසැ-13	17-දෙසැ-13	13-නොවැ-14	13-නොවැ-14
කල්පිරෙන දිනය	27-මාර්තු-18	27-මාර්තු-17	27-මාර්තු-18	27-මාර්තු-18	16-දෙසැ-17	16-දෙසැ-17	16-දෙසැ-17	12-නොවැ-19	12-නොවැ-19
පොළී අනුපාතය	17.50%	17.25%	16.70%	16.50%	14.25%	13.50%	13.25%	9.00%	8.75%
කූපන් අනුපාතය (%)	17.50%	17.25%	16.70%	16.50%	14.25%	13.50%	13.25%	9.00%	8.75%
ඵලදායී වාර්ෂික ආදායම (%)	17.50%	17.25%	17.77%	17.80%	14.25%	14.19%	14.08%	9.00%	9.07%
රජයේ සුරැකුම්පත්වලට අනුව පොළී අනුපාතය (%)	11.56%	10.31%	11.56%	11.56%	10.31%	10.31%	10.31%	11.94%	11.94%
පොළී ගෙවිය යුතු වාර ගණන	වාර්ෂිකව	වාර්ෂිකව	කාර්තුමය	මාසිකම	වාර්ෂිකව	කාර්තුමය	වාර්ෂිකව	වාර්ෂිකව	අර්ධ - වාර්ෂිකව
ශ්‍රේණිගත කිරීම	AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී				AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී				AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී
ප්‍රමාණය (රු.මි.)	625.11	485.24	723.19	166.46	674.77	17.54	11.47	909.77	1,090.23
ISIN අංකය.	LK0186D19194	LK0186D19202	LK0186D19210	LK0186D19228	LK0186D20929	LK0186D20911	LK0186D20937	LK0186D22669	LK0186D22677
වෙළෙඳ පොල අගය (රු)									
උපරිම මිල	115.18	102.56	102.00	101.00	102.63	ගනුදෙනු කර නොමැත	ගනුදෙනු කර නොමැත	ගනුදෙනු කර නොමැත	ගනුදෙනු කර නොමැත
අවම මිල	107.92	102.56	102.00	101.00	102.62				
අවසාන ගනුදෙනුවේ මිල	115.18	102.56	102.00	101.00	102.62				
වර්තන ආදායම	15.19%	16.82%	16.37%	16.34%	13.89%				
YTM (%)	13.16%	16.33%	15.95%	16.19%	13.36%				

2016 දෙසැම්බර් අවසානයට, සුරැකුම් නොලත් නිදහස් කළ හැකි ණයකර රු. මිලියන 47.03 ඇතුළුව MBSL හි ගෙවීමට ඇති මුළු ණයකර වටිනාකම රු. බි

2015										
වර්ගය A13 මාර්තු	වර්ගය B13 මාර්තු	වර්ගය C13 මාර්තු	වර්ගය D13 මාර්තු	වර්ගය A13 දෙසැ	වර්ගය B13 දෙසැ	වර්ගය C13 දෙසැ	වර්ගය D13 දෙසැ	වර්ගය A14 නොවැ	වර්ගය B14 නොවැ
වසර 5	වසර 4	වසර 5	වසර 5	වසර 4	3 Years	වසර 4	වසර 4	වසර 5	වසර 5
28-මාර්තු-13	28-මාර්තු-13	28-මාර්තු-13	28-මාර්තු-13	17-දෙසැ-13	17-දෙසැ-13	17-දෙසැ-13	17-දෙසැ-13	13-නොවැ-14	13-නොවැ-14
27-මාර්තු-18	27-මාර්තු-17	27-මාර්තු-18	27-මාර්තු-18	16-දෙසැ-17	16-දෙසැ-16	16-දෙසැ-17	16-දෙසැ-16	12-නොවැ-19	12-නොවැ-19
17.50%	17.25%	16.70%	16.50%	14.25%	13.50%	13.50%	13.25%	9.00%	8.75%
17.50%	17.25%	16.70%	16.50%	14.25%	13.50%	13.50%	13.25%	9.00%	8.75%
17.50%	17.25%	17.77%	17.80%	14.25%	13.50%	14.19%	14.08%	9.00%	9.07%
8.82%	8.36%	8.82%	8.82%	8.36%	7.74%	8.36%	8.36%	9.46%	9.46%
ඩෆර්ෂියඩ	ඩෆර්ෂියඩ	ඝාර්නුමය	මාසික්ම	ඩෆර්ෂියඩ	ඩෆර්ෂියඩ	ඝාර්නුමය	මාසික්ම	ඩෆර්ෂියඩ	අර්ධ - ඩෆර්ෂියඩ
AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී				AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී					AA- ලංකා රේටින් (ලංකා) ලිමිටඩ් විසිනී
625.11	485.24	723.19	166.46	674.77	296.22	17.54	11.47	909.77	1,090.23
LK0186D19194	LK0186D19202	LK0186D19210	LK0186D19228	LK0186D20929	LK0186D20945	LK0186D20911	LK0186D20937	LK0186D22669	LK0186D22677
121.70	110.64			108.82			111.04	97.35	
115.18	110.64	ගනුදෙනු	ගනුදෙනු	108.82	ගනුදෙනු	ගනුදෙනු	111.04	97.35	ගනුදෙනු
115.18	110.64	කර	කර	108.82	කර	කර	111.04	97.35	කර
15.19%	15.59%	නොමැත	නොමැත	13.10%	නොමැත	නොමැත	11.93%	9.24%	නොමැත
9.91%	9.74%			9.79%			9.65%	9.74%	

ිලියන 5.15 කි. සියලුම ණයකර 8.75% සිට 17.50% දක්වා පරාසයක ප්‍රතිලාභ අනුපාත සහිතව කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කෙරේ.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

නිෂ්පාදිත ප්‍රාග්ධනය

මූල්‍ය ආයතනයක් ලෙස, සමාගමේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ශාඛා ජාලය සහ රන් ණය මධ්‍යස්ථාන සහ එහි තොරතුරු පද්ධතිය මෙන්ම අනෙකුත් ඩිජිටල් යටිතල පහසුකම් ඇතුළුව සමාගමේ භෞතික යටිතල පහසුකම්වලින් සමන්විත වේ. නිෂ්පාදිත ප්‍රාග්ධනය කාර්යක්ෂම සහ සරල කල ක්‍රියාවලිය සහතික කරමින් සේවකයින් සහ ගනුදෙනුකරුවන් සම්බන්ධ කිරීමේදී සහ ගනුදෙනුකාර අත්දැකීම ලබාදීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

	2016	2015	වාර්ෂික %
යෙදවුම්			
දේපල හා උපකරණ (රු.මි.)	741.13	598.56	24
ගනුදෙනුකරු සේවා ස්ථාන	49	49	-

අගය නිර්මාණය කිරීමේ කටයුතු

- රු. මිලියන 248ක් දේපල හා උපකරණ හි ආයෝජනය කිරීම / එකතු කිරීම්
- 2017 දෙවන අර්ධයේදී දියත් කිරීමට අපේක්ෂිත මධ්‍ය බැංකුකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලික කාර්යය කිරීම හා රු. මිලියන 81 ආයෝජනය කිරීම
- ශාඛා 04ක් නැවත ස්ථානගත කිරීම
- නව රන් ණය මධ්‍යස්ථාන 06ක් විවෘත කිරීම

	2016	2015	වාර්ෂික %
නිමවුම්			
ණය කළඹ	27,052.00	23,225.78	16
තැන්පතු කළඹ	18,518.42	15,846.31	17

භෞතික යටිතල පහසුකම්

සමාගමේ ජාලය දිස්ත්‍රික්ක 22 පුරා ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන 49කින් සමන්විත වන අතර ගනුදෙනුකාර සහභාගීත්වය සඳහා ඒවා ප්‍රධාන සම්බන්ධතා ස්ථාන වේ. ණය වර්ධනය සහ තැන්පතු යෙදවීම සඳහා පහසුකම් ඇති කරමින්, කල්බදු මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ සහ පාරිභෝගික නිෂ්පාදන ශාඛා ජාලය තුළින් ගනුදෙනුකරුවන් වෙත ප්‍රවර්ධනය කරනු ලබයි. රන් ණය පහසුකම් මෙම ශාඛා 34 මගින් ලබාදෙන අතර වසර තුල ශාඛා ජාලයට නව රන් ණය මධස්ථාන 06ක් එකතු කරන ලදී.


2016 දී, අපගේ ශාඛා ඒකාබද්ධ කිරීම සහ වර්ධන අවස්ථාවන් කෙරෙහි ප්‍රාග්ධනය කිරීමට ජාලය ප්‍රශස්ථ කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. ඒ අනුව, ශාඛා හතරක් එනම් කිලිනොච්චිය, නිට්ටඹුව, කොටහේන සහ යාපනය යන ශාඛා වර්ධිත ප්‍රවේශය සහ පහසුව තුළින් ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට වසර තුළ නැවත ස්ථානගත කරන ලදී. නැවත ස්ථානගත කිරීම්ද වර්ධනය සඳහා ශක්තිමත් අවස්ථාවක් සමූහය වෙත ලබාදී ඇති අතර විශේෂයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවස්ථාව ලද අතර එය මෙම කලාපයන් හී ණය ඉල්ලුමට හේතු විය. සේවකයින්ගේ තැන්පතු යෙදවීමේ දක්ෂතාව වැඩි කිරීම සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් මගින් සහය ලබමින් ශාඛාවන්ද වසර තුළ තැන්පතු වර්ධනයට කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ තැන්පතු කළඹ වසර තුළ 17% කින් වර්ධනය වූ අතර අඩු පිරිවැය ඉතුරුම් තැන්පතු 5%ක වර්ධනයක් වාර්තා කළේය.

ඩිජිටල් යටිතල පහසුකම්

සමාගම වෙනුවෙන් ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම කෙටි කාලීන සිට මධ්‍ය කාලීන දක්වා මූලික ප්‍රමුඛතාවක් විය. 2017 දෙවන අර්ධයේදී දියත් කිරීමට අපේක්ෂිත මධ්‍ය බැංකුකරණ පද්ධතිය මගින් කළමනාකාරිත්වයට යථා කාල, සාකල්‍ය තොරතුරුවලට ප්‍රවේශය ලබාදීම තුළින් කාර්යක්ෂම, ගනුදෙනුකරු කේන්ද්‍රීය, අනාගතයට සුදානම් ආයතනයක් බවට සමාගම පරිවර්තනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් වසරේ දෙවන අර්ධය තුළ සකස් කිරීමට නියමිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මාර්ගගත සහ ජංගම බැංකුකරණ සේවා සහිත සමාගමේ ස්වයං සේවා කොටස වැඩි කරනු ඇත. වසර තුළ, මාර්ගගත අන්තර් බැංකු ගෙවීම් හා අරමුදල් මාරුකිරීම් හැකියාව වර්ධනය කරමින් සමාගම ස්ලිප්ස් (SLIPS) (ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය) හා එකතු විය.




සමාගමේ ඩිජිටල්කරණ වැඩසටහනේ මූලික අංග වලට පහත දෑ ඇතුළත් වේ.



නිෂ්පාදිත ප්‍රාග්ධනයට වටිනාකම් එකතු කිරීම

2016, සමාගම එහි නිෂ්පාදිත ප්‍රාග්ධනය වැඩි කිරීමට රු. මිලියන 248ක් ආයෝජනය කළ අතර ඉන් ආසන්න වශයෙන් 80%ක් පහත පෙන්වා දෙන පරිදි පරිගණක උපකරණ සහ ඩිජිටල් යටිතල පහසුකම් තුල ආයෝජන සමන්විත වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනයට වටිනාකම් එකතු කිරීම



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මානව ප්‍රාග්ධනය

අභිප්‍රේරිත සහ පුහුණු සේවකයින් 917ක් සහිත අප කණ්ඩායම සමාගමේ ත්‍රමෝපායික වැඩසටහන ඉදිරියට ගෙන යාමට සවිබල ගැන්වේ. ඔවුන් MBSL ආයතනික සාරධර්ම ජීවත්කරවමින්, ගනුදෙනුකාර අත්දැකීමට පහසුකම් සපයන අතර අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය තුළ අත්‍යවශ්‍ය කොටසකි. එමෙන්ම, සමාගම එහි සේවකයින්ට ක්‍රියාශීලී හා අගනා ප්‍රතිඵල ලබාදෙන සේවා පරිසරයක්, තරඟකාරී වැටුප් සහ දක්ෂතා සහ වෘත්තීය සංවර්ධනය සඳහා විවිධ අවස්ථාවන් ලබා දේ.

	2016	2015	වාර්ෂික %
යෙදවුම්			
පුද්ගල සංඛ්‍යාව	917	866	6
සේවක පුහුණු පැය	18,395	11,100	66
පුහුණු සංවර්ධනය සඳහා මුළු පිරිවැය (රු. මිලියන)	14.62	7.09	106
අපගේ කණ්ඩායමේ දක්ෂතා, ආකල්ප සහ අභිප්‍රේරණය			

අඟය නිර්මාණය කිරීමේ කටයුතු

- පුහණු පැය 18,395ක රු.මිලියන 14.62ක් ආයෝජනය කිරීම
- කළමනාකාරීත්ව මට්ටමේ උසස්වීම් 04 සහ විධායක මට්ටමේ උසස්වීම් 06
- බඳවාගැනීම, පුහුණු කිරීම සහ උසස්වීම් සඳහා ප්‍රතිපත්ති වැඩරාමුව සංවර්ධනය කිරීම

	2016	2015	වාර්ෂික %
නිමවුම්			
ත්‍යාග හා ප්‍රතිලාභ (රු. මිලියන)	818	707	16
සේවකයින් රඳවා ගැනීම (%)	85	84	1

අපගේ ප්‍රවේශය සහ වටිනාකම් කොටස

මානව ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සඳහා MBSL හි ප්‍රවේශයට කණ්ඩායම් වැඩ, හැකියා සංවර්ධනය තුළ දැනට පවත්නා ආයෝජන සහ ඉහළ මට්ටමේ සේවක සහභාගිත්වයක් පෝෂණය කරන පරිසරයක් ඇතුළත් වේ. අපගේ සේවක වටිනාකම් කොටසේ ශක්තිය දක්ෂ පුද්ගලයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට සමාගමට හැකියාව ලබාදී ඇත.

සේවක වටිනාකම් කොටස



2016 දී සේවක ත්‍රමෝපාය

G4-LA8

වසර තුළ සමාගමේ සේවක ත්‍රමෝපාය විශේෂ පරමාර්ථ කිහිපයක් කෙරෙහි කේන්ද්‍රගත කරන ලදී. කාර්යසාධනය කරා ගමන්කරන සංස්කෘතියක් පෝෂණය කිරීම සහ ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයින් සඳහා වෘත්තීය ප්‍රගතිය පිළිබඳ පැහැදිලි මාවතක් ලබාදීම යන පරමාර්ථයන් දෙකක් සමඟ නව උසස්වීම් ප්‍රතිපත්තියක් හඳුන්වාදෙන ලදී. සමාගමේ ත්‍රමෝපායික වැඩසටහන ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය කරන විශේෂිත දක්ෂතා සහිත සේවකයින්ගෙන් සවිමත් කිරීම ඉලක්ක කළ පුහුණු වැඩසටහන් වසර තුළ පවත්වන ලදී. එමෙන්ම සමාගම 2017 ජනවාරි වසර තුනක සාමූහික විකඟතාවයක් ඇති කර ගැනීමට සාර්ථකව වෘත්තීය සමිති සමඟ කටයුතු කරන ලද අතර ඒ තුළින් සේවකයින්ට අදාළ ගැටළුවලින් මෙහෙයුම්වලට ඇතිවිය හැකි බාධා අවම කිරීම සහතික කරන ලදී. සමස්තයක් ලෙස, සමාගමේ ඊලඟ පරම්පරාවේ නායකයින් වීමට අපේක්ෂා කරන ඉහළ කාර්යසාධනයකින් යුත් සේවකයින් රඳවා ගැනීම සහතික කිරීමට ශක්තිමත් පදනමක් ක්‍රියාත්මකව පවතී.

මානව සම්පත් පාලනය සහ ප්‍රතිපත්ති රාමුව

විස්තරාත්මක ප්‍රතිපත්ති රාමු, ශක්තිමත් පාලන ව්‍යුහ සහ විධිමත්කළ පද්ධති සහ ක්‍රියාපටිපාටි ආයතනයේ සෑම මට්ටමකම සමාගමේ මානව සම්පත් වැඩ පිළිවෙල නියමාකාරව ක්‍රියාත්මක කිරීම සහතික කරයි. ප්‍රතිපත්ති රාමුවට අනිකුත් දෑ අතර බඳවාගැනීම, සමාන අවස්ථාව, ත්‍යාග සහ හඳුනාගැනීම, පුහුණු හා සංවර්ධනය, මැසිවිලි යාන්ත්‍රණ සහ පුද්ගල සම්බන්ධතා ඇතුළුව මානව සම්පත් කළමනාකරණයට අදාළ වන්නා වූ විවිධ අංග සම්බන්ධ පුළුල් ආවරණයක් ඇත. වසර තුළ, සමාගම එහි බඳවාගැනීම, පුහුණු සහ වෘත්තීය සංවර්ධන ප්‍රතිපත්ති සමාගමේ 2016 සේවක ත්‍රමෝපායට අනුකූලව සංශෝධනය කරන ලදී.






කණ්ඩායම් පැතිකඩ


G4-10,G4-LA 12

සමාගමේ ශ්‍රම බලකාය විවිධ දෘෂ්ටිකෝණ සහ අදහස්වල සාරයක් ලබාදෙමින් ස්ත්‍රීපුරුෂභාවය සහ වයස් නියෝජනය විවිධත්වයක් ගනී. මුළු ශ්‍රම බලකායෙන් කාන්තා නියෝජනය ජාතික නියෝජනය වන 34%ට සාපේක්ෂව 38% කි. අපගේ සේවකයින්ගෙන් 80%ක් වයස අවුරුදු 40ට පහළ අය වන අතර, සමාගමේ ශ්‍රම බලකාය තරුණ, ජවසම්පන්න, සහ වෙනස්වන ගතිකතාවන්ට ඉක්මණින් ප්‍රතිචාර දක්වන ශ්‍රම බලකායකි. අපි අර්ධකාලීන සේවකයින් සේවයේ යොදවා නොමැත.


ආගම සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවකයින්



වයස හා ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවකයින්



වර්ගය සහ ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවකයින්



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මානව ප්‍රාග්ධනය

සේවක සහභාගීත්වය
G4-LA05

විවිධ විධිමත් සහ අවිධිමත් අවස්ථා තුළින් අපි ඉහළ මට්ටමේ සේවක සහභාගීත්වය පවත්වා ගනිමු. කාර්යසාධන ඇගයීම් වාර්ෂික පදනමක් මත සියලුම කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන අතර, කාර්ය මණ්ඩල රැස්වීම් විධිමත් පරිදි දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය මට්ටමින් පවත්වනු ලබයි. විවෘත සහ පැහැදිළි සන්නිවේදන මාර්ගයක් ලබාදෙමින් සියලුම මධ්‍ය සහ ආයතනික කළමනාකාරිත්වය විසින් සියලු දෙනාට විවෘත ප්‍රතිපත්තියක් පවත්වා ගනු ලබයි. සහභාගීත්වය වෘත්තීය සමිති සහ අදාළ සාමුහික කේවල් කිරීම් තුළින් සිදුකරන අතර, සේවක අදහස්වලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීම සඳහා විධිමත් කළ මැසිවිලි නිරාකරණ යාන්ත්‍රණයක්ද ක්‍රියාත්මකව පවතී.

පොසොන් බැති ගී සරණිය, නත්තල් කැරොල් සහ සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සව වැනි සංස්කෘතික සහ ආගමික උත්සව ඇතුළු වසර පුරා සේවක වෘත්තීය සමබරතා වැඩසටහන් සේවකයින් අතර මිත්‍රත්වය පිළිබඳ හැඟීමක් ප්‍රවර්ධනය කරයි.







අපි සේවකයින්ට පිරිනමන වටිනාකම් කොටස හඳුනාගැනීමේදී, පාර්ට්නර්ෂිප් සමිටි හා බිස්නස් එවෝඩ්ස් විසින් සංවිධානය කළ ලෝක මානව සම්පත් සංවර්ධන කොන්ග්‍රසයේදී MBSL විශිෂ්ඨතම සේවා යෝජක සන්නාමවලින් එකක් ලෙස නම් කරනු ලැබීය. මෙම ප්‍රදානය මගින් දැනට ක්‍රියාත්මක මානව සම්පත් ව්‍යවහාර, ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන්හි විශිෂ්ඨත්වය හඳුනා ගනී.




සේවක ආකර්ශනය
G4-LA01


අපි සමාන අවස්ථා ලබාදෙන සේවා යෝජකයෙක් වන අතර වයස, ස්ත්‍රීපුරුෂභාවය හෝ ජනවර්ගය මත පදනම් වී කිසිදු වෙනසක් නොකරමු. ශ්‍රී ලංකාවේ කම්කරු නීතිවලට අනුකූලව, අපි කිසිදු ආකාරයක ළමා ශ්‍රමය සහ/හෝ බලහත්කාර ශ්‍රමය යොදා නොගනිමු. වසර තුළදී MBSL එහි කණ්ඩායමට නව සේවකයින් 217ක් බඳවා ගන්නා ලදී.

ශාඛා සඳහා බඳවා ගැනීමේදී, අදාළ පළාත්වලින් බඳවා ගැනීමට උපරිම උත්සාහයන් සිදු කරනු ලබන අතර වසර තුළ නව සේවකයින් 107ක් බස්නාහිර පළාතට පිටතින් බඳවා ගනු ලැබීය.


ස්ත්‍රීපුරුෂභාවය අනුව නව බඳවාගැනීම්



කලාපය අනුව බඳවාගත් නව සේවකයින්



වයස් කාණ්ඩය අනුව බඳවාගත් නව සේවකයින්



තෑගි සහ පිළිගැනීම

G4-EC03 G4-LA02, G4-LA05,G4-LA13

සමාගමේ පාරිශ්‍රමික පැකේජය ක්ෂේත්‍රයේ ඉහළම දක්ෂයන් ආකර්ෂණය කර රඳවා ගැනීම සඳහා සැලසුම් කරනු ලබයි. අපි මූල්‍යමය සහ මූල්‍යමය නොවන දිරිදීමනා රාශියක් පිරිනමන අතර, දිරිදීමනා තීරණය කිරීමේදී ස්ත්‍රී පුරුෂභාවය, වයස හෝ ජනවර්ගය අතර වෙනසක් සිදු නොකරන්නෙමු. පිරිමි සහ කාන්තාවන් අතර මූලික වැටුප් සහ පාරිශ්‍රමික අනුපාතය 1:1 කි. වසර තුළ, වසර තුනක සාමූහික විකඟතාවයක් ඇති කර ගැනීමට සාර්ථකව වෘත්තීය සමිති සමඟ කටයුතු කරන ලදී. මූල්‍ය සේවා අංශයේ දක්ෂයින් සඳහා ක්‍රමයෙන් වැඩිවන තරඟකාරිත්වය හමුවේ, වෙළෙඳපොල තත්ත්වයන් යෝග්‍ය පරිදි පිළිබිඹු වන වැටුප් ව්‍යුහ සහ ප්‍රතිලාභ අපි ප්‍රතිශෝධනය කළෙමු. MBSL සේවකයින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ (ETF) ප්‍රතිලාභවලට හිමිකම් ලබයි. MBSL විසින් EPF සහ ETF සඳහා පිළිවෙලින් 12%ක් සහ 3%ක් දායක වේ. ඊට අමතරව, සමාගම වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සහිත සියලුම සේවකයින් සඳහා විශ්‍රාම ගන්නා අවස්ථාවේදී පාරිතෝෂික ලබා දේ.

වැටුපට අමතරව, ස්ථිර සේවකයින්ට පහත ප්‍රතිලාභ ලබාදේ.

මූලික ප්‍රතිලාභ රු.මි.	2016	2015
වැටුප්, වේතන හා ප්‍රසාද දීමනා	608.4	530.9
EPF සඳහා සේවක දායකත්වය	59.2	49.2
පාරිතෝෂික	40.5	42.6
වෛද්‍ය වියදම්	32.6	22.1
අතීකාල	20.8	18.0
සේවක ශුභසාධන	20.0	17.3
ETF සඳහා සේවක දායකත්වය	14.8	12.3
නිවාස ණය ලබාදීම	9.6	7.1
දිරිදීමනා	5.4	3.0
වෘත්තීය මණ්ඩලවල සාමාජිකත්වය	5.1	2.8
සේවක රක්ෂණය	1.1	1.5

කාර්යසාධන කළමනාකරණය

G4-LA11

සියලුම ස්ථිර සේවකයින්ට අපේක්ෂිත පරතර විවෘතව සාකච්ඡා කිරීමට, පුහුණු අවස්ථා හඳුනා ගැනීමට සහ කාර්යසාධන වර්ධනය සඳහා ප්‍රයෝජනවත් ප්‍රතිචාර ලබාදීමට අවස්ථාවක් ලබාදෙමින් අවම වශයෙන් වාර්ෂික පදනමක් මත ඔවුන් ඇගයීමට ලක් කෙරේ. දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ඉලක්ක සෑම වසරකම ආරම්භයේදී ආයතනික ව්‍යාපාර සැලැස්ම මත පදනම් වී පවරනු ලබන අතර මෙම ඉලක්කවලට අනුව කාර්යසාධනය අගයනු ලබයි.

වසර තුළ, ඉහළ කාර්යසාධනයෙන් යුත් සේවකයින් සඳහා වෘත්තීය ප්‍රගතිය පිළිබඳ පැහැදිලි ගමන් මාර්ගයක් නිර්මාණය කිරීමේ පරමාර්ථය ඇතිව සමාගමේ උසස්වීම් ප්‍රතිපත්තිය සංශෝධනය කළෙමු. ඒ අනුව, වර්තමානයේ උසස්වීම් සඳහා යෝග්‍යතාව මාර්ග දෙකකින් ඇති වේ. අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කළ සේවකයින්ට සාමාන්‍ය උසස්වීම් පිරිනමන අතර, ඉහළ කාර්යසාධනයෙන් යුත් සේවකයින් වෙත කුසලතා පදනම් උසස්වීම් පිරිනමනු ලබයි. මේ තුළින් ඉහළින් කටයුතු කරන්නන්ට වේගයෙන් ප්‍රගතිය කරා යාමට සහය වන අතර ඊලඟ පරම්පරාවේ නායකයින් පෝෂණය කිරීමට දක්ෂතා මාර්ගයක් සංවර්ධනය කිරීමට සමාගමට ඉඩ දේ. වසර තුළ,විධායක ශ්‍රේණියේ සේවකයින් හතර දෙනෙක් කළමනාකාර ශ්‍රේණියට උසස් කළ අතර අනෙකුත් ශ්‍රේණිවල සේවකයින් හය දෙනෙක් විධායක ශ්‍රේණිවලට උසස් කරන ලදී.

පුහුණු හා සංවර්ධනය

G4-LA09,G4-LA10

සමාගමේ සේවක වටිනාකම් කොටස තුළ මූලික ස්ථරයක් ලෙස සේවක හැකියා සංවර්ධනය පැමිණ ඇති අතර අභ්‍යන්තර, බාහිර සහ විදේශීය පුහුණු අවස්ථා ගණනාවක් අපි ලබාදෙන්නෙමු. 2016 දී, සමාගමේ මධ්‍යකාලීන ක්‍රමෝපායික වැඩසටහන ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කරන විශේෂ දක්ෂතා සහිත සේවකයින් බිහිකිරීම අරමුණ කරමින් පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සහ පුහුණු වැඩසටහන් රාශියක් පැවැත්වීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. පුහුණු කිරීම් පිළිබඳ තක්සේරුවක්ද වසර තුළ හඳුන්වා දුන්

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මානව ප්‍රාග්ධනය

අතර, ඒ තුළින් සේවකයින්ට අදාළ පුහුණු වැඩසටහන්වල ඵලදායිත්වය පිළිබඳ ප්‍රතිචාර ලබාදීමට අවස්ථාවක් ලබා දුන්හ. වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

	ඉලක්කගත දක්ෂතාව	විස්තරය	සහභාගි වූ සංඛ්‍යාව	සම්පූර්ණ පුහුණු පැය ගණන
අභ්‍යන්තර පුහුණු	නායකත්ව හැකියා සංවර්ධනය	නායකත්වය පදනම් හැකියා ඵලදායීව සංවර්ධනය කිරීමට කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා දින 2 ක නේවාසික වැඩමුළුව	143	2,002
	ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය සහ නිෂ්පාදන දැනුම	නව අලෙවිකරණ සේවකයින් සඳහා පුහුණු පදනම් මොඩියුලය	105	840
	නීතිමය අනුකූලතාව, ණය සහ අයකර ගැනීම	ණය අයකර ගන්නා කාර්ය මණ්ඩලය අතර ණය සහ අයකර ගැනීමට අදාළ වන නීතිමය ගැටළු පිළිබඳ දැනුම වර්ධනය කිරීම	345	2,760
	මූල්‍ය විශ්ලේෂණ ඇප ඇගයීම්, සාකච්ඡාමය හැකියාව ඇතුළුව ණය ඇගයීම් හැකියාව	ශාඛා කළමනාකරුවන් සහ ණය නිලධාරීන් ඉලක්ක කරමින් විස්තීර්ණ ණය පුහුණුව	75	6,600
	ක්‍රමෝපායික සැලසුම් කිරීම	ආයතනයේ වර්තමාන ක්‍රමෝපායික සැලසුම් සාකච්ඡා කිරීම සඳහා ඉහළ මට්ටමේ වැඩමුළු.	93	744






ඉහත පුහුණුවලට අමතරව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානය, පිරිස් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමය පවත්වන ලද විවිධ බාහිර පුහුණු වැඩසටහන්වලට සහභාගි කර ඇත.

පුහුණු සංඛ්‍යාලේඛන

G4-LA11, G4- HR02

වසර තුළ,රු.මිලියන 14.62ක මුළු ආයෝජනයක් සමඟ පුහුණු පැය 18,395ක් තුළ සේවකයින් 1,382ක් සහභාගි කරවන ලදී. සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන පැය 20ක් වූ අතර, එය පසුගිය වසරට වඩා 57% ක වැඩිවීමකි.

සේවක පුහුණුව



පුහුණු වර්ග	සහභාගිවූ සංඛ්‍යාව		පුහුණු පැය	
	2016	2015	2016	2015
අභ්‍යන්තර	1,279	1,121	17,364	9,940
බාහිර	102	86	919	952
විදේශීය	1	6	112	208
	1,382	1,213	18,395	11,100

සීමාවාසික අවස්ථා
G4-LA10

වෘත්තීය සුදුසුකම් ලබාගැනීමේ නියුක්තව සිටින උපාධි අපේක්ෂකයින් සහ සිසුන් සඳහා MBSL සීමාවාසික අවස්ථා ලබා දේ. මෙම වැඩසටහන තුළින්, සමාගම ක්‍රියාශීලී සහ අගනා ප්‍රතිඵල ලබාදෙන පරිසරයක් තුළ ප්‍රායෝගික කාර්යස්ථ සේවා පළපුරුද්ද සිසුන්ට ලබාදීමට කටයුතු කරයි. වසර තුළ, පහත දක්වා ඇති පරිදි සිසුන්ට එවැනි සීමාවාසික අවස්ථා 32ක් අපි ලබා දී ඇත.

ආයතනය/ විශ්ව විද්‍යාලය	2016	
	පිරිමි	ගැහැණු
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	6	9
ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පී ආයතනය	-	3
ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය	-	1
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	-	1
රජරට විශ්ව විද්‍යාලය	1	-
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය	-	1
වෙනත්	1	9
එකතුව	8	24

කාර්මික සම්බන්ධතා
G4-11,G4-EC5, G4- EC6, G4-LA04,G4-LA08

අපගේ සේවකයින්ට රැස්වීම් සඳහා ඇති නිදහස පිළිබඳ අයිතිය අපි පිළිගන්නා අතර අපගේ සේවකයින්ගෙන් 47%ක් ලංකා බැංකු සේවක සංගමයේ MBSL ශාඛාව නියෝජනය කරයි. ඊලඟ වසර තුන සඳහා සාමූහික ගිවිසුමක් ඇති කර ගැනීමට අපගේ වෘත්තීය සමිති සමඟ අපි සක්‍රියව කටයුතු කළ අතර, ඵලදායී සහ මිත්‍රශීලී සම්බන්ධතා තවදුරටත් පවත්වා ගනිමු. වසර තුළ කාර්මික ආරවුල්වලින් සේවාවන්ට බාධා වූ කිසිදු අවස්ථාවක් නොමැත.

මෙහෙයුම් වෙනස්වීම් සඳහා සේවකයින්ට ලබාදී ඇති අවම දැන්වීම් කාලය පහත දැක්වේ.

	2016
විශ්‍රාම	මාස 3
ඉල්ලා අස්වීම- සේවය නතර කිරීම	මාස 3


මැසිවිලි යාන්ත්‍රණ
G4-57, G4-58, G4-LA16,G4-HR12

සේවකයින්ට ඔවුන්ගේ අදහස් දැක්වීම සඳහා ව්‍යුහගත සහ විධිමත් ගැටළු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මකව පවතී. එම ක්‍රියාවලිය නිර්නාමිකත්වය සහතික කරන අතර, සේවක මැසිවිලි නිරාකරණය සඳහා විශේෂ කාර්යභාරයන් සහ වගකීම් නියම කරයි.

සේවකයින් රඳවාගැනීම
G4-LA03

සේවක සහභාගිත්වය ශක්තිමත් කිරීම සඳහා වූ අපගේ උත්සාහයන් වෘත්තීය ප්‍රගතිය සඳහා අවස්ථාවන් වැඩිකළ අතර, පුහුණු හා සංවර්ධනය තුළ අඛණ්ඩ ආයෝජනය නිසා වසර තුළ ආසන්න වශයෙන් 85%ක සේවක රඳවා ගැනීමක් වාර්තා කිරීමට සමාගමට හැකිවිය.


වයස හා ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවක පිරිවැටුම



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මානව ප්‍රාග්ධනය

පළාත හා ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවක පිරිවැටුම



මේ අතර, උපකාරී සේවා පරිසරයක් ලබාදීම තුලින් කාන්තා සේවකයින් රඳවා ගැනීමේදී සමාගමේ උත්සාහයන් පෙන්වා දෙමින් ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවයට පැමිණීමේ අනුපාතය වසර තුළ සැලකිය යුතු පරිදි වර්ධනය විය.

	2016	2015
කාන්තා සේවකයින් මුළු ගණන	346	312
ප්‍රසූත නිවාඩු ලබාගත් ගණන	16	8
ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවයට පැමිණීම	13	4
සේවයට පැමිණීමේ අනුපාතය % (ප්‍රසූත නිවාඩුවෙන් පසු සේවයට පැමිණීමේ අනුපාතය ප්‍රසූත නිවාඩු ලබාගත් ගණන)	81%	50%

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ පාර්ශවකාර අවශ්‍යතාවන් අවබෝධකර ගැනීම සහ ඒවාට සක්‍රීයව ප්‍රතිචාර දැක්වීම අපගේ වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අතර අපි අපගේ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා වැඩි කිරීමට හා ශක්තිමත් කිරීමට අවස්ථාවන් අඛණ්ඩව සොයන්නෙමු.

	2016	2015	වාර්ෂික %
යෙදවුම්			
මුළු ගනුදෙනුකාර පදනම	198,824	138,895	43
ප්‍රජා සම්බන්ධතා			
අපගේ සැපයුම්කරුවන් සමඟ හවුල්කාරත්වය			

වටිනාකම් එකතු කිරීමේ කටයුතු

- නව නිෂ්පාදන සංවර්ධනය සහ ගනුදෙනුකාර සේවා අරමුණු කළ සංස්කෘතිය
- ප්‍රජා සහභාගිත්වය තුළ අඛණ්ඩ ආයෝජනය

යෙදවුම්

	2016	2015	වාර්ෂික %
ලබාදුන් ණය සංඛ්‍යාව	33,725	19,033	77
උත්පාදිත නව තැන්පතු	45,170	31,576	43

සමාගමේ සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනයේ මූලික අංග වන්නේ,



ගනුදෙනුකාර සහභාගිත්වය

G4-PR5

ගනුදෙනුකාර සමීක්ෂණ, මුහුණට මුහුණ මැදිහත්වීම්, ගනුදෙනුකාර හඳිසි ඇමතුම් සේවාවක් සහ ආයතනික වෙබ් අඩවිය සහ ෆේස්බුක් සහ ලින්කෙඩින් ඇතුළු සමාජ ජාල ඇතුළුව විවිධ ආකාරයේ මුද්‍රිත සහ විද්‍යුත් මාර්ග සන්නිවේදනය ලබාදීම තුළින් ගනුදෙනුකරුවන් සමඟ ඉහළ මට්ටමේ සම්බන්ධතා අපි පවත්වා ගනිමු. මෙවැනි සහභාගිත්ව යාන්ත්‍රණ තුළින් ලබාගන්නා ප්‍රතිචාර අපගේ අලෙවිකරණ, ගනුදෙනුකාර සේවා සහ නිෂ්පාදන සංවර්ධන ක්‍රමෝපායන්ට මූලික යෙදවුමකි.



සමාජ ජාල සහභාගිත්වය

සහශ්‍ර වාර්ෂික අතර සන්නාම පිළිගැනීම වැඩි කිරීම පිණිස, නව ෆේස්බුක් පිටුවක් ආරම්භ කිරීමත් සමඟ වසර තුළ MBSL එහි සමාජ ජාල පැවැත්ම ශක්තිමත් කරන ලදී. එම පිටුව තුළ පවත්නා පිරිනැමීම්, නිෂ්පාදන විස්තර සහ අනාගත සහ දැනට සිටින ගනුදෙනුකරුවන්ට අදාළ වන අනෙකුත් තොරතුරු ඇතුළත්ය. අපගේ ෆේස්බුක් ග්‍රහකයින් සඳහා ඔවුන් විශාල වශයෙන් දායක වූ ප්‍රශ්න තරඟයක්ද අපි පැවැත්වූවෙමි. 2016 අවසානය වන විට, අපගේ පිටුවේ මුළු 'කැමති' ගණන 6,100 වඩා ඉක්මවා ඇත.

ගනුදෙනුකාර පැතිකඩ


ව්‍යාපාර සහ පුද්ගල වර්ධනයේ විවිධ අවස්ථාවලදී ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට සහයදීම අරමුණු කළ සාකල්‍ය වටිනාකම් කොටසක් තුළින් දිවයින පුරා පුද්ගල, ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ ණය ගනුදෙනුකරුවන් 69,347කට ආසන්න ගණනකට අපි සේවය ලබා දෙමු. 2016 දී, සේවය කරන ණය ගනුදෙනුකරුවන්ගේ මුළු සංඛ්‍යාව 36% දක්වා වැඩිවීමකට පරිවර්තනය කරමින් අපගේ ගනුදෙනුකාර පදනමට නව ගනුදෙනුකරුවන් 33,681ක් අපි එකතු කර ගත්තෙමු. එමෙන්ම, MBSL ආකර්ෂණීය ස්ථිර සහ ඉතුරුම් තැන්පතු නිෂ්පාදන පරාසයක් තුළින් 130,000කට වැඩි තැන්පතු ගනුදෙනුකරුවන්ට සේවය ලබා දේ. ගනුදෙනුකරුවන් ඔවුන්ගේ කර්මාන්ත නිරාවරණය අනුව එනම් කෘෂිකර්මය, ධීවර, කිරිපට්ටි සහ කුඩා කර්මාන්ත ලෙස වෙනස් වේ.

සංගම් සාමාජිකත්ව


G4-16

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- කොළඹ කොටස් හුවමාරුව
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා කල්බදු සංගමය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා හිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියාමන මණ්ඩලය


ණයදුන් ගණුදෙනුකරුවන්



ස්ථාවර තැන්පතු ගණුදෙනුකරුවන්




ණය කළඹ පළාත් අනුව බෙදා දැක්වීම




කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

තැන්පතු කළඹ පළාත් අනුව බෙදා දැක්වීම



ඉතුරුම් තැන්පතු



ගනුදෙනුකාර පිවිසීමේ හැකියාව

වසර කිහිපයකට පෙර ආක්‍රමණශීලී ශාඛා ව්‍යාප්තිය සමඟ, 2015 දී ඒකාබද්ධ කිරීමෙන් පසු, දිවයිනේ සියලුම පළාත් 9 තුළ ප්‍රධාන කාර්යාලය ඇතුළුව සේවා ස්ථාන 49ක ජාලයක් දැනට MBSL ක්‍රියාත්මක කරයි. අපගේ ගනුදෙනුකරුවන්ට ආසන්න වශයෙන් දිවයින පුරා ශාඛා 600කින් සමන්විත වන අපගේ පාලක සමාග මේ විස්තීර්ණ ශාඛා ජාලය තුළින් ණය ආපසු ගෙවීම්, මුදල් හා චෙක්පත් තැන්පතු සහ ස්ලිප් ගිණුම් වැනි අපගේ සීමිත සේවා රාශියක් ලබාගැනීමට හැකිය. අපගේ ගනුදෙනුකරුවන් 2017 දී අපේක්ෂිත මධ්‍ය බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ කොමර්ෂල් බැංකුවේ විස්තීරණ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය තුළින් මුදල් කරා ප්‍රවේශය ලබාගත හැකිය. ස්වයං සේවා කොටස ශක්තිමත් කිරීම තුළින් ගනුදෙනුකාර ප්‍රවේශය සහ පහසුව වැඩි කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

පළාත්	ගනුදෙනුකාර සේවා ස්ථාන
දකුණු	6
නැගෙනහිර	4
උතුරු මැද	5
බස්නාහිර	20
ඌව	2
වයඹ	4
මධ්‍යම	4
සබරගමුව	2
උතුර	2

ගනුදෙනුකාර අධ්‍යාපනය සහ මූල්‍ය පුහුණුව

G4-SO1,G4-SO2,G4-SO4,

මූල්‍ය අන්තර්කරණය පිළිබඳ ජාතික සමාජ ආර්ථික ඉලක්ක, කලාපීය සංවර්ධනය සහ කාන්තා සවිබලගැන්වීම සමඟ අනුකූලව යමින්, අප ව්‍යුහගත පුහුණු වැඩසටහන් තුළින් අපගේ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් අතර මූල්‍ය විනය හා පුහුණුව ශක්තිමත් කිරීම තුළ MBSL අඛණ්ඩව ආයෝජනය කරයි. 'සියත් සවිය' වැඩසටහන අත්‍යවශ්‍ය අංගයක් ලෙස ඉදිරියට ගෙන යමින්, දිවයින පුරා මෙම වැඩසටන්වලින් ඉතුරුම්, ව්‍යවසාය සංවර්ධනය සහ මුදල් කළමනාකරණය ආවරණය වන විෂයන් රාශියක් පිළිබඳ MBSL සේවකයින් සහ බාහිර ප්‍රවීනයින් විසින් දේශන සහ වැඩමුළු පවත්වන ලදී. වසර තුළ, අනාගත කාන්තා ව්‍යවසායකයින් සහ MBSL හි ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් 110 කගේ සහභාගිත්වයෙන් මොණරාගල චිවැනි වැඩසටහනක් පවත්වමින් කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සමඟ අපි කටයුතු කළෙමු.





වගකීම්සහගත ණයදීමේ ව්‍යවහාර
G4-SO8, G4-PR2,G4- PR3, G4- PR4, G4-PR6,G4-PR9

අපගේ නිෂ්පාදන හා සේවාවන්ට අදාළ වන නියමයන් සහ කොන්දේසි සියලුම ගනුදෙනුකරුවන්ට පැහැදිලිව අවබෝධ කරදෙන බව අපි සහතික කරමු. ණය හා තැන්පතු මත පොළි අනුපාත, විනිමය හුවමාරු අනුපාත සහ වෙනත් නියමයන් වැනි අදාළ තොරතුරු සියලුම ගනුදෙනුකරුවන් වෙත අපි පැහැදිලිව සන්නිවේදනය කරමු. CBSL අවශ්‍යතා සහ අනෙකුත් අදාළ නීතිකරණයන්ට අනුකූල වන විස්තරාත්මක නිෂ්පාදන පොත් පිංච සියලුම ගනුදෙනුකරුවන්ට ලබාගැනීමට සලස්වා ඇත. අලෙවිකරණ නිලධාරීන් සහ සම්බන්ධතා කළමනාකරුවන් නිෂ්පාදනවල ලක්ෂණ, පිරිවැය ව්‍යුහය, ප්‍රතිලාභ, සහ වෙනත් යම් අදාළ තොරතුරු අනාගත සහ දැනට සිටින ගනුදෙනුකරුවන් වෙත විස්තර කර දීම සඳහා වගකීමට බැඳී සිටී. වසර තුළ, අදාළ නිෂ්පාදන හා සේවාවන්ට අදාළ රෙගුලාසි හෝ වෙනත් මාර්ගෝපදේශවලට අනුකූල නොවූ අවස්ථා නොමැත.

මේ සමඟම, සමාගමේ අලෙවිකරණ සන්නිවේදන නිරවද්‍යතාව. අදාළ රෙගුලාසි අවශ්‍යතා සහ අපගේ සන්නාම මාර්ගෝපදේශවලට අනුකූල බව සහතික කිරීමට අපි ව්‍යූහගත අනුමත කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කරමු. වසර තුළ, අලෙවිකරණ සන්නිවේදනවලට අදාළ රෙගුලාසි, ස්වේච්ඡා සංග්‍රහ හෝ වෙනත් මාර්ගෝපදේශවලට අනුකූල නොවූ අවස්ථා නොමැත.

ගනුදෙනුකාර රහස්‍යතාව
G4-PR07, GR-PR08

මූල්‍ය ආයතනයක් ලෙස, අපගේ ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය සහ පුද්ගලික තොරතුරු ඉදිරිපත් කිරීමේදි අපට වැදගත් බැඳීමක් ඇති බව අපි අවබෝධ කර ගනිමු. 2016 දී, අපගේ තොරතුරු පද්ධතිවල ගිනි වැට සහ වාර්තාකරණ හැකියාවන් ශක්තිමත් කිරීම තුළ අපි ආයෝජනය කළ අතර, තොරතුරු තාක්ෂණ (IT) ප්‍රතිපත්තිය CBSL පාදම් රේඛා ආරක්ෂිත ප්‍රමිතිවලට සරිලන පරිදි සකස් කරන ලදී. සමාගම තුළ IT ආරක්ෂක කවුන්සිලයක්ද ක්‍රියාත්මක වන අතර ඒ මගින් තොරතුරු ආරක්ෂණ ක්‍රියාමාර්ගවල අවශ්‍ය වර්ධනයන් විධිමත්ව සමාලෝචනය කරනු ලබයි. වසර තුළ, ගනුදෙනුකාර රහස්‍යතාවට අදාළ රෙගුලාසි, ස්වේච්ඡා සංග්‍රහ හෝ වෙනත් මාර්ගෝපදේශවලට අනුකූල නොවූ අවස්ථා නොමැත

ගනුදෙනුකාර මැසිවිලි
G4-S011

සියලුම ගනුදෙනුකාර පැමිණිලි සඳහා විධිමත් කළ මැසිවිලි නිරාකරණ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මකව පවතී. ගනුදෙනුකරුවන්ට ඇමතුම් මධ්‍යස්ථානය තුළින් හෝ සියලුම ශාඛාවන්හී යෝජනා පෙට්ටි තුළින් මැසිවිලි සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබා දේ. ලැබුනු සියලුම මැසිවිලි වාර්තා කරන අතර, ප්‍රතිචාර සඳහා ගනුදෙනුකාර සේවා ඒකකය වෙත යවනු ලැබේ. ක්‍රියාවලි සහ ගුණාත්මකභාවය වර්ධනයන් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට මැසිවිලි දත්ත පසුකාලීනව විශ්ලේෂණය කරනු ලබයි.

MBSL ඇමතුම් මධ්‍යස්ථානය සහ ගනුදෙනුකාර සේවා ඒකකය ගනුදෙනුකරුවන්ගේ සියලුම මැසිවිලි පිළිබඳ සොයා බලන අතර සේවාවන්හී ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනයන් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට මේවා පසුකාලීනව විශ්ලේෂණය කරනු ලබයි. සමාගම එහි සේවා ලබාදීම වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින් පසුගිය වසර කිහිපය තුළ ගනුදෙනුකාර පැමිණිලි අඛණ්ඩව පහත වැටී ඇත.

ව්‍යාපාර හවුල්කරුවන්
G4-12, G4-13,G4-EC9, G4-HR6

MBSL අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ සිට උපයෝගිතා සේවා සපයන්නන් සහ වත්කම් සපයන්නන් දක්වා පරාසයක විවිධ පාර්ශවයන්ගෙන් නිෂ්පාදන සහ සේවා ලබා ගනිමු. සමාගමේ ප්‍රතිසම්පාදන වියදම්න් ආසන්න වශයෙන් 99%ක් දේශීය සැපයුම්කරුවන් වෙනුවෙනි.

දූෂණ සහ වංචා අවස්ථා ප්‍රමිතිගතකරණ සහ විනිවිද ක්‍රියාවලිය තුළින් අවම කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ප්‍රතිසම්පාදන අත්පොත සහතික කරයි. අත්පොතේ දක්වා ඇති නියමයන් ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා විශේෂ ප්‍රතිසම්පාදන කමිටුවක් ද ක්‍රියාත්මකය. ප්‍රසිද්ධ ටෙන්ඩර් වාර්ෂිකව කැඳවන අතර සැපයුම්කරුවන් තෝරීම. ක්‍රියාවලියේ අවංකභාවය සහතික කරමින් සම්පූර්ණයෙන්ම ස්වාධීන තෙවන පාර්ශවයක් විසින් සිදු කරනු ලබයි. තෝරාගත් නව සැපයුම්කරුවන් මධ්‍ය දත්ත පදනමක් මත ලියාපදිංචි කෙරේ.



ප්‍රජා සම්බන්ධතා
G4-S01

වසර ගණනාවක් පුරා අපි පෝෂණය කර ඇති ප්‍රජා සම්බන්ධතා අපට ක්‍රියාත්මක වීමට සමාජීය බලය ලබාදෙන අතර, අපි ක්‍රියාත්මක වන ප්‍රජාවන්ට තිරසාර වටිනාකමක් අති කිරීමට අපට හැකියාව ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම විසින් කරගෙන යන සියලුම ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් එහි තිරසාරාත්මක පරමාර්ථවලට පුළුල්ව ගැලපෙන බව සහතික කිරීම සඳහා සම්පූර්ණ වගකීම දරයි. මෙම ව්‍යාපෘති තේරීම, ඵලදායීව ක්‍රියාත්මක කිරීම සහ කාර්යසාධනය නියාමනය කිරීම පිළිබඳ වගකීම ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම වෙත පැවරේ. වසර තුළ, අධ්‍යාපනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය යන විශේෂ ක්ෂේත්‍ර දෙක කෙරෙහි අපගේ ආයතනික සමාජ වගකීම් අවධානය යොමුකළ අතර සක්‍රීය සහ උපායමාර්ගික ආකාරයකින් ප්‍රජාවන් සමඟ සහභාගිවීමට අපි උත්සාහ ගනිමු.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ව්‍යවසායකත්ව සංවර්ධනය

අපගේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන වන 'සියත් සවිය' අවදානම් පැතිකඩ හේතු කොට ගෙන අරමුදල් පිළිබඳ අනෙකුක් ස්ථාන කරා ප්‍රවේශය සීමා වී ඇති ග්‍රාමීය ව්‍යවසායකයින්ට මූල්‍ය සහය ලබාදීමේදී අපගේ තිරසාරාත්මක වැඩසටහන සමඟ අපගේ ව්‍යාපාර පරමාර්ථ සම්බන්ධ කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ, කෘෂිකර්මය, සුළු ව්‍යාපාර සහ කිරි නිෂ්පාදනවල නියලී සිටින පුද්ගලයින් වෙත ඇප රහිත ණය අපි ලබා දෙන්නෙමු. රටෙහි උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල කාන්තාවන් සහ ව්‍යවසායකයින් ඇතුළුව අවදානමට ලක්වන කණ්ඩායම්වලට මූලික වශයෙන් ප්‍රතිලාභ ලබාදීමට මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

2010 දී එහි ආරම්භයේ සිට, මූල්‍ය සහය, තාක්ෂණික සහය සහ වෙනත් ආකාරයේ උපදෙස් තුළින් ආසන්න වශයෙන් ව්‍යවසායකයින් 25,000කගේ ජීවනෝපායන්ට අපි සහය ලබා දී ඇත. දියත් සවිය වැඩසටහන පාසැල් තුළින් මෙම ප්‍රජාවන්ට සෘජුවම ප්‍රතිලාභ ලබා දී ඇත.



අධ්‍යාපනය

MBSL ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ඇතුළුව විශ්ව විද්‍යාල, වෘත්තීය ගිණුම්කරණ ආයතන කිහිපයක් සඳහා අනුමත පුහුණු හවුල්කරුවෙක් වන අතර, ඒ මගින් සීමාවාසික අවස්ථාවන් සහ ස්ථාපනයන් තුළින් සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා අවස්ථාවන් ලබා දේ.

වසර තුළ, තරුණ සිසුන්ගේ දක්ෂතා මට්ටම සහ රුකියාවක් කිරීමේ හැකියාව වැඩි කිරීම කරා සාපුවම දායක වෙමින් එවැනි සීමාවාසික අවස්ථා 32ක් අපි ලබාදී ඇත.

2016 දී, MBSL ළමුන්ගේ සාක්ෂරතා දැනුම සංවර්ධනය කිරීම පිණිස දායකවෙමින් කියවීමේ පුරුද්ද වැඩිකිරීමේ පරමාර්ථය ඇතිව ධර්මපුරම් උලවනුර් ළමා සමාජයට පොත් තොගයක් පරිත්‍යාග කරන ලදී. රු. මිලියන 0.025ක මුළු ආයෝජනයක් වූ, මේ මගින් 50කට වැඩි සිසුන්ට සෘජුවම ප්‍රතිලාභ ලැබුනි. ග්‍රාමීය පාසල් තෝරාගෙන ආධාර සහිතව අඛණ්ඩ වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කෙරේ. වසර තුළ, අරණායක ගංවතුරට අදාළ පරිපාලන කාර්යයන්ට සහයවීම සඳහා රු.මිලියන 0.44කට ආසන්න වටිනාකමින් යුත් පරිගණක 5 ක් පරිත්‍යාග කරන ලදී.



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

ස්වභාවික ප්‍රාග්ධනය

මූල්‍ය සේවා සපයන්නෙක් වශයෙන්, අපගේ ණයගැතියන් අපගේ ව්‍යාපාරය සහ ක්‍රියාවලීන් මගින් සිදුවිය හැකි සෘණාත්මක පාරිසරික බලපෑම් පිළිබඳ දැනුවත් බව සහතික කරමින් පරිසර හිතකාමී ව්‍යාපාර භාවිතාවන් ව්‍යාප්ත කිරීමේදී අපගේ හැකියාවන් අපි හඳුනා ගනිමු. සමාගම එහි ස්වාභාවික සම්පත් භාවිතය සහ අපද්‍රව්‍ය සහ අනිකුත් ඉවතලන දෑ බැහැරකිරීම අඩණ්ඩව නියාමනය කිරීම තුළින් එහි මෙහෙයුම්වල සෘජු පාරිසරික බලපෑම් අවම කිරීමට බැඳී සිටී.

G4-EN06

රු.මි.	2016	2015	වාර්ෂික %
යෙදවුම්			
කඩදාසි	3.77	3.60	5
ජලය	1.41	1.83	(22)
බලශක්තිය	32.34	31.10	4


වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රම

- කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය
- බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට ඒකාබද්ධ උත්සාහයන්
- ජලය සංරක්ෂණය තුළ සේවක සහභාගිත්වය
- විශාල ණය සඳහා පාරිසරික නිවාරණ නිර්ණායක

නිමවුම් සහ යෙදවුම්	
ප්‍රතිචක්‍රීයකරණය කළ ඉවතලන කඩදාසි- ප්‍රධාන කාර්යාලය	720 ක්‍රි.ග්‍රෑ.
අඩුකළ ජල පිරිවැය	22%
අඩුකළ ලිපිද්‍රව්‍ය භාවිතය	15%

කළමනාකරණ ප්‍රවේශය

මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස, සමාගමේ පාරිසරික බලපෑම බලශක්තිය, ජලය සහ කඩදාසි සහ යෙදවුම් වැනි ස්වභාවික සම්පත් පරිභෝජනය සීමාකරනු ලැබේ. අදාළ සියලුම පාරිසරික දර්ශක ස්ථාවර පදනමක් මත දැඩිව අනුගමනය කරන බව සමාගමේ පාරිසරික කළමනාකරණ වැඩපිළිවෙල මගින් සහතික කරන අතර ඉන් තවදුරටත් වර්ධනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීමට සහය ලබා දේ.



ණයදීමේ ව්‍යවහාර

G4-14,G4-32, G4-33, G4-EN27, G4-EN32, G4-EN33, G4-HR1, G4-FS7, G4-FS8

පහසුකම් සඳහා පාරිසරික නිවාරණ නිර්ණායක ඇතුළත් කර ගනිමින් යහපත් පාරිසරික ව්‍යවහාර ව්‍යාප්ත කිරීමට අපි උත්සාහ ගනිමු. ඒ අනුව, මෙම පහසුකම් සඳහා සමාගමේ ණය නිර්ණායකයට මධ්‍යම පරිසර අධිකාරියට සහ අනෙකුත් අදාළ පාරිසරික රෙගුලාසිවලට ගනුදෙනුකරුගේ අනුකූලතාව පිළිබඳ තක්සේරුව ඇතුළත්ය. ව්‍යාපාරයෙන් සිදුවිය හැකි සෘණාත්මක පාරිසරික ගම්‍යාර්ථයන්ද අගයනු ලැබේ. සමාගම ණය ලබාදීමේදී සහ නව නිෂ්පාදන සංවර්ධනය කිරීමේදී පූර්ව අවවාද මූලධර්ම යොදා ගනී.

සමාගම කාබන් විමෝචනය සහ පොසිල ඉන්ධන කෙරෙහි විශ්වාසය අඩුකිරීමේ පර්මාර්ථයෙන් විශේෂ කල්බදු නිෂ්පාදන තුළින් හයිබ්‍රිඩ් හා ඉලෙක්ට්‍රිකල් වාහන භාවිතය දිරිමත් කර ඇත. 2016 දී, සමාගම හයිබ්‍රිඩ් හා ඉලෙක්ට්‍රිකල් වාහන සඳහා පිළිවෙලින් රු.මිලියන 13.56ක් සහ රු.මිලියන 6.85ක් ලබාදී ඇත.

හයිබ්‍රිඩ් වාහන	රු.මි.
2016 දෙසැ. අවසානයට ණය කළඹ (දළ)	95.80
2016 දී වියදම් කිරීම	13.56
ඉලෙක්ට්‍රිකල් වාහන	
2016 දෙසැ. අවසානයට ණය කළඹ (දළ)*	28.78
2016 දී වියදම් කිරීම	6.85

අනුකූලතාව සහ ආයෝජනය

G4-EN-29

සියලුම පාරිසරික රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා වගකීම අනුකූලතා අංශයට පැවරෙන අතර මාසික අනුකූලතා වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දේ. වසර තුළ පාරිසරික රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නොමැත.

කළමනාකරණ යෙදවුම්

අමුද්‍රව්‍ය

G4-EN1

සමාගමේ මූලික අමුද්‍රව්‍යය කඩදාසි වන අතර, එය එහි දෛනික මෙහෙයුම් තුළ පරිභෝජනය කෙරේ. මෙම යෙදවුම කළමනාකරණය පිණිස අපගේ ප්‍රවේශය අඩුකිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රියකරණ ක්‍රමෝපාය මත පදනම් වේ. (3R -Reduce, Reuse and Re-cycle)ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය මගින්ද කඩදාසි භාවිතය අඩුකිරීම දිරිමත් කර ඇත. නිදසුනක් ලෙස, ස්වයංක්‍රීයකළ සේවක පැමිණීම් ක්‍රමයක් හඳුන්වාදීම තුළින් නිවාඩු ඩිපිටල් ලෙස අයදුම්කිරීම වැනි පරිපාලන කාර්යයන් කරගෙන යාමට සේවකයින්ට ඉඩදේ.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

ස්වභාවික ප්‍රාග්ධනය


වාර්ෂික වාර්තා විශේෂ ඉල්ලීම් අවස්ථා හැරුණ විට පමණක් දෘඪ පිටපත්වලින් ලබා දේ. එමෙන්ම අපි අනවශ්‍ය මුද්‍රණය සහ ඡායාපිටපත් ගැනීම සක්‍රීයව අධෛර්යමත් කරමු.



නවීනතම හරයාත්මක බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් ගනුදෙනුකරුවන්ට සන්නිවේදනය සඳහා ඩිජිටල් අවස්ථා මෙන්ම ස්වයං සේවා කොටස් ඇති කිරීම මගින් සමාගමේ කඩදාසි පරිභෝජනයෙහි සැලකියයුතු අඩුකිරීමකට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2016 දී, සමාගමේ මුළු කඩදාසි භාවිතය 291,761 දක්වා 17%කින් අඩුවී ඇත.

ඒ මගින් සේවකයින් අතර කඩදාසි භාවිතය අඩුකිරීම ඉදිරියට ගෙනයාම සඳහා වන අපගේ උත්සාහයන් සනාථ කර ඇත.

කඩදාසි භාවිතය



කඩදාසිවලට අමතරව, සමාගමේ අනිකුත් අමුද්‍රව්‍යවලට ලිපිගොනු, ටෝනර්ස් සහ රිබන් ඇතුළත් වන අතර මෙම අමුද්‍රව්‍ය භාවිතය පහත පරිදි වේ.

	2016	2015	වාර්ෂික %
යෙදවුම් (ඒකක)			
කඩදාසි	291,761	349,887	(17)
ලිපිගොනු	15,568	12,601	24
ටෝනර්	407	389	5
රිබන්	430	370	16
වෙනත්	7,794	6,377	22
එකතුව	315,960	369,624	

බලශක්තිය

G4-EN3, G4-EN5, G4-EN6, G4-EN30

බලශක්ති මූලාශ්‍ර ජාතික පද්ධතියෙන් ලබාගන්නා විදුලිය සහ සමාගමට අයත් වාහනවලට භාවිතා කරන ඉන්ධනවලින් සමන්විත වේ. සමාගමේ බලශක්ති පා සටහන ඵලදායීව ග්‍රහණය කර ගැනීමට සහ වර්ධනය සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සමාගමේ බලශක්ති පරිභෝජනය ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවන්හී පරීක්ෂා කරනු ලබයි. සමාගමේ විදුලි පරිභෝජනය වසර තුළ 12%කින් වැඩි වී ඇත. සාකල්‍ය සහ ක්‍රමානුකූල ආකාරයකින් සමාගමේ ඉන්ධන පරිභෝජනය ග්‍රහණය කිරීමට යාන්ත්‍රණ අපි ක්‍රියාත්මක කර ඇත. වසර තුළ, සමාගමේ ඉන්ධන පිරිවැය පසුගිය වසරට සාපේක්ෂව 38%කින් වැඩිවිය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සහ ආපසු අයකර ගැනීම් පිළිබඳ වර්ධිත උත්සාහයන් හේතු විය.

මූලාශ්‍රය	ඒකක පරිභෝජනය - 2016	ඒකක පරිභෝජනය - 2015
විදුලිය -ඒකක	1,269,818	1,138,679
පෙට්රල් -ලීටර්	11,158	අ/නැ
ඩීසල් - ලීටර්	17,281	අ/නැ
සේවකයෙකුට විදුලිය පරිභෝජනය -ඒකක	1,385	1,315
සේවකයෙකුට ඉන්ධන පරිභෝජනය - ලීටර්	31	අ/නැ

අ/නැ - අදාළ නැත


පහත විස්තර කරන පරිදි සමාගමේ බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කරා ස්ථිර උත්සාහයන් සිදුකරන ලදී.



ජලය

G4-EN8, G4-EN9, G4-EN10

සමාගමේ මෙහෙයුම් ජලය මත සිදු නොවූවද සේවකයින් විසින් පරිභෝජනය සඳහා පමණක් ජලය භාවිතා කරයි. සේවකයින් ප්‍රදර්ශන, පෝස්ටර් සහ කාලීන දැන්වීම් තුළින් අඩු ජල පරිභෝජනය තුළ සහභාගි කෙරේ. වසර තුළ, සමාගමේ මුළු ජල පරිභෝජනය ඒකක 17,616කින් අඩු වූ අතර, ජල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා වන අපගේ උත්සාහයන් සනාථ කරමින් සේවකයෙකුට ජල පරිභෝජනය 8%කින් පහත වැටුණි.



නිමවුම් කළමනාකරණය

අපද්‍රව්‍ය සහ අපජලය

G4-EN2, G4-EN23

සමාගමේ මෙහෙයුම්වලින් ඇතිවන ප්‍රධාන වර්ගයේ අපද්‍රව්‍ය වන්නේ කඩදාසි සහ ඊ- අපද්‍රව්‍ය වේ. කඩදාසි අපද්‍රව්‍ය ප්‍රධාන කාර්යාලයේදී එකතු කරන අතර ප්‍රතිචක්‍රීයකරණය සඳහා යවනු ලබයි. සමාලෝචිත වසර තුළ, සමාගම කිලෝ ග්‍රෑම් 720ක් ප්‍රතිචක්‍රීයකරණය කළ අතර පසුගිය වසරට වඩා මෙය දෙගුණයකට ආසන්න වේ. ඊ- අපද්‍රව්‍ය වගකීමෙන් බැහැර කරන අතර, නැවත භාවිතා කළ හැකි පරිගණක දෘඩාංග අධ්‍යාපනය තුළ සමාගමේ ආයතනික වගකීම් පුරවැසි වැඩසටහනේ කොටසක් ලෙස ප්‍රාථමික පාසල්වලට යවනු ලැබේ.

(රු.මි.)	ගණන	පිරිවැය
පරිගණක උපාංග	112	3.35
කාර්යාල උපකරණ	අ/නැ	0.59

අ/නැ- අදාළ නැත

කාලගුණ වෙනස්වීමේ බලපෑම්

G4-EC2

සමාගම එහි මෙහෙයුම් කෙරෙහි කාලගුණ වෙනස්වීම්වල බලපෑම් ගණනය කර නොමැත. එසේවුවත්, මූල්‍ය සේවා ආයතනයක් ලෙස, කාලගුණ වෙනසෙහි ගම්‍යාර්ථ අහිතකර කාලගුණ තත්ත්වයන් සහ නියඟවලින් පීඩාවට පත්වන කෘෂිකර්මය සහ ධීවර වැනි ක්ෂේත්‍රයන් හි සමාගමේ ණය කළඹට බලපෑම් විය හැකිය.



නව්‍යකරණ මූල්‍ය විසඳුම් සපයන්නෙක් වීම වන අපගේ දැක්ම කරා අප ඉදිරියට යමින්

ශක්තිමත් ආයතනික පාලන ව්‍යවහාර සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ වැඩපිළිවෙල අපගේ වටිනාකම් නිර්මාණය තහවුරු කරන අතර ව්‍යාපාර පරිචයන්හී ඉහළම ප්‍රමිති මත අවධාරණයක් සහිතව සදාචාරාත්මක සහ විනිවිදභාවයකින් අප ආයතනය කළමනාකරණය කරන බව සහතික කරයි.

කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනික කළමනාකාරිත්වය

ආයතනික යහපාලනය

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

විගණන කමිටු වාර්තාව

පාරිශ්‍රමික කමිටු වාර්තාව

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

ඒකාබද්ධ කළමනාකරණ කමිටු වාර්තාව

අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය





1. ආචාර්ය එස්.ලොකුහේවා මහතා - සභාපති
2. සී.එන්. විජේවර්ධන මහතා - අධ්‍යක්ෂ
3. ඩී.එම්. ගුණසේකර මහතා - අධ්‍යක්ෂ
4. ඩබ්.පී.ආර්.පී.එච්. ගොන්සේකා මහතා - අධ්‍යක්ෂ
5. කේ.බී.එස්.බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
6. එන්. පෙරේරා මහතා - අධ්‍යක්ෂ
7. එස්.එන්. දයාරත්න මහතා - අධ්‍යක්ෂ
8. එස්.පී. අර්ෂකුලරත්න මහතා - අධ්‍යක්ෂ
9. එච්.ජේ.ඩී. ගොන්සේකා මහතා - අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය එස්. ලොකුහේවා
සභාපති
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ආචාර්ය ලොකුහේවා දැනට දනරොසෝ හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ සහ යුනිවර්සල් කන්සල්ටන්සි සර්විසස් (පුද්ගලික) සමාගමේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂවරයාද වේ. මෙම තනතුරු 2009 සිට දරා ඇත. ඔහු නිශ්චල දේපල සංවර්ධනය, සූර්ය බලශක්ති නිෂ්පාදන, ඉතාලියන් කොෆි ෂොප්ස්, උපදේශන සේවාවන් ඇතුළුව විවිධ ව්‍යාපාර කළමනාකරණයන්හී නියැලී සිටී. පිළිගත් සමාගම්වල ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරුවල වසර විස්සකට වැඩි පළපුරුද්දක් සහ තොරතුරු තාක්ෂණය, නිශ්චල දේපල, රත්‍රන් වෙළෙඳාම, ඖෂධ, සූර්ය බලශක්ති, වායු සම්කරණ පිරියත, සහ සත්කාරක ව්‍යාපාරය තුළ වසර දහයකට වැඩි පළපුරුද්ද ඔහු සතු වේ. එමෙන්ම ඔහු වසර පහක කාලසීමාවක් සඳහා ඊඒපී ඊජන්ට් සමූහයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරියා විය.

2011 දී, ආචාර්ය ලොකුහේවා කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළ සමාගම වෙනුවෙන් මැලේසියාවේ හිටපු අගමැති ආචාර්ය මහතීර් මොහමඩ් විසින් ඉදිරිපත් කළ විශිෂ්ඨතම දේපල සංවර්ධන සමාගම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මාස්ටර් ක්ලාස් ප්‍රදානයේ සම්මානලාභියා විය. මධ්‍යම කළමනාකරණය තුළ ඔහුගේ වෘත්තිය තුළ, අඛණ්ඩව වසර පහක් සඳහා ඔහු විශිෂ්ඨතම ශාඛා කළමනාකරු වශයෙන් පිදුම් ලබා ඇත. ආචාර්ය ලොකුහේවා 2016 නොවැම්බර් MBSL රක්ෂණ සමාගමේ (MBSLI) සභාපති ලෙස පත්කරන ලදී. ආචාර්ය ලොකුහේවා ග්‍රීසියේ විවෘත ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය (Ph.D.) උපාධිධාරියෙකි.

සී. එන්. විජේවර්ධන මහතා
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

විජේවර්ධන මහතා විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද අතර 2016 ජූනි MBSL රක්ෂණ සමාගමේ (MBSLI) විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලදී.

වෘත්තියෙන් ඉංජිනේරුවරයෙක් වන විජේවර්ධන මහතා එක්සත් රාජධානියේ හල් විශ්ව විද්‍යාලයෙන් ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස් සහ සන්නිවේදනය පිළිබඳ ගෞරව උපාධිය BSc ලබාගෙන ඇත. ඔහුගේ සේවා පළපුරුද්ට IBM ලෝක වෙළෙඳ සහයෝගිතාවයේ සේවා කාලය ඇතුළත්ය. එම ආයතනයේ ඔහු ශ්‍රී ලංකා මෙහෙයුම්වල පද්ධති ඉංජිනේරු සහ අලෙවි කළමනාකරු ලෙස සහ පසුකාලීනව මෙරට සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරන ලදී. එමෙන්ම ඔහු හොන් කොන් හී IBM ආසියා පැසිසික් සමූහයේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන ලද අතර සියලුම IBM's AS/400 මාලා සඳහා ආසියා පැසිපික් හී ජනතා අලෙවිකරණ වැඩසටහන්වල ප්‍රධානියා විය. විජේවර්ධන මහතා IBM ශ්‍රී ලංකා හි අලෙවිකරණ කණ්ඩායම මෙහෙයවූ අතර සිංගප්පූරුවෙන් පිටත IBM ASEAN මෙහෙයුම් සඳහා AS/400 ජනතා අලෙවිකරණ වැඩසටහන කළමනාකරණය කරන ලදී. විජේවර්ධන මහතා ඔස්ට්‍රේලියාවේ සිඩ්නි පදනම්ව ලෙක්ස්මාර්ක් ඉන්ටර්නැෂනල්ස් ඒෂියා පැසිපික් මෙහෙයුම් හි සේවය කර ඇත. ලෙක්ස්මාර්කි හී, ඔහු කලාපීය කළමනාකරු ලෙස කටයුතු කළ අතර එහිදී පාකිස්ථානය, ඉන්දියාව, බංග්ලාදේශය, ශ්‍රී ලංකාව, මියන්මාරය, මාල දිවයින, සහ නවසීලන්තය තුළ ලෙක්ස්මාර්ක් නිෂ්පාදන බෙදා හැරීම සහ සේවා මෙහෙයුම් ව්‍යාප්ත කරන ලදී, ඔහු විවිධ සංස්කෘති සහ උප සංස්කෘතින්හී ඵලදායී මාර්ග මෙහෙයුම් ස්ථාපිත කිරීම සඳහා පිළිගනී.

ඩී.එම්.ගුණසේකර මහතා
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

ගුණසේකර මහතා ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී වන අතර 2013 පෙබරවාරි මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ ෆිනෑන්ස් පීවිල්සි වෙත පත්කරන ලදී. 2016 ජූලි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ ලෙස නැවත පත්කරන ලදී.

ගුණසේකර මහතා ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, විකුණුම් සහ මාර්ග කළමනාකරණය සහ අන්තර් ජාතික බැංකුකරණ මෙහෙයුම් හි 34 වසරක විවිධ ක්ෂේත්‍රයන්හි බැංකුකරණ පළපුරුද්ද සතු බැංකුකරුවෙකි. ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත්කිරීමට පෙර. මෙවැනි ක්ෂේත්‍රයන්හි ප්‍රධාන ආයතනික කළමනාකරණ තනතුරු ගණනාවක් ඔහු දරා ඇත. ඔහුට ණය කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විස්තීර්ණ පළපුරුද්ද ඇත.

කොළඹ විශ්ව විද්‍යාලයේ රාජ්‍ය මුදල් සහ බදුකරණය පිළිබඳ විශේෂ උපාධිධරයෙක් වන ඔහු ජපානයේ විදේශීය තාක්ෂණික ශිෂ්‍යත්ව සහ සංගමය (AOTS) විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ ආයතනික කළමනාකරණය පිළිබඳ වැඩසටහන (LKCM2) සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙනිසෙල්වෙනියාවේ වාර්ටන් විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකාවේ ආයතනික කළමනාකරණය පිළිබඳ උසස් කළමනාකරණ වැඩසටහන (AMP63) සාර්ථකව අවසන් කර ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සමාජිකයෙකි.

ඔහු විධායක නොවන නම්කළ අධ්‍යක්ෂවරයෙක් ලෙස ලංකා බැංකුව (එක්සත් ජනපදය) ඇතුළුව ලංකා බැංකුවේ පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇත. එමෙන්ම ඔහු ලංකා බැංකුවේ කළමනාකරණ සහ සහය සේවා පුද්ගලික සමාගම, සී බෑන්ක් හොලිඩේ හෝම්ස් පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා බැංකු සංගමයේ (ඇප) සමාගම, සහ ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇප) සමාගම වෙනුවෙන් 2016/2017 වසර සඳහා මණ්ඩලවල මුලසුන දරයි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) පාලන මණ්ඩලයේ සාමාජිකයෙක්ද වන අතර වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ (APB ශ්‍රී ලංකා) සාමාජිකයෙකි.

ඔහු 2016/2017 වසර සඳහා ආසියා පැසිෆික් ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමයේ (APRACA) උප සභාපති ලෙස පත් කරනු ලැබ ඇත.

ඔහු ඩුබායි හි ලෝක තිරසාර කොන්ග්‍රසය විසින් 2016, 100 ග්ලෝබල් තිරසාර නායකයින් (CEO) සම්මානයෙන් පිදුම් ලබා ඇත. මෙම ප්‍රදානය අති ශ්‍රේෂ්ඨ තිරසාර නායකයින් ලෙස වඩාත් කීර්තිමත් වෘත්තීය සහ සංවිධාන හඳුනාගැනීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලය

ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

ෆොන්සේකා මහතා ලංකා බැංකුව විසින් නම් කළ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. ඔහු කළමනාකරණ පුහුණුකරුවෙක් ලෙස 1990දී ලංකා බැංකුවට එක්වී ඇති අතර, දැනට බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර දරයි. ෆොන්සේකා මහතා ශාඛා මෙහෙයුම්වලින් ඔහුගේ බැංකුකරණ වෘත්තිය ආරම්භ කර ඇති අතර, වාණිජ බැංකුකරණයේ සියලුම අංශයන්හී 27 වසරක විස්තීර්ණ පළපුරුද්ද ඔහුට ඇත. ඔහු මූල්‍ය කළමනාකරණය සහ ක්‍රමෝපායික සැලසුම් කිරීමෙහි විශේෂිත වන අතර, ලංකා බැංකුව තුළ ඵලදායී, ආයතනික සැලසුම් ක්‍රියාවලියක්, අයවැය පාලන පද්ධතියක් යනාදිය ක්‍රියාත්මක කර ඇත. ඔහු ලංකා බැංකුවේ අයවැය සහ ක්‍රමෝපායික සැලසුම්, පාරිභෝගික බැංකුකරණය සහ මූල්‍ය හා සැලසුම් ඇතුළුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු රාශියක් දරා ඇත.

ඔහු 2012 නොවැම්බර් සිට ට්‍රාන්සිෂනල් ලංකා සොලූයුෂන්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සභාපති ලෙස කටයුතු කරයි. ෆොන්සේකා මහතා ලංකා සිකියුරිටීස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද පත්කරනු ලැබ ඇත. ඔහු ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පීඑල්සී සහ MBSL රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරයි. ඔහු ලංකා ක්ලියර් පුද්ගලික සමාගමේ විකල්ප අධ්‍යක්ෂ වන අතර, ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පීඑල්සී, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්නස් පීඑල්සී සහ ලංකා ක්ලියර් පුද්ගලික සමාගමේ විගණන කමිටුවල සභාපති ලෙස කටයුතු කරයි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ උපාධිය, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

කේ.බී.එස්. බණ්ඩාර මහතා
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

බණ්ඩාර මහතා ලංකා බැංකුවට අනුයුක්ත කර ඇති අතර දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි හා මාර්ග කළමනාකරණ) තනතුර දරයි. ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම්, භාණ්ඩාගාර කළමනාකරණය, ආයතනික ණයදීම, සංවර්ධන බැංකුකරණය සහ ඉලෙක්ට්‍රොණික බැංකුකරණ මාර්ග ඇතුළුව බැංකුකරණය තුළ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක සේවය කරමින් පුළුල් පළපුරුද්දක් ඔහු සතු වේ. එමෙන්ම ඔහු 2011-2012 කාලය තුළ ලංකා බැංකුවේ (චීක්සත් ජනපදය) ප්‍රධාන විධායක නිලධාරී ලෙස ලන්ඩන්වල බැංකු මෙහෙයුම් මෙහෙයවා ඇත. ඔහු 2016 නොවැම්බර් විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස MBSL රක්ෂණ සමාගමේ (MBSLI) අධ්‍යක්ෂ මණ්ඩලයටද පත්කරන ලදී.

ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය සහ ආයෝජන කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයන්හි සම්පත් දායකයෙක් ලෙස කටයුතු කරයි. බැංකුවට එක්වීමට පෙර, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ සහය කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කොට ඇති අතර, මහවැලි අධිකාරියේද සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සභාපති ලෙසද සේවය කරයි.

බණ්ඩාර මහතා ශ්‍රී ලංකාවේ කැලණිය විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා උපාධිධාරියෙක් වන අතර ශ්‍රී ලංකාවේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් කුසලතා සමාර්ථයක් සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර 1998 දී විශිෂ්ඨතම ශිෂ්‍ය සම්මානය සහිතව එම ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත.

එන්. පෙරේරා මහතා
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

නීතිඥවරයෙක් වන, පෙරේරා මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපති ජනාධිපති නීතිඥ ආනන්ද විජේසේකරගේ මණ්ඩලය තුළින් ඔහුගේ නීතිඥ වෘත්තිය ආරම්භ කර ඇති අතර, ඔහු ජ්‍යෙෂ්ඨ අපරාධ නීතිඥයෙකි. ඔහු දිවයින පුරා මහේස්ත්‍රාත් උසාවි සහ දිස්ත්‍රික් උසාවිවල ප්‍රදාන වශයෙන් පෙනී සිටිමින් සංචාරය කර ඇත. බුද්ධිමය දේපල, අල්ලස් සහ දූෂණ, ණය ආපසු අයකරගැනීම, අපකීර්තිකරණය, කම්කරු ආශ්‍රිත කරුණු සහ වෙනත් රැවටීම් පිළිබඳ සාපරාධී නඩු, දාමරිකකම, ස්ත්‍රී දූෂණය සහ මිනිමැරීම් නඩුවලට පෙනී සිට ඇත. එමෙන්ම පාරිභෝගික ආරක්ෂක පනත සහ ආහාර පනත යටතේ ගොනු කළ නඩු සම්බන්ධයෙන් තමන්ගේ නීතිඥ ලෙස ඔහු සාර්ථකව රඳවා තබා ගෙන ඇත.

ශ්‍රී ලංකා වෛද්‍ය නීති සභාවේ සාමාජිකයෙක් වන, ඔහු පසුගිය වසර 15 තුළ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ වඩාත් ගෞරවයට පත් වූ නියෝජිතයෙක් වන අතර, වසර පහක කාලසීමාවක් සඳහා කොළඹ නීති සමාජයේ කමිටු සාමාජිකයෙක්ද විය. පෙරේරා මහතා දැනට ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණික ආයතනයේ (මෙයට පෙර CISIR) සභාපති මෙන්ම 2016 නොවැම්බර් සිට MBSL රක්ෂණ සමාගමේ (MBSLI) අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ ෆෙඩරේෂනයේ නීති උපදේශක ලෙස, 2006 දී එක්සත් රාජධානියේ කොන්සවේටිව් පක්ෂ ව්‍යාපාරයෙදී ශ්‍රී ලාංකීය නියෝජිතයින් තිදෙනාගෙන් එක් අයෙකි.

එස්.එන්. දයාරත්න මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

නීතිඥවරයෙක් වන, දයාරත්න මහතා 1979 දී නීති ක්ෂේත්‍රයට පිවිසි අතර, මුල් උසාවි සහ අභියාචනාධිකරණවල කම්කරු, සුළුතර, සහ සිවිල් කරුණු වල සක්‍රීය නීති වෘත්තිකයෙක් ලෙස වසර තිස් අටක පළපුරුද්ද ඇත. ඔහු 1977 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය ලබාගෙන ඇත. ඔහු වසර හයක කාලසීමාවක් සඳහා කෑගල්ල ගෙවල් කුලී මණ්ඩලයේ සභාපති ලෙස සේවය කර ඇති අතර, බස් සමාගම් තුනක් එනම් මාවනැල්ල, කෑගල්ල සහ රඹුක්කන බස් සමාගම් තුන සබරගමුව බස් සමාගම ලෙස ඒකාබද්ධ කරන තුරු සමාගම් ලේකම් ලෙස කටයුතු කරන ලදී. ඔහු දැනට හොටෙල් ඇත්ගිරි පුද්ගලික සමාගමේ සහ ඒ.එම්.අබේරත්න සහ පුත්‍රයෝ පුද්ගලික සමාගමේ සමාගම් ලේකම් ලෙස සේවය කරමින් සිටී.

එස්.පී. අර්ෂකුලරත්න මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අර්ෂකුලරත්න මහතා ලංකා බනිජ තෙල් සංස්ථාවේ බෙදාහරින්නෙක් වන, කේ.ඩී.පී. අර්ෂකුලරත්න සහ පුත්‍රයෝ හි හවුල්කරුවෙකි. ඔහු සීතාවකපුර නගර සභාවේ හිටපු උප සභාපති වේ. අර්ෂකුලරත්න මහතාට ණය පරිපාලනය, ජාත්‍යන්තර වෙළෙඳාම, විදේශීය ව්‍යවහාර මුදල්, සහ මෙහෙයුම් යන ක්ෂේත්‍රයන්හි වසර කිහිපයක් බැංකුකරණ පළපුරුද්ද ඇත.

එච්. ජේ.ඩී. ෆොන්සේකා මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ෆොන්සේකා මහතා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක් වන අතර, 1984 දී නීති ක්ෂේත්‍රයට පිවිසි අතර, දැනට නඩුකටයුතුවල යෙදී සිටී. ඔහු ලංකා විශ්ව විද්‍යාලයෙන් 1968 දී ශාස්ත්‍රවේදී උපාධිය ලබාගෙන ඇත. ඔහු ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව පීවිල්සී, සහ කොමර්ෂල් බැංකුව පීවිල්සී හි මණ්ඩල නීතිඥවරයෙක් ලෙස සේවය කරයි.

ආයතනික කළමනාකරණය



1. ටී. මුතුගල මහතා - ප්‍රධාන විධායක නිලධාරී, **2. ඩී. දලුවත්ත මහතා** - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
3. එස් අමරතුංඟ මෙනවිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී **4. එල්. කළුආරච්චි මහතා** - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 03, **5. එස්. උඩුවාවල මහතා** - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 02,
6. ජේ. ගම්ලත් මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ හා නිෂ්පාදන සංවර්ධනය



7. කේ.ජයතිලක මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති/ සමාගම් ලේකම්, **8. එල්. පීරිස් මහතා** - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සහය සේවා සහ රන් ණය,
9. කේ. ජයසුන්දර මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - අයකරගැනීම්, **10. එස්. ප්‍රනාන්දු මහත** - සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන,
11. සී. විතානාරච්චි මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ, **12. ඩී. ගුණවර්ධක මහතා** - සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත්,
13. පී. කඳනාආරච්චි මහතා - මූල්‍ය ප්‍රධානි

ආයතනික කළමනාකරණය

ටී.මුතුගල මහතා
ප්‍රධාන විධායක නිලධාරී

මුතුගල මහතා රජයට අයත් විශාලතම වාණිජ බැංකුව වන ලංකා බැංකුවේ මූලිකවම වාණිජ බැංකුකරණය තුළ ආසන්න වශයෙන් වසර 40ක පළපුරුද්ද සහිත වෘත්තීය බැංකුකරුවෙකි. ඔහුට බැංකුකරණය, මෙහෙයුම්, තොරතුරු පද්ධති විගණනය මෙන්ම විදේශීය ශාඛා මෙහෙයුම් පිළිබඳ දක්ෂතාවන්ගේ අනර්ඝ මුසුවක් ඇත. සහකාර සාමාන්‍යාධිකාරිවරයෙක් ලෙස, ඔහු බැංකුවේ තොරතුරු තාක්ෂණ ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකර ඇත. පසුකාලීනව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සහය සේවා ලෙස, ඔහු බැංකුවේ ප්‍රසම්පාදන කාර්යය, ව්‍යාපාර ක්‍රියාවලි නැවත සකස් කිරීම, සහ 2012 ජූලි සිට 2013 ජූලි දක්වා මධ්‍යම පසුකාර්යාල මෙහෙයුම්වලට නායකත්වය ලබාදී ඇත.

මුතුගල මහතා කළමනාකරණ ගණකාධිකාරිවරුන් පිළිබඳ වරලත් ආයතනයේ (ACMA) සාමාජිකයෙක් වන අතර, තොරතුරු තාක්ෂණ පද්ධති විගණන සහ පාලන සංගමය ISACA (USA) විසින් සහතික ලත් තොරතුරු පද්ධති විගණකවරයෙකි. (CISA)

ඩී. දලුවත්ත මහතා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

පළපුරුදු බැංකුකරණ සහ මූල්‍ය වෘත්තිකයෙක් වන, ඩී දලුවත්ත මහතාට ආයෝජන බැංකුකරණය සහ ආයතනික මූල්‍ය පිළිබඳ වසර 28ක ආයතනික කළමනාකරණ පළපුරුද්දක් ඇත. ඔහු මෙයට පෙර හැටන් නැෂනල් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයතනික මූල්‍ය තනතුර දරන ලද අතර, ජෝර්ජ් ස්ටුවට් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් හී සමූහ හවුල් කළමනාකාර අධ්‍යක්ෂ විය. සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ලෙස ඔහු පත්කිරීමට පෙර, MCSL මූල්‍ය සේවා පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන ලදී.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක්, එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ අධිසාමාජික, සහ එක්සත් රාජධානියේ තොරතුරු තාක්ෂණ සඳහා වරලත් ආයතනයේ සාමාජිකයෙකි. ඔහු වසර තුනක කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය නිවාස සංගමයේ උප සභාපති ලෙස කටයුතු කොට ඇති අතර ලංකා වාණිජ මණ්ඩලයේ කමිටුවේ FHA නියෝජනය කර ඇත.

එස් අමරතුංග මෙනවිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

අමරතුංග මෙනවිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් කුසලතා සමාර්ථයක් සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ PIM වෙතින් නවීන බැංකුකරණය සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා මට්ටමේ සහතික පත්‍රයක් ලබාගෙන ඇත. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධියද උසුලයි.

අමරතුංග මෙනෙවිය වසර 27ක පළපුරුද්දට සමීප වී ඇති අතර භාණ්ඩාගාර, වෙළෙඳ මූල්‍ය, ක්‍රමෝපායික සැලසුම් සහ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අංශය වැනි සමාගමේ අංශ කිහිපයක් තුළ ප්‍රධානියා ලෙස සේවය කොට ඇත.

එමෙන්ම ඇයට ණය කළමනාකරණය, ආපසු අයකරගැනීම්, ශේෂ ලකුණුකාඩ් කාර්යසාධන කළමනාකරණ පද්ධතිය, වීකාබද්ධකිරීම් හා අත්පත්කර ගැනීමේ ක්‍රියාවලි, ප්‍රතිව්‍යුහගතකරණය. මූල්‍ය හා පිරිවැය ගිණුම්කරණය,සහ මානව සම්පත් තුළ විස්තීර්ණ පළපුරුද්ද ඇත. ඇය ණය පරිපාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා අංශ මෙන්ම සමාගමේ ක්‍රමෝපායික සැලසුම් ක්‍රියාවලියට අමතරව අයකරගැනීම් අංශය, මානව සම්පත් අංශයේ කාර්යයන්ද සොයා බලමින් සිටී.

එල්. කළුආරච්චි මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 03

මූල්‍ය ක්ෂේත්‍රය තුළ වසර 31කට වැඩි පළපුරුද්ද සහිත, එල් කළුආරච්චි මහතාට ණය, කල්බදු සහ ණය අවදානම් කළමනාකරණය පිළිබඳ විවිධ දක්ෂතා රාශියක් ඇත. කල්බදු කළමනාකරු ලෙස 1994 දී මර්චන්ට් බැංකුකරණයට පිවිසි ඒ මහතා පසුකාලීනව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- කල්බදු, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකරගැනීම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- සහය සේවා ඇතුළුව සමාගමේ ජ්‍යෙෂ්ඨ තනතුරු රාශියක් කරා පියමන් කර ඇති අතර වර්තමානයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 03 තනතුර දරනු ලබයි. ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිධරයෙකි.

එස්. උඩුවාවල මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 02

උඩුවාවල මහතාට විශේෂයෙන් ණය සහ ශාඛා මෙහෙයුම් ඇතුළුව බැංකුකරණ ක්ෂේත්‍රයෙහි වසර 35කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහුට ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ බැංකු තුනක විස්තීර්ණ පළපුරුද්ද සතු අතර නේපාලයේ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ විදේශීය පත්වීමක් මත එහි ණය කළමනාකරු ලෙස අනුයුක්තව කටයුතු කර ඇත.

වර්තමානයේ ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 02 ලෙස කටයුතු කරන අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කලාපය 02 තනතුර භාරගැනීමට පෙර, ඔහු කල්බදු අංශය, ශාඛා මෙහෙයුම් මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කර ඇත.

ජේ. ගම්ලත් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ හා නිෂ්පාදන සංවර්ධනය

විකුණුම් සහ බෙදාහැරීම, මාර්ග කළමනාකරණය, නිෂ්පාදන හ සන්නාම කළමනාකරණය සහ අලෙවිකරණ සන්නිවේදනය යන අංශවල විවිධ කාර්යභාරයන්හි පළපුරුද්ද සමඟ දක්ෂ අලෙවිකරණ වෘත්තිකයෙක් වන, ගම්ලත් මහතා ප්‍රමුඛ පෙළේ විදුලි සන්නිවේදන අංශයේ සමාගම්වල ජ්‍යෙෂ්ඨ අලෙවිකරණ තනතුරු දරා ඇත. ගම්ලත් මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය උසුලන අතර එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ අලෙවිකරණය පිළිබඳ වෘත්තීය පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙක් ද වේ.

කේ.ජයතිලක මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති/ සමාගම් ලේකම්

ජයතිලක මහත්මිය නීතිඥ වෘත්තියේ වසර 26කට වැඩි පළපුරුද්දක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් මෙන්ම ප්‍රසිද්ධ නොතාරිස්වරියකි. ඇය සදම්ප්ටන් විශ්ව විද්‍යාලයෙන් (එක්සත් රාජධානිය) නීතිය පිළිබඳ (වාණිජමය නීතිය) ශාස්ත්‍රපති උපාධිය, ඉංග්‍රීසියෙන් ආර්ථික හා දේශපාලන විද්‍යාව පිළිබඳ කොළඹ විශ්ව විද්‍යාලයෙන් දෙවන පෙළ ගෞරව (ඉහළ අංශය සමත්) ශාස්ත්‍රවේදී ප්‍රථම උපාධිය උසුලන්නීය. ජයතිලක මහත්මිය සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස කරන කාර්යයන්ට අමතරව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමේ කාර්යස්ථ නීති උපදේශක ලෙස රාජ්‍ය සහ පුද්ගලික යන දෙඅංශය තුළ සේවය කර ඇත. විමෙන්ම ඇය ලෝක බැංකුවේ කෙටි කාලීන උපදේශක ලෙසද සේවය කර ඇත.

එල්. පීරිස් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සහය සේවා සහ රන් ණය

පීරිස් මහතාට බැංකුකරණ ක්ෂේත්‍රයෙහි වසර 32කට වැඩි පළපුරුද්දක් ඇති අතර එයට ආයතනික කළමනාකාරිත්වය, නිරාවරණය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව සහ කළමනාකරණ ධාරිතාවන්ගේ තනතුරු ඇතුළත්ය. ඔහුගේ පළපුරුද්දට සෞදි බ්‍රිටිස් බැංකුවේ ජාත්‍යන්තර බැංකුකරණය (වෙළෙඳ මූල්‍ය), රියාද්, සෞදි අරාබිය (HSBC සමූහය) වසර 6 සහ ශ්‍රී ලංකාවේ (එමිරේට්ස් බැංකු ජාත්‍යන්තරයේ කොළඹ ශාඛාව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, සෙලින්කෝ ඉතුරුම් බැංකුව, MBSL ඉතුරුම් බැංකුව සහ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ ෆිනෑන්ස් පීවිල්සී) වසර 26 ඇතුළත් වේ.

ඔහුගේ හැකියාව සහ දක්ෂතා මට්ටම් ජාත්‍යන්තර වෙළෙඳාම, බැංකුකරණ මෙහෙයුම්, ශාඛා බැංකුකරණය සහ පරිපාලනය, ව්‍යාපාර සංවර්ධනය සහ සේවා අනර්ඝත්වය තුළ පැතිරී පවතී. ඔහු ස්පාඤ්ඤයේ ත්‍රිත්ව විද්‍යාලය සහ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර බැංකුකරණය සහ මූල්‍ය සහ පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබාගෙන ඇත.

කේ. ජයසුන්දර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - අයකරගැනීම්

ජයසුන්දර මහතාට මූල්‍ය සේවාවන්හී විවිධ ක්ෂේත්‍රවල විවිධ විෂය මුබාශ්‍රිත නිරාවරණය ඇති අතර මෙයට පෙර මෙහෙයුම් සහ ණය අංශයන්හී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු දරා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- බැංකුකරණ හා මූල්‍ය සහ කෘෂිකාර්මික ආර්ථිකයන් හි විශේෂීකරණයක් සහිත විද්‍යාවේදී (ගෞරව) උපාධිය ලබාගෙන ඇත

එස්. ප්‍රනාන්දු මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

ප්‍රනාන්දු මහතා අභ්‍යන්තර විගණක ආයතනයේ (U.S.A) සාමාජිකයෙක් වන අතර සහතික ලත් අභ්‍යන්තර විගණකවරයෙකි. (U.S.A) ඔහුට දේශීය සමාගම් මෙන්ම බහුජාතික සමාගම්වල අභ්‍යන්තර විගණනය පිළිබඳ වසර 17ක පළපුරුද්ද ඇත.

සී. විතානාරච්චි මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ

විතානාරච්චි මහතාට මෘදුකාංග සංවර්ධනය, නිර්මාණය කිරීම, පද්ධති පරිපාලන සහ බෙදාහැරීම් කළමනාකරණය සහ බැංකුකරණ හා මූල්‍ය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම විදුලි සන්දේශනය සහ නිෂ්පාදනය ඇතුළුව තොරතුරු තාක්ෂණය තුළ වසර 17ක පමණ පළපුරුද්ද ඇත. ඔහු තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇති අතර දැනට තොරතුරු ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සූදානම් වේ. IBM සමාගමෙන් සහ නව්‍යකරණය හා තොරතුරු සන්නිවේදන කළමනාකරණය සඳහා බැංගලෝරයේ ඉන්දියානු කළමනාකරණ ආයතනයෙන් ඔහු ILE RPG වැඩසටහනේ 1 ශ්‍රේණියේ ප්‍රවීනයෙක් ලෙස සහතික කර ඇත.

ඩී. ගුණවර්ධක මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත්

මානව සම්පත් සංවර්ධන වෘත්තිකයෙක් වන ගුණවර්ධන මහතාට විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන් හී මානව සම්පත් කළමනාකරණය පිලිබඳ විස්තීර්ණ පලපුරුද්ද ඇත.

ඔහු වරලත් ව්‍යාපාර පරිපාලකයින්ගේ ආයතනයේ සාමාජිකයෙක්, මානව සම්පත් වෘත්තිකයින්ගේ සංගමයේ වෘත්තීය සාමාජිකයෙක් සහ පිරිස් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙක්ද වේ. විමෙන්ම, ඔහු සහතික ලත් වෘත්තිය කළමනාකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනය සහ වෘත්තික උපදේශකයින්ගේ ආයතනයේ සහය සාමාජිකයෙකි.

ගුණවර්ධන මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් (මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂිත) BMS. විශේෂ (දෙවන පෙළ ඉහල ගෞරව) උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයෙන් මානසික රෝග අධ්‍යයනය පිළිබඳ ආයතනය හා මනෝ චිකිත්සක දෙපාර්තමේන්තුවෙන් මානසික උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා සහ පරිගණක විද්‍යා පිළිබඳ ඩිප්ලෝමාව ලබාගෙන ඇත.

පී. කඳනාආරච්චි මහතා

මූල්‍ය ප්‍රධානි

කඳනාආරච්චි මහතා මූල්‍ය ප්‍රධානී ලෙස සේවය කරයි. කඳනාආරච්චි මහතා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ වසර 11ක පළපුරුද්ද සහ විගණන සහ ගිණුම්කරණ පිළිබඳ 5ස් වසරක පළපුරුද්ද සතු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

ආයතනික යහපාලනය

G4-34-44,G4-48-52

ආයතනික යහපාලනය

MBSL හි තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම තහවුරු කළ ශක්තිමත් පාලන පරිචය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය, කොටස්හිමියන් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර ශක්තිමත් සම්බන්ධතා ඇති කිරීමට හේතු වී ඇත. සමාගම සවිස්තරාත්මක ප්‍රතිපත්ති රාමුවක් සහ අධ්‍යක්ෂවරුන්ගේ අචාරධර්ම සංග්‍රහය තුළින් සකස් කරන ලද විනිවිදභාවයේ ඉහළම ප්‍රමිති සහ සදාචාර ව්‍යාපාර හැසිරීම කෙරෙහි බැඳී සිටී. සමාගම තුළ සුදුසු බලතුලනයක් ඇති බව සහතික කරන විධිමත් පාලන ව්‍යූහ තුළින් පරීක්ෂාකාරී සවිබලගැන්වීම ඇති කරයි.

පාලන රාමුව

MBSL හි ආයතනික යහපාලන රාමුව ශ්‍රී ලංකා මහබැංකුව, කොළඹ කොටස් හුවමාරුවේ අවශ්‍යතා සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව වැඩි දියුණු කර ඇත. ඊට අමතරව, ගෝලීය වාර්තාකරණ වැඩසටහන විසින් නිකුත් කළ තිරසාරත්ව වාර්තාකරණය සඳහාවන G4 ප්‍රමිති සහ අන්තර් ජාතික වාර්තාකරණ සභාව (IIRC). විසින් නිකුත් කළ ඒකාබද්ධ වාර්තාකරණ වැඩපිළිවෙල ස්වේච්ඡාවෙන්ම MBSL යොදා ගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවට සිදුකළ 19 වැනි සංශෝධනයේ 36 වගන්තියේ (1) (1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ විගණකාධිපති සමාගමේ විගණකවරයා වන්නේය.

ප්‍රමිති හා මූලධර්ම

යහපාලන ක්‍රමය

අභ්‍යන්තර	බාහිර	
• දැක්ම, මෙහෙවර සහ සාරධර්ම • සාංගමික ව්‍යවස්ථාවලිය • අධ්‍යක්ෂවරුන්ගේ සදාචාර සංග්‍රහය • සමූහයේ ආයතනික යහපාලන රාමුව සහ ව්‍යවහාර • අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාණ්ඩලීය අනුකමිටු යොමුකිරීමේ නිර්දේශ • ප්‍රතිපත්ති, ක්‍රම සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරාත්මක වැඩරාමුව	• 2007 අංක 07 දරන සමාගම් පනත • 2008 අංක 3 දරන මූල්‍ය සමාගම් (ආයතනික යහපාලන) නියෝගය • 2009 අංක 4 දරන මූල්‍ය කල්බදු (ආයතනික යහපාලන) නියෝගය • කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් • ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති • සහ අන්තර් ජාතික වාර්තාකරණ සභාව (IIRC). විසින් නිකුත් කළ ඒකාබද්ධ වාර්තාකරණ වැඩපිළිවෙල • ගෝලීය වාර්තාකරණ වැඩසටහන විසින් නිකුත් කළ තිරසාරත්ව වාර්තාකරණය සඳහාවන G4 ප්‍රමිති	• කොටස්හිමිකාර සහභාගිත්වය • ක්‍රමෝපායික සැලසුම්කිරීම • අවදානම් කළමනාකරණය • අනුකූලතාවය • සේවක සහභාගිත්වය • අභ්‍යන්තර හා බාහිර විගණනය • සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරු 9කින් (සභාපති ඇතුළුව) සමන්විත වන අතර, ඉන් තිදෙනෙක් ස්වාධීන ලෙස සලකනු ලබයි. අධ්‍යක්ෂවරු වෘත්තීමය, අධ්‍යාපනික සහ තීරණවල ගැඹුරු සහ සමස්ත ඵලදායිත්වය වැඩිකරන ව්‍යවසායකත්ව දර්ශන ඇතුළුව විවිධ දෘෂ්ටිකෝණවල සංයෝගයකි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට සමාග මේ ක්‍රමෝපායික සැලැස්ම තීරණය කිරීම, යහපාලන ව්‍යූහය අර්ථදැක්වීම, අවදානම් රුචිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම ඇතුළත් වේ.

විශේෂ ක්ෂේත්‍ර සඳහා පාලන වගකීම සහිත අනුකමිටු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. වසර තුළ, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන්ගේ අවශ්‍යතාවන්ට අනුකූලව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව ස්ථාපිත කරන ලදී.

මාණ්ඩලීය අනුකමිටු	කාර්යභාරය
විගණන කමිටුව	සමාගමේ මූල්‍ය ප්‍රකාශයන්හි අවංකභාවය සහතික කිරීම සමාගමේ අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීම බාහිර විගණකවරු පත්කිරීම සහ ඔහුගේ පාරිශ්‍රමිකය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම අභ්‍යන්තර විගණන කාර්යයන් විෂයානුබද්ධව සහ ස්වාධිනව සිදුකරන බව සහතික කිරීම
වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	වේකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩපිළිවෙලක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම අසම්භාව්‍ය සැලසුම්වල ප්‍රමාණාත්මතාව නියාමනය කිරීම
පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂවරුන්ට සහ ප්‍රධාන විධායක නිලධාරීට ගෙවන පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම
සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව	සංග්‍රහයේ පැහැදිලිව නිදහස්කළ ගනුදෙනු හැර යෝජිත සියලුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචනය කිරීම සමාගමේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි යොදා ගැනීම සහ සමාලෝචනය කිරීම සහ පවත්නා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පරීක්ෂා කිරීම සමාගම විසින් ඇතුළත්වීමට නියමිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවලට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ සමාගමේ කොටස්හිමියන්ගේ අනුමැතිය අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීම.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට කළමනාකරණ කමිටු හයක් වෙනම් වත්කම් හා වගකීම් කමිටුව, ආයෝජන කමිටුව, අක්‍රීය ණය කමිටුව, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව, ණය කමිටුව, මානව සම්පත් කමිටුව සහ නිශ්චල දේපල කමිටුව සහය ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය විට සහ අවශ්‍යතාවක් ඇති වූ විට කැඳවන විශේෂ රැස්වීම් සහිතව අවම වශයෙන් මාසික පදනමක් මත රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සූදානම්වීම සඳහා ප්‍රමාණවත් කාලය ලබාදෙමින් වේලාසනින් බෙදාහරිනු ලබයි. ආයතනික කළමනාකාරිත්වය සෑම රැස්වීමකට ප්‍රමාණවත් කාලයකට පෙර කාලීන සහ උසස් තත්ත්වයේ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂවරුන් වෙත ඔවුන්ගේ දැනුම සහ දක්ෂතා යාවත් කිරීමට නම්කළ විධිමත් සාරාංශ ලබාදෙන අතර ඔවුන්ට අධ්‍යක්ෂවරුන් පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැනි අදාළ බාහිර පුහුණු සැසිවලට සහභාගිවීම සඳහා අවස්ථාව ඇත. සමාගමේ ලේකම්ගේ සහයෝගයෙන් වාර්ෂිත පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කාර්යයන් පිළිබඳව ඇගයීමක් සිදුකරයි.

ක්‍රමෝපායික උපදේශය සකස් කිරීම

වසර තුළ, සමාගමේ කටයුතු 2017 - 2019 සඳහා වන ක්‍රමෝපායික සැලැස්ම හා සම්බන්ධ කරන ලදී. සමාගමේ අගය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය, එහි තරඟකාරී ශක්තීන් සහ මෙහෙයුම් පරිසරය තුළ ඇතිවන ප්‍රවනතා මත පදනම් වී ක්‍රමෝපාය තීරණය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය අනිකුත් දෑ අතර ඉපයීම්, මූල්‍ය තත්ත්වය, ණයවල ගුණාත්මකභාවය සහ ප්‍රාග්ධනීයකරණය ආවරණය කරමින් නිශ්චිත පරාමිති රාමුවක් මත පදනම් වී ක්‍රමෝපායික සැලැස්මට අනුරූපව කාර්යසාධනය නියාමනය කරයි. 2017 - 2019 සඳහා ක්‍රමෝපායික සැලැස්ම MBSL ඊලඟ වර්ධන අවධිය කරා ස්ථානගත කරමින්, තරඟකාරිත්වය සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය බව වැඩි කිරීමේ පර්මාර්ථය තිබිව සකස් කරන ලදී.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන

අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන රාමු පවත්වා ගැනීම සඳහා ඉහළම වගකීම දරයි. එමෙන්ම එය සමාගමේ අවදානම් රුචිය එහි වර්ධන අභිප්‍රායන් අත්කරගැනීමට අපේක්ෂා කරමින් සිටින්නේද යන්න තීරණය කිරීම සඳහාද වගකීමට බැඳී සිටී. වසර තුළ අවදානම් කළමනාකරණ රාමුව සහ අවදානම් කාර්යසාධනය පිටු අංක 122 සිට 131 දක්වා පිටුවල අවදානම් වාර්තාව තුළ සහ පිටු අංක 120 සිට 121 දක්වා පිටුවල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව තුළ විස්තර කෙරේ. වත්කම් ආරක්ෂා කරන බවට සහ මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය ආරක්ෂා කරන බව සහතික කරන විස්තරාත්මක අභ්‍යන්තර පාලන රාමුවක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂකවරු වගකීමට බැඳී සිටී.

ආයතනික යහපාලනය

i කොටස

ලැයිස්තුගත කිරීමේ නියමයන්හි 7.6 නියමයෙහි වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය සම්බන්ධ අවශ්‍යතා සමඟ අනුකූලතාව

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
7.6 (i)	මූල්‍ය වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් වූ පුද්ගලයින්ගේ නම්	කරුණාකර “සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව” බලන්න.
7.6 (ii)	වර්ෂය තුළ සමාගමේ සහ එහි පරිපාලන සමාගම්වල ප්‍රධාන කටයුතු සහ එයට සිදුකළ වෙනස්වීම්.	කරුණාකර “සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව” බලන්න.
7.6 (iii)	ජන්දය හිමි සහ ජන්දය අහිමි කොටස් හිමි විශාලතම කොටස්හිමියන් ගේ නම් සහ ඔවුන් විසින් දරනු ලබන සංඛ්‍යාව සහ එසේ දරන කොටස්වල ප්‍රතිශතය.	කරුණාකර ජන්දය හිමි කොටස් හිමි විශාලතම කොටස්හිමියන් 20 සඳහා “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න. සමාගම ජන්දය අහිමි කොටස් නිකුත් කර නොමැත
7.6 (iv)	ජනතාව දරන ප්‍රතිශතය	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න.
7.6 (v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී සමාගමේ කොටස් තුළ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් දරන කොටස් හිමිකම	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න.
7.6 (vi)	අනාගතය දැකියහැකි අවදානම් සාධක විෂයන්ට අදාළ තොරතුරු.	කරුණාකර “අවදානම් කළමනාකරණ වාර්තාව” බලන්න.
7.6 (vii)	සේවකයින් සහ කම්කරු සබඳතාවන්ට අදාළ විෂයාත්මක කරුණු පිළිබඳ විස්තර.	කරුණාකර “මානව ප්‍රාග්ධනය” බලන්න.
7.6 (viii)	අයිති ඉඩම්වල ප්‍රමාණ, ස්ථාන, වටිනාකම් සහ ගොඩනැගිලි ප්‍රමාණය සහ ආයෝජන දේපල.	කරුණාකර “මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 26” බලන්න.
7.6 (ix)	ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය වන කොටස් ගණන.	කරුණාකර ප්‍රාග්ධනය පිළිබඳ “මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 38” බලන්න.
7.6 (x)	එක් එක් ස්කන්ධ සුරුකුම්පත් හිමිකරුවන්ට බෙදී ඇති ආකාරය සහ මුළු හිමිකමේ ප්‍රතිශතය.	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න
7.6 (xi)	අනුපාත සහ වෙළෙඳපොල මිල තොරතුරු:	
	ස්කන්ධය	
	1. ලාභාංශ කොටස	අදාළ නැත
	2. ලාභාංශ ගෙවීම	අදාළ නැත
	3. කොටසකට ශුද්ධ වටිනාකම	කරුණාකර “මූල්‍ය තත්ත්ව ප්‍රකාශය” බලන්න.
	4. කොටසක වෙළෙඳපොල අගය (මූල්‍ය වසර තුළ වාර්තාකළ ඉහල සහ පහළ අගය සහ මූල්‍ය වසර අවසානයට වටිනාකම).	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න.
	ණය	
	1. තුලනාත්මත රජයේ සුරුකුම්වල පොළී අනුපාත	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න..
	2. ණය/ස්කන්ධ අනුපාතය.	කරුණාකර “දශකය දෙස බැලීම” බලන්න.
	3. පොළී ආවරණය.	කරුණාකර “දශකය දෙස බැලීම” බලන්න.
	4 ක්ෂණික වත්කම් අනුපාතය.	කරුණාකර “දශකය දෙස බැලීම” බලන්න.
	5 වසර තුළ වෙළෙඳපොල මිල ගණන් සහ ඉපයීම්.	කරුණාකර “මූල්‍ය ප්‍රාග්ධනය” බලන්න
	6 ණය අනුපාතයේ වෙනස්වීම්.	කරුණාකර “අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව” බලන්න.

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
7.6 (xii)	වටිනාකම පසුකාලීනව පොතේ අගයට වෙනස් වන්නේනම්, සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථිර වත්කම් සහ ඉඩම්වල වෙළෙඳපොලේ අගයෙහි සැලකිය යුතු වෙනස්වීම්.	කරුණාකර දේපල හා උපකරණ පිළිබඳ “මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 27” බලන්න.
7.6 (xiii)	ප්‍රසිද්ධ නිකුතුවක්, හිමිකම් නිකුතුවක් සහ පුද්ගලික ස්ථාපනයක් තුළින් ඇති වූ අරමුදල්වල විස්තර.	2016 වසර තුළ ප්‍රසිද්ධ නිකුතුවක්, හිමිකම් නිකුතුවක් සහ පුද්ගලික ස්ථාපනයක් තුළින් අරමුදල් රැස් කර නොමැත.
7.6 (xiv)	සේවක කොටස් විකල්ප යෝජනා ක්‍රමය හෝ සේවක කොටස් මිලදීගැනීමේ යෝජනා ක්‍රමය සම්බන්ධ තොරතුරු.	සමාගමට කිසිදු සේවක කොටස් විකල්ප යෝජනා ක්‍රමයක් හෝ සේවක කොටස් මිලදීගැනීමේ යෝජනා ක්‍රමයක් නොමැත.
7.6 (xv)	ලැයිස්තුගත නියමයන් හී 7 වගන්තියේ 7.10.3, 7.10.5 ඇ සහ 7.10.6 ඇ නියමයන් ප්‍රකාරව, ආයතනික යහපාලනයට අදාළ අනාවරණයන්.	ලැයිස්තුගත නියමයන් හි 7 වගන්තියේ 7.10.3, 7.10.5 ඇ සහ 7.10.6 ඇ නියමයන් හි සඳහන් අනාවරණ මෙම වාර්තාවෙන් ලබා දේ.
7.6 (xvi)	විගණනය කළ මූල්‍ය ප්‍රකාශ පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5%ක් ඉක්මවන වැඩි අගය	2016 වසර තුළ මෙම සීමාවන් ඉක්මවන කිසිදු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් සමාගමට නොමැත.

ii කොටස

කොළඹ කොටස් හුවමාරුව විසින් ලැයිස්තුගත සමාගම් සඳහා නිකුත් කළ ආයතනික පාලන නියමයන් සම්බන්ධ ලැයිස්තුගත අවශ්‍යතාවන්ට අනුකූලතාව

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
7.10.1	**විධායක නොවන** අ. අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක් (02) හෝ එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ගණන මුළු අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් (1/3) හෝ මේ දෙකෙන් වැඩි ගණනක් ඇතුළත් විය යුතුය. ආ. අධ්‍යක්ෂවරුන්ගේ මුළු ගණන වාර්ෂික මහා සභා රැස්වීම අවසන්වීමත් සමඟම අවසාන ගණන මත පදනම් වී ගණනය කිරීමට නියමිතය. ඇ. මෙම අනුපාතයට සිදුවන යම් වෙනසක් වෙනස සිදු වී දින අනූවක් (90) ක් ඇතුළත සංශෝධනය කරනු ලැබේ.	අනුකූල විය. අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අධ්‍යක්ෂවරු නව (09) දෙනා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර වාර්ෂික මහා සභාවට පෙර තනතුර දරා ඇත.
7.10.2	**ස්වාධීන අධ්‍යක්ෂවරු** අ. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ ඉහත 7.10.1. නියමය අනුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් පමණක් ඇතුලත් වන අවස්ථාවක, එම විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනා ස්වාධීන විය යුතුය. (CSE, ලැයිස්තුගත නියමයන්හි 7.10.4 හි නිර්ණායකය අනුව). අනිකුත් සෑම අවස්ථාවකදීම, දෙදෙනෙක් (2) හෝ විධායක නොවන අධ්‍යක්ෂවරු 1/3ක් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබේ. ඉන් වැඩි කොටස ස්වාධීන විය යුතුය. ආ. අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂිත නිර්ණායක අනුව විධායක නොවන අධ්‍යක්ෂ විසින් ඔහු/ඇය ස්වාධීන හෝ ස්වාධීන නොවන බව දන්වා දිනය සහ අත්සන් කර වාර්ෂිකව ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.	අනුකූල විය. CSE නියමයන් 7.10.4. විසින් නියම කළ නිර්ණායකය අනුව අධ්‍යක්ෂවරුන් නව දෙනාගෙන් තිදෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති. අනුකූල විය.

ආයතනික යහපාලනය

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
7.10.3	**අධ්‍යක්ෂවරුන්ට අදාළ අනාවරණ**	
	අ. අධ්‍යක්ෂ මණ්ඩලයට එසේ ලැබෙන එවැනි ප්‍රකාශ සහ වෙනත් තොරතුරු මත පදනම් වී සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන හෝ ස්වාධීන නොවන බවට තීරණයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකළ යුතු අතර ස්වාධීන ලෙස තීරණය කළ අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේ සඳහන් කළ යුතුය.”	අනුකූල විය.
	ආ. පහත සඳහන් කර ඇති නිර්ණායක අනුව අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන ලෙස සුදුසුකම් නොලැබුවද, සියලුම කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු අධ්‍යක්ෂ ස්වාධීන වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කල්පනා කරන්නේනම්, වාර්ෂික වාර්තාවේ එම තීරණය සඳහා සපුරා නොමැති නිර්ණායක හා පදනම විශේෂයෙන් දැක්විය යුතුය.	අදාළ නැත.
	ඇ. ඉහත දක්වන ලද අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීනතාවට අදාළ වන්නා වූ අනාවරණයන්ට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ කාර්ය ක්ෂේත්‍රයන් හී ඔහුගේ /ඇයගේ ප්‍රවීනතාවයේ ස්වභාවය පිළිබඳ තොරතුරු ඇතුළත් වන කෙටි විස්තරයක් එහි වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කළ යුතුය.	අනුකූල විය. සෑම අධ්‍යක්ෂවරයෙක් පිළිබඳ කෙටි විස්තරයක් වාර්ෂික වාර්තාවේ 64 සිට 67 දක්වා පිටුවල දැක්වේ.
	ඈ. එහි අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරයෙක් පත්කිරීම මත, සමාගම විසින් ජනතාවට ප්‍රකාශයට පත් කිරීම සඳහා එවැනි අධ්‍යක්ෂවරයෙක් පිළිබඳ කෙටි විස්තරයක් කොළඹ කොටස් හුවමාරුව (හුවමාරුව) වෙත ලබා දිය යුතුය.	අනුකූල විය නව අධ්‍යක්ෂවරු පත්කිරීම මත, සමාගමේ ලේකම් විසින් අවශ්‍ය තොරතුරු හුවමාරුවේ වෙත ලබා දී ඇත.
7.10.5	**පාරිශ්‍රමික කමිටුව**	
	අ. සංයුතිය	
	පාරිශ්‍රමික කමිටුව;	අනුකූල විය.
	අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් (02) (සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් (02) සිටින අවස්ථාව);	පාරිශ්‍රමික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු පස් (05) දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් තිදෙනෙක් (03) ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති.
	හෝ	
	විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් යන අවස්ථා දෙකෙන් වැඩිපුර ගණනින් සමන්විත වන අතර එහි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරු විය යුතුය.	
	විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් (01) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාරිශ්‍රමික කමිටුවේ සභාපති ලෙස පත් කරනු ලැබේ.	
	ආ. කාර්යයන්	
	පාරිශ්‍රමික කමිටුව සමාගමේ විධායක අධ්‍යක්ෂවරුන්ට සහ ප්‍රධාන විධායක නිලධාරී (“CEO”) වෙත ගෙවිය යුතු පාරිශ්‍රමික සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි නිර්දේශ සලකා බලා අවසාන තීරණය ගනු ලබයි.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ 116 පිටුවේ ‘පාරිශ්‍රමික කමිටුව වාර්තාව’ බලන්න.

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
	ඇ. වාර්ෂික වාර්තාවේ අනාවරණය	
	පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශනයක් අඩංගුව පාරිශ්‍රමික කමිටුව සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ (හෝ සමූහ සමාගමක වන අවස්ථාවක මව් සමාගමේ කමිටුවේ පුද්ගලයින්ගේ) නම් වාර්ෂික වාර්තාව තුළ දැක්විය යුතු අතර විධායක සහ විධායන නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවූ මුළු පාරිශ්‍රමිකය දැක්විය යුතුය.	අනුකූල විය. පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින්ගේ නම් වාර්ෂික වාර්තාවේ 116 පිටුවේ 'පාරිශ්‍රමික කමිටුව වාර්තාව තුළ දැක්වේ. අධ්‍යක්ෂවරුන්ට ගෙවූ ගාස්තු වාර්ෂික වාර්තාවේ 161 පිටුවේ 'මූල්‍ය ප්‍රකාශනයන්ට සටහන' හි හෙළිදරව් කෙරේ.
7.10.6	**විගණන කමිටුව**	
	අ. සංයුතිය	අනුකූල විය.
	විගණන කමිටුව;	විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු හය (06) දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් තිදෙනෙක් (03) ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති.
	අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් (02) (යම් ආයතනයක එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් (02) සිටින අවස්ථාව);	
	හෝ	
	විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් යන අවස්ථා දෙකෙන් වැඩිපුර ගණනින් සමන්විත වන අතර එහි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරු විය යුතුය	
	විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් (01) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරනු ලැබේ.	
	විගණන කමිටුව විසින් තීරණය කරනු ලැබුවේනම් මිස, සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ("CEO") සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී ("CFO") විගණන කමිටුවේ රැස්වීම්වලට සහභාගි විය යුතුය	අනුකූල විය.
	විගණන කමිටුවේ සභාපති හෝ එක් (01) සාමාජිකයෙක් පිළිගත් වෘත්තීය ගිණුම්කරණ මණ්ඩලයක සාමාජිකයෙක් විය යුතුය.	
	ආ. කාර්යයන්	
	විගණන කමිටුවේ කාර්යයන්ට ඇතුළත් වන්නේ	
	(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම, ඉදිරිපත් කිරීම, හෙළිදරව් කිරීම්වල ප්‍රමාණාත්මතාව අධීක්ෂණය කිරීම.	අනුකූල විය. විගණන කමිටුවේ කාර්යයන් සහ එහි වාර්තාව 114 පිටුවේ දක්වා ඇත.
	(ii) 2007 අංක 07 දරන සමාගම් පනතේ මූල්‍ය වාර්තාකරන අවශ්‍යතා, තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතාවන්ට සමාගමේ අනුකූලතාව අධීක්ෂණය කිරීම.	අනුකූල විය .
	(iii) සමාගමේ අභ්‍යන්තර පාලනයන් හා අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වන බව සහතික කරන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.	අනුකූල විය.
	(iv) සමාගමේ බාහිර විගණකයින්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීම.	අදාළ නැත. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන බැවින්, ස්වාධීනත්වය ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කෙරෙන අතර විගණක කමිටුවට බාහිර විගණකගේ සහභාගිත්වය සම්බන්ධයෙන් කිසිදු කාර්යභාරයක් නොමැත.

ආයතනික යහපාලනය

CSE නියමයන්	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
	(v) බාහිර විගණක පත්කිරීම, නැවත පත්කිරීම සහ ඉවත් කිරීමට අදාළ වන්නා වූ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට සිදුකිරීම සහ බාහිර විගණකගේ පාරිශ්‍රමිකය සහ සහභාගීත්ව නියමයන් අනුමත කිරීම.	අදාළ නැත.
	ඇ. වාර්ෂික වාර්තාවේ අනාවරණය	
	විගණන කමිටුව සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ (හෝ සමූහ සමාගමක වන අවස්ථාවක මව් සමාගමේ කමිටුවේ පුද්ගලයින්ගේ) නම් වාර්ෂික වාර්තාව තුළ දැක්විය යුතුය.	අනුකූල විය. විගණන කමිටුවේ සාමාජිකයින්ගේ නම් සහ එහි වාර්තාව වාර්ෂික වාර්තාවේ 113 පිටුවේ දැක්වේ.
	විගණක කමිටුව විගණකවරයාගේ ස්වාධීනත්වය තීරණය කළ යුතු අතර වාර්ෂික වාර්තාව තුළ එවැනි තීරණයක් සඳහා පදනම හෙළිදරව් කළ යුතුය.	
	වාර්ෂික වාර්තාව අදාළවන කාලසීමාව තුළ ඉහත දේ සම්බන්ධව සමාගමේ අනුකූලතා ආකාරය විස්තර කරමින් වාර්තාවක් ඇතුළත් කළ යුතුය.	

iii කොටස

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා 2008 අංක 3 දරන මූල්‍ය සමාගම් (ආයතනික යහපාලනය) විධිවිධානය

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
2	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
2(1)	අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය ලෙස මෙහි මින්මතු සඳහන්) පහත දෑ මගින් මූල්‍ය සමාගමේ ආරක්ෂාව සහ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම.	අනුකූල විය.
	අ) මූල්‍ය සමාගමේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික සාරධර්ම අනුමත කර අධීක්ෂණය කිරීම සහ එම පරමාර්ථ සහ සාරධර්ම සමාගම පුරා සන්නිවේදනය කරන බව සහතික කිරීම;	
	ආ) සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ ආසන්න ඉදිරි වසර තුන (03) සඳහා මැනිය හැකි ඉලක්ක සහිත යාන්ත්‍රණ ඇතුළුව මූල්‍ය සමාගමේ සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය අනුමත කිරීම;	2017 - 2019 ක්‍රමෝපායික සැලැස්ම ලබාගත හැකිය.
	ඇ) අවදානම් හඳුනා ගැනීම සහ දූරදර්ශීව අවදානම් කළමනාකරණය කිරීමට සුදුසු ක්‍රම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;	
	ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්හිමියන් සහ ණයකරුවන් ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කිරීම;	
	ඉ) මූල්‍ය සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණාත්මතාව සහ අවංකභාවය සමාලෝචනය කිරීම;	
	ඊ) (i) සැලකියයුතු ප්‍රතිපත්තියට බලපෑම් කරන;	
	(ii) කටයුතුවලට උපදෙස් දෙන, සහ	
	(iii) ව්‍යාපාර කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය පාලනය කරන තනතුරුවල සිටින ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගැනීම සහ නම් කිරීම.;	

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
	උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ බල අධිකාර් ක්ෂේත්‍ර අර්ථ දැක්වීම; ඌ) මූල්‍ය සමාගමේ ප්‍රතිපත්තියට ගැලපෙන පරිදි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් සමාගමේ කටයුතු සම්බන්ධයෙන් සුදුසු පාලනය තිබෙන බවට සහතික කිරීම; එ) පහත දෑ අතුළුව එයටම අයත් පාලන ව්‍යවහාරවල ඵලදායිත්වය කාලීනව ඇගයීම; (i) අධ්‍යක්ෂවරු තෝරීම, නම්කිරීම සහ තෝරා ගැනීම සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය පත්කිරීම; (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ (iii) අවශ්‍ය නැත්හිදී, දුර්වලතා තීරණය කිරීම සහ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම; ඒ) මූල්‍ය සමාගමට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා සුදුසු අනුප්‍රාප්ති සැලැස්මක් ඇති බවට සහතික කිරීම; ඔ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික පරමාර්ථ කරා ප්‍රගතිය නියාමනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ක්‍රමානුකූල රැස්වීම්; ඕ නියාමන පරිසරය අවබෝධ කර ගැනීම; ක බාහිර විගණකවරුන් බඳවා ගැනීම සඳහා පාලනයේදී නිසි ක්‍රියාමාර්ග ගැනීම;	
2(2)	අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (“CEO”) පත්කරන අතර මෙම නියෝගයේ 7 පරිච්ඡේදය අනුව යමින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යයන් හා වගකීම් නියමකර අනුමත කරයි.	අනුකූල විය.
2(3)	සාධාරණ ඉල්ලීමක් මත අධ්‍යක්ෂවරුන්ට මූල්‍ය සමාගමේ වියදමින් සුදුසු අවස්ථාවන්හිදී ස්වාධීන වෘත්තීමය උපදේශන ලබාගත හැකිබවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. මූල්‍ය සමාගම වෙනුවෙන් රාජකාරි ඉටු කිරීමට අදාළ අධ්‍යක්ෂ (අධ්‍යක්ෂවරු) වෙත සහයවීම සඳහා වෙනම ස්වාධීන වෘත්තීය උපදේශන ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය නියම කළ යුතුය.	අනුකූල විය. අධ්‍යක්ෂවරු අවශ්‍ය අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදේශන ලබාගෙන ඇත.
2(4)	අධ්‍යක්ෂවරයෙක් ඔහු හෝ ඔහුගේ ඥාතියෙකු පිළිබඳව හෝ ඔහුට සමීප සම්බන්ධතාවක් ඇති කරුණක් සම්බන්ධ යම් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකදී ඡන්දය දීමෙන් වැලකී සිටිය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍රය සඳහා ඔහු හෝ ඇය ඇතුළත්කිරීම සඳහා ගණන් ගනු නොලබයි.	අදාළ නැත. සමාලෝචිත මූල්‍ය වසර තුළ එවැනි අවස්ථා ඇති නොවීය.
2(5)	මූල්‍ය සමාගම මෙහෙයවීම සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයේ බලාධිකාරිය යටතේ ස්ථිරවම පවතින බව සහතික කිරීමට තීරණය සඳහා එයට විශේෂයෙන් වෙන් වූ කරුණු සම්බන්ධ විධිමත් කාලසටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවිය යුතුය.	අනුකූල විය.
2(6)	මූල්‍ය සමාගමට එහි බැඳීම් ඉටු කිරීමට නොහැකි නම් හෝ නොහැකි වන්නේ නම් හෝ බුන්වත්බවට පත්වීමට නියමිත නම් හෝ තැන්පත්කරුවන් හෝ අනෙකුත් ණයහිමියන් නිසා ගෙවීම් අත්හිටුවීමට නියමිත නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යම් තීරණයක් හෝ පියවරක් ගැනීමට පෙර මූල්‍ය සමාගමේ තත්ත්වය පිළිබඳව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.	අදාළ නැත. සමාලෝචිත මූල්‍ය වසර තුළ එවැනි අවස්ථා ඇති නොවීය.
2(7)	අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය සමාගමේ වාර්ෂික වාර්තාවේ මෙම නියෝගයට අනුකූලව සකස් කළ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක් ඇතුළත් කළ යුතුය.	අනුකූල විය. “ආයතනික යහපාලන වාර්තාව” වාර්ෂික වාර්තාවේ පිටු අංක 72 සිට 105 දක්වා ඇතුලත් වේ.

ආයතනික යහපාලනය

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
2(8)	සෑම අධ්‍යක්ෂවරයෙක් විසින් වාර්ෂිකව සිදුකරනු ලබන ස්වයං ඇගයීම් යෝජනා ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගත යුතු අතර එවැනි ඇගයීම් වාර්තා පවත්වා ගත යුතුය.	අනුකූල විය.
3	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**	
3(1)	අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වශයෙන් මූල්‍ය වසරක් තුළ අවම වශයෙන් මාසිකව දොළොස් (12) වරක් රැස්විය යුතුය. ලිඛිත හෝ විද්‍යුත් යෝජනා/පත්‍රිකා බෙදාහැරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීමෙන් හැකි තරම් වැළකී සිටිය යුතුය.	අනුකූල විය. කරුණාකර පැමිණීම පිළිබඳ විස්තර සඳහා වාර්ෂික වාර්තාවේ 105 පිටුව බලන්න
3(2)	යම් කරුණාක් මූල්‍ය සමාගමේ ව්‍යාපාර ප්‍රවර්ධනයට සහ අවදානම් කළමනාකරණයට සම්බන්ධ වන අවස්ථාවක විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයෙහි එම කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකිවන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය යුතු බව සහතික කළ යුතුය.	අනුකූල විය.
3(3)	සියලුම අධ්‍යක්ෂවරුන්ට විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවීමට හැකි වන පරිදි ඒ පිළිබඳ දැන්වීම අවම වශයෙන් දින හතකට (07)කට පෙර ලබාදිය යුතුය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා, සාධාරණ කාලසීමාවක් තුළ දැනුම් දිය යුතුය.	අනුකූල විය.
3(4)	මාස දොළහක (12) කාලසීමාවක් තුළ පවත්වන ලද රැස්වීම්වලින් අවම වශයෙන් තුනෙන් දෙකකට (2/3) සහභාගි නොවූ හෝ පවත්වන ලද රැස්වීම් තුනකට (03) අඛණ්ඩව සහභාගි වී නොමැති අධ්‍යක්ෂවරයෙක්ගේ අධ්‍යක්ෂධූරය අවසන් කළ යුතුය. කෙසේවෙතත්, අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමට විකල්ප අධ්‍යක්ෂවරයෙක් මගින් සහභාගිත්වය පැමිණීමක් ලෙස සැලකිය යුතුය'	අනුකූල විය.
3(5)	අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම් ලේකම්වරයෙක් පත්කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස්හිමියන්ගේ රැස්වීම්වල ලේඛන තබාගැනීම සහ පවත්වාගෙන යාම සහ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලින් නියම කර ඇති අනෙකුත් කාර්යයන් කරගෙන යාම ඔහුගේ මූලික වගකීම් වේ.	අනුකූල විය.
3(6)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය ලේකම් වෙත පවරා ඇත්නම්, එම කාර්යය කරගෙන යාම සඳහා සමාගම් ලේකම් වගකීමට බැඳී සිටී.	අනුකූල විය.
3(7)	අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි සහ අදාළ සියලුම නීති, උපදෙස්, නියමයන් සහ රෙගුලාසි අනුගමනය කරන බව සහතික කිරීමේ අරමුණින් සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය තිබිය යුතුය.	අනුකූල විය.
3(8)	සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වා ගත යුතු අතර, එම වාර්තා යම් අධ්‍යක්ෂවරයෙක් විසින් සිදුකරන සාධාරණ දැනුම්දීමක් මත සාධාරණ කාලයක් තුළ පරීක්ෂාව සඳහා ලබාදිය යුතුය.	අනුකූල විය.
3(9)	අධ්‍යක්ෂ මණ්ඩලය එහි රාජකාරි ඉටු කිරීමේදී නිසි සැලකිල්ලෙන් හා වාර්තා දූරදර්ශීව කටයුතු කළේද යන්න වාර්තාවලින් ලබාගත හැකි වන පරිදි ප්‍රමාණවත් විස්තර සමඟ ගබඩා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවල පැහැදිලිව පහත කරුණු ඇතුළත් කළ යුතුය. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි විචාරයන්ට යොදාගනු ලැබූ දත්ත හා තොරතුරු පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු, (ඇ) සාධක සොයනලද සාකච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය එහි රාජකාරි ඉටු කිරීමේදී නිසි සැලකිල්ලෙන් කරමින් සිටියේද යන්න පැහැදිලි කරන සම්මුති සහ විසම්මුති පිළිබඳ කරුණු, (ඈ) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායන්ට සහ ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වන සහ අදාළ නීති හා රෙගුලාසි පිළිගැනීමට අදාළ විධායකයින්ගේ පැහැදිලි කිරීම් සහ තහවුරු කිරීම්, (ඉ) මූල්‍ය සමාගම අනාවරණය කෙරෙන අවදානම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ අවබෝධය සහ යොදා ගනු ලැබූ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක්, සහ (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා.	අනුකූල විය.

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
4	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
4(1)	අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව පහ (05)ට නොඅඩු සහ දහතුනට (13) නොවැඩි විය යුතුය.	අනුකූල විය. අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරු නව (09) දෙනෙකුගෙන් සමන්විත වේ.
4(2)	මෙහි අඩංගු සංක්‍රාන්තිමය විධිවිධානවලට යටත්ව සහ මෙම නියෝගයේ පරිච්ඡේද 5 (1) ට යටත්ව, ප්‍රධාන විධායක නිලධාරී හෝ විධායක අධ්‍යක්ෂ තනතුර දරන අධ්‍යක්ෂවරයෙක් නොවන අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවය (09) නොඉක්මවිය යුතුය. විධායක නොවන අධ්‍යක්ෂ තනතුරක මුළු සේවා කාලයට මෙම නියෝගයේ දිනය දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙක් විසින් සේවය කරන ලද මුළු සේවා කාලය ඇතුළත් විය යුතුය.	අනුකූල විය.
4(3)	මූල්‍ය සමාගමේ සේවකයෙක් මූල්‍ය සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කිරීම තෝරාගැනීම හෝ නම්කිරීම කළ හැකි (මෙහි මින්මතු “විධායක අධ්‍යක්ෂ” ලෙස සඳහන් කරන) අතර එසේ කළ හැකි වන්නේ විධායක අධ්‍යක්ෂවරුන්ගේ ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගය (1/2) නොඉක්මවන්නේ නම් පමණි. එවැනි අවස්ථාවකදී, විධායක අධ්‍යක්ෂවරුන්ගේ එක් තැනැත්තෙක් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විය යුතුය.	අදාළ නැත. සමාගම කිසිදු විධායක අධ්‍යක්ෂවරයෙක් පත් කර නොමැත.
4(4)	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සංඛ්‍යාව (මෙම නියෝගයේ ස්වාධීනත්වය තීරණය කිරීම සඳහා දක්වා ඇති නිර්ණායකය අනුව) අවම වශයෙන් මුළු අධ්‍යක්ෂ සංඛ්‍යාවෙන් අවම වශයෙන් හතරෙන් එකක් (1/4)ක් විය යුතුය.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 109 සිට 110 දක්වා බලන්න.
4(5)	විකල්ප අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් නියෝජනය කිරීමට පත්කරන අවස්ථාවක, එසේ පත්කරන පුද්ගලයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්ට අදාළ වන නිර්ණායක සපුරාලිය යුතුය.	අදාළ නැත. කිසිදු විකල්ප අධ්‍යක්ෂවරයෙක් පත් කර නොමැත.
4(6)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ක්‍රමෝපායික ගැටළු, කාර්යසාධනය සහ සම්පත් දැරීම සඳහා අවශ්‍ය කරන නිපුණතා සහ පළපුරුද්ද තිබිය යුතුය.	අනුකූල විය. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද වාර්ෂික වාර්තාවේ පිටු අංක 64 සිට 67 දක්වා විස්තර කෙරේ.
4(7)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක ඍණපූරණයට ඇතුලත්වීමට අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව පැමිණ සිටියද, එම රැස්වීමේ ඍණපූරණයට අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් අවම වශයෙන් භාගයක් (1/2) විධායක නොවන අධ්‍යක්ෂවරු වන්නේනම් මිස අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් නිසිපරිදි පැවත්විය නොහැක.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 105 බලන්න.
4(8)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු මූල්‍ය සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් අනාවරණය කරන සියලුම ආයතනික සන්නිවේදනවලින් පැහැදිලිව හඳුනාගත යුතුය. මූල්‍ය සමාගම සභාපති, විධායක අධ්‍යක්ෂවරු, විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂ වර්ගය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වන වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුලින් අනාවරණය කළ යුතුය.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 109 බලන්න
4(9)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරු පත් කිරීම සඳහා විධිමත්, පරීක්ෂාකාරී සහ විනිවිද ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට පිළිවෙලින් අනුප්‍රාප්තිකව පත් කිරීම සඳහා ක්‍රියාපටිපාටියක්ද තිබිය යුතුය.	අනුකූල විය.
4(10)	තාවකාලික ඇබෑර්තුවක් පිරවීම සඳහා පත්කරන සියලුම අධ්‍යක්ෂවරු ඔවුන්ගේ පත්කිරීමෙන් පසු පළමු වාර්ෂික මහ සභා රැස්වීමේදී තෝරා ගැනීමට යටත් විය යුතුය.	අනුකූල විය.

ආයතනික යහපාලනය

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
4 (11)	අධ්‍යක්ෂවරයෙක් තනතුරින් ඉල්ලා අස්වන්නේනම් හෝ ඉවත් කරනු ලබන්නේනම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම සම්බන්ධයෙන් සහ මෙයටම සීමා නොවූවද අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ අදාළ අධ්‍යක්ෂගේ නොඒකඟතාවයට අදාළ තොරතුරු ඇතුළුව එකී ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සඳහා හේතු ඇත්නම් ඒ බව කොටස්හිමියන්ට නිවේදනය කර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය අංශයේ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම්දිය යුතුය.	අනුකූල විය.
5	**අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාව ඇගයීමේ නිර්ණායක**	
5(1)	වයස අවුරුදු හැත්තෑව (70) ට වැඩි කිසිදු පුද්ගලයෙකුට මූල්‍ය සමාගමේ අධ්‍යක්ෂ ලෙස සේවය කළ නොහැක.	අනුකූල විය.
5(2)	මූල්‍ය සමාගමේ අධ්‍යක්ෂවරයෙක් මූල්‍ය සමාගමේ පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාගම්/ සමාජ/ ආයතනික මණ්ඩල විස්ස (20) කට වැඩිපුර අධ්‍යක්ෂවරයෙක් ලෙස හෝ මෙයට සමාන වෙනත් යම් තනතුරක් දැරිය නොහැක. එසේවුවත්, එම අධ්‍යක්ෂවරයාට ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ 1995 අංක 15 දරන විගණන ප්‍රමිති අනුව විශේෂ ව්‍යාපාර ආයතනයක් ලෙස වර්ගීකරණය කරන සමාගම් දහයකට (10) වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙක් හෝ යම් වෙනත් සමාන තනතුරක් නොදැරිය යුතුය.	අනුකූල විය.
6.	**කාර්යයන් පැවරීම**	
6(1)	අධ්‍යක්ෂ මණ්ඩලය එහි කාර්යයන් සමස්ථයක් ලෙස මුදාහැරීමේ හැකියාවට විශේෂයෙන් බාධාවක් වන හෝ හානිවන පරිදි එහි බලතල මාණ්ඩලීය කමිටු, ප්‍රධාන විධායක නිලධාරී, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත නොපැවරිය යුතුය.	අනුකූල විය.
6(2)	මූල්‍ය සමාගමේ අවශ්‍යතාවන්ට අදාළ වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පවත්නා බව සහතික කිරීමට කාලීන පදනමක් මත බලය පැවරීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතුය.	අනුකූල විය.
7	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**	
9 (4)	මූල්‍ය සමාගමේ වෙනත් සමාන පාර්ශවයකට වඩා හිතකර සැලකීම" ක් යම් පාර්ශවයකට සිදුවන ආකාරයෙන් සම්බන්ධිත පාර්ශවයක් සමඟ ගනුදෙනුවල මූල්‍ය සමාගමේ නොයෙදෙන බව මූල්‍ය සමාගම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. මෙම පරිච්ඡේදයේ අරමුණ සඳහා "වඩා හිතකර සැලකීම" යන්නෙන් පහත දෑ අදහස් වේ: අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි මූල්‍ය සමාගමේ නියාමන ප්‍රාග්ධනයේ දූරදර්ශී ප්‍රතිශතය ඉක්මවමින් සම්බන්ධිත පාර්ශවයකට "මුළු ශුද්ධ පහසුකම" ප්‍රදානය කිරීම. "මුළු ශුද්ධ පහසුකම" ගණනය කරනු ලබන්නේ මුළු පහසුකමින් මූල්‍ය සමාග මේ කොටස් ප්‍රාග්ධනය සහ වසර පහක් (5) හෝ ඊට වැඩි කාලයක් කල්පිරීමට පවත්නා ණය උපකරණ තුළ එවැනි සම්බන්ධිත පාර්ශවයක් විසින් සිදුකරන ලද මුළු ඇප සහ ආයෝජන අඩු කිරීමෙනි. b) මූල්‍ය සමාගමේ වඩා යහපත් ණය දීමේ අනුපාතයට වඩා පහළ පොලී අනුපාතයක් අයකිරීම හෝ අසම්බන්ධිත සමකළ හැකි සමපාර්ශවයක් සමඟ සමකළ හැකි ගනුදෙනුවක් සඳහා ගෙවන ලද පොළිය ඉක්මවන පොළී අනුපාතයක් ගෙවීම. c) අසම්බන්ධිත පාර්ශවයක් සමඟ සමානව ව්‍යාපාර රටාව තුළ ලබාදෙන නියමයන්ගේ සීමාවට ඉක්මවන හිතකර නියමයන්, වෙළෙඳ අලාභ ආවරණය සහ / හෝ ගාස්තු / කොමිස් කපාහැරීම වැනි වරණාත්මක සැලකීම් ලබාදීම; d) විධිමත් ඇගයීමේ ක්‍රියාපටිපාටියක් නොමැතිව සම්බන්ධිත පාර්ශවයකට සේවා ලබාදීම හෝ එවැනි පාර්ශවයකින් සේවා ලබා ගැනීම; e) සමාගම සහ සම්බන්ධිත පාර්ශවය අතර වාර්තාකරණ මාර්ග තොරතුරු ගලායාම් පවත්වා ගැනීම මෙය නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන්ගේ කාර්යසාධනය සඳහා අවශ්‍ය කරන දෑ හැර එවැනි සම්බන්ධිත පාර්ශවයකට ප්‍රතිලාභ ලැබිය හැකි හිමිකම්, රහසිගත හෝ වෙනත් ආකාරයක සංවේදී තොරතුරු හුවමාරුවකට මඟ පෑදිය හැක.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 206 සිට 209 දක්වා 'මූල්‍ය ප්‍රකාශනවලට සටහන්' යටතේ අංක 41 බලන්න.

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
10.	**හෙළිදරවිකිරීම්**	
10 (1)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාලීන මූල්‍ය ප්‍රකාශන නියාමන සහ අධීක්ෂණ බලධාරීන්ගේ අවශ්‍යතාවන්ට සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කරන බව සහතික කළ යුතුය.	අනුකූල විය.
10 (2)	අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාව තුළ සිදුකරන බව සහතික විය යුතුය:	
10 (2) (අ)	වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන විශේෂ අනාවරණයන් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බවට ප්‍රකාශයක්	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 136 හි 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' පිළිබඳ වාර්තාව බලන්න.
10 (2) (ආ)	මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් යුක්තිසහගත සහතික කිරීමක් ලබාදීම සඳහා නිර්මාණය කර ඇති බව සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව තහවුරු කරන මූල්‍ය සමාගමේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවක්.	අනුකූල විය. කරුණාකර අධ්‍යක්ෂ මණ්ඩලයේ අදාළ වාර්තාව සඳහා වාර්ෂික වාර්තාවේ පිටු අංක 134 සිට 135 දක්වා බලන්න.
10 (2) (ඇ)	සකස් කළ හෝ ප්‍රකාශයට පත්කළ යම් මූල්‍ය ප්‍රකාශ සම්බන්ධව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීත්වය සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ සහතික කිරීම.	අනුකූල විය. කරුණාකර පිටු අංක 135 බලන්න.
10 (2) (ඈ)	නම් සහ මූල්‍ය සමාගම සමඟ ගනුදෙනු ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර	අනුකූල විය. විස්තර සඳහා කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 207 බලන්න.
10 (2) (ඉ)	මූල්‍ය සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවූ ගාස්තු/පාරිශ්‍රමිකවල එකතුව	අනුකූල විය. විස්තර සඳහා කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 110 බලන්න.
10 (2) (ඊ)	සම්බන්ධිත පාර්ශවයන්හී එක් එක් වර්ගය සම්බන්ධයෙන් හිඟව තිබෙන මෙම විධානයේ 9 (4) පරිච්ඡේදයෙහි දක්වා ඇති මුළු ශුද්ධ පහසුකම සහ මූල්‍ය සමාගමේ ප්‍රාග්ධන අරමුදලේ ප්‍රතිශතයක් ලෙස සම්බන්ධිත පාර්ශවයන්හී එක් එක් වර්ගය සම්බන්ධයෙන් හිඟව තිබෙන මුළු ශුද්ධ පහසුකම.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 206 සිට 209 දක්වා "මූල්‍ය ප්‍රකාශනවලට සටහන්" යටතේ අංක 41 බලන්න.
10 (2) (උ)	වසර තුළ මූල්‍ය සමාගම විසින් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩයට ගෙවූ පාරිශ්‍රමිකවල එකතුකල වටිනාකම සහ මූල්‍ය සමාගම විසින් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ සිදුකළ ගනුදෙනුවල එකතුකල වටිනාකම, ගෙවූ පාරිශ්‍රමික, ලබාදුන් පහසුකම් සහ මූල්‍ය සමාගම තුළ සිදුකළ තැන්පතු හෝ ආයෝජන වැනි පුළුල් වර්ගීකරණ අනුව දක්වා ඇත.	අනුකූල විය. කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 206 සිට 207 දක්වා " මූල්‍ය ප්‍රකාශනවලට සටහන්" යටතේ අංක 41 බලන්න.

ආයතනික යහපාලනය

අංශය	පාලන අවශ්‍යතාව	2016 දී අනුකූලතා මට්ටම
10 (2) (උ)	දූරදර්ශී අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලන සමඟ අනුකූලතාවයේ විස්තර සහ අනුකූලතා නොවූ අවස්ථා නිවැරදි කිරීමට ගනු ලැබූ පියවර විස්තර කරන වාර්තාවක්.	අනුකූල විය. විස්තර සහ අනුකූලතා නොවූ අවස්ථා නිවැරදි කිරීමට ගනු ලැබූ පියවර කරුණාකර වාර්ෂික වාර්තාවේ පිටු අංක 111 සහ 136 හි පිළිවෙලින් දක්වා ඇති 'සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව' සහ 'මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්' පිළිබඳ වාර්තා බලන්න.
10 (2) (ව)	2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත සහ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කර ඇති නීති හා නියෝග සමඟ අනුකූලතාව පිළිබඳ බාහිර විගණකවරයාගේ සහතික කිරීම.	ආයතනික යහපාලන උපදෙස්වල අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (SLSRS 4750) විසින් නිකුත් කළ සම්බන්ධිත සේවා 4750 පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිවල දක්වා ඇති ක්‍රියාපටිපාටි බාහිර විගණකවරු විසින් යොදා ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අමතන ලද ඔවුන්ගේ වාර්තාවෙන් ඉදිරිපත් කරන සොයා ගැනීම් ඉහත අනාවරණය කළ කරුණු සමඟ අනුරූප වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත වාර්තා කළ කරුණුවලට යම් වැදගත් අනුරූප නොවූ අවස්ථාවන් හඳුනාගෙන නොමැත.

2016 මූල්‍ය වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටු රැස්වීම්වල පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂගේ තත්ත්වය	අධ්‍යක්ෂ මණ්ඩලය	විගණන කමිටුව	පාරිශ්‍රමික කමිටුව		ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	සම්බන්ධිත පාර්ශ්වය ගනුදෙනු සමාලෝචන කමිටුව
				පවත්වන ලද රැස්වීම් ගණන			
		23	03	01		03	01
ඊ.එම්.ආර්. පෙරේරා මහතා (සභාපති) 2016.07.26 දින සිට ඉල්ලා අස්විය	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	10	අ/නැ	අ/නැ		අ/නැ	අ/නැ
එස්.පී. වෙල්ලප්පිලි මහත්මිය 2016.05.17 දින සිට ඉල්ලා අස්විය	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	04	අ/නැ	අ/නැ		අ/නැ	අ/නැ
ආර්.ටී. විජේසිංහ මහතා 2016.06.28 දින සිට ඉල්ලා අස්විය	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	06	අ/නැ	අ/නැ		අ/නැ	අ/නැ
සී.එන්. විජේවර්ධන මහතා	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	21	අ/නැ	01		03	01
ඒ.එස්. පද්මපෙරුම මහතා 2016.07.26 දින සිට ඉල්ලා අස්විය	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	09	අ/නැ	අ/නැ		අ/නැ	අ/නැ
එච්.පී.ඒ. ගුණවර්ධන මහතා 2016.07.26 දින සිට ඉල්ලා අස්විය	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	09	අ/නැ	අ/නැ		අ/නැ	අ/නැ
ආචාර්ය එස්. ලොකුහේවා (සභාපති)	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	13	අ/නැ	01		අ/නැ	අ/නැ
ඩී, එම්. ගුණසේකර මහතා	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	12	අ/නැ	00		අ/නැ	අ/නැ
ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	10	03	අ/නැ		අ/නැ	01
කේ.ඩී.එස්. බණ්ඩාර මහතා	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	10	02	අ/නැ		02	00
එන්. පෙරේරා මහතා	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ	11	03	00		අ/නැ	අ/නැ
එස්.එන් දයාරත්න මහතා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	13	03	01		අ/නැ	01
එස්.පී. අර්ෂකුලරත්න මහතා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	12	03	00		අ/නැ	00
එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	12	00	01		02	01

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

1. පොදු කරුණු

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාව අධ්‍යක්ෂවරු විසින් කොටස්හිමියන් වෙත සතුටින් ඉදිරිපත් කරයි.

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම් ආඥා පනතේ (පරිච්ඡේද 45) යටතේ 1982 මාර්තු 04 දින සංස්ථාපිත පොදු සීමිත වගකීම් සහිත සමාගමකි. මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ නැවත ලියාපදිංචි කරන ලද අතර 1991 සිට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. සමාගම 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති අතර 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ මූල්‍ය කල්බදු සමාගමක් වශයෙන්ද ලියාපදිංචි කර ඇත.

මෙම වාර්තාව තුළ ඇතුළත් කර ඇති විගණන කළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස්කර ඉදිරිපත් කර ඇත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය මෙන්ම සමාගමේ ප්‍රධාන කාර්යාලයද කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 28 ලංකා බැංකුවේ මර්චන්ට් කුළුණෙහි පිහිටා ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත නියමයන්, ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්ගෙන් නිර්දේශ කළ පරිදි අවශ්‍ය කරන තොරතුරු මෙම වාර්තාවෙන් ලබා දේ. මෙම වාර්තාව 2017 මැයි 17 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

2007 අංක 07 දරන සමාගම් පනතේ 168 වගන්තිය අනුව පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වන අතර, සමාලෝචිත වසර (එනම් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා) සම්බන්ධයෙන් මේ යටතේ අනාවරණය කෙරේ.

2007 අංක 07 දරන සමාගම් පනත පරිදි අනාවරණය කළ යුතු තොරතුරු		යොමුව (2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්තිය)	සමාගමේ අනුකූලතා මට්ටම
i	ගිණුම්කරණ කාලසීමාව තුළ යම් වෙනස්වීම් සමඟ සමූහය සහ සමාගමේ ව්‍යාපාරයන්හි ස්වභාවය සහ සමාගමට උනන්දුවක් ඇති ව්‍යාපාර පන්ත	168 (1) (අ) වගන්තිය	146 පිටුව බලන්න
ii	ගිණුම්කරණ කාලසීමාව සඳහා සමූහය සහ සමාගමේ අත්සන් කළ මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කර තිබීම	168 (1) (ආ) වගන්තිය	140 පිටුව බලන්න
iii	සමූහය සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව	168 (1) (ඇ) වගන්තිය	137 පිටුව බලන්න
iv	ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එහි යම් වෙනස්වීම් (සමූහයද ඇතුළත්ව)	168 (1) (ඈ) වගන්තිය	146 පිටුව බලන්න
v	ගිණුම්කරණ කාලසීමාව තුළ හිමිකම් ලේඛනය තුළ සිදුකළ ඇතුළත්කිරීම්වල විස්තර	168 (1) (ඉ) වගන්තිය	206 සිට 209 පිටු බලන්න
vi	සමාගමේ සහ එහි පාලිත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට ගෙවූ අධ්‍යක්ෂ ගාස්තු සහ අනෙකුත් ප්‍රතිලාභ	168 (1) (ඊ) වගන්තිය	110 පිටුව බලන්න
vii	ගිණුම්කරණ කාලසීමාව තුළ සමාගම විසින් සිදුකළ පරිත්‍යාග පිළිබඳ විස්තර	168 (1) (උ) වගන්තිය	111 පිටුව බලන්න
viii	ගිණුම්කරණ කාලසීමාව අවසානයට සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ගිණුම්කරණ කාලසීමාව අධ්‍යක්ෂවරු වශයෙන් තනතුරු දැරීම අවසන් කළ අයගේ නම්	168 (1) (ඌ) වගන්තිය	109 සිට 110 පිටු බලන්න
ix	විගණක ගාස්තු ලෙස විගණකවරුන්ට ගෙවිය යුතු මුදල පිළිබඳ අනාවරණය සහ ගිණුම්කරණ කාලසීමාව තුළ ඉටුකරන ලද අනෙකුත් සේවාවන් සඳහා ගාස්තු ලෙස විගණකවරුන්ට ගෙවිය යුතු මුදල පිළිබඳ වෙනම අනාවරණය	168 (1) (එ) වගන්තිය	111 පිටුව බලන්න
x	සමාගම සහ /හෝ එහි පාලිත සමාගම් සමඟ විගණකවරුන්ගේ සම්බන්ධතා පිළිබඳ විස්තර (විගණක හැර) හෝ විගණකට සමාගම සහ /හෝ එහි පාලිත සමාගම් සමඟ ඇති හිමිකම	168 (1) (ඒ) වගන්තිය	111 පිටුව බලන්න
xi	මෙම වාර්තාවේ අන්තර්ගතව පිළිගැනීම/ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරු දෙදෙනෙක් සහ සමාගම් ලේකම්ගේ අත්සන්	168 (1) (ඔ) වගන්තිය	112 පිටුව බලන්න

2. දැක්ම, මෙහෙවර සහ ආයතනික චර්යාව

සමාගමේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම මෙම වාර්තාවේ 3 පිටුවේ දක්වා ඇත.

3. මුඛ්‍ය ව්‍යාපාර කාර්යයන්

සමාගම 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද මූල්‍ය කල්බදු සමාගමක් වන අතර 2011 අංක 43 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් බලය දෙන ලද මූල්‍ය සමාගමකි. එමෙන්ම, සමාගම, (i) ආන්තික සැපයුම්කරු ii) ප්‍රාරක්ෂකයෙක් සහ (iii) ආයෝජන කළමනාකරුවෙක් යන වර්ගීකරණයන් යටතේ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලියාපදිංචි වෙළෙඳපොල අතරමැදියෙක්ද වේ. MBSL වෙත පාලිත සමාගමක් සහ ආශ්‍රිත සමාගමක් අයත් වන අතර, ඒවානම් MBSL රක්ෂණ සමාගම සහ ලංකා සිකියුරිටීස් (පුද්ගලික) සමාගම වන අතර ඒවා සාමූහිකව සමූහයට ඇතුළත් වේ.

කල්බදු සහ කුලීපිට ගැණුම්, ආයතනික සහ පාරිභෝගික ණය, ආයතනික උපදේශන, ප්‍රාග්ධන වෙළෙඳපොල කටයුතු, සුළු හා මධ්‍ය පරිමාණ අංශවලට මෙන්ම සමාගමේ කෘෂිකාර්මික අංශවලට ණයදීම, තැන්පතු යෙදවීම සහ අනෙකුත් අදාළ මූල්‍ය සේවා සැපයීම සමාගමේ ප්‍රධාන කටයුතු වේ.

පාලිත සහ ආශ්‍රිත සමාගමේ ප්‍රධාන කටයුතු මෙහි 146 පිටුවේ මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්වල 2.3 හී දැක්වේ.

4. මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳ සමාලෝචනයක් සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිටු අංක 6 සිට 7 දක්වා සභාපතිවරයාගේ සමාලෝචනය, පිටු අංක 8 සිට 9 දක්වා ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය සහ පිටු අංක 36 සිට 59 දක්වා කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ තුළ අඩංගු වේ.

5. අනාගත දර්ශනය

සමාගමේ අනාගත සැලසුම් සහ සංවර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් 7 පිටුවේ සභාපතිවරයාගේ සමාලෝචනය සහ 9 පිටුවේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය තුළ ඉදිරිපත් කෙරේ.

6. සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රධානී සහ ප්‍රධාන විධායක නිලධාරි විසින් විධිමත්ව අත්සන් කරන ලද සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමාගමේ සහ සමූහයේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිටු අංක 140 සිට 238 දක්වා සඳහන් කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ සංඝටනීය කොටසක් ලෙස සැලකිය යුතුය.

7. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයන් පිළබිඹු කෙරෙන අයුරින්, පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් සතුවේ. පිටු අංක 140 සිට 238 දක්වා පළකොට ඇති ලාභාලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතින් සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2011 අංක 43 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි සහ 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් හි අඩංගු අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇත. පිටු අංක 36 දැක්වෙන මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් සාදයි.

8. විගණකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳව විගණකාධිපති විසින් සකස් කරණ ලද වාර්තාව පිටු අංක 137හි දැක්වේ.

9. වසර තුළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනස්වීම්

සමාලෝචිත වසර තුළ, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවූ අතර ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 – මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අනුකූලව පසුගිය මූල්‍ය වසරේ යොදා ගනු ලැබූ ඒවාට අනුරූප වූ අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 168(1)(ඈ) වගන්තියට අනුකූල වේ. ගිණුම් ප්‍රකාශයන් පිළියෙළ කොට ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක146 සිට 238 දක්වා ඉදිරිපත් කොට ඇත.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

10. ආදායම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාග මේ ආදායම රු.මිලියන 4,888/-කි (2015 : රු.මිලියන 4,217කි). ආදායම පිළිබඳ විශ්ලේෂණයක් පිටු අංක 156 හි මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක 4 හි දැක්වේ.

11. මූල්‍ය ලාභය හා විසර්ජන

සමාගමේ සහ සමූහයේ කාර්යසාධනය පිළිබඳ විස්තර සහ ලාභ විසර්ජනය පහත වගුවේ දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016 රු.මි.	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
බදු පෙර ලාභය	239.87	(35.43)	246.80	56.00
බදුවියදම	(154.25)	(42.88)	(165.66)	(52.72)
බදු පසු ලාභය	85.62	(78.31)	81.14	3.28
පසුගිය වසරෙන් ඉදිරියට ගෙන ආ ලාභය	747.41	842.94	746.02	742.99
විසර්ජනය කළහැකි ලාභය	833.03	764.63	827.16	746.27
අධි ලාභ බද්ද	-	(38.75)	-	(38.75)
	833.03	725.88	827.16	707.52
විසර්ජනයන්				
අනෙකුත් විස්තීර්ණ ආදායම	37.26	21.53	39.53	19.63
සංචිතවලට මාරු කිරීම	(17.12)	-	(17.12)	-
මුළු විසර්ජනය	20.14	21.53	22.41	19.63
පාලනයට යටත් නොවන හිමිකම	-	-	36.71	18.87
පහළට ගෙන ආ විසර්ජනය නොකළ ලාභය	853.17	747.41	886.28	746.02

12. සංචිත

සමාගමේ සහ සමූහයේ සංචිත පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන	සමාගම		සමූහය	
	2016 රු.මි.	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
ව්‍යවස්ථාපිත සංචිත	157.67	140.54	157.67	140.54
අලෙවිය සඳහා ඇති සංචිතය	(21.80)	(4.35)	(36.20)	(8.92)
රඳවාගත්	853.17	747.41	886.28	746.02

සංචිතවල වෙනස්වීම් පිළිබඳ තොරතුරු 144 පිටුවේ ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය තුළ හා පිටු අංක 205 සිට 206 දක්වා මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 39 හි පිළිවෙලින් දක්වා ඇත.

13. බදුකරණය

සමාගම 28%ක අනුපාතයකට (2015 - 28%) ආදායම් බදු සඳහා වගකීමට බැඳී සිටින අතර මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අනුපාතය 11% - 15% කි.

14. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුම හා විශ්වාසය අනුව අදාළ සියලුම රෙගුලාසි සහ ව්‍යවස්ථාපිත ආයතනයන්ට කළ යුතු ගෙවීම් සමාගම විසින් ගෙවා ඇති බව සහතික කරයි.

15. දේපල හා උපකරණ

සමූහය හා සමාගමට දේපල හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු.මිලියන 175ක් සහ 167ක් විය. සමාගමේ දේපල හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 191 සිට 194 දක්වා මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් අංක 27 සටහන්වල ඇතුළත් වේ.

16. සින්නක්කර දේපළවල වෙළෙඳපොල වටිනාකම

සමාගමේ සියලුම සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි වෘත්තීය සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවෙක් විසින් නැවත තක්සේරු කරන ලදී. ප්‍රකාශිත වටිනාකම ඒ දේපලවල වත්මන් වෙළෙඳ පොල වටිනාකම නොඉක්මවන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ. සමාගමට පූර්ණ අයිතිය ඇති සින්නක්කර දේපලවල විස්තර පිටු අංක 193 මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 27හි ඇතුළත් වේ.

17. කොටස් හා ණයකර නිකුත් කිරීම

සමාගම කොටස් හෝ ණයකර කිසිවක් මූල්‍ය වසර තුළ නිකුත් කර නොමැත.

18. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා ණයකර හා

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය ඡන්දහිමි කොටස් 165,874,541 කින් සමන්විත රු. මිලියන 2,124.46 ක් විය. ප්‍රකාශිත ප්‍රාග්ධනය පිලිබඳ 205 පිටුවේ විස්තර මූල්‍ය ප්‍රකාශයන්හි අංක 38 දරන සටහනෙහි දැක්වේ.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර තුල නිදහස්කළ ණයකර පිළිබඳ විස්තර 198 පිටුවේ විස්තර මූල්‍ය ප්‍රකාශයන්හි අංක32.1 දරන සටහනෙහි දැක්වේ.

19. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

ද්‍රවශීලතා අවදානම අවම කර ගැනීමට සහ තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට මධ්‍ය ප්‍රාග්ධනය සහ පරිපූරක ප්‍රාග්ධනය පිළිබඳ ව්‍යවස්ථාපිත අවශ්‍යතා පවත්වාගන්නා බව සමාගම සහතික කරයි.

ඒ මගින් සමස්තයක් ලෙස සමාගමේ සහ ක්ෂේත්‍රයේ තිරසාරත්වය සහතික කරයි. 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මධ්‍ය ප්‍රාග්ධනය සහ අවදානම මත බරතබන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පිළිවෙලින් 10.66% හා10.69% ක් විය. අවම ප්‍රාග්ධන අවශ්‍යතාව පිළිබඳ තොරතුරු 238 පිටුවේ දැක්වේ.

20. කොටස් පිළිබඳ තොරතුරු

එක් කොටසක් හා අදාළ ඉපයීම්, ලාභාංශ, ශුද්ධ වත්කම් හා වෙළෙඳ පොල වටිනාකම පිටු අංක 11 මූල්‍ය හා සම්බන්ධ කැපී පෙනෙන තොරතුරු වශයෙන් ඉදිරිපත් කොට ඇත. කොටස් හා අදාළ වෙළෙඳ ගනුදෙනු හා සමාගමේ කොටස්වල සංචලනය පිළිබඳ විස්තර පිටු අංක 39 සිට 41 දක්වා මූල්‍ය ප්‍රාග්ධනය කොටසෙහි අනාවරණය කොට ඇත.

21. සැලකිය යුතු කොටස් අයිතිය

ඉහළම කොටස්හිමියන් විසිදෙනා පිළිබඳ විස්තර

වැඩි කොටස් හිමිකම් ඇති විසිදෙනා ඔවුන් සතු කොටස් ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් හා පොදු ජනතාව සතු ප්‍රතිශතය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රාග්ධනය කොටසෙහි පිටු අංක 40 සිට 41 දක්වා අඩංගු කොට ඇත.

22. අධ්‍යක්ෂ මණ්ඩලය

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දක්වා ඇති අතර වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඔවුන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 105 දක්වා ඇත.

අධ්‍යක්ෂවරයාගේ නම	විධායක/ විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන/ විධායක නොවන තත්ත්වය
ආචාර්ය එස්. ලොකුහේවා	සභාපති විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
සී.එන්. විජේවර්ධන මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
ඩී. එම්. ගුණසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
කේ.බී.එස්. බණ්ඩාර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
එන්. පෙරේරා මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන නොවන
එස්.එන් දයාරත්න මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන
එස්.පී. අර්ෂකුලරත්න මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන
එච්.පේ.ඩී. ෆොන්සේකා මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	ස්වාධීන

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාලෝචිත වසර තුළ පත්කිරීම්

2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 (6) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කළ විධානය පරිදි ඊ.එම්.රොනල්ඩ් සී පෙරේරා මහතා, එස්.පී වෙල්ලප්පිලි මහත්මිය, ආර්.ටී. විජේසිංහ මහතා, සී.එන්.විජේවර්ධන මහතා, ඒ.එස්. පද්මපෙරුම මහතා සහ එච්.පී.ඒ. ගුණවර්ධන මහතා 2016.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි MBSL හි අධ්‍යක්ෂවරු ලෙස පත්කරන ලදී.

ආචාර්ය එස්. ලොකුහේවා, ඩී, එම්. ගුණසේකර මහතා, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා, කේ.බී.එස්. බණ්ඩාර මහතා, එන්. පෙරේරා මහතා, එස්.එන්. දයාරත්න මහතා, එස්.පී. අර්ෂකුලරත්න මහතා සහ එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා 2016.07.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි MBSL හි අධ්‍යක්ෂවරු ලෙස පත්කරන ලදී.

සමාලෝචිත වසර තුල ඉල්ලා අස්වීම්

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 84(b) ව්‍යවස්ථාව අනුව ආර්.පී.කේ. ගාල්ලගේ මහතා, ඩී. එම්. ගුණසේකර මහතා, එස්.එස්.ගමගේ මහතා, ඒ එච්. සමරසුන්දර මහතා, එස්.එල්.රහමාන් මහතා, එල්.සී. ද සිල්වා මහතා, බී.ජේ. සින්නයියා සහ ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා (ඩී. එම්. ගුණසේකර මහතාට විකල්ප අධ්‍යක්ෂ) අධ්‍යක්ෂ ලෙස තනතුරු පුරප්පාඩු විය.

එස්.පී. වෙල්ලප්පිලි මහත්මිය 2016.05.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි MBSL හි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

ආර්.ටී. විජේසිංහ මහතා 2016.06.28 දින පැවති වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත්කර ගැනීම සඳහා ඔහු ඉදිරිපත් නොවූයෙන් 2016.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි MBSL හි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂධූරය අවසන් විය.

ඊ.එම්.රොනල්ඩ් සී පෙරේරා මහතා, ඒ.එස්. පද්මපෙරුම මහතා සහ එච්.පී.ඒ. ගුණවර්ධන මහතා 2016.07.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි MBSL හි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

2017 ජනවාරි 1 දිනෙන් පසු පත්කිරීම්
2017.04.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ.බී.එස්. බණ්ඩාර මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ සඳහා විකල්ප අධ්‍යක්ෂ ලෙස ආර්.එම්.ඩී.වී. ජයබාහු මහතා පත්කරන ලදී.

2017.05.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩී. එම්. ගුණසේකර මහතා මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ සඳහා විකල්ප අධ්‍යක්ෂ ලෙස ඩී.එම්.එල්.බී. දසනායක මහතා පත්කරන ලදී.

2017 ජනවාරි 1 දිනෙන් පසු ඉල්ලා අස්වීම්
කිසිවක් නැත.

තෝරාපත් කර ගැනීම සඳහා නිර්දේශ

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 93 ව්‍යවස්ථාව අනුව ආචාර්ය එස්. ලොකුහේවා, ඩී. එම්. ගුණසේකර මහතා, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා, කේ.බී.එස්. බණ්ඩාර මහතා, එන්. පෙරේරා මහතා, එස්.එන්. දයාරත්න මහතා, එස්.පී. අර්ෂකුලරත්න මහතා සහ එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා විශ්‍රාම ගනු ලැබූ අතර

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික නිර්දේශයට අනුව ඉදිරි වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තෝරාගනු ලැබීම පිණිස ඉදිරිපත්වීමට හැකියාව ඇත.

සී.එන්.විජේවර්ධන මහතා සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 87 සමඟ කියවිය යුතු 86 ව්‍යවස්ථාව අනුව විශ්‍රාම ගනු ලැබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික නිර්දේශයට අනුව ඉදිරි වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තෝරාගනු ලැබීම පිණිස ඉදිරිපත්වීමට හැකියාව ඇත.

23. අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා විගණන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, පාරිශ්‍රමික කමිටුව සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව වැනි මාණ්ඩලීය අනු කමිටුවල රැස්වීම් ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වලට ඔවුන්ගේ සහභාගීත්වය පිළිබඳ විස්තර පිටු අංක 105 හි දැක්වේ.

24. හිමිකම් පිළිබඳ ලේඛනය

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව, සමාගම විසින් හිමිකම් ලේඛනයක් පවත්වා ගනී.

2007 අංක 07 දරන සමාගම් පනතේ 192 (2) වගන්තීන් යටතේ දැක්වෙන නියමයන්ට අනුකූලව බැංකුවේ අධ්‍යක්ෂවරුන් ගිවිසුම් හා යෝජිත ගිවිසුම් පිළිබඳ ඔවුන්ගේ සම්බන්ධය හෙළි කොට ඇත. මෙකී සම්බන්ධතා එහි සටහන් කොට ඇති අතර, එකී තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 206 සිට 209 දක්වා සම්බන්ධිත පාර්ශව දක්වා ඇති පිටුවල මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් අංක 41 හි දක්වා ඇත.

25. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වසර තුළ ගෙවූ අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමික පහත පරිදි වේ:

	සමාගම	සමූහය
	රු.මි.	රු. මි.
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමික	4.12	7.37

26. සමාගමේ කොටස් තුළ අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම

සී.එන්. විජේවර්ධන මහතාට අයත් කොටස් 4,235 හැර 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් කොටස්වල හිමිකම නොදරයි.

27. යෝජිත හෝ යෝජිත නොවන ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම

සෘජු සහ වක්‍ර අංශ ද්විත්වයෙන්ම යෝජිත හෝ යෝජිත නොවන ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම් පිටු අංක 206 සිට 209 දක්වා අනාවරණය කෙරේ.

28. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදා ගනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන්ගේ හෙළිදරව් කිරීම අනුකූලව සම්බන්ධිත පාර්ශවයන් හා අදාළ ගනුදෙනු වේ නම් ඒ සියල්ල අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කොට ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මෙම කාරණය උපයෝගි කොට ගැනේ. එසේ හෙළිදරව් කොට ඇති තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 41 සටහනෙහි දක්වා ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වේ.

29. විගණකවරුන් පත්කිරීම

විශ්‍රාම යන විගණකවරු වන විගණකාධිපති විසින් 2017 වසර සඳහා එම තනතුර අබණ්ඩව දැරීමට එකඟතාව පළකර ඇත.

විගණකාධිපති නැවත පත්කිරීමට සහ ඔවුන්ගේ විගණන ගාස්තු තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය දීම සඳහා යෝජනාවක් ඉදිරි වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ලැබේ.

30. විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සහ සමාගම/සමූහය සමඟ සම්බන්ධය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සමාගමේ විගණන ගාස්තු වශයෙන් විගණකවරු වන විගණකාධිපති වෙත රු. 1,917,685 ක් ගෙවන ලදී. ඊට අමතරව, අවසරලත් විගණන නොවන සේවා සඳහා සමාගම විසින් රු. 625,000 ක් ගෙවන ලදී.

සමාගමේ ස්වාධීනත්වය කෙරෙහි බලපෑමක් සිදු කරන යම් සම්බන්ධයක් හෝ උනන්දුවක් විගණකවරුන්ට නොමැති බවට අධ්‍යක්ෂවරුන්ට දැන ගැනීමට ඇති කාරණාවන්ට අනුව පැහැදිලි වේ.

31. නීති හා රෙගුලාසිවලට අනුකූලතාව

සමාගම නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු කාර්යයක යෙදී නොමැත.

32. පරිසරය සුරැකීම

පරිසරය හා අදාළ නීති රීති සියල්ලක්ම සමාගම විසින් පිළිපදිනු ලබයි. සමාගම පරිසරයට හානි පමුණුවන හෝ අහිතකර වන කිසිදු කාර්යයක නිරත නොවේ.

33. ආයතනික පරිත්‍යාග

වසර තුළ, වාර්ෂික මහ සභා රැස්වීමේදී අනුමත කළ යෝජනාවකට අනුව, සමාගම වර්ෂය තුලදී රු. 197,286 (2015: රු. 230,737) ක් පරිත්‍යාග කොට ඇත. මෙම මුදලට සමාගමේ ආයතනික සමාජීය වගකීම් (CSR) වැඩසටහන්වල දායකත්වය ඇතුළත් නොවේ. සමාගමේ CSR වැඩසටහන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 52 සිට 56 දක්වා පිටුවල සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධන වාර්තාව තුළ විස්තර කෙරේ.

34. වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයේ නියමිත දිනට පසු සිදුව ඇති යම් සිදුවීම් අංක 213 පිටුවේ මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 43 සටහනෙහි දක්වා ඇත.

34. අවසන් නොවූ නීති කෘත්‍ය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයට හා සමාගමේ නීතිඥයින්ගේ උපදෙස්වලට අනුව, අවසන් නෙවූ නීති කෘත්‍ය හේතු කොට ගෙන, වාර්තා කොට ඇති බැංකුවේ ඉදිරි ක්‍රියාමාර්ගයන්ට සැලකිය යුතු බලපෑමක් සිදු නොවේ. බැංකුවට එරෙහිව පවත්නා නීතිමය කටයුතු පිළිබඳ විස්තරයක් මූල්‍ය ප්‍රකාශයේ අංක 218 මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 47 සටහනෙහි දැක්වේ.

35. අබණ්ඩ පැවැත්ම

සාධාරණ ලෙස දැකිය හැකි කාලයක් පුරාවට මෙහෙයුම් කටයුතු කරගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් මෙම සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වෙති. ඒ අනුව 2014 පිටුවේ මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 44 හි සාකච්ඡා කළ පරිදි පාලිත සමාගම වන MBSL රක්ෂණ සමාගම (MBSLI) අබණ්ඩ පැවැත්ව පිළිබඳ ගැටළු තිබුනද, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී, ඔවුහු අබණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගනිති.

36. අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන විධි

අවදානම් කළමනාකරණය

සමාගමට මුහුණපෑමට ඇති අවදානම් හඳුනාගැනීමේ, සමීක්ෂණය කිරීමේ හා කළමනාකරණය කිරීමේ යාවත්කාලීනව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් සමාගම සතුව ඇත. අධ්‍යක්ෂවරු, මාණ්ඩලීය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා මෙම ක්‍රියාවලිය ක්‍රමවත් කාලරාමුවක් යටතේ සමාලෝචනය කරති. අවදානම් කළමනාකරණ කිරීමේදී සමාගම විසින් ගනු ලැබූ පියවර පිටු අංක 122 සිට 131 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාවේ විස්තර සහිතව දක්වා ඇත.

37. ආයතනික යහපාලනය

අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩල පහත කරුණු ප්‍රකාශ කර සිටී-

(අ) සමාගම විහි ව්‍යාපාර පවත්වාගෙන යාමේදී අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව සහ අදාළ නීති සහ රෙගුලාසිවලට පටහැනිව කිසිදු කටයුත්තක් නොකරන බව,

(ආ) අධ්‍යක්ෂවරු සමාගම සම්බන්ධවන ගිවිසුම්වල සියලුම වැදගත් කරුණු අනාවරණය කර ඇති බව,

(ඇ) සමාගමේ කොටස් හිමියන්ට මුල් නිකුත් කිරීමේ අනුදේශවලට අනුකූලව සමාන අයුරින් සලකා ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂවරු සියලුම පියවර ගෙන ඇති බව,

(ඈ) අවශ්‍ය උපකල්පන සහ සුදුසුකම්වල ආධාරයෙන් ව්‍යාපාරය අබණ්ඩතා පැවැත්මක් මත මෙහෙයවන බව සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ආයතනික/ ව්‍යාපාර සැලසුම් සමාලෝචනය කර ඇති බව සහ සාධාරණ ලෙස දැකිය හැකි

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

කාලයක් පුරාවට මෙහෙයුම් කටයුතු කරගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් මෙම සමාගම සතුව ඇති බවට සෑහීමට පත්වන බව. ඒ අනුව, සමාගමේ, එහි පාලිත සමාගමේ සහ ආශ්‍රිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩතා පැවැත්ම සංකල්පය මත සකස් කරන බව, සහ

(ඉ) මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලන සහ අවදානම් කළමනාකරණය ආවරණය කෙරෙන අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයක් අධ්‍යක්ෂ මණ්ඩලය පවත්වා ඇති බව සහ මේවායේ ඵලදායීත්වය සහ සාර්ථක අනුකූලතාව පිළිබඳ යුක්ති සහගත සහතිකයක් ලබාගෙන ඇති බව.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම් සභාව එක්ව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචයන් අඩංගු සංග්‍රහයේ හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ නියමයන්හි ඇතුළත් විධිවිධාන අනුව සමාගම සුදුසු පියවර සුදුසු ප්‍රමාණයෙන් ගෙන ඇත. ඒ පිළිබඳ විස්තර පිටු අංක 72 සිට 105 දක්වා ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කර ඇත.

38. මානව සම්පත්

සමාගම සේවකයින් සංවර්ධනය කිරීමට සහ ආයතනික පරමාර්ථ අත්පත් කර ගැනීමට ඔවුන්ගේ දායකත්වය උපරිම කිරීම සඳහා සුදුසු මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. මෙම ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සියලුම සේවකයින්ට සමාන ආකාරයෙන් සැලකීම සහතික කරන අතර එය ඉහල අභිප්‍රේරණයකට හේතු වී ඇත.

39. මහ සභා රැස්වීම

සමාගමේ තිස් පස් වැනි වාර්ෂික මහ සභා රැස්වීම කොළඹ 1, ලෝටස් පාරේ අංක 64 හි ගලදාරී හෝටලයේ උත්සව ශාලාවේදී 2017 ජූනි 27 දින පවත්වනු ලැබේ.

තිස් පස් වැනි වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය 278 වන පිටුවේ දැක්වේ.

40. වාර්තාවේ අඩංගු කරුණු පිළිගැනීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 168 (1) (k) වගන්තිය ප්‍රකාරව, පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්තාවේ අඩංගු කරුණු පිළිගනී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරනු ලැබුවේ.

ආචාර්ය එස්. ලොකුහේවා
සභාපති

සී. එන්. විජේවර්ධන
අධ්‍යක්ෂ

කේ. ජයතිලක
සමාගම් ලේකම්

2017 මැයි 17
කොළඹ

විගණන කමිටු වාර්තාව

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (MBSL) හි විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විගණන කමිටු ප්‍රඥාප්තිය අනුව කටයුතු කරයි. විගණන කමිටු ප්‍රඥාප්තියේ විෂයපථය නව නියාමන අවශ්‍යතා, ප්‍රමිති හා පනත්වල විධිවිධාන ඇතුළත් කරමින් විධිමත්ව සමාලෝචනය කර යාවත් කෙරේ.

විගණන කමිටුවේ සංයුතිය

2016 මාර්තු අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුවීම අනුව, විගණන කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

- රනෙල් ටී විජේසිංහ - සභාපති
  විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ
  (2016 .04.29 දින සිට පත්කළ අතර 2016.07.26 දින සිට ඉල්ලා අස්විය)

  සී.එන්. විජේවර්ධන මහතා - සාමාජික
  විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ
  (2016 .04.29 දින සිට පත්කළ අතර 2016.07.26 දින සිට ඉල්ලා අස්විය)

  ඒ.එස්. පද්මපෙරුම මහතා
  විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ
  (2016 .04.29 දින සිට පත්කළ අතර 2016.07.26 දින සිට ඉල්ලා අස්විය)

  2016 ජූලි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුවීම අනුව, විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ:

- ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා - සභාපති
  විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ (2016 .08.10 දින සිට පත්කරන ලදී.)

- කේ.බී.එස්. බණ්ඩාර මහතා - සාමාජික
  විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ
  (2016 .08.10 දින සිට පත්කළ අතර 2016.12.23 දින සිට ඉල්ලා අස්විය)

- එන්. පෙරේරා මහතා - සාමාජික
- විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ (2016 .08.10 දින සිට පත්කළ)

- එස්.එන් දයාරත්න මහතා - සාමාජික
  විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ
  (2016 .08.10 දින සිට පත්කළ)

- එස්.පී. අර්ෂකුලරත්න මහතා - සාමාජික
  විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ (2016 .08.10 දින සිට පත්කළ)

  එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා - සාමාජික
  විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ
  (2016 .12.23 දින සිට පත්කළ)

කමිටු රැස්වීම්

සමාලෝචිත වසර තුළ කමිටුව රැස්වීම් 3ක් පවත්වන ලදී. විගණන කමිටුමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත්ව වාර්තා කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරී මූල්‍ය ප්‍රධානී ආරාධනය අනුව / ස්වීම්වලට සහභාගි වේ. පැහැදිලි කර ගැනීම් කර ගැනීමට විවිධ අවස්ථාවන්හිදී කමිටුවේ රැස්වීම්වලට අංශයේ ප්‍රධානීන් වෙත ආරාධනය කරන ලදී.

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන කමිටුවේ ලේකම්වරයා වේ.

කමිටුවේ ප්‍රධාන වගකීම්

ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස කටයුතු කරන MBSL හි විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට එහි පාලන වගකීම් කරගෙන යාමේදී සහය වන අතර මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් ලබා දේ. පහත සඳහන් ක්ෂේත්‍ර විගණන කමිටුවේ පාලනය යටතට අයත් වේ.

මූල්‍ය වාර්තාකරණය

අ) මූල්‍ය ප්‍රකාශන, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් යනාදියේ අවංකභාවය සහතික කිරීම පිණිස සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම

ආ) මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය සහතික කිරීම පිණිස අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි ප්‍රමාණාත්මතාව සහ ඵලදායීත්වය ඇගයීම, සමාලෝචනය කිරීම සහ නියාමනය කිරීම.

විගණන කමිටු වාර්තාව

අනුකූලතාව

අ) සමාගම විසින් යොදා ගනු ලැබූ ක්‍රම සහ ක්‍රියාපටිපාටිවල ඵලදායීත්වය සමාලෝචනය කිරීම සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව නියාමනය කිරීම.

ආ) එවැනි නීති හා රෙගුලාසිවලට අනුකූලතාව පිළිබඳ නියාමන ආයතන සහ/ හෝ යම් විගණකවරයෙක් සිදුකළ විමර්ශනයේ සොයා ගැනීම් සමාලෝචනය කිරීම.

ඇ) නියාමන හා රෙගුලාසි අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අවස්ථා පිළිබඳ තවදුරටත් සොයා බැලීම.

විගණන කමිටු වාර්තාව

අභ්‍යන්තර විගණනය

අ) අභ්‍යන්තර විගණන කාර්යය, විගණන වාර්තා සහ නිර්දේශ මත ඉදිරියට කටයුතු කිරීම පිළිබඳ කාර්යසාධනය සමාලෝචනය කිරීම

ආ) සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයේ විගණන ප්‍රඥාප්තිය, විගණන සැලසුම්, ක්‍රියාකාරකම්, විගණන විෂයපථය, වාර්තාකරන අවශ්‍යතා සමාලෝචනය කිරීම

ඇ) කළමනාකාරිත්වය විසින් සිදුකළ අදහස් සමඟ අභ්‍යන්තර විගණකවරුන්ගේ සොයා ගැනීම් සහ නිර්දේශ සමාලෝචනය කිරීම

ඈ) එවැනි සොයා ගැනීම් සහ ප්‍රතිචාරවල ඵලදායිත්වය ඇගයීම.

බාහිර විගණනය

අ) බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ විෂයාත්මකබව මෙන්ම විගණන ක්‍රියාවලියේ ඵළදායීත්වය ඇගයීම.

ආ) අභ්‍යන්තර විගණනය සමඟ සම්බන්ධීකරණය.

ඇ) සොයාගැනීම්, නිරීක්ෂණ සහ නිර්දේශ සහ කළමනාකාරිත්ව ප්‍රතිචාර මෙන්ම නිවැරදි කිරීමේ සැලසුම්වල තත්වය දක්වමින් මූල්‍ය ප්‍රකාශ සහ කළමනාකාරිත්ව ලිපිය පිළිබඳ බාහිර විගණක වාර්තාව සමාලෝචනය කිරීම.

ඈ) කමිටුව හෝ විගණකවරු පුද්ගලිකව සාකච්ඡා කළ යුතු යම් කරුණු සාකච්ඡා කිරීම සඳහා කමිටුව වෙනම බාහිර විගණකවරු හමු වේ.

වසර තුළ කමිටුව විසින් සිදුකළ කටයුතුවල සාරාංශය

සමාලෝචිත වසර තුළ කමිටුව පහත පරිදි එහි රාජකාරි සිදුකරන ලදී;

මූල්‍ය තොරතුරු

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නීති, නියමයන් හා රෙගුලාසිවල අවශ්‍යතාවන්ට අනුකූල ප්‍රමාණය ඇතුළුව සමාගමේ කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ජනතාව වෙත බෙදාහැරීමට පෙර කළමනාකාරිත්වය සහ බාහිර විගණකවරු සමඟ සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

ආ) මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතීන්වල ප්‍රමාණාත්මතාව සහ ඵලදායීත්වය ඇගයීම

අනුකූලතාවඃ

අ) රටෙහි අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව නියාමනය කිරීම සඳහා සමාගමේ පද්ධති සහ ක්‍රියාපටිපාටිවල ඵලදායීත්වය සමාලෝචනය කිරීම.

ආ) අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතා තත්ත්වය පිළිබඳ කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ වාර්තා සමාලෝචනය කිරීම සහ ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීම සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

අභ්‍යන්තර විගණනය

අ) අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි, ගිණුම්කරණ ක්‍රම සහ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිවල ඵලදායිත්වය සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්ට විධිමත් විවේක කාල පැවරීම.

ආ) විගණන සහ විමර්ශනය ආවරණය කරමින් අභ්‍යන්තර විගණකගෙන් ලද වාර්තා සමාලෝචනය කිරීම සහ සිදුකළ නිර්දේශ සහ අඛන්ඩව ක්‍රියාත්මක කිරීම පිළිබඳ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීම.

ඇ) අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීම නියාමනය කෙරෙන බව සහ ඔවුන්ගේ ප්‍රමාණාත්මතාව අඛණ්ඩ පදනමක් මත ඇගයීමට ලක් කරන බව සහතික කිරීමට අභ්‍යන්තර විගණන වැඩසටහන් සමාලෝචනය කිරීම.

ඈ) අභ්‍යන්තර විගණන සමාලෝචනය කිරීම හා ඉන් සිදුකළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.

බාහිර විගණනය

අ) රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විගණකාධිපති විසින් බාහිර විගණනය සිදුකරන ලදී. 2016 වසර තුළ වරලත් ගණකාධිකාරිවරුන් වන M/s BDO Partners විසින් විගණකාධිපතිට සහය විය. විගණනය ආරම්භ කිරීමට පෙර, ක්‍රියාවලිය සහ ක්‍රියාපටිපාටි සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටුව බාහිර විගණක, M/s BDO Partners හමුවිය.

ආ) බාහිර විගණකවරු විසින් නිකුත් කළ කළමනාකරණ ලිපිය සහ එයට කළමණාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව සමාලෝචනය කරන ලදී.

ඇ) 2016 වසරේ විගණනයට අදාළ වන විගණකවරු විසින් හඳුනාගනු ලැබූ අවසාන විගණන කරුණු පිළිබඳ සමාලෝචනය කර ඒ පිළිබඳ සොයා බලන ලදී.

නිගමනය

සමාගමේ කටයුතු සමාගමේ අනුමත ප්‍රතිපත්තිවලට අනුකූලව පාලනය කෙරෙන බවට සමාගමේ වත්කම් විධිමත්ව ගණානය කරන බවට සහ ප්‍රමාණවත් පරිදි ආරක්ෂා කෙරෙන බවට යුක්ති සහගත සහතිකයක් ලබාදෙන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණාන කමිටුව සෑහීමට පත්වේ.

විගණන කමිටුවේ වගකීම් ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ 2009 අංක 4 දරන විධානය සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් පරිදි අනුකූල වන බව විගණාන කමිටුව තහවුරු කරයි.

ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා

සභාපති - විගණාන කමිටුව

2017 මැයි 17 දින

කොළඹ

පාරිශ්‍රමික කමිටු වාර්තාව

පාරිශ්‍රමික කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

රුවන් ගාල්ලගේ මහතා- සභාපති/ ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂ (2016.03.02. දින සිට අධ්‍යක්ෂ ලෙස තනතුර පුරප්පාඩු විය)

සඳුන් ගමගේ මහතා - සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ (2016.03.02. දින සිට අධ්‍යක්ෂ ලෙස තනතුර පුරප්පාඩු විය)

2016.04.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි පාරිශ්‍රමික කමිටුව පහත පරිදි සමන්විත වේ. අජිත් ගුණවර්ධන මහතා - සභාපති / ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ (2016.07.26 දින සිට අධ්‍යක්ෂධුරයෙන් ඉල්ලා අස්විය.)

රනෙල් ටී විජේසිංහ මහතා - සාමාජික / ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ (2016.06.28 දින සිට අධ්‍යක්ෂ තනතුර අවසන් විය.)

සී.එන්. විජේවර්ධන මහතා - සාමාජික / ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

2016.08.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පාරිශ්‍රමික කමිටුව පහත පරිදි සමන්විත වේ.

ආචාර්ය එස්. ලොකුහේවා - සභාපති / ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂ

සී.එන්. විජේවර්ධන මහතා - ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ

ඩී, එම්. ගුණසේකර මහතා - ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ

එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා - ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂ

එස්.එන් දයාරත්න මහතා - ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂ

2016.12.23 දින සිට ක්‍රියාත්මක වන පරිදි පාරිශ්‍රමික කමිටුව පහත පරිදි සමන්විත වේ:

ආචාර්ය එස්. ලොකුහේවා සභාපති/ ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ

සී.එන්. විජේවර්ධන මහතා - ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ

එන්. පෙරේරා මහතා - ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ

එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

එස්.එන් දයාරත්න මහතා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

එස්.පී. අර්ෂකුලරත්න මහතා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

පාරිශ්‍රමික කමිටුවේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙසද කටයුතු කරයි. පාරිශ්‍රමික කමිටුව සමාලෝචිත මුදල් වසර තුළ වරක් රැස්විය.

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීවල්සී (MBSL) හි පාරිශ්‍රමික කමිටුව විධායක (ඇත්නම්) සහ විධායක නොවන අධ්‍යක්ෂවරු මෙන්ම ප්‍රධාන විධායක නිලධාරී ඇතුළුව සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පුළුල් පාරිශ්‍රමික වැඩපිළිවෙලක් තීරණය කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

සමාගමේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සමාගම අපේක්ෂිත පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අදාළ ප්‍රවීණයින් සහිත තරඟකාරී පරිසරයක් තුළ ගුණාත්මත කළමනාකාරිත්වයක් ආකර්ෂණය කිරීමට, අභිප්‍රේරණය කිරීමට සහ රඳවා තබා ගැනීමට උත්සාහ කරයි.

MBSL සහ එහි කොටස්හිමියන්ගේ දිගුකාලීන යහපත සැලකිල්ලට ගැනීමට අමතරව, පාරිශ්‍රමික කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන පාරිශ්‍රමික තීරණය කිරීමේදී රාජ්‍ය ව්‍යවසායට අදාළ වන චක්‍රලේඛ (රාජ්‍ය මූල්‍ය ව්‍යවසාය චක්‍රලේඛ), අදාළ රේඛීය අමාත්‍යංශය විසින් නිකුත් කල විධානවලට සහ ලංකා බැංකුවේ එකඟත්වයට අනුකූල විය යුතුය.

අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම්වලට පැමිණීම සඳහා (පැමිණීම අනුව) ගාස්තු ලබා ගැනීමට මෙන්ම ගමන් අත්තිකාරම් ප්‍රතිපූරණය කර ගැනීමටද හිමිකම ඇත. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට වරින් වර තීරණය කළ හැකි පරිදි කමිටු මට්ටමේ සහභාගීත්වය තුළින් ගනු ලබන අමතර සේවා/වගකීම් සඳහා අතිරේක ගාස්තු ගෙවීම සඳහාද හිමිකම ඇත.

සභාපතිවරයාගේ පාරිශ්‍රමික සමාන ආයතන විසින් ගෙවනු ලබන තරඟකාරී වෙළෙඳපොල අනුපාත සැලකිල්ලට ගනිමින් ඔහුගේ /ඇයගේ අදාළ ප්‍රවීණත්වය, අධ්‍යාපනික හා දක්ෂතා මට්ටම්, නායකත්ව ගුණාංග සැලකිල්ලට ගනිමින් තීරණය කරනු ලබයි.


ප්‍රධාන විධායක නිලධාරීගේ පාරිශ්‍රමිකය ආයතනයේ පාරිශ්‍රමික ව්‍යූහයට ගැලපෙන ලෙස පාරිශ්‍රමික කමිටුව / අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි සමාන ආයතන විසින් ගෙවනු ලබන තරඟකාරී වෙළෙඳපොල අනුපාත සහ වෙනත් යම් අදාළ සාධක සැලකිල්ලට ගනිමින් ඔහුගේ /ඇයගේ ක්ෂේත්‍රයේ පළපුරුද්ද,

අධ්‍යාපනික හා දක්ෂතා මට්ටම්, සැලකිල්ලට ගනිමින් තීරණය කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරීගේ පාරිශ්‍රමිකය මුදල් සහ මුදල්මය නොවන ප්‍රතිලාභ වැනි විවිධ සංයෝගවලින් සමන්විත වන අතර කාර්යසාධනය පිළිබඳ මැනිය හැකි ප්‍රමිතිවලට සම්බන්ධ කරනු ලැබේ.

පාරිශ්‍රමික කමිටුව අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එහි නිර්දේශ සිදුකරයි.

අධ්‍යක්ෂවරුන්ගේ සම්පූර්ණ වේතන මූල්‍ය ප්‍රකාශනවල 161 පිටුවේ සටහන් 13 හි අනාවරණය කෙරේ.



ආචාර්ය එස්. ලොකුහේවා
සභාපති - පාරිශ්‍රමික කමිටුව

2017 මැයි 17 දින
කොළඹ

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

කමිටුවේ අරමුණ

කමිටුවේ අරමුණ සංග්‍රහයේ පැහැදිලිව නිදහස් කරන ලද ගනුදෙනු හැර යෝජිත සියලුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කලින්ම සමාලෝචනය කරනු ලබයි. ඒ අනුව, සංග්‍රහයේ 27 නියමය යටතේ සඳහන් කර ඇති ගනුදෙනු හැර, අනෙකුත් සියලුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) විසින් ගනුදෙනුවට ඇතුළත්වීමට පෙර, හෝ එවැනි සමාලෝචනය මත ගනුදෙනුව කොන්දේසි බවට ප්‍රකාශ කරන්නේනම්, ගනුදෙනු අවසාන කිරීමට පෙර සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

කමිටුවේ සංයුතිය

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබයි. 2016 දෙසැම්බර් 31 දිනට, එය පහත අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

	අධ්‍යක්ෂවරුන්ගේ නම්	අධ්‍යක්ෂවරයාගේ තත්ත්වය	සමාජික තත්ත්වය
1	එස්.එන් දයාරත්න මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	සභාපති
2	සී.එන්. විජේවර්ධන මහතා	විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ	සාමාජික
3	ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා	විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ	සාමාජික
4	කේ.බී.එස්. බණ්ඩාර මහතා	විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ	සාමාජික
5	එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	සාමාජික
6	එස්.පී. අර්ෂකුලරත්න මහතා	විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ	සාමාජික

කමිටුවේ විෂයපථය

- සමාගමේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචනය කිරීමට ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි යොදා ගැනීම සහ දැනට පවත්නා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම.
- 27 නියමය යටතේ සංග්‍රහයේ පැහැදිලිව නිදහස් කරන ලද ගනුදෙනු හැර සමාගමේ යෝජිත සියලුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කලින් සමාලෝචනය කිරීම.
- සමාගම විසින් ඇතුළත්වීමට නියමිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවලට අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ කොටස්හිමියන්ගේ අනුමැතිය අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීම.
- සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමඟ දැනට පවත්නා ගනුදෙනු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨකළමනාකාරිත්වය විසින් අනුගමනය කරන නැවත නැවත ඇතිවන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධ මාර්ගෝපදේශ නියම කිරීම.
- සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඔහු හෝ ඇය සම්බන්ධිත පාර්ශවයක් වන යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සඳහා වන සාකච්ඡාවන්ට, කමිටුව වෙත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් තොරතුරු ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා කමිටුව විසින් එවැනි අධ්‍යක්ෂවරයෙක් වෙත ඉල්ලා සිටින්නේනම් මිස සහභාගි නොවන බව තහවුරු කිරීම.
- අදාළ නීති/ රෙගුලාසිවල අවශ්‍යතාව පරිදි ආසන්නතම වෙළෙඳපොල අනාවරණ සහ වාර්ෂික වාර්තාවේ අනාවරණ කාලීන සහ විස්තරාත්මක ආකාරයෙන් සිදුකරන බව සහතික කිරීම.

ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි

සමාගම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තියක් (RPT) ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව “සම්බන්ධිත පාර්ශව” ලෙස සැලකිය හැකි පුද්ගලයින් / ආයතන පිළිබඳ වර්ගීකරණයක් හඳුනා ගෙන ඇත. සමාගම “වඩාත් හිතකර” සැලකීමක් පාර්ශව වෙත ලබාදෙන ආකාරයකින් සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනුවල නොයෙදෙන බව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් සහතික කරයි.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුව, අධ්‍යක්ෂවරුන්ගෙන් ඔවුන්ට අදාළ සම්බන්ධිත පාර්ශව හඳුනාගැනීමේ අරමුණ සඳහා සෑම අධ්‍යක්ෂවරයෙකුගෙන් ස්වයං ප්‍රකාශන ලබා ගනී.

බැඳියා පිළිගැටුම්වලට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්ති දක්වා ඇති ව්‍යාපාර චර්යා සංග්‍රහය සහ සමාගමේ ආචාරධර්ම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කළමනාකරණය කර ගැනීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

කමිටුවේ රැස්වීම්

කමිටුව වසරේ අවසාන කොටසේදී පිහිටුවනු ලැබූ අතර සමාලෝචිත වසර තුළ එක් වරක් රැස් වී ඇත. රැස්වීමක ඍණපූරණය සාමාජිකයින් හතර දෙනෙකි. ජ්‍යෙෂ්ඨකළමනාකාරිත්වයේ සාමාජිකයින්ට අවශ්‍යතාව පරිදි රැස්වීම්වලට සහභාගි වන ලෙස ආරාධනය කරන ලදී. මූල්‍ය අංශය කමිටුව වෙත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇත. 2016 වසර තුළ අදාළ පාර්ශව සමඟ සියලුම ගනුදෙනුවල විස්තර කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

නිගමනය

සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවලට අදාළ ලැයිස්තුගත නියමයන් සමඟ අනුකූලතාව සහතික කර කියා සිටින ප්‍රකාශයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ප්‍රකාශනයක් මෙම වාර්ෂික වාර්තාවේ සටහන් 41 හි දැක්වේ.



එස්.එන් දයාරත්න මහතා
සභාපති - සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව

2017 මැයි 17 දින
කොළඹ

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (MBSL) හි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව කටයුතු කරයි. සමාගම තුළ විචක්ෂණ අවදානම් කළමනාකරණ භාවිතයන් පවත්වා ගැනීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය විධිමත්ව සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලබයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ සාමාජිකයින්

සී.එන්. විජේවර්ධන මහතා - සභාපති
විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ

කේ.බී.එස්. බණ්ඩාර මහතා - සාමාජික
විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එච්.පේ.ඩී. ගොන්සේකා මහතා - සාමාජික
විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ

ටී. මුතුගල මහතා - සාමාජික ප්‍රධාන විධායක නිලධාරී

අනෙකුත් සාමාජිකයින්

ඩී. දලුවත්ත මහතා - සාමාජික ප්‍රධාන මෙහෙයුම් නිලධාරී හා වැඩබලන ශාඛා කලාපය 1

එස්.අමරතුංග මහත්මිය - සාමාජික
ජ්‍යෙෂ්ඨනියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- අනුකූලතා නිලධාරී

එස්. උඩුවාවල මහතා - සාමාජික
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ශාඛා කලාප 2

එල්. කලුආරච්චි මහතා - සාමාජික
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ශාඛා කලාප 3

කේ.ජයතිලක මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති හා සමාගම් ලේකම්

එල් පීරිස් මහතා - සාමාජික
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - රන් ණය හා සහය සේවා

ජේ.ගම්ලත් මහතා - සාමාජික
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, නිෂ්පාදන සංවර්ධන,

පී.අයි. කඳනාරච්චි මහතා - සාමාජික
මූල්‍ය ප්‍රධානී

සී. විතාරච්චි මහතා - සාමාජික
තොරතුරු තාක්ෂණ ප්‍රධානී

එස්. ප්‍රනාන්දු මහතා - සාමාජික
සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

කේ. ජයසුන්දර මහතා - සාමාජික
සහකාර සාමාන්‍යාධිකාරී - අයකරගැනීම්

ටී.ඩී.ඩී.කේ. ගුණවර්ධන මහතා - සාමාජික
සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත්

එල්. ගුණවර්ධන මහතා - සාමාජික
වැඩබලන ප්‍රධාන කළමනාකරු - ආයතනික උපදේශන හා ප්‍රාග්ධන වෙළෙඳපොල

එච්.එන්. විජයතුංග මහතා - සාමාජික
කළමනාකරු - අවදානම් කළමනාකරණ

IRMC රැස්වීම්

සමාලෝචිත වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී. අවදානම් කළමනාකරණ වාර්තා සහ වෙනත් අවදානම් ආශ්‍රිත වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සමාලෝචනය කරන අතර අවදානම් කළමනාකරණ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විස්තර කර ඇති ආයතනික පාලන විධානයන්ගෙන් නියම කර ඇති පරිදි නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

කමිටුවේ ප්‍රධාන වගකීම්

IRMC යනු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබූ අනු කමිටුවක් වන අතර, එය විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරී සහ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් වැනි අවදානම් වර්ග අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් සමන්විත වේ. MBSL සමාගම් ලේකම් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරන අතර, කමිටුව වෙත පවරන ලද බලය හා වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගනී. ඊට අමතරව කමිටුවට පහත වගකීම්ද පැවරී ඇතත;

(I) සුදුසු අවදානම් දර්ශක හා කළමනාකාරිත්ව තොරතුරු තුළින් මාසික පදනමක් මත සමාගමට ඇති අවදානම් ඇගයීම. පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, මූල්‍ය සමාගමේ පදනම සහ සමූහ පදනම මත අවදානම් කළමනාකරණය කිරීම.

(II) විශේෂ අවදානම් හඳුනාගැනීමට සහ කමිටුව විසින් නියම කළ පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් යොදා ගනී. තවද එවැනි අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකාරිත්ව කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායීත්වය සමාලෝචනය කිරීම.

(III) විශේෂ අවදානම් සමාගමේ ප්‍රතිපත්ති, නියාමන සහ අධික්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විචක්ෂණ මට්ටමින් එහා ඇති අවස්ථාවක එම විශේෂ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් පිළියම් ගැනීම.

(IV) යාවත්කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලුම අංග ඇගයීමට අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම.

(V) විශේෂ අවදානම් හඳුනා ගැනීමට අසමත් වීම සඳහා වගකීම් සහගත නිලධාරීන්ට විරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ කමිටුවේ නිර්දේශ පරිදි සහ / හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් උපදෙස් දී ඇති පරිදි කඩිනම් පිළියම් ගැනීම.

(VI) අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, විකඟත්වය සහ / හෝ විශේෂ විධානයන් සොයමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමකට සතියක් තුළ අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(VII) සියලුම ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නීති, රෙගුලාසි, විධාන, නියමයන්, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්තිවලට සමාගමේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා කාර්යයක් ස්ථාපිත කිරීම. ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයෙන් තෝරාගත් විශේෂ අනුකූලතා නිලධාරියෙක් අනුකූලතා කාර්ය කරගෙන යනු ලබන අතර කලින් කළ කමිටුව වෙත වාර්තා කරයි.

නිගමනය

MBSL හි තීරණාත්මක අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය කමිටුව සමාලෝචනය කර ඇති අතර පූර්ව නිශ්චිත අවදානම් පරාමිති තුළ සමාගමේ සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට සහය විය.

සී.එන්. විජේවර්ධන මහතා
සභාපති - ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2017 මැයි 23 දින
කොළඹ

අවදානම් කළමනාකරණය

G4-45-47

අවදානම් කළමනාකරණ සමාලෝචනය


සක්‍රීය සහ ඵලදායී අවදානම් කළමනාකරණය තිරසාර ඇල්මැති පාර්ශව වටිනාකමක් ඇති කිරීමට මූලික වේ. සමාගමක් ලෙස, අපගේ ක්ෂේත්‍රයෙහි වෙනස්වන ගතිකතාවන්ට අපි අනුකූල වෙන අතර, අපගේ අවදානම් කළමනාකරණය රාමුව සහ භාවිතයන් අඛන්ඩව ප්‍රසාදනය කිරීමේ සහ වැඩි කිරීමේ අත්‍යවශ්‍ය වැදගත්කම අපි හඳුනා ගනිමු. අවදානම් ප්‍රතිඵලාවන් ක්‍රමෝපාය තීරණය කිරීමේදී මෙන්ම අපගේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීමේදී තීරණාත්මක යෙදවුමකි. අවදානම් කළමනාකරණය සඳහා අවදානම් මැනිම සහ පාලනය කිරීම සඳහා විස්තරාත්මක ප්‍රතිපත්ති රාමු, මනාව නිශ්චය කළ පාලන ව්‍යුහය සහ සුදුසු මෙවලම් සහ ශිල්ප මගින් අවදානම් කළමනාකරණය සඳහා සමාගමේ සාකල්‍ය ප්‍රවේශයට පහසුකම් සපයයි.

2016 විශේෂ සිදුවීම්

- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- 2016 CCD නියමයන් සමඟ අනුකූලවීමට AML ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.
- 4.2% කින් දළ අක්‍රීය ණය අනුපාතය අඩුකිරීම.
- නියාමන අවශ්‍යතාවන්ට ඉහල මට්ටමක ද්‍රවශීලතා වත්කම් අනුපාතය පවත්වා ගැනීම
- නව මධ්‍ය බැංකුකරණ පද්ධතිය තුළ ආයෝජනය
- 2017 - 2019 ක්‍රමෝපායික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධාන සහ SEC, CSE සහ අනෙකුත් ආයතන විසින් නිකුත් කළ අනෙකුත් රෙගුලාසිවලට අනුකූලවීම.
- සමාගමේ සන්නාමය ප්‍රවර්ධනය වීම

අවදානම් පාලනය

MBSL හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ අවදානම් පැතිකඩ පූර්ව නිශ්චිත පරාමිති තුළ පවත්වා ගන්නා බව සහතික කිරීම සඳහා ඉහළම වගකීම් දරයි. මේ අයුරින් අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ අවදානම් රුචිය තීරණය කිරීම, අවදානම ආශ්‍රිත ප්‍රතිපත්ති රාමු සකස් කිරීම, අඛණ්ඩ පදනමක් මත සමාගමේ අවදානම් පැතිකඩ නියාමනය සඳහා මෙන්ම ක්‍රියාත්මකව පවත්නා අවදානම් කළමනාකරණ ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටියේ ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අනු කමිටු සහ කළමනාකරණ කමිටු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වැඩි රාජකාරී මුදා හැරීමේදී සහය වන අතර එය පහත දැක්වේ.



ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාගමේ සියලුම අවදානම් ආශ්‍රිත අංශ පිළිබඳ ස්වාධීන විශ්ලේෂණයක් ලබාදෙන අතර අවදානම් පාලන ව්‍යූහ, ප්‍රතිපත්ති රාමු, සම්මත සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණාත්මතාව සහ ඵලදායීත්වය සහතික කිරීමේදී කළමනාකාරිත්වය සමඟ සමීපව කටයුතු කරයි. එම කමිටුව එය විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරි සහ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් වැනි අවදානම් වර්ග අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගෙන් සමන්විත වේ. වසර තුළ ස්ථාපන නියමයන් කමිටුවේ කටයුතු වාර්ෂික වාර්තාවේ 120 පිටුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාවේ විස්තර කෙරේ.

ණය කමිටුව
කළමනාකරණ කමිටුවක් වන ණය කමිටුව සමාගමේ ණය අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අවදානම් රුචිය තුළ පාලනය කෙරෙන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳි සිටී. විශේෂ නියමයන් හා කොන්දේසිවලට යටත්ව බලය පවරන ලද පරාමිති තුළ (BOD විසින් පවරන ලද) ණය අනුමත කිරීමට කමිටුව වෙත බලය පැවරේ. එමෙන්ම BOD ගේ අවධානය අවශ්‍ය වන විශේෂ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි නිර්දේශ කරයි. කමිටුව ප්‍රධාන විධායක නිලධාරි විසින් මෙහෙයවන ආයතනික කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

වත්කම් හා වගකීම් කමිටුව (ALCO)
වත්කම් හා වගකීම් කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවසාන උපදේශන ඒකකයක් ලෙස සැලකෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කළමනාකරණ කමිටුවකි. එය ප්‍රාග්ධන අවදානම ඇතුළුව වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම සහ ශේෂ පත්‍ර ව්‍යූහය කළමනාකරණය කිරීම සඳහා වගකීමට බැඳි සිටී. කමිටුව ප්‍රධාන විධායක නිලධාරි විසින් මෙහෙයවන ආයතනික කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් සමන්විත වන අතර සමාගමේ අනාගත ක්‍රමෝපායික උපදෙස් සඳහා අත්‍යවශ්‍ය දායකත්වයක් ලබා දේ.

ආයෝජන කමිටුව
කළමනාකරණ කමිටුවක් වන ආයෝජන කමිටුව සමාගමේ ආයෝජන කළඹ පවත්වා ගැනීම සඳහා වගකීම දරන අතර ආයෝජන මිලදීගැනීම්, තබාගැනීම් සහ විකිණීම්වලට අදාළ තීරණ ගනී. කමිටුව ප්‍රධාන විධායක නිලධාරි විසින් මෙහෙයවන ලද අතර ආයතනික කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධාරියෙක් නියෝජනය කරයි.

අයකරගැනීම් කමිටුව
මෙම කමිටුව සමාගමේ ණය එකතු කිරීම් සහ අයකරගැනීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ අක්‍රීය ණය තත්ත්වය නිශ්චිත පරාමිති තුළ පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. කමිටුව ආයතනික කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධාරියෙක්ගෙන් සමන්විත වන අතර ප්‍රධාන විධායක නිලධාරි විසින් මෙහෙයවනු ලබයි.

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව
තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව ප්‍රධාන විධායක නිලධාරි විසින් මෙහෙයවන ලද අතර එක් නිලධාරියෙක් බැගින් සෑම අංශයක්ම නියෝජනය කරයි. සමාගමේ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය එක් එක් අංශයේ වර්ධන ක්‍රමෝපායන් සහ ව්‍යාපාර අවශ්‍යතාවන්ට සම්බන්ධ කරන බව කමිටුව සහතික කරයි.

ප්‍රාදේශීය ප්‍රධානීන් සහ කලාප කළමනාකරුවන්
ආරක්ෂාවේ පළමු මාර්ගය ලෙස, ප්‍රාදේශීය ප්‍රධානීන් ඔවුන්ට අදාළ ප්‍රදේශවල මුහුණ පාන අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා වගකීමට බැඳි සිටී. ප්‍රාදේශීය කළමනාකරුවන් කලාපය තුළ ශාඛාවන්හී අවදානම් හඳුනාගෙන පාලනය කිරීම සඳහා වගකීමට බැඳි සිටී.

අභ්‍යන්තර විගණන අංශය
අභ්‍යන්තර විගණන අංශය සහකාර සාමාන්‍යාධිකාරී - සමූහ අභ්‍යන්තර විගණන විසින් මෙහෙයවනු ලැබේ. මෙම අංශය සමාග මේ සියලුම ශාඛා සහ අංශ විගණනය කිරීමට බලය ඇති අතර මාණ්ඩලීය විගණන කමිටුව වෙත වාර්තා කරයි.

අවදානම් කළමනාකරණ අංශය
අවදානම් කළමනාකරණ අංශය ලාභ සහ ධාරිතා ඉලක්කවලින් ස්වාධීනව කටයුතු කරන අතර සමාගමේ සමස්ථ අවදානම් පැතිකඩ හඳුනාගැනීම, විශ්ලේෂණය, ඇගයීම, අවම කිරීම සහ නියාමනය කිරීම සඳහා විධායක වගකීම දරයි. අංශයේ ප්‍රධාන වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ.

- කාලානුරූපීව සමාගමට බලපාන සියලු අවදානම් සහ අවදානම් අවම කිරීමට යෝජිත ක්‍රමෝපායන් ඇගයීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තීරණය කිරීම.
- විවිධ වර්ගයේ අවදානම් අවම කිරීම සඳහා විශේෂ කටයුතු, ක්‍රියාවලි, ශාඛා හෝ අංශවලට සහයවීම සඳහා මාර්ගෝපදේශ, උපදෙස්, ආදර්ශ සහ කාර්ය සැලසුම් සංවර්ධනය කිරීම.
- ප්‍රධාන අවදානම් නිරාවරණ හඳුනාගැනීම හා විශ්ලේෂණය
- අවදානම් අවම කිරීමේ ක්‍රමවේදයන් ප්‍රමාණවත්ව ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීම.

අවදානම් කළමනාකරණය
- කාර්තුමය අවදානම් ඇගයීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණයට ප්‍රවේශය

MBSL හි අවදානම් කළමනාකරණ රාමුව ගෝලීය වශයෙන් පිළිගත් තෙවැදෑරුම් ආරක්ෂක ආදර්ශ මත පදනම් වන අතර සමාගමට එහි අවදානම් ප්‍රමිතිගත ආකාරයකින් පාලනය කිරීමට හැකියාව ඇති කරමින් රාජකාරී පැහැදිලිව බෙදාදැක්වීම සහතික කරයි.

පළමු ආරක්ෂක මායිම

- ප්‍රාදේශීය හා කලාපීය මට්ටමින් අවදානම් හඳුනාගැනීම, ඇගයීම, වාර්තාකිරීම සහ අවමකිරීම හා සම්බන්ධ වේ.
- මෙම ආරක්ෂක මාර්ගයේ වගකීම ශාඛා සහ ප්‍රාදේශීය ප්‍රධානීන් සහ කළමනාකරණ මට්ටමේ අවදානම් ආශ්‍රිත කමිටු හා බැඳේ.

දෙවන ආරක්ෂක මායිම

- අවදානම් කළමනාකරණ අංශයේ මධ්‍යගත පාලනය සහ සමාගම නිරාවරණය වන එක් එක් අවදානම් වර්ග සඳහා වැඩපිළිවෙල සහ ප්‍රතිපත්තිවලින් මෙය සමන්විත වේ.

තෙවන ආරක්ෂක මායිම

- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දෙන අභ්‍යන්තර හා බාහිර විගණක කාර්යයන්ගෙන් මෙය සමන්විත වේ.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය



අවදානම් හඳුනාගැනීම : අවදානම් හඳුනා ගැනීමේ විවිධ ක්‍රම තුළින් වාර්ෂික පදනමක් මත අවම වශයෙන් ව්‍යාපාර ඒකක මට්ටම්වලදී අනාගත අවදානම් හඳුනා ගනී.

අවදානම් විශ්ලේෂණය සහ ඇස්තමේන්තු කිරීම : ප්‍රමාණාත්මක සහ ගුණාත්මක මෙවලම් රාශියක් හඳුනාගත් අවදානම් නිරාවරණය ඇගයීම සඳහා භාවිතා කරනු ලබයි. මෙම ක්‍රමවලට අනෙකුත් කරුණු අතර විශ්ලේෂණාත්මක සමාලෝචනය, පීඩන පරීක්ෂණය සහ ක්‍රියාදාම විශ්ලේෂණය, විමසීම සහ තහවුරු කිරීම ඇතුළත් වේ. අවදානම් විශ්ලේෂණය ව්‍යාපාර ඒකක මට්ටමින් පවත්වනු ලබන අතර අවදානම් කළමනාකරණ අංශය විසින් සහතික කරනු ලබයි.

අවදානම් අවමකිරීම :අවදානම් අවම කිරීමේ ක්‍රමෝපාය අවදානම් විශ්ලේෂණ අභ්‍යාසයෙන් ලබාගත් ප්‍රතිචාර මත පදනම්ව තීරණය කරයි. ක්‍රමෝපායන් අවදානම් කළමනාකරණ අංශය විසින් සියලුම ව්‍යාපාර ඒකක වෙත නිර්දේශ කරයි. ප්‍රධාන ක්‍රමෝපායන් හතර නම් ගවේෂණය, පිළිගැනීම, හුවමාරුව සහ වැළැක්වීමයි.

අවදානම් නියාමනය සහ වාර්තාකරණය : සමාගමේ සමස්ත අවදානම් පැතිකඩ විස්තර කරන අවදානම් තක්සේරු වාර්තාවක් අවදානම් කළමනාකරණ අංශය විසින් සකස් කර කාර්තුමය පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. ඊට අමතරව, අවදානම් කළමනාකරණ අංශය විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා විවිධ අවදානම් ඇගයීමේ වාර්තා සම්පාදනය කරයි. එමෙන්ම, අනුකූලතා වාර්තාව මාසික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

අවදානම් සංගහනය

MBSL හි ව්‍යාපාර කටයුතු විවිධ අවදානම් නිරාවරණ ඇති කරන අතර එයට සමාගමට සෘජුව කළමනාකරණය කළ හැකි සහ සමාගමේ පාලනයෙන් බාහිරව පවත්නා අවදානම්වලින් සමන්විත වේ. මෙම අවදානම් ප්‍රාග්ධනයට ඇති අනාගත බලපෑම ඇගයීම සඳහා පමණක් නියාමනය කළ හැකිය. සමාගමේ ප්‍රධාන අවදානම් නිරාවරණ පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

බැංකුව විසින් පාලනය කරන අවදානම් සංගහනය


අවදානම් වර්ගය	මූල්‍ය අවදානම				සිදුවීම් අවදානම	
අවදානම් නිරාවරණය	ණය අවදානම	ද්‍රවශීලතා අවදානම අරමුදල් අවදානම	වෙළෙඳපොල අවදානම	ක්‍රමෝපායික අවදානම	මෙහෙයුම් අවදානම කීර්තිනාම අවදානම	අනුකූලතා අවදානම

බලපෑම් ඇගයීමට බැංකුව විසින් නියාමනය කරන

අවදානම් වර්ගය	භූගෝලීයමය	සාර්ව ආර්ථික	නියාමන

ණය අවදානම

ණය අවදානම යම් සේවාදායකයෙක් හෝ වෙළෙඳපොල සමපාර්ශවයක් MBSL වෙත ඔහුගේ ගිවිසුම්ගත බැඳීම ඉටුකිරීමට අසමත් වීමෙන් ඇතිවන අවදානම ලෙස ණය අවදානම අර්ථ දැක්විය හැක. ණය අවදානම පැහැරහැරීම් අවදානම සහ සංකේන්ද්‍රණ අවදානම ස්වරූපයක් ගන්නා අතර සමාගමේ ණය කළඹින් ප්‍රධාන වශයෙන් ඇති වේ.



ණය අවදානම් කළමනාකරණය

ව්‍යාපාර වීකක ණය අවදානම කළමනාකරණය කිරීමේදී පළමු ආරක්ෂක මායිම ලෙස කටයුතු කරන අතර ණය කමිටුවේ ස්වාධීන සමාලෝචනය මෙන්ම අවදානම් කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාවලි, ප්‍රමිති සහ වැඩපිළිවෙල මගින් සහය වේ. සමාගමේ ණය අවදානම කළමනාකරණ වැඩපිළිවෙල, ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති වැඩපිළිවෙල, දැඩි සහ මනාව නිශ්චය කළ ණය නිර්ණායක, සක්‍රීය නියාමනය සහ වගකීම්සහගත ණයදීම් සංස්කෘතියක් මගින් හැඩගස්වා ඇත.

පූර්ව ණය ලබාදීම

- දැඩි ණය අගය කිරීමේ හා ඇගයීමේ නිර්ණායක
- නිශ්චිත ණය නිර්ණායකයන්
- විවිධ මට්ටම්වල බලය පවරන ලද අනුමත කිරීමේ බලය
- ණය පරිපාලන අංශය විසින් ස්වාධීන සමාලෝචනය

පශ්චාත් ණය ලබාදීම

- පූර්ව අවවාද සංඥා පිළිබඳ අවධාරණය සහිතව අංශයේ සහ නිෂ්පාදන අනාවරණ අනුරූපව නියාමනය කිරීම
- ශාඛා, කලාප, අංශ සහ නිෂ්පාදන අනාවරණ ඇතුළුව විවිධ මට්ටම්වල අක්‍රීය ණය අඛණ්ඩව නියාමනය
- විධිමත් පදනමක් මත පීඩන පරීක්ෂාව සහ ක්‍රමවේද විශ්ලේෂණ පැවැත්වීම
- අවදානම් කළමනාකරණ අංශයට සහ IRMC වෙත කාලීන වාර්තා ලබාදීම

අවදානම් කළමනාකරණය

වසර තුළ, සමාගම එහි ණය අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමට පහත කරුණු මගින් ක්‍රමෝපායික අවධානය යොමු කරන ලදී.

- ණය අයකර ගැනීමේ ඉලක්ක සහ ශාඛා සඳහා අනුපාත හඳුන්වාදෙමින් එකතු කිරීමේ යාන්ත්‍රණ වැඩි කිරීම
- ශාඛාවන්හි පූර්ව අවවාද ක්‍රමයක් තුළින් අනාගත අක්‍රීය ණය හඳුනාගැනීම සඳහා යාන්ත්‍රණ
- ශාඛා සහ මධ්‍යම අයකරගැනීම් ඒකකය අතර වඩා යහපත් සම්බන්ධීකරණය
- නම්‍යශීලී ආපසු ගෙවීමේ විසඳුම් ප්‍රතිව්‍යුහගතකරමින් සහ පිරිනැමීම තුළින් ගනුදෙනුකාර සහභාගීත්වය වැඩි කිරීම

2016 ණය අවදානම් කාර්යසාධනය

පැහැරහැරීමේ අවදානම


පැහැරහැරීම් අවදානම ණය අවදානමේ ප්‍රධාන සංරචකයක් වන අතර ණයකරුවෙක් හෝ සමපාර්ශවයක් ණය පැහැරහැරීමෙන් ඇතිවන අවදානම්වලින් මෙය සමන්විත වේ. සමාගම එහි පැහැරහැරීම් අවදානම් දර්ශකවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලද අතර වසර තුළ, දළ අක්‍රීය ණය සහ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් 4.2% සහ 4.0% කින් අඩු වී ඇත.

සංකේන්ද්‍රණ අවදානම


විශේෂිත අංශයකට, නිෂ්පාදනයකට, කලාපයකට හෝ ගනුදෙනුකරුවකුට/ සමාගමකට ණයදීම තුළින් සංකේන්ද්‍රණ අවදානම ඇති වේ. සමාගමේ පුද්ගල, අංශ, සහ නිෂ්පාදන සංකේන්ද්‍රණය අඛණ්ඩ පදනමක් මත නියාමනය කෙරෙන අතර අවදානමට අනුව පූර්ව නිශ්චිත සීමාවන් තුළින් පාලනය කෙරේ.

පුද්ගල ණයකරුවන්ට විශාල ප්‍රමාණයේ ණය ලබාදීම තුළින් සංකේන්ද්‍රණ අවදානම ඇති වේ. සමාගම සාපේක්ෂව විවිධාංගීකරණය කළ ආයෝජන කළඹක් තුළින් අවම සංකේන්ද්‍රණ අවදානමක් පවත්වා ගනී. 2016 දී, ඉහලම ණය ගනුදෙනුකරුවන් 20 සමාගමේ මුළු ණය කළඹින් 5%ක් පමණක් නියෝජනය කරන ලදී.

2015




2016




අංශ සංකේන්ද්‍රණය අනුව, සමාගමේ විශාලතම අනාවරණයන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට වන අතර එම ක්ෂේත්‍රය මුළු ණය කළඹින් ආසන්න වශයෙන් 61%කට දායක වේ. ඒ සමඟම, සමාගමේ කළඹ කලාපීය වශයෙන් තවදුරටත් මනාව විවිධාංගීකරණය වන අතර බස්නාහිර පළාතින් පිට ණය හා අත්තිකාරම් ආසන්න වශයෙන් 55% ක් විය.

කර්මාන්ත අනුව සංකේන්ද්‍රණය 2016




භූගෝලීයමය සංකේන්ද්‍රණය - 2016




නිෂ්පාදන සංකේන්ද්‍රණය අනුව, සමාගම අනෙකුත් නිෂ්පාදන වර්ගයන් තුළ අඛන්ඩව ක්‍රමෝපායික ව්‍යාප්තිය සිදුකළ බැවින් සමාගමේ කල්බදු ණය කළඹ පහත වැටුනද තවදුරටත් කල්බදු සමාගමේ ණය කළඹ තුළ ඉහලින්ම පවතී,

නිෂ්පාදන සංකේන්ද්‍රණය - 2016



නිෂ්පාදන සංකේන්ද්‍රණය -2015




සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තත්ත්වය පිළිබඳ වත්කමේ ගුණාත්මකභාවය පිරිහීමෙන් වියහැකි බලපෑම හඳුනා ගැනීමට පීඩන පරීක්ෂණ සිදුකරන ලදී.

විස්තරය	2016 දෙ.31 දිනට CAR	කම්පන මට්ටම 5%	20%	50%
ණය අවදානම				
ප්‍රාථමික ප්‍රාග්ධනය	10.66%	10.64%	10.60%	10.51%
මුළු ප්‍රාග්ධනය	10.69%	10.67%	10.63%	10.54%

වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු වෙළෙඳපොල විචල්‍යතාවන් හී වෙනස්වීම් තුළින් ඇතිවන MBSL හි විවෘත ශේෂ පත්‍ර සහ ආවෘත ශේෂ පත්‍ර තුළ අලාභ අවදානම ලෙස නිර්වචනය කෙරේ. MBSL හි වෙළෙඳපොල අවදානම පොළිඅනුපාත, ස්කන්ධ වෙළෙඳ පොල, ද්‍රව්‍ය වෙළෙඳපොල සහ හුවමාරු අනුපාත තුළ අහිතකර චලනයන් හේතු කොට ගෙන ඇතිවේ.



වෙළෙඳපොල අවදානම කළමනාකරණය

වත්කම් හා වගකීම් කමිටුව සහ ආයෝජන කමිටුව පොළී අනුපාත සහ ස්කන්ධ අවදානම් නියාමනය ඇතුළත් වන සමාග මේ වෙළෙඳපොල අවදානම පාලනය සඳහා විධායක වගකීම දරයි. සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය විස්තර කරන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාපටිපාටි පිළිබඳ උපදෙස්, හඳුනාගැනීම, ඇගයීම සහ නියාමනය සඳහා මෙවලම් හා තාක්ෂණය සහ වෙළෙඳපොල අවදානමට අදාළ සියලු අංග වාර්තා කිරීම ලබා දේ.

පොළිඅනුපාත අවදානම

සමාගම එහි ණය දීමේ කටයුතු, තැන්පතු හා මූල්‍ය ආයෝජන තුළින් පොළිඅනුපාත අවදානමට නිරාවරණය වේ. වත්කම් හා වගකීම් කමිටුව (ALCO) සමාගමේ වත්කම් වගකීම් කල්පිරීමේ නොගැලපීම් සමඟ වෙළෙඳපොල පොළී අනුපාත තුළ වෙනස්වීම් විධිමත්ව නියාමනය කරන අතර අනාවරණයන් IRMC තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. ඊට අමතරව, සමාගම එහි ප්‍රාග්ධන තත්ත්වය මත පොළී අනුපාත තුළ වෙනස්වීම් හි වියහැකි බලපෑම ඇගයීම සඳහා විධිමත්ව පීඩන පරීක්ෂණ විශ්ලේෂණ පවත්වන ලබයි.

අවදානම් කළමනාකරණය

ස්කන්ධ අවදානම


ආයෝජන කමිටුව සියලුම විකිණීමේ සහ මිලදී ගැනීමේ තීරණ ඇතුළුව සමාගමේ ස්කන්ධ කළඹ පාලනය කිරීම සඳහා සමස්ත වගකීම දරයි. ඒ අනුව, කමිටුව, විධිමත්ව කොටස් වෙළෙඳපොලහි වෙනස්වීම්, කළඹ තුළ සංකේන්ද්‍රණ අවදානම් සහ පුළුල් ආර්ථික සංවර්ධනයන් නියාමනය කරයි. අහිතකර කොටස් මිල වෙනස්වීම්වල බලපෑම ඇගයීම සඳහා අවදානම් වටිනාකම (VAR) සහ පීඩන පරීක්ෂණය භාවිතා කරනු ලබයි. කළඹේ කාර්යසාධනය සහ සංකේන්ද්‍රණය අවම වශයෙන් කාර්තුමය පදනමක් මත IRMC විසින් සමාලෝචනය කරනු ලබයි.

වෙළෙඳපොල අවදානම් කාර්යසාධනය - 2016

ස්කන්ධ අවදානම

සමස්තයක් ලෙස, ස්කන්ධ ආයෝජන සඳහා සමාගමේ නිරාවරණය 2016 දෙසැම්බර් අවසානය වන විට 2%ට වඩා පහත අගයක් පෙන්වමින් සීමා කෙරේ. MBSL හි කොටස් කළඹේ කාර්සාධනය වසර තුල 40%ට වඩා පහත වැටෙමින් පුළුල් වෙළෙඳපොල තුළ පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. ඒ හේතුවෙන් වෙළෙඳ කළඹ මත සමාගම රු.මිලියන 61ක අලාභයක් සනිටුහන් කරන ලදී. මේ අතර සමාගමේ ස්කන්ධ කළඹ කර්මාන්තයේ සියලුම අංශ කරා තුලනය කළ නිරාවරණයක් සමඟ අඛණ්ඩව විවිධාංගීකරණය වීම සිදුවිය.

අංශයේ කළඹ 2016




පීඩන පරීක්ෂණ ප්‍රතිඵල

විස්තරය	2016 දෙ.31 දිනට CAR	කම්පන මට්ටම 5%	20%	50%
ණය අවදානම - ස්කන්ධ				
ප්‍රාථමික ප්‍රාග්ධනය	10.66%	10.65%	10.64%	10.61%
මුළු ප්‍රාග්ධනය	10.69%	10.68%	10.67%	10.64%

වෙළෙඳ ද්‍රව්‍ය අවදානම

ගෝලීය රන්මිළ ගණන්වල වෙනස්වීම අනුව සමාගම විසි රන් ණය කළඹින් ඇතිවන වෙළෙඳ ද්‍රව්‍ය අවදානමට නිරාවරණය මගින් සමාගම විසින් පවත්වා ගනු ලබන ඇපවල වටිනාකම මත සෘජු බලපෑමක් ඇත. මෙම අවදානම වටිනාකමට සාමාන්‍ය ණය අනුපාතයක් පවත්වා ගැනීම මගින් පවත්වා ගනු ලබන අතර ඒ තුලින් මිල ගණන් තියුණු ලෙස පහත වැටීමට එරෙහිව ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දේ. 2016 දී, අවසාන මාස දෙකේ සුලු වශයෙන් අඩුවුවද රන් මිල ගණන් ඉහල යමින් පැවතින.

ලෝක රන්මිල රන් රිදි මිනුම් ඒකකයකට



විස්තරය	2016 දෙ.31 දිනට CAR	කම්පන මට්ටම 5%	20%	50%
ණය අවදානම - උකස්				
ප්‍රාථමික ප්‍රාග්ධනය	10.66%	10.65%	10.65%	10.65%
මුළු ප්‍රාග්ධනය	10.69%	10.68%	10.68%	10.68%

ද්‍රවශීලතාවය සහ අරමුදල් අවදානම

ද්‍රවශීලතා අවදානම යනු වත්කම් විකිණීමට සහ බැහැර කිරීමට මෙන්ම කාලීන ආකාරයකින් වගකීම් පියවීමට සමාගමට ඇති හැකියාව වෙනස්වීම තුළින් ඇතිවන අනාගත අලාභයන්ය.


සමාගමේ ද්‍රවශීලතා අවදානම ඵලදායීව කළමනාකරණය කිරීම එහි මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතික කිරීමේදී අත්‍යවශ්‍ය වන අතර, එහි ද්‍රවශීලතා අවදානම කළමනාකරණ වැඩපිළිවෙල මගින් සමාගම එහි ගිවිසුම්ගත බැඳීම් කාලීන පදනමක් මත සපුරාලීමට ප්‍රමාණවත් අරමුදල් පවත්වා ගන්නා බව සහතික කරයි.

වත්කම් හා වගකීම් කමිටුව (ALCO) භාණ්ඩාගාර අංශය විසින් සමාගම එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගන්නා බව සහතික කිරීම සඳහා වගකීම දරයි. සමාගමේ ද්‍රවශීලතා කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංග පහත පරිදි වේ;

- අභ්‍යන්තර ඉලක්ක සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය අනුරූපව නියාමනය කිරීම
- විවිධ මූලාශ්‍රවලින් ඇතිවන ද්‍රවශීලතාව සහිත අරමුදල් ක්‍රමෝපාය විවිධාංගීකරණය කිරීම
- ක්ෂණික ද්‍රවශීලතා අර්බුදයක් ඇති අවස්ථාවක අවදානම් අවම කිරීම සඳහා අසම්භාව්‍ය අරමුදල් සැලසුම් ක්‍රියාත්මකව පවතී.

වසර තුළ, පහත පෙන්වා දෙන පරිදි නියමිත අවමයන්ට වඩා යහපත් මට්ටම්වල සමාගම එහි ද්‍රවශීලතාවය පවත්වා ගනු ලැබීය.


ද්‍රවශීලතා අනුපාතය



සමාගම වෙලෙඳපොල ගතිකතා සහ පොළිඅනුපාත වෙනස්වීම් මත රැඳෙමින් විවිධ මූලාශ්‍රවලින් ද්‍රවශීලතාව මූලාශ්‍ර කරමින් සාපේක්ෂව විවිධ අරමුදල් කළඹක් පවත්වා ගනී. තැන්පතු විශාලතම අරමුදල් මූලාශ්‍රය වන අතර මුළු අරමුදල් පදනමින් 61%කට දායක වන අතර ඉන්පසු පිළිවෙලින් ණය ගැනීම් 29 %ක් හා කොටස් හිමියන්ගේ අරමුදල 10%ක් වේ.

ඒ අතරම, සමාගමේ ප්‍රාග්ධනීයකරණ මට්ටම් යහපත්ව පවත්නා අතර ණය වර්ධනය අනුව වසර තුළ තැන්පතු සුළු වශයෙන් පහත වැටිනි. MBSL ප්‍රාථමික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය නියාමන අවශ්‍යතාවන්ට වඩා ඉහලින් පැවතුනි. සමස්ත RWCAR 2016 දෙසැම්බර් අවසානයට 10.69% මට්ටමේ පැවති අතර 2017 දී ද්විතීයික ණයකර තුළින් සමස්ථ ප්‍රාග්ධන තත්ත්වය වැඩි කිරීම පිණිස මුළු ප්‍රාග්ධනය ඉහල දැමීම සඳහා සමාගම සැලසුම් කරයි.


අරමුදල් සංයුතිය



ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය	1කා 2016	2කා 2016	3කා 2016	4කා 2016
ප්‍රාථමික ප්‍රාග්ධනය	11.75	11.35	11.10	10.66
පදනම් ප්‍රාග්ධනය	11.63	11.24	11.07	10.69

මෙහෙයුම් අවදානම

අභ්‍යන්තර ක්‍රියාවලි, සේවකයින්, සහ ක්‍රම ප්‍රමාණවත් නොවීම හෝ අසමත්වීම හෝ බාහිර සිදුවීම්වල ඇතිවන සෘජු හා වක්‍ර අලාභ ලෙස මෙහෙයුම් අවදානම නිර්වචනය කෙරේ. බාසල් II නිර්වචන අනුව, නීතිමය අවදානම මෙහෙයුම් අවදානමේ සංරචකයක් ලෙස ඇතුළත් කරනු ලබයි.



මෙහෙයුම් අවදානම්

MBSL මෙහෙයුම් අවදානම කළමනාකරණයේ මූලික අංග පහත පරිදි වේ.

- පද්ධති හා ක්‍රියාවලි දෝෂ අවස්ථාවක මෙහෙයුම්වලට සිදුවිය හැති බාධා අවම කර ගැනීමට විස්තරාත්මක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

අවදානම් කළමනාකරණය

- ශාඛා මට්ටමේ මෙහෙයුම් අවදානම් තක්සේරු අන්තර්ජාල පදනමක් තුළින් කාර්තුමය වශයෙන් කරගෙන යන අතර ඒ තුළින් තීරණාත්මක ගැටළු හඳුනා ගැනීම සහතික කරයි. ශාඛා ආශ්‍රිත කරුණු අඛණ්ඩ පදනමක් මත ආයතනික කළමනාකරණ රැස්වීම්වලදි සාකච්ඡා කරනු ලැබේ.

- වියහැකි සහ පවත්නා වංචාසහගත කටයුතු පිළිබඳ වාර්තා කිරීම දිරිමත් කිරීම සඳහා තොරතුරු දැණුම්දීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවතී.

- මානව සම්පත් අදාළ සියලුම ගැටළු හඳුනාගෙන ආමන්ත්‍රණය කිරීම සඳහා සක්‍රීය මානව සම්පත් මෙහෙයුම් කමිටුවක් ක්‍රියාත්මකව පවතී.

- රාජකාරී වෙන්කර ඇති බව සහතික කරන පැහැදිලි, මනාව නිශ්චය කළ රැකියා වගකීම්

- අභ්‍යන්තර පාලන ක්‍රමවල දෝෂ හඳුනා ගැනීම සඳහා සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ ඇගයීම් පවත්වනු ලැබේ.

සමාලෝචිත වසර තුළ, මෙහෙයුම් අවදානම්වලින් ඇති වූ සැලකිය යුතු අවදානම් කිසිවක් නොවීය.

පීඩන පරීක්ෂණය
මෙහෙයුම් අවදානම්වලට අදාළ විවිධ වැදගත්කම්වල කම්පන දරා ගැනීමට සමාගමට ඇති හැකියාව ඇගයීම සඳහා පීඩන පරීක්ෂණය පවත්වන ලදී. MBSL ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පවත්වා ගනිමින් 50%ක මට්ටමක කම්පන දරා ගැනීමේ හැකියාව ඇත.

	16 දෙසැ 31 දිනට	කම්පන මට්ටම		
විස්තරය	CAR	5%	20%	50%
මෙහෙයුම් අවදානම				
මූලික ප්‍රාග්ධනය	10.66%	10.32%	10.28%	10.18%
මුළු ප්‍රාග්ධනය	10.69%	10.35%	10.30%	10.21%

** උපකල්පනය : මෙහෙයුම් අලාභය රු.මි. 100කි.

ක්‍රමෝපායික අවදානම
ක්‍රමෝපායික අවදානම යනු බැංකුවේ අනාගත ව්‍යාපාර සැලසුම් සහ ක්‍රමෝපායන් ප්‍රමාණවත් නොවීම නිසා ඇතිවිය හැකි අලාභයන්ය.

මෙම අවදානම් MBSL හි ක්‍රමෝපායික අරමුණු, වීම අරමුණු අත්පත් කර ගැනීමට සංවර්ධනය කළ ව්‍යාපාර ක්‍රමෝපායන්, මෙම අරමුණු අනුව යොදවන ලද සම්පත් සහ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ ගැලපුම් කාර්යයකි.

MBSL හි ක්‍රමෝපායික අවදානම් කළමනාකරණ රාමුවේ මූලික අංග වන්නේල

- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ක්‍රමෝපායික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

- අනුරූප පදනමක් මත පූර්ව නිශ්චිත කාර්යසාධක දර්ශන අනුව ක්‍රමෝපායික සැලැස්මේ කාර්යසාධනය සමාලෝචනය කිරීම.

- වෙළෙඳපොල ගතිකතාවන්, සාර්ව ආර්ථික වෙනස්වීම් සහ තරඟකාරී හැසිරීම් ඇතුළුව ක්ෂේත්‍රයේ ප්‍රවනතාවන් අඛණ්ඩව නියාමනය කිරීම

- සැබෑ කාර්යසාධනය සහ නිර්දේශිත සුදුසු ක්‍රමෝපායන්ට අනුව අයවැය සසඳමින් විචලතා විශ්ලේෂණ පැවැත්වීම

- තරඟකරුවන්ගේ විශ්ලේෂණ පැවැත්වීම, ක්ෂේත්‍රයේ ප්‍රවනතාවන් සමාලෝචනය කිරීම, අවදානම් වැලැක්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම

- යම් අත්පත් කර ගැනීමකට හෝ ආයෝජනයකට පෙර අවදානම් තක්සේරුවක් පැවැත්වීම

අනුකූලතා අවදානම
අනුකූලතා අවදානම යනු මූල්‍ය අලාභයක් හෝ සමාගමේ කීර්තිනාමයට අලාභයක් ඇති කරමින් අදාළ නීති, රෙගුලාසි, ආචාර ධර්ම සංග්‍රහය, සහ ප්‍රමිති සහ මනා පරිචයන්ට අනුකූල නොවීමෙන් ඇතිවන අවදානමයි.

MBSL හි විශේෂ අනුකූලතා නිලධාරී සමාගමේ සමස්ත අනුකූලතා අවදානම් නියාමනය කිරීම සඳහා වගකීමට බැඳී සිටී.


අනුකූලතා පරීක්ෂා කිරීම් මාසික පදනමක් මත සියලුම ව්‍යාපාර ඒකක සඳහා පවත්වනු ලබන අතර අනුකූල නොවූ අවස්ථාවන්වලදී කඩිනම් පියවර ගනු ලැබේ. විගණන කමිටුව අනුකූලතා අංශයේ විධිමත් වාර්තාකරණ තුළින් සමාගමේ අනුකූලතාව නියාමනය කරයි.

එමෙන්ම ප්‍රසිද්ධ කිරීම් අදාළ අනුකූලතා අවශ්‍යතාවන්ට අනුව පවත්නා බව සහතික කිරීමට සියලුම වෙළෙඳ දැන්වීම්, ප්‍රකාශන අනුකූලතා අංශය විසින් සමාලෝචනය කෙරේ. සමාගම විසින් එවැනි අනුකූලතා අවශ්‍යතා කඩ කිරීම් අවම කිරීම පිණිස අභ්‍යන්තර ජාලය තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කළ අනුකූලතා අවශ්‍යතා සහ රෙගුලාසි සම්බන්ධයෙන් MBSL කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.

නව මධ්‍ය බැංකුකරණ පද්ධතියේ අපේක්ෂිත ක්‍රියාත්මක කිරීමත් සමඟ, අවදානම් පදනම් ප්‍රවේශය ඇතුළුව ගනුදෙනුකරුගේ නිසි නියෝගය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට MBSL අපේක්ෂා කෙරේ.

කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු බැංකුවේ වර්තමාන හෝ අනාගත ඉපයීම් ධාරිතාවට බලපාන සහ විශ්වාසය නැතිවීමෙන් ඇතිවන ආයතනිකමය වටිනාකම, සම්බන්ධතා නතරවීම සහ ගනුදෙනුකාර කොටස් කරුවන්ගේ සෘණාත්මක දෘෂ්ටිකෝණ පිළිබඳ අවදානමයි.





මූලාශ්‍රය : GARP

සමාගමේ කීර්තිනාම අවදානම් කළමනාකරණ රාමුව පහත කරුණු මගින් තහවුරු කෙරේ.

- ශක්තිමත් කොටස් හිමිකාර සහභාගිත්ව යාන්ත්‍රණ සහ සියලුම පාර්ශවකරුවන් සමඟ විධිමත් සන්නිවේදන ක්‍රමොපායක්
- ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ අනෙකුත් අදාළ රෙගුලාසිවලට අනුකූලතාව.
- ණය දීමේ හා තැන්පතු අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ පරිදි පවත්වා ගනී.
- සමාගම ගනුදෙනුකාර නිසි පැවැත්ම, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න, එවැනි සංවිධාන හා පුද්ගලයින්ගෙන් තැන්පතු භාර ගැනීම වැලැක්වීමට මුදල් විශුද්ධිකරණ ව්‍යවහාර ක්‍රියාත්මක කර ඇත.

MBSL **හි පාර්ශවකරුවන්**





2016 වසර තුළ, MBSL පසුගිය වසරේ වටිනාකම ඉක්මවන වත්කම් පදනමේ වර්ධනයක් සමඟ ලාභය සහ ලාභදායිතා මට්ටම්වල

වර්ධනයක් අත්කර ගනු ලැබීය

මූල්‍ය තොරතුරු

මූල්‍ය දින දර්ශනය	දිනය
2016	
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2016 මාර්තු 23
2016 මාර්තු 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2016 මැයි 10
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ අවසරය දීම	2016 මැයි18
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම	2016 ජූනි 02
සමාගමේ 34 වැනි වාර්ෂික මහ සභා රැස්වීම	2016 ජූනි 28
2016 ජූනි 30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2016 ජූලි 26
2016 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2016 නොවැ.07
2017	
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2017 පෙබ 28
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ අවසරය දීම	2017 අප්‍රේ. 28
ණයකර වෙන්කිරීම - 2017	2017 මැයි 03
2017 මාර්තු 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම	2017 මැයි 09
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම දිනට හෝ පෙර	2017 මැයි 31
සමාගමේ 35 වැනි වාර්ෂික මහ සභා රැස්වීම	2017 ජූනි 27
2017 ජූනි 30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන (විගණනය නොකළ) ප්‍රසිද්ධ කිරීම	2017 අගෝ. 15
2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම දිනට හෝ පෙර	2017 නොවැ. 15
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම දිනට හෝ පෙර	2018 පෙබ. 15

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

2013 අංක 06 දරන නියෝගයෙන් සංශෝධිත 2008 අංක 03 දරන මූල්‍ය සමාගම් විධානයේ 10:2) (b) වගන්තියට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

වගකීම

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (MBSL) හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය හා ඵලදායීතාවය ගැන අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") වගකීම දරයි. එසේ වුවත්', MBSL හි ප්‍රතිපත්ති හා ව්‍යාපාර පරමාර්ථ අත්කර ගැනීමට නොහැකි වන අවදානම් ඉවත් කරනවා වෙනුවට පිළිගතහැකි අවදානම් පැතිකඩක් තුළ MBSL හි ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පාලනය කිරීමට එවැනි පද්ධතියන් නිර්මාණය කෙරේ. මේ අනුව මූල්‍ය හා කළමනාකරණ තොරතුරු හා වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, මූල්‍ය අලාභයන් හෝ වංචාවලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබා දිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

ආයතනය විසින් මුහුණ පෑ හැකි සැලකිය යුතු අවදානම් හඳුනාගැනීම්, නිරීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති අතර ව්‍යාපාරික පරිසරයෙහි හා නියාමන මාර්ගෝපදේශවල යම් වෙනස්කම් ඇතිවන සෑමවිටම අභ්‍යන්තර පාලන විධි වැඩි දියුණු කිරීම මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ.

මෙම ක්‍රියාවලිය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනයට භාජනය කරන අතර, එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති මාර්ගෝපදේශවල සඳහන් කාරණාවන්ට අනුකූලව සිදු කරනු ලැබේ. එකී මාර්ගෝපදේශ අනුව, MBSL හි සැලකිය යුතු ගිණුම්වලට බලපාන සැලකිල්ලට ගත යුතු ක්‍රියාවලි MBSL හි ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර ඇගයීමේදී භාජනය කරන ලදී.

ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීමට යහපත් හා ප්‍රමාණවත් මට්ටමක පවත්නා බවත්, එමෙන්ම බාහිර කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව ගිණුම්කරණ මූලධර්මවලට හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

අවදානම හා පාලන විධි පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීමේදී MBSL මුහුණ දෙන අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා එකී අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මගින් ද කළමනාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වෙයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යය සැලැස්ම හා සඵලත්වය පිළිබඳව සමාලෝචනය කිරීමේදී භාවිතා කළ ක්‍රමවේදයේ මූලික ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව හා සම්පූර්ණත්වය පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපිත කොට ඇති මූලික ක්‍රියාපටිපාටීන්හි පහත දෑ ඇතුළත් වේ.

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ අභ්‍යන්තර විගණන අංශය, MBSL ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූල වන බව, ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාව ඇගයීම සහ අඛණ්ඩ පදනමක් මත සැලකිය යුතු සොයා ගැනීම් ඉස්මතු කර දැක්වීම සහතික කිරීමට මණ්ඩලයට සහය වේ. සියලු දෙපාර්තමේන්තු සහ ශාඛා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පැවැත්වෙන අතර, ඒ විගණන වාර ගණන තීරණය කෙරෙන්නේ ඇගයීමට ලක් වූ අවදානම් මට්ටම අනුවය. මෙහි අරමුණ වන්නේ මෙම දෙපාර්තමේන්තු සහ ශාඛාවල මෙහෙයුම් හා කළමනාකාරිත්වය පිළිබඳ ස්වාධීන වූද, විෂය මූලික වූද වාර්තාවක් සැපයීමය. වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කිරීම විගණන කමිටුව විසින් සිදු කරන අතර විගණනයේ වාර්තා නියමිත රැස්වීම්වල දී සමාලෝචනය කිරීම පිණිස විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- සමාගමේ විගණන කමිටුව, අභ්‍යන්තර විගණන අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් හා කළමනාකාරිත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කර අවදානම් කළමනාකරණයේ හා අභ්‍යන්තර පාලන පද්ධතීන්වල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව ඇගයීමට ලක් කරයි. එමෙන්ම, පවත්නා අභ්‍යන්තර පාලනයට වැඩිදියුණු කිරීම් යෝජනා කරමින් අභ්‍යන්තර පාලනය වඩාත් අවශ්‍ය ක්ෂේත්‍ර ඉස්මතු කරයි. විගණන කමිටුවල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර ඉදිරිපත් කෙරේ. මාණ්ඩලීය විගණන කමිටුව වෙත පැවරෙන වෙනත් කාර්යයන් පිළිබඳ වැඩි විස්තර පිටු අංක 114 මාණ්ඩලීය විගණන කමිටු වාර්තාවේ සඳහන් කෙරේ.


- සමාගමේ දෛනික මෙහෙයුම්වල ඵලදායිත්වය සහ සමාග මේ මෙහෙයුම් ආයතනික පරමාර්ථ, ක්‍රමෝපාය සහ වාර්ෂික අයවැය මෙන්ම අනුමත කරන ලද ප්‍රතිපත්ති හා ව්‍යාපාර උපදෙස්වලට අනුකූල වන බව සහතික කිරීමේදී මණ්ඩලයට සහයවීම සඳහා සුදුසු බලය සහිතව මෙහෙයුම් කමිටු මණ්ඩලය විසින් ස්ථාපිත කරනු ලබයි.

- අභ්‍යන්තර පද්ධතිය ඇගයීමේදී විශේෂ වශයෙන් යොදා ගනු ලැබූ සමාගමේ නිලධාරීන් විසින් වැදගත් වන ගිණුම් සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හී හෙළිදරව් කිරීම් හා සම්බන්ධ සියලු කාර්යපටිපාටි සහ පාලන විධි ලේඛනගත කිරීම කරන ලද අතර, ඒවා අභ්‍යන්තර විගණන අංශය විසින් නිරීක්ෂණය කරනු ලැබ, ඒවා සැලසුම් හා ඵලදායි බව අතින් යෝග්‍යදැයි අඛණ්ඩව පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තහවුරු කිරීම.
ඉහත කී ක්‍රියාවලිය පදනම් කර ගෙන, MBSL මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසි බව සම්බන්ධයෙන් සාධාරණ සහතික කිරීමක් ලබාදීම සඳහාත්, බාහිර කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සිදු කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුව බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ සමාලෝචනය
ඉටුකළ ක්‍රියාපටිපාටිය මත පදනම්ව, මෙම ප්‍රකාශනයන් සමාග මේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන විධිවිධානවල සැලැස්ම සහ ඵලදායිත්වය පිළිබඳ සමාලෝචනය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගනු ලැබූ ක්‍රියාපිළිවෙල පිළිබඳ අවබෝධය හා මෙම ප්‍රකාශනය අනුරූප නොවන බව විශ්වාස කිරීමට තරම් හේතුවක් ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බවට බාහිර විගණකවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,



ඩබ්ලිව්. පී. ආර්.පී.එච්. ෆොන්සේකා
අධ්‍යක්ෂ



සී.එන්. විජේවර්ධන
අධ්‍යක්ෂ

2017 මැයි 17 දින
කොළඹ

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගම සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම පහත දැක්වෙන ප්‍රකාශයෙන් පැහැදිළි වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම පැහැදිළි කෙරෙන ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව පිටු අංක 137 හි දැක්වේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 150 (1), 151, 152 සහ 153 (1) & (2) පනත්වලට අනුකූලව, සමාගමේ සහ සමූහයේ සියලුම ගනුදෙනු පිළිබඳ තොරතුරු නිසි පරිදි පවත්වාගෙන යාම, එක් එක් මුදල් වසර අවසානයට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය, හා එක් එක් මුදල් වසර සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ නිවැරදි හා සාධාරණ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඒවා මහ සභාවක් වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ඒ හා අදාළ සටහන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් විය යුතුය.

ඒ අනුව, සමාගමේ සහ සමූහයේ ප්‍රකාශන පහත දැක්වෙන කරුණු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහසක් ලබා දෙන බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

(අ) වාර්තාකරණ දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය, සහ

(ආ) වාර්තාකරණ දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs සහ LKASs), 2007 අංක 07 දරන සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත හා ඊට නිකුත්කළ නියෝග, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම් රෙගුලාසි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිසන් සභාව එක්ව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ පරිචයන් යන සියල්ලෙහි සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කරති.

වංචා සහ වෙනත් අක්‍රමිකතා හෙළිකර ගැනීමට හා වැලැක්වීමටත් සමාගමේ හා සමූහයේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ට ගත හැකි සාධාරණ පියවර ගෙන ඇත. මෙම සම්බන්ධයෙන්, වංචා සහ වෙනත් අක්‍රමිකතා හෙළිකර ගැනීමට හා වැලැක්වීමේ අරමුණ ඇතිව සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති අධ්‍යක්ෂවරුන් විසින් ස්ථාපිත කොට ඇත. මුදල් ප්‍රවාහ, ණය පහසුකම් ඇතුළුව ඉදිරි වසර සඳහා සමාගමේ අයවැය පිළිබඳ විමසීමත් සහ සමාලෝචනයක් කිරීමෙන් පසු, දුරදක්නා අනාගතය සඳහා මෙහෙයුම් පැවැත්ම තුළ අඛණ්ඩව සිටීමට සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන්ට සාධාරණ අපේක්ෂාවන් ඇති අතර එමනිසාම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම තවදුරටත් යොදා ගෙන ඇත.


සමාගමේ පනතේ 166 (1) සහ 167 (1) වගන්තිවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්තාව නිසි කලට පිළියෙල කොට ඇති බව ඔවුන් තහවුරු කිරීමට එකඟ වන බවත්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නියමයන් හී අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවන් පිළිබඳ නියමයන් අංක 7.5 (අ) සහ (ආ) අනුව නිශ්චිත කාලසීමාවක් තුළ ඉන් පිටපතක් දෘඪ පිටපතක් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති සමාගමේ සියලුම කොටස්හිමියන් වෙත සහ අනෙක් කොටස්හිමියන් වෙත වාර්ෂික වාර්තාව අඩංගුවන සංයුක්ත තැටිය බැගින් මෘදු පිටපතක් යවන බවටත් සහතික වේ. සෑම වර්ගයකම කොටස්හිමියන් වෙත මුල් නිකුත් කිරීමේ අනුදේශයන්ට අනුකූලව සමාන ලෙස සලකා ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව, විගණකාධිපති සමාගමේ විගණකවරයා වන අතර ඔහු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අවසාන මතය නිකුත් කරයි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ 137 පිටුවේ විගණකාධිපති වාර්තාවේ ඉදිරිපත් කොට ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුවත්භාවයට අනුව, සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු, ව්‍යවස්ථාපිත බදු ගෙවීම් සහ මූල්‍ය බැඳීම් යන සියල්ලක්ම ගෙවා ඇති බවට හෝ සුදුසු පරිදි ඒ සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයන්හී සලස්වා ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කරති. මූල්‍ය තත්වය, මෙහෙයුම් තත්ත්වයන්, නියාමන සහ අනෙකුත් සාධක, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිසන් සභාව එක්ව නිකුත් කරන ලද ආයතනික යහපාලන සංග්‍රහයේ ආමන්ත්‍රණය කළ යුතු කරුණු පිළිබඳ සලකා බැලීමෙන් පසු, දැකිය හැකි අනාගතය සඳහා මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගමට සහ සමූහයට ඇති බවට සාධාරණ අපේක්ෂා අධ්‍යක්ෂවරුන්ට ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරති. මෙම හේතුව සඳහා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම තවදුරටත් යොදා ගෙන ඇත. මෙම ප්‍රකාශයේ දක්වා ඇති වගකීම් අධ්‍යක්ෂවරු මුදාහැර ඇති බව ඔවුන්ගේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



කේ. ජයතිලක
සමාගම් ලේකම්

2017 මැයි 17 දින.
කොළඹ

ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } BAF/B/BOC-S/MBSL/2016 මෙහි අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 23 May 2017

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ කොටස්කරුවන් වෙත,

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගම හා එහි පරිපාලිතයෙහි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය විය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අවධාරණය කළ කරුණු

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, පරිපාලිත සමාගම වන සීමාසහිත එම්බීඑස්එල් රක්ෂණ සමාගමට අදාළ මූල්‍ය ප්‍රකාශයන්හි පහත සඳහන් සටහන්වලට ඔබගේ අවධානය යොමු කරවමි.

- සීමාසහිත එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අබණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල 44 සටහන.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அலுவலகம்
Auditor General's Department
AGDSL

- වර්ෂය තුළ දක්වන ලද කාර්යසාධන බැඳුම්කර රක්ෂණ හිමිකමට අදාළ අසම්භාව්‍ය බැරකම විස්තර කෙරෙන 47.2.2 සටහන මෙම කරුණු සම්බන්ධයෙන් මාගේ මතය තත්වාගණනය කරනු නොලැබේ.

වෙනත් කරුණු

පරිපාලිතය වන එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ අබණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවධාරණය කරන ලද කරුණු සමඟ 2016 මැයි 18 දින එම ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කරන ලද වෙනත් විගණකවරයෙකු විසින් මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය කරන ලදි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තා කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත කරුණු සඳහන් කරමි.

අ) මතය පිළිබඳ පදනම හා විෂයපථය සහ විගණනයේ සීමාවන් ඉහත සඳහන් පරිදි වේ.

ආ) මාගේ මතය වනුයේ:

විගණනය සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින්

ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට,

සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත්ය.

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිය සහ 153 වගන්තිවලට අනුකූල වන බවත්ය. කෙසේ වුවද, පරිපාලිතයේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අර්ධයකටත් වඩා අඩු බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාර ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ බරපතල පාඩුවකට මුහුණ දෙන බවත් අවධානයට ලක් කළ යුතුය.

- මූල්‍ය ප්‍රකාශනවල 44 සටහනේ සාකච්ඡා කර ඇති පරිදි, 2011 අංක 3

දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (සංශෝධිත) 53 වගන්තියට

අනුකූලව පරිපාලිතය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

ලෙස වෙනම සමාගම් දෙකකට වෙන් කර නොමැත.

- පරිපාලිතයේ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සඳහා හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ රෙගුලාසිය මගින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය "නුබුන්වත් ආන්තිකය (අවදානම පදනම් වූ ප්‍රාග්ධනය)" ඊතිය සඳහා අවම අවශ්‍ය ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරන අතර ජීවිත රක්ෂණ ව්‍යාපාරය විසින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරයි.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිනී විජේසිංහ
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන - වගුව

සටහන් අංකය		පිටු අංකය
මූල්‍ය ප්‍රකාශන		
	ලාභාලාභ ප්‍රකාශනය	140
	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	141
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	142
	ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	144
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	145
මූල්‍ය ප්‍රකාශවලට සටහන		
ලාභාලාභ ප්‍රකාශනය		
1	ආයතනික තොරතුරු	146
2	පිළියෙල කිරීමේ පදනම	146
3	ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති	148
4	ආදායම	156
5	ශුද්ධ පොළී ආදායම්	156
6	ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	157
7	රක්ෂණ වාරික ආදායම	158
8	ශුද්ධ වෙළඳ ආදායම	159
9	අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය /(අලාභය)	159
10	අනෙකුත් මෙහෙයුම් ආදායම	159
11	ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන	160
12	කාර්ය මණ්ඩල වියදම්	160
13	අනෙකුත් මෙහෙයුම් වියදම්	161
14	ආදායම් බදු වියදම්	162
15	කොටසක ඉපයීම් / (අලාභය) සහ කොටසකට ලාභාංශය	163
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය		
16	මූල්‍ය උපකරණ ඇගයීමේ පදනම මත විශ්ලේෂණය	164
17	මුදල් හා මුදලට සමාන දෑ	167
18	බැංකු හා මූල්‍ය ආයතනවල තැන්පතු	168
19	ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්	168
20	මූල්‍ය ආයෝජන - වෙළෙඳපොල ගනුදෙනු දරා සිටින	168
21	ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	177
22	මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	182
23	මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	184
24	ආශ්‍රිත සමාගමේ ආයෝජන	185
25	පරිපාලිත සමාගමේ ආයෝජන	187
26	ආයෝජන දේපල	189
27	දේපල හා උපකරණ	191
28	අස්පෘෂ්‍ය වත්කම්	194
29	අනෙකුත් වත්කම්	197
30	බැංකුවලට ගෙවිය යුතු	197
31	ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	197
32	නිකුත්කළ ණය සහ අනෙකුත් ණය ගැනීම්	198
33	රක්ෂණ ප්‍රතිපාදන	199
34	වර්තන බදු වගකීම්	201
35	විලම්බිත බදු වගකීම්	202
36	අනෙකුත් වගකීම්	203
37	සේවක ප්‍රතිලාභ බැඳීම්	203
38	ප්‍රකාශිත ප්‍රාග්ධනය	205
39	සංචිත	205
40	අමතර මුදල් ප්‍රවාහ තොරතුරු	206
අනෙකුත් මූල්‍ය අනාවරණයන්		
41	සම්බන්ධිත පාර්ශව අනාවරණයන්	206
42	මූල්‍ය උපකරණවල සාධාරණ අගය	210
43	වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්	213
44	පරිපාලිතයේ අඛණ්ඩ පැවැත්ම	214
45	ප්‍රතිශෝධිත සංසන්දනාත්මක අගයන්	214
46	අංශ අනුව මූල්‍ය වාර්තාකරණය	215
47	අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්	218
48	අවදානම් කළමනාකරණය	226
49	මෙහෙයුම් අවදානම	237

ලාභාලාභ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	සමාගම		සමූහය	
		2016	2015	**2016**	2015
		රු.'000	රු.'000 සංශෝධිත*	රු.'000	රු.'000 සංශෝධිත *
ආදායම	4	4,888,155	4,216,991	6,099,998	5,429,495
පොළී හා සමාන ආදායම		4,737,774	4,073,159	4,853,007	4,164,059
පොළී හා සමාන වියදම්		(2,709,604)	(2,133,325)	(2,710,557)	(2,134,351)
ශුද්ධ පොළී ආදායම	5	2,028,170	1,939,834	2,142,450	2,029,708
ගාස්තු හා කොමිස් ආදායම		41,455	42,640	100,695	197,659
ගාස්තු හා කොමිස් වියදම		-	-	(65,674)	(99,898)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	6	41,455	42,640	35,021	97,761
රක්ෂණ වාරික ආදායම	7	-	-	995,321	903,910
ශුද්ධ හිමිකම් හා ප්‍රතිලාභ		-	-	(845,430)	(616,128)
ශුද්ධ වෙළෙඳ ආදායම	8	10,072	46.862	5,612	48,531
අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභ)	9	(61,096)	(54,137)	(58,226)	(55,336)
අනෙකුත් මෙහෙයුම් ආදායම්	10	159,950	108,467	203,589	170,672
මුළු මෙහෙයුම් ආදායම්		2,178,551	2,083,666	2,478,337	2,579,118
ණය හා ලැබීම් සහ අනෙකුත් අලාභ සඳහා හාණිකරණ ප්‍රතිපාදන	11	(24,239)	(462,151)	(27,959)	(474,618)
ශුද්ධ මෙහෙයුම් ආදායම		2,154,312	1,621,515	2,450,378	2,104,500
කාර්ය මණ්ඩල වියදම්	12	(781,530)	(670,740)	(993,084)	(857,116)
විශ්‍රාම ප්‍රතිලාභ වියදම්	37.1	(40,464)	(42,648)	(45,697)	(47,751)
දේපල, උපකරණ හා ආයෝජන දේපල ක්ෂයකිරීම	27 හා 26	(63,572)	(59,022)	(82,651)	(79,897)
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	28	(14,098)	(11,148)	(21,588)	(20,269)
අනෙකුත් මෙහෙයුම් වියදම්	13	(670,156)	(610,267)	(943,391)	(975,134)
මුළු මෙහෙයුම් වියදම්		(1,569,820)	(1,393,825)	(2,086,411)	(1,980,167)
මූල්‍ය සේවා මත එ.අ.බදු. පෙර මෙහෙයුම් ලාභය සහ පරිපාලිත සමාගම්වල ආයෝජනවල		584,492	227,690	363,967	124,333
පරිපාලිත සමාගම්වල ආයෝජනවල හාණිකරණය		(232,891)	(205,899)	-	(18,193)
පරිපාලිත සමාගම්වල ආයෝජනවල හානිකරණයෙන් පසු මෙහෙයුම් ලාභය		351,601	21,791	363,967	106,140
මූල්‍ය සේවා මත චිකතු කළ අගය මත බදු		(111,730)	(57,219)	(111,730)	(57,219)
බදු පෙර ආශ්‍රිත සමාගමේ ලාභ/ (අලාභ) කොටස	24.1	-	-	(5,437)	7,080
ආදායම් බදු පෙර ලාභය/ (අලාභය)		239,871	(35,428)	246,800	56,001
ආදායම් බදු වියදම	14	(154,247)	(42,878)	(165,658)	(52,718)
වසර සඳහා ලාභය/ (අලාභය)		85,624	(78,306)	81,142	3,283
වසර සඳහා ලාභය බෙදාහැරීම:					
මව් සමාගමේ කොටස් හිමියන්ට		85,624	(78,306)	117,853	22,152
පාලනයට යටත් නොවන හිමිකම		-	-	(36,711)	(18,869)
වසර සඳහා ලාභය/ (අලාභය)		85,624	(78,306)	81,142	3,283
කොටසක ඉපයීම් /(අලාභය):					
මූලික/ තනුක ඉපයීම් /(අලාභය) : (රු.)	15	0.52	(0.47)	0.71	0.13

* මූල්‍ය ප්‍රකාශනවල සටහන් 45 හි විස්තර වන පරිදි දක්වා ඇති සමහර අගයන් 2015 මූල්‍ය ප්‍රකාශයන්ට අනුරූප නොවන අතර 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පොළී ආදායම් මත කාල්පනික බදු හේතු කොට ගෙන සිදුකළ ගැලපීම් පිළිබිඹු කරයි.

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 146 සිට 238 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	සමාගම		සමූහය	
		2016 රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත *
වසර සඳහා ලාභය/ (අලාභය)		85,624	(78,306)	81,142	3,283
අනෙකුත් විස්තීර්ණ ආදායම්/(වියදම්)					
ඉදිරි කාලසීමාවන්හි ලාභාලාභවලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදුවලට ශුද්ධ)					
අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් ඇතිවූ ලාභ /(අලාභ)		(17,452)	(47,835)	(29,129)	(53,833)
ඉදිරි කාලසීමාවන්හි ලාභාලාභවලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් ශුද්ධ අනෙකුත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (බදුවලට ශුද්ධ)		(17,452)	(47,835)	(29,129)	(53,833)
ඉදිරි කාලසීමාවන්හි ලාභාලාභවලට නැවත වර්ග නොකරනු ලබන අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදුවලට ශුද්ධ)					
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මත ජීවගණක ලාභ/ අලාභ	37	39,068	32,603	40,541	31,215
ආශ්‍රිත සමාගමේ අනෙකුත් විස්තීර්ණ ආදායම් කොටස	24.1	-	-	1,035	(726)
අනෙකුත් විස්තීර්ණ ආදායම් වල සංරචකවලට අදාළ විලම්භිත බදු බලපෑම	14	(1,810)	(11,072)	(1,810)	(11,072)
ඉදිරි කාලසීමාවන්හි ලාභාලාභවලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් ශුද්ධ අනෙකුත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (බදුවලට ශුද්ධ)		37,258	21,531	39,766	19,417
බද්දෙන් ශුද්ධ වූ අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදු පසු)		19,806	(26,304)	10,637	(34,416)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම්		105,430	(104,610)	91,779	(31,133)
මුළු විස්තීර්ණ ආදායම් /(වියදම්) බෙදාහැරීම:					
මව් සමාගමේ කොටස් හිමියන්ට		105,430	(104,610)	130,111	(11,091)
පාලනයට යටත් නොවන හිමිකම		-	-	(38,332)	(20,042)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම්		105,430	(104,610)	91,779	(31,133)

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 146 සිට 238 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	සමාගම		සමූහය	
		2016 රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
වත්කම්					
මුදල් හා මුදලට සමාන දෑ	17	**401,301**	380,830	**441,357**	432,947
බැංකු හා මූල්‍ය ආයතනවල තැන්පතු	18	**118,933**	440,093	**262,319**	571,672
නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්	19.1	**265,687**	785,965	**730,773**	1,609,702
මූල්‍ය ආයෝජන - වෙළෙඳපොල ගනුදෙනු දරා සිටින	20	**323,655**	541,970	**331,586**	552,741
ලැබිය යුතු බිල්	21.1	**739,403**	595,888	**739,403**	595,888
ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම්	21.2	**11,320,845**	8,406,632	**11,392,491**	8,505,054
ලැබිය යුතු කල්බදු සහ කුළිපිට ගැණුම්	21.3	**14,991,751**	14,223,259	**14,991,751**	14,223,259
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	22	**2,735,645**	1,754,206	**3,126,815**	1,994,857
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	23	**57,766**	56,507	**57,766**	56,507
දේපළ වෙළෙඳාම් තොගය		**24,144**	62,545	**24,143**	62,545
ආශ්‍රිත සමාගමේ ආයෝජන	24	**81,084**	81,084	**91,325**	96,484
පරිපාලිත සමාගම්වල ආයෝජන	25	**77,306**	310,197	**-**	-
ආයෝජන දේපල	26	**127,670**	145,840	**127,670**	145,840
දේපල සහ උපකරණ	27	**312,337**	219,260	**354,092**	273,122
අස්පෘශ්‍ය වත්කම්	28	**37,705**	38,816	**59,028**	67,141
අනෙකුත් වත්කම්	29	**318,496**	231,455	**910,918**	712,333
මුළු වත්කම්		**31,933,728**	28,274,547	**33,641,437**	29,900,092
වගකීම්					
බැංකුවලට ගෙවිය යුතු	30	**201,635**	258,062	**224,997**	273,968
ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම මත විකුණූ සුරැකුම්පත්	19.2	**401,820**	416,472	**401,820**	416,472
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	31	**18,518,419**	15,846,306	**18,518,419**	15,846,306
නිකුත්කළ ණය සහ අනෙකුත් ණය ගැනීම්	32	**8,722,787**	7,883,323	**8,722,787**	7,883,323
රක්ෂණ ප්‍රතිපාදන -ජීවිත	33.1	**-**	-	**514,258**	444,257
රක්ෂණ ප්‍රතිපාදන -ජීවිත නොවන	33.4	**-**	-	**781,034**	512,333
වර්තන බදු වගකීම්	34	**151,128**	146,284	**141,180**	136,336
විලම්භිත බදු වගකීම්	35	**206,888**	113,669	**206,888**	113,669
අනෙකුත් වගකීම්	36	**404,174**	356,840	**752,034**	956,610
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	37	**213,388**	245,532	**231,463**	262,040
මුළු වගකීම්		**28,820,239**	25,266,488	**30,494,880**	26,845,314

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	සමාගම		සමූහය	
		2016 රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
ස්කන්ධය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	38	**2,124,457**	2,124,457	**2,124,457**	2,124,457
ව්‍යවස්ථාපිත සංචිත	39.1	**157,669**	140,544	**157,669**	140,544
රඳවාගත් ඉපයීම්	39.2	**853,165**	747,408	**886,283**	746,023
අලෙවිය සඳහා ඇති සංචිත	39.3	**(21,802)**	(4,350)	**(36,195)**	(8,920)
මව් සමාගමේ කොටස් හිමියන්ට බෙදාහැරිය හැකි මුළු ස්කන්ධය		**3,113,489**	3,008,059	**3,132,214**	3,002,104
පාලනයට යටත් නොවන හිමිකම		**-**	-	**14,343**	52,674
මුළු ස්කන්ධය		**3,113,489**	3,008,059	**3,146,557**	3,054,778
මුළු වගකීම් සහ ස්කන්ධය		**31,933,728**	28,274,547	**33,641,437**	29,900,092
බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්	47	**132,265**	123,536	**616,478**	546,079
කොටසක ශුද්ධ වත්කම් අගය (රු.)		**18.77**	18.13	**18.88**	18.10

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 45 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 146 සිට 238 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කොට ඇති බව සහතික කරමි.

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

සී. අයි. කඳනාආරච්චි
මූල්‍ය ප්‍රධානී

ටී. මුතුගල
ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරමි.

ආචාර්ය එස්. ලොකුහේවා
සභාපති

ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා
අධ්‍යක්ෂ

2017 අප්‍රේල් 28 දින
කොළඹ, ශ්‍රී ලංකාව

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

සමාගම	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.'000	ව්‍යවස්ථාපිත සංචිත රු.'000	උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය උපකරණ සමඟ සංචිත රු.'000	රඳවාගත් ඉපයීම් රු.'000	මුළු ස්කන්ධය රු.'000
2015 ජනවාරි 01 දිනට ශේෂය	2,124,457	140,544	43,485	842,936	3,151,422
අධි ප්‍රතිලාභ මත බදු ගැලපීම	-	-	-	(38,753)	(38,753)
වසර සඳහා ශුද්ධ ලාභය	-	-	-	(78,306)	(78,306)
බදු පසු අනෙකුත් ශුද්ධ විස්තීර්ණ ආදායම් /(වියදම්)	-	-	(47,835)	21,531	(26,304)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය- සංශෝධිත	2,124,457	140,544	(4,350)	747,408	3,008,059
වසර සඳහා ශුද්ධ ලාභය	-	-	-	85,624	85,624
බදු පසු අනෙකුත් ශුද්ධ විස්තීර්ණ ආදායම් /(වියදම්)	-	-	(17,452)	37,258	19,806
ව්‍යවස්ථාපිත සංචිතවලට මාරුකිරීම්	-	17,125	-	(17,125)	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,124,457**	**157,669**	**(21,802)**	**853,165**	**3,113,489**

සමූහය	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.'000	ව්‍යවස්ථාපිත සංචිත රු.'000	උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය උපකරණ සමඟ සංචිත රු.'000	රඳවාගත් ඉපයීම් රු.'000	පාලනයට යටත් නොවන හිමිකම රු.'000	මුළු ස්කන්ධය රු.'000
2015 ජනවාරි 01 දිනට ශේෂය	2,124,457	140,544	43,961	742,987	72,715	3,124,664
අධි ප්‍රතිලාභ බදු ගැලපීම	-	-	-	(38,753)	-	(38,753)
වසර සඳහා ශුද්ධ ලාභය	-	-	-	22,152	(18,869)	3,283
බදු පසු අනෙකුත් ශුද්ධ විස්තීර්ණ ආදායම් /(වියදම්	-	-	(52,881)	19,637	(1,172)	(34,416)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය- සංශෝධිත	2,124,457	140,544	(8,920)	746,023	52,674	3,054,778
වසර සඳහා ශුද්ධ ලාභය	-	-	-	117,853	(36,711)	81,142
බදු පසු අනෙකුත් ශුද්ධ විස්තීර්ණ ආදායම්	-	-	(27,275)	39,532	(1,620)	10,637
ව්‍යවස්ථාපිත සංචිතවලට මාරුකිරීම්	-	17,125	-	(17,125)	-	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,124,457**	**157,669**	**(36,195)**	**886,283**	**14,343**	**3,146,557**

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 146 සිට 238 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS7ට අනුකූලව, මුදල් ප්‍රවාහ සකස් කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කොට ඇත. මෙහිදී මෙහෙයුම් කටයුතු, ආයෝජන කටයුතු, සහ මූල්‍ය කටයුතු වෙන වෙනම හඳුනාගනී. මුදල් හා මුදලට සමාන දෑ හි මුදල්වලට පහසුවෙන් හැරවිය හැකි කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතා සහ වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමකට යටත් ආයෝජනවලින් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ සඳහන් මුදල් හා මුදලට සමාන දෑ පිටු අංක 40 සිට 206 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වල දැන්වා ඇති පරිදි එම අයිතම සමන්විත වේ.

		සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය/(අලාභය)		239,871	(35,428)	246,800	56,001
ගැලපීම්:					
මෙහෙයුම් වත්කම් තුළ වෙනස්වීම	40.2	(3,899,099)	(2,989,522)	(3,987,586)	(2,916,392)
මෙහෙයුම් වගකීම් තුළ වෙනස්වීම	40.3	2,719,447	4,416,592	2,806,239	4,671,856
ආශ්‍රිත සමාගමේ බදු පෙර ලාභ කොටස		-	-	5,437	(7,080)
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වලට දායකත්වය		40,464	42,648	45,697	47,751
බදු පෙර ලාභය තුළ ඇතුළත් අනෙකුත් මුදල් නොවන අයිතම	40.4	219,617	610,963	15,798	451,330
ලද ලාභාංශ		(12,853)	(14,008)	(13,127)	(12,559)
		(692,553)	2,031,245	(880,742)	2,290,907
ගෙවූ පාරිතෝෂික		(33,539)	(11,564)	(35,733)	(13,603)
ආදායම් බදු පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල		(726,092)	2,019,681	(916,475)	2,277,304
ගෙවූ ආදායම් බදු		(57,995)	(89,315)	(69,683)	(89,315)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්		(784,087)	1,930,366	(986,158)	2,187,989
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ					
වෙළෙඳපොල ගනුදෙනු දරා සිටින මූල්‍ය වත්කම් මිලදී ගැනීම		(31,279)	(563,386)	(33,716)	(563,595)
වෙළෙඳපොල ගනුදෙනු දරා සිටින මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද මුදල්		185,713	879,520	189,128	882,543
උපලබ්ධිය සඳහා පවතින සහ කල්පිරීම තෙක් ඇති මූල්‍ය ආයෝජන මිලදී ගැනීම		(3,082,222)	(2,639,079)	(3,243,384)	(2,843,193)
උපලබ්ධිය සඳහා පවතින / කල්පිරීම තෙක් ඇති මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද ශුද්ධ මුදල		2,228,223	2,704,596	2,228,223	2,719,096
අනෙකුත් ආයෝජනවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		321,160	1,274,323	309,353	1,281,409
දේපල හා උපකරණ මිලදී ගැනීම		(154,237)	(81,487)	(160,095)	(89,803)
අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම		(12,987)	(19,415)	(14,487)	(22,879)
දේපල හා උපකරණ විකිණීමෙන් ලද මුදල		48,671	3,329	51,649	3,329
ලද ලාභාංශ		12,853	14,008	13,127	15,346
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතයෙන්) ලද ශුද්ධ මුදල්		(484,105)	1,572,409	(660,202)	1,382,253
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ					
ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් ආපසු හැරවීමේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		505,626	(246,438)	864,277	(321,914)
අනෙකුත් ණය ගැනීම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		1,173,945	(3,017,390)	1,173,945	(3,017,390)
ණයකර නිදහස්කිරීම මත ගෙවීම්		(334,481)	(268,080)	(334,481)	(268,080)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් (භාවිතයෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		1,345,090	(3,531,908)	1,703,741	(3,607,384)
වසර තුළ මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම		76,898	(29,133)	57,381	(37,142)
වසර ආරම්භයට මුදල් හා මුදලට සමාන දෑ		122,768	151,901	158,979	196,121
වසර අවසානයට මුදල් හා මුදලට සමාන දෑ		199,666	122,768	216,360	158,979
වසර අවසානයට මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණ	40.1				
මුදල් සහ කෙටි කාලීන අරමුදල්		401,301	380,830	441,357	432,947
බැංකුවට ගෙවිය යුතු		(201,635)	(258,062)	(224,997)	(273,968)
		199,666	122,768	216,360	158,979

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 146 සිට 238 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1 ආයතනික තොරතුරු

මෙම කොටසින් වාර්තාකරණ සමාගමේ සහ සමූහයේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු සහ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන හඳුනාගැනීම පිළිබඳ විස්තරයක් ලබා දේ.

1.1 වාර්තාකරණ ආයතනය

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී (MBSL)1982 දී සංස්ථාපිත ශ්‍රී ලංකාව තුළ පිහිටි ලැයිස්තුගත පොදු සමාගමකි. 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ එය ලියාපදිංචි කර ඇත. සමාගමේ සාමාන්‍ය කොටස් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කරයි. සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී. 2014 නොවැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම එහි නාමය මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී ලෙස වෙනස් කරන ලද අතර, මීට පෙර මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීවිල්සී ලෙස හඳුන්වන ලදී. MBSL ඉතුරුම් බැංකු සමාගම සහ MCSL මූල්‍ය සේවා සමාගම 2015 ජනවාරි 01 දින සිට මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී ලෙස ඒකාබද්ධ කොට ඇත. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී ඒකාබද්ධ කිරීමෙන් පසු ස්ථිර ආයතනය ලෙස පවතී. සමාගමේ ලියාපදිංචි කාර්යාලය ලංකා බැංකුවේ මර්චන්ට් කුළුණ, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 යන ලිපිනයේ පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමාගම සහ එහි පරිපාලිත සමාගමේ (එක්ව සමූහය ලෙස හඳුන්වන) සහ එහි ආශ්‍රිත සමාගම්වල සමූහයේ අයිතිය යන ඒවායෙන් සමන්විත වේ.

මව් සමාගම සහ අවසාන පරිපාලක සමාගම

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමේ මව් සමාගම සහ අවසාන පරිපාලක සමාගම වන්නේ රජයට සම්පූර්ණයෙන්ම අයත්වන ලංකා බැංකුව වේ.

සේවකයින් සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ කාර්ය මණ්ඩල ශක්තිය පිළිවෙලින් 971 ක් සහ 1,423 ක් විය. :2015 දෙසැම්බර් 31 දිනට 866 සහ 1,440)

1.3 සමූහයේ තොරතුරු

මූලික කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

ආයතනය	ප්‍රධාන ව්‍යාපාර කටයුතු
සමාගම	
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීවිල්සී	කල්බදු, කුලී සින්නක්කර, ආයතනික හා පාරිභෝගික ණය, ආයතනික උපදේශන සේවය, ප්‍රාග්ධන වෙළෙඳ පොල මෙහෙයුම්, ආන්තික වෙළෙඳාම, ක්ෂුද්‍ර මූල්‍ය, කෘෂිකාර්මික ණය පහසුකම්, නිශ්චල දේපල වෙළෙඳාම, උකස් කටයුතු, ඉස්ලාමීය මූල්‍ය සහ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු භාරග ැනීමග
පරිපාලිත සමාගම	
MBSL රක්ෂණ සමාගම.	ජීවිත සහ සාමාන්‍ය රක්ෂණයේ සියලුම වර්ග රක්ෂණය
ආශ්‍රිත සමාගම	
ලංකා සිකියුරිටීස් පුද්ගලික සමාගම	කොටස් වෙළෙඳාම, ණය වෙළෙඳාම සහ ආන්තික වෙළෙඳාම තුළ ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙක් ලෙස ලියාපදිංචි වී ඇත.

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ප්‍රධාන ව්‍යාපාර කටයුතුවල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්වීම් සිදු වී නොමැත.

1.4 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාග මේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන (සංසන්දනාත්මක ඇතුළුව) 2017 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂවරුන්ගේ යෝජනාවකට අනුව 2017 අප්‍රේල් 28 දින නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

2. පිළියෙල කිරීමේ පදනම

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම මෙම කොටසින් විස්තර කරයි.

2.1 පිළියෙල කිරීමේ පදනම සහ අනෙකුත් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, ප්‍රධාන ගිණුම්කරණ විනිශ්චයන්, භාවිතා කළ ඇස්තමේන්තු සහ උපකල්පන, අනෙකුත් පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙතෙක් අනුගත නොවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) මෙම කොටස තුළ සාරාංශ ගත කර ඇත.

වාර්තාකරණ අගයන් සම්බන්ධයෙන් සියලුම විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු අදාළ සටහන් තුළ ඉදිරිපත් කොට ඇත.

2.2 අනුකූලතා ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමූහයේ වීකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් –SLFRS සහ LKAS&, සහ 2007 අංක 07 දරන සමාගම් පනත, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ අවශ්‍යතාවයන්ට සහ කොලඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට පහත සංරචක ඇතුළත්ය.

- සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ලබාදෙන ලාභාලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය :පිටු අංක 140 සිට 141 දක්වා බලන්න);
- වසර අවසානයට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් (පිටු අංකය 142 බලන්න);
- සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ කොටස්හිමියන්ගේ ස්කන්ධයෙහි සියලුම වෙනස්වීම් පෙන්නුම් කරන ස්කන්ධයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයක් පිටු අංකය 144 බලන්න);
- මුදල් හා මුදලට සමාන දෑ ඇති කිරීම සඳහා සමාග මේ සහ සමූහයේ හැකියාව සහ එම මුදල් ප්‍රවාහ භාවිතා කිරීම සඳහා ආයතනයේ අවශ්‍යතාව පිළිබඳව භාවිතා කරන්නන්ට තොරතුරු සපයන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයක් (පිටු අංකය 145 බලන්න);
  සහ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තීර්ණ තොරතුරු සමන්විත මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් (පිටු අංකය 146 සිට 238 බලන්න).

2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

2007 අංක 07 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගමේ සහ සමූහයේ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය, සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තුළ , සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහතික කිරීම පිළිබඳව පිළිවෙලින් පිටු අංක 136,106 සහ 143 වල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් භාරගනී.

2.4 අගය කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ චෛතිහාසික පිරිවැය සම්මතය පදනම් කරගෙන වන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභාලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ දැක්වෙන පහත අයිතම හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනීය සාධක සඳහා අනුරූප ගැලපීම් යොදා ගෙන නොමැත.

අයිතම	අගය කිරීමේ පදනම	සටහන් අංක	පිටු අංකය
වෙළෙඳපොල ගනුදෙනු දරා සිටින මූල්‍ය වත්කම්	සාධාරණ අගය	20	168
උපබිධිය සඳහා පවතින මූල්‍ය වත්කම්	සාධාරණ අගය	22	182
නීර්ණය කරන ලද ප්‍රතිලාභ බැඳීම්	නිර්ණය කරන ලද ප්‍රතිලාභ බැඳීම් වර්තමාන අගය සහ හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභවලට අඩුකළ හඳුනා නොගත් ආයුගණක ලාභවල එකතුව ලෙස හඳුනා ගනී	37	203

2.5 ක්‍රියාකාරිත්වය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය සමූහයේ ක්‍රියාකාරිත්ව සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වේ.

2.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සමාගමේ සහ සමූහයේ වත්කම් සහ වගකීම් ඒවායේ ස්වභාවය අනුව වර්ග කර ඇති අතර සාපේක්ෂ ද්‍රවශීලතාව සහ කල්පිරෙන ආකාරය අනුව ලැයිස්තු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ගත කර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 -මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම තුළ දක්වා ඇති නිර්ණායකවලින් විචක්ෂණභාවය, නෛතිකත්වය ඉක්ම වූ ආර්ථික හරය පිළිබඳ නිසි සැලකිල්ල සහිතව විශේෂයෙන් අනාවරණය කළ අවස්ථා හැර ගිණුම්කරණ මූලධර්ම අනුරූප ලෙස යොදා ගනී. අවශ්‍ය තැන්හිදී, ගිණුම්කරණ මූලධර්ම පසු සටහන්වල අනාවරණය කෙරේ.

2.7 ප්‍රමාණාත්මකබව, හිලව්කිරීම, සහ වටැයිම සහ සමූහනය භාවිතා කිරීම

සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක පන්ති මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ සහ විවැනි කාර්යවල අයිතම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 -මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මගින් අවසර දී ඇති පරිදි ඒවා නොවැදගත්නම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

හිලව්කිරීම

මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ වගකීම් සහ ආදායම් සහ වියදම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍යනම් හෝ අවසරය ඇත්නම් මිස හිලව් නොකෙරේ.

වටැයීම

“මූල්‍ය ප්‍රකාශවල සංඛ්‍යා වෙනත් ආකාරයක දක්වා ඇති අවස්ථා හැර ආසන්න රුපියල් දහසට වටැයිම් (රු. 000) කර ඇත.“

2.8 ප්‍රධාන ගිණුම්කරණ විනිශ්චයන්, අනුගත ඇස්තමේන්තු සහ උපකල්පන වල සාරාංශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තාකළ ප්‍රමාණ සහ සම්භාව්‍යතාවන් හෙළි කිරීම සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කිරීම සඳහා සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKAS) අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කළමනාකාරිත්වයට අවශ්‍ය වේ. විනිශ්චයන්, ඇස්තමේන්තු පවත්නා වාතාවරණයන් යටතේ යුක්තිසහගතයයි විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළුව අතීත පළපුරුද්ද සහ අනෙකුත් කරුණු මත පදනම් වේ.

මේ නිසා, සැබෑ පළපුරුද්ද සහ ප්‍රතිඵල මෙවැනි විනිශ්චයන්, ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ ඒ යටතේ උපකල්පන අඛන්ඩ පදනමක් මත සමාලෝචනය කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සංශෝධන ඒ අනුව හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශනයන්හී හඳුනාගත් සංඛ්‍යා මත වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී ඇස්තමේන්තුවල සැලකියයුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු, අවිනිශ්චිත සහ වැදගත් විනිශ්චයන් පහත පරිදි අදාළ සටහන්වල සාකච්ඡා කෙරේ. .

- මූල්‍ය නොවන වත්කම් මත හානිකරණ අලාභ සටහන් අංක 25,26,27 හා 28
- විලම්භිත බදු වගකීම්-සටහන් අංක .35
- ණය හා අත්තිකාරම්වල හානිකරණ ප්‍රතිපාදන - සටහන් අංක 21
- විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සටහන් අංක .37
- වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්-සටහන් අංක 47

2.8.1 අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමට පත්විය හැකි සම්පත්, බැංකුව සතු බව කළමනාකාරිත්වය උපකල්පනය කරයි. තවද, තවදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධව සැලකිය යුතු විෂයාත්මක අවිනිශ්චිතා කළමනාකාරිත්වය හඳුනා නොගනී. එමනිසා, සමූහයේ මූල්‍ය ප්‍රකාශන අඛන්ඩ පැවැත්ම මත පදනම්ව සකස් කර ඇත.

2.8.2 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසරය දෙන අවස්ථාව අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම්ය.

මේ සම්බන්ධව, වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදු වූ සියලුම වැදගත් සහ නොවැදගත් සිදුවීම් පිළිබඳ සලකා බලන ලද අතර අවශ්‍ය තැන්හිදී සුදුසු ගැලපීම් සිදු කරනු ලබයි. වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම් පිළිබඳ තොරතුරු 213 පිටුවේ සටහන් අංක 43 යටතේ දැක්වේ.

3 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ත

3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමාගමේ (පරිපාලක සමාගම) සහ එහි පරිපාලිත සමාගමේ (එක්ව සමූහය ලෙස හඳුන්වන) මූල්‍ය ප්‍රකාශන සහ ආශ්‍රිත සමාගම තුළ සමාගමේ අයිතිය යන ඒවායින් සමන්විත වේ. සමූහයේ සියලුම සමාගම්වලට මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වසර සඳහා වන අතර ව්‍යාපාර සහ අනුරූප ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

අන්තර්-සමූහ ගනුදෙනු ශේෂයන්, ආදායම් හා වියදම් සහ අන්තර්-සමූහ ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ලාභ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉවත් කෙරේ.

3.2 ව්‍යාපාර සංයෝජනය හා කීර්තිනාමය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 03 (ව්‍යාපාර සංයෝජනය) අනුව අත්පත්කර ගැනීමේ ක්‍රමය භාවිතයෙන් ව්‍යාපාර සංයෝජනය ගිණුම්ගත කෙරේ.

සමූහයේ කීර්තිනාමය අත්පත් කර ගත් දිනයට අනුව අත්පත් කරගත් හඳුනාගත හැකි වත්කම් සහ භාරගත හැකි වගකීම්වල ශුද්ධ අගය අඩුකළ පරිපාලිතයේ පාලනයට යටත් නොවන හිමිකමේ හඳුනාගත හැකි අගයද ඇතුළුව මාරු කළ ප්‍රතිඳාවේ සාධාරණ අගයට අගය කරනු ලැබේ.

අතිරික්තය සෘණාත්මක වන විටි කේවල මිලදී ගැනීමේ ලාභය ක්ෂණිකව ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

ව්‍යාපාර සංයෝජනයක් තුළ, අත්පත්කරගත් කීර්තිනාමය අත්පත්කර ගත් හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය බැරකම්වල ශුද්ධ අගය තුළ සමූහයේ අයිතියට වැඩි ව්‍යාපාර සංයෝජනයේ පිරිවැයේ අතිරික්තය වන පිරිවැයට මූලිකවම හඳුනා ගනී.

මූලිකවම හඳුනා ගැනීමෙන් පසු. සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට කීර්තිනාමය අගය කෙරේ. වාතාවරණයන් තුළ සිදුවීම් හෝ වෙනස්වීම් මගින් ඉදිරියට ගෙනා අගය හානිකරණය විය හැකි බව පෙන්නුම් කරන්නේ නම් කීර්තිනාමය වාර්ෂිකව හෝ වඩාත් කාලීනව සමාලෝචනය කෙරේ. හානිකරණ පරීක්ෂණයේ අරමුණ සඳහා, අත්පත්කර ගත් දිනයට, ව්‍යාපාර සංයෝජනයක් තුළ අත්පත් කරගත් කීර්තිනාමය සමූහයේ මුදල් ඉපයීමේ ඒකක වෙත හෝ මුදල් ඉපයීමේ ඒකකවල සමූහ අතර බෙදනු ලබන අතර ඉන් පරිපාලිතයේ අනෙකුත් වත්කම් සහ වගකීම් වීම ඒකකවලට පවරනු ලබන්නේද යන්න නොසලකා සංයෝජනයේ සහක්‍රියාවෙන් ප්‍රතිලාභ ලැබීම අපේක්ෂා කරයි.

කීර්තිනාමය මුදල් ඉපයීමේ ඒකකයක (හෝ මුදල් ඉපයීමේ ඒකකවල සමූහයක) කොටසක් සාදන අවස්ථාවක සහ එම ඒකකය තුළ මෙහෙයුම් කොටස බැහැර කෙරෙන අවස්ථාවක, බැහැර කරන මෙහෙයුම් හා බැඳුණු කීර්තිනාමය, මෙහෙයුම බැහැර කිරීම මත ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී මෙහෙයුම්වල ඉදිරියට ගෙනා අගයට ඇතුළත් කෙරේ. මෙවැනි අවස්ථාවන් හි බැහැර කරන කීර්තිනාමය බැහැරකරන මෙහෙයුමේ සාපේක්ෂ අගයන් සහ රඳවාගත් මුදල් ඉපයීමේ ඒකකයේ කොටස මත පදනම් වී අගය කෙරේ.

3.3 පොදුවේ පාලන ව්‍යාපාර සංයෝජනය

පොදුවේ පාලන ව්‍යාපාර සංයෝජන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ පොදුවේ පාලන ව්‍යාපාර සංයෝජනය සඳහා නිර්දේශිත ව්‍යවහාර පිළිබඳ ප්‍රකාශනය (SoRP) - ඒකාබද්ධ ගිණුම්කරණය යටතේ නිකුත් කළ මාර්ගෝපදේශ භාවිතයෙන් ගිණුම්ගත කෙරේ. ඒ අනුව,

- ඒකාබද්ධ ආයතනවල ශුද්ධ වත්කම් පවත්නා පොතේ වටිනාකම භාවිතයෙන් ඒකාබද්ධ කෙරේ.
- ඒකාබද්ධ කිරීම සහ අත්පත්කර ගත් ශුද්ධ අගය අතර වෙනසේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කීර්තිනාමය ලෙස කිසිදු අගයක් හඳුනා නොගනී.

3.3.1 පාලනය අහිමිවීම

පාලනය අහිමිවීම මත, සමූහය පරිපාලිත සමාගමේ වත්කම් සහ වගකීම්, පරිපාලිත සමාගමට අදාළ පාලනයට යටත් නොවන හිමිකම සහ ස්කන්ධයේ අනෙකුත් සංරචක නැවත හඳුනා නොගනී. පාලනය අහිමිවීම මත ඇතිවන යම් අතිරික්තය හෝ හිඟය ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. සමූහය පෙර පරිපාලිත සමාගමේ යම් අයිතියක් තබාගන්නේනම්, එවිට එවැනි අයිතිය පාලනය අහිමිවන දිනයේ සාධාරණ අගයට අගය කරනු ලැබේ. ඉන්පසුව, එය ස්කන්ධය ගණනය කළ ආයෝජක ලෙස හෝ රඳවාගත් බලපෑම් මට්ටම මත රැඳෙමින් මූල්‍ය උපකරණ සඳහා සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ගිණුම්ගත කෙරේ.

3.3.2 ඒකාබද්ධකිරීම් මත ඉවත්කළ ගනුදෙනු

අන්තර් සමූහ තුළනයන් සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉවත් කෙරේ. ස්කන්ධය ගණනය කළ ආයෝජකයින් සමඟ ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ලාභ ආයෝජකයා තුළ සමූහයේ අයිතියේ ප්‍රමාණයට අනුව ඉවත් කෙරේ. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලාභ මෙන් සමාන ආකාරයට වුවත් හානිකරණ සාක්ෂි නොමැති ප්‍රමාණය දක්වා පමණක් ඉවත් කරනු ලැබේ.

3.4 විදේශ ව්‍යවහාර මුදල්

3.4.1 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂයන්

විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන සියලුම ගනුදෙනු එකී ගනුදෙනු සිදුවන අවස්ථාවේදී පැවති විනිමය අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල්වලට (රු.) පරිවර්තනය කෙරේ.

විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයට පවත්නා විනිමය අනුපාතිකයට සමාන ක්‍රියාත්මක ව්‍යවහාර මුදලකට නැවත මාරු කරනු ලැබේ.

මූල්‍ය උපකරණ පරිවර්තනය මත ඇතිවන ලාභ හෝ අලාභ ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

3.5 මූල්‍ය උපකරණ

3.5.1 හඳුනා ගැනීමේ දිනය

සමූහ ආයතනයක් මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත ප්‍රතිපාදනවල පාර්ශවයක් බවට පත්වන විට, මූල්‍ය වත්කම් සහ වගකීම් ආරම්භයේදී හඳුනාගනී. සියළුම විධිමත් ආකාරයේ මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හා විකිණීම් ගනුදෙනු දින පදනමක් මත හඳුනා ගැනීම හෝ නොගැනීම සිදු කරයි. වෙළෙඳපොළේ රෙගුලාසියකින් හෝ සම්මුතියක් මගින් තහවුරු කරන ලද කාලරාමුවක් තුළ භාරදීමට අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් විධිමත් ක්‍රමයට වන ගනුදෙනු ගණයට ඇතුළත් වේ.

3.5.2 මූල්‍ය උපකරණ ආරම්භක අගය කිරීම

මූල්‍ය වත්කම් සහ වගකීම් ආරම්භයේදී සාධාරණ අගයට හඳුනා ගනී. මූල්‍ය වත්කම් සහ වගකීම් අත්පත් කරගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය (සාධාරණ අගය මගින් ලාභ අලාභ වන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර) ආරම්භක හඳුනාගැනීම මත සුදුසු පරිදි මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල සාධාරණ අගයට එකතු කෙරේ නැතිනම් අඩු කෙරේ. සාධාරණ අගය මගින් ලාභ අලාභ වන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් අත්කර ගැනීමට සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය ක්ෂණිකව ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

3.5.3 මූල්‍ය වත්කම් වර්ග කිරීම සහ පසු අගය කිරීම

මූල්‍ය වත්කම් ආරම්භයේදී පහත දැක්වෙන ඒවායින් එකකට වර්ග කරනු ලැබේ :

- සාධාරණ අගය මගින් ලාභ අලාභ වන ලෙස නම් කරන ලද මූල්‍ය වත්කම් (FVTPL) :සාධාරණ අගය මගින් ලාභ අලාභ වන ලෙස නම් කරන ලද ගනුදෙනු සඳහා ඇති)
- ණය හා ලැබීම් (L&R)
- කල්පිරීම තෙක් රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් (HTM)
- අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් (AFS)

මූල්‍ය වත්කම්වල ස්වභාවය සහ අරමුණ මත වර්ගීකරණය රඳා පවතින අතර ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කෙරේ.

3.5.4 ඵලදායී පොළී ක්‍රමය (EIR)

ඵලදායී පොළී ක්‍රමය යනු ණය උපකරණයක ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීමේ සහ අදාළ කාලසීමාව පුරා පොළී ආදායම වෙන්කිරීමේ ක්‍රමයකි. ඵලදායී පොළී අනුපාතය යනු ණය උපකරණයක අපේක්ෂිත කාලය හෝ සුදුසු තැන්හිදී වඩා කෙටි කාලසීමාවක් තුළින් ආරම්භක හඳුනාගැනීම මත ඉදිරියට ගෙනා ශුද්ධ අගයට ඇස්තමේන්තු කළ අනාගත මුදල් ලැබීම් (ඵලදායී පොළී අනුපාත, ගනුදෙනු පිරිවැය සහ අනෙකුත් වාරික හෝ වට්ටම්වල අත්‍යවශ්‍ය කොටසක් සාදන ගෙවූ හෝ ලද සියලුම ගාස්තු සහ ලකුණු ඇතුළුව) නිවැරදිව වට්ටම්කරන අනුපාතයයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් හැර ණය උපකරණ සඳහා ඵලදායී පොළී පදනමක් මත ආදායම් හඳුනා ගනී.

3.5.5 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අගය කරන මූල්‍ය වත්කම් හා වගකීම්

අ) ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනුයේ ඒවා මූලිකවම අත්කර ගනු ලබන්නේ කෙටි කාලයක් තුළ විකිණීමේ හෝ නැවත මිලදී ගැනීම සඳහා හෝ කෙටි කාලීන ලාභය හෝ ගන්නා තත්ත්වය එක්ව පාලනය කරන කළඹක කොටසක් ලෙස දරා ගැනීම නිසයි.

ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරයි. සාධාරණ අගයෙහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළ හඳුනාගන්නා අතර පොළී සහ ලාභාංශ ආදායම ගිවිසුමේ නියමයන්ට අනුව හෝ ගෙවීම ලැබීමට හිමිකම පිහිටුවා ඇති අවස්ථාවක ශුද්ධ වෙළෙඳ ආදායම තුළ වාර්තා කෙරේ. සමූහය එහි ගනුදෙනු කිරීම සඳහා ඇති ව්‍යුත්පන්න නොවන වත්කම් කළඹ ඉදිරි කෙටි කාලයකදී ඒවා අලෙවි කිරීම සුදුසුද යන්න තීරණය කිරීම සඳහා ඇගයීම් කරනු ලැබේ. අකාර්යක්ෂම වෙළෙඳපොල හේතු කොට ගෙන හෝ මෙම වත්කම් ඉදිරි අනාගතයේදී විකිණීම සම්බන්ධව කළමනාකාරිත්වයේ අරමුණ සැලකිය යුතු ලෙස වෙනස්වීම හේතු කොට ගෙන ගනුදෙනු කිරීමට නොහැකි වන අවස්ථාවක නැවත වර්ගීකරණය සඳහා යොමු වේ. ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වත්කම් තුළ ඵලදායී ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් නොකරන ලද වෙන් වූ අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණද ඇතුළුව රජයේ හා අනෙකුත් ණය සුරැකුම්පත්, ඉදිරි කෙටි කාලයකදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ පරමාර්ථයෙන් රඳවාගෙන ඇති ස්කන්ධ උපකරණ ඇතුළත් වේ.

ආ) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ මූල්‍ය වත්කම් සහ වගකීම්

මෙම වර්ගය තුළ වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් සහ වගකීම් යනු ආරම්භක හඳුනාගැනීමේදී කළමනාකාරිත්වය විසින් නම් කරනු ලබන මූල්‍ය වත්කම් හා වගකීම්ය. පහත නිර්ණායක සපුරාලන සහ නම් කිරීම උපකරණ පදනමක් මගින් උපකරණයක් මත තීරණය කරන අවස්ථාවක ආරම්භක අවස්ථාවේදී කළමනාකාරිත්වය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී පමණක් උපකරණයක් නම්කළ හැකිය.

- වෙනස් පදනමක් මත වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් හෝ ලාභ හෝ අලාභ හඳුනා ගැනීමෙන් පැනනැගිය හැකිව තිබූ අසංගතභාවයක් අදාළ නම් කිරීම මගින් වැලකීයාම හෝ සැලකිය යුතු මට්ටමකට අඩුවීම.
- වත්කම් හා වගකීම් යනු මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් හෝ මූල්‍ය වත්කම් හා වගකීම් හෝ දෙකෙහිම සමූහවල කොටසක් වන අතර ඒවා ලිඛිත අවදානම් කළමනාකරණයක හෝ ආයෝජන ක්‍රමෝපායකට අනුකූලව සාධාරණ අගය පදනමක් මත පාලනය කිරීම සහ ඒවායේ කාර්යසාධනය අගයනු ලැබීම.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සාධාරණ අගය මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ. සාධාරණ අගයෙහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ හෝ අලාභ තුළ වාර්තා කරනු ලැබේ. ඉපයූ පොළී ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් පොළී ආදායම් තුළ එකතු කෙරෙන අතර ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය පිහිට වූ විට ශුද්ධ වෙළෙඳ ආදායමෙහි සටහන් කරනු ලැබේ.

3.5.6 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අගය නොකරන සමාගම සහ සමූහය විසින් නිකුත් කළ මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

ආරම්භක හඳුනාගැනීමෙන් පසු, මෙම මූල්‍ය වගකීම් ඵලදායී ආදායම් පදනමක් මත හඳුනාගත් පොළී වියදම් සමඟ ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් පසුකාලීනව ක්‍රමක්ෂයට අගය කරනු

ලැබේ. එලදායී පොළී ක්‍රමය යනු මූල්‍ය වගකීමක් මත ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීමේ සහ අදාළ කාලසීමාව පුරා පොළී වියදම් වෙන් කිරීමේ ක්‍රමයකි.

3.5.7 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නැවත හඳුනා ගැනීම

3.5.7.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් හෝ අවශ්‍ය තැන්වලදී මූල්‍ය වත්කම්වල කොටසක් නැතිනම් සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පහත අවස්ථාවල හඳුනා නොගනී.

- වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය අවසන් වී තිබීම හෝ, සහ
- සමාගම සහ සමූහය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර තිබීම, හෝ පසුකර යැවීමේ ක්‍රියාවලියක් තුළින් තෙවන පාර්ශවයකට වැදගත් ප්‍රමාදයක් නොමැතිව ලද මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන් ගෙවීම සඳහා බැඳීමක් භාරගන්නා අවස්ථාව.
- සමාගම සහ සමූහය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රදාන මාරු කර ඇති අවස්ථාව, හෝ
- සමාගම සහ සමූහය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රදාන සැලකිය යුතු පරිදි මාරුකර හෝ රඳවාගෙන නොමැති නමුත් වත්කමේ පාලනය මාරු කර ඇති අවස්ථාව.

මූල්‍ය වත්කමක් හඳුනා නොගැනීම මත, වත්කමේ ඉදිරියට ගෙනා අගය (හෝ මාරු කළ වත්කමේ කොටසට වෙන්කළ ඉදිරියට ගෙනා අගය) සහ ලද ප්‍රතිෂ්ඨාව (පිළිගත් නව වගකීම අඩුකළ ලබාගත් නව වත්කම ඇතුළුව) අතර වෙනස සහ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන තිබූ යම් සමුච්චිත ලාභ ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනී.

සමාගම සහ සමූහය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර ඇති විට හෝ මාරු කිරීමේ වැඩපිළිවෙලකට ඇතුළත් වී ඇති විට සහ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රදාන සැලකිය යුතු පරිදි රඳවාගෙන හෝ මාරු කර නොමැති හෝ එහි පාලනය මාරුකර නොමැති විට, වත්කම තුළ සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණයට එය හඳුනා ගනී. මාරුකළ වත්කම් සහ ආශ්‍රිත වගකීම සමූහය රඳවාගෙන ඇති හිමිකම් හා බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත අගය කරනු ලබයි.

මාරුකළ වත්කමට ඇපයක ආකාරයක් ගන්නා අඛණ්ඩ සම්බන්ධතාව වත්කමේ මුල් ධාරණ අගයේ අවමයට සහ සමාගම ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම අගයට අගය කරනු ලබයි.

3.5.7.2 මූල්‍ය වගකීම්

වගකීම යටතේ බැඳීම මුදාහරින හෝ අවලංගු කරන හෝ කල්පිරෙන විට, මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. පවත්නා මූල්‍ය වගකීමක් තිරසාරාත්මකව විවිධ නියමයන් මත එම ණයකරුගෙන් වෙනත් එකකින් ප්‍රතිෂ්ඨාපනය කරන විට, හෝ පවත්නා වගකීමක නියමයන් සැලකියුතු පරිදි වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනී.

3.5.8 මූල්‍ය උපකරණ හිලව් කිරීම

දැනට බලපවත්නා නීතිමය අයිතියක් ඇති විට හෝ ශුද්ධ පදනම යටතේ නිරවුල් කිරීමට අදහස් කරන විට හෝ වත්කම නිදහස් කර ඒ සමඟම වගකීම් පියවීමට අදහස් කරන විට මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරනු ලබයි.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අවසර දී ඇති විට හා සමූහයේ වෙළෙඳ කටයුතු තුළ මෙන් එක හා සමාන ගනුදෙනුවලින් ලාභාලාභ ඇතිවන අවස්ථාවල පමණි.

3.5.9 සාධාරණ අගය තීරණය කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයට සක්‍රිය වෙළෙඳපොලක් තුළ අලෙවි කල මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය ගනුදෙනු පිරිවැය සඳහා යම් අඩුකිරීමක් නොමැතිව ඒවායේ ලැයිස්තුගත වෙළෙඳපොල මිල මත පදනම් වේ.

සක්‍රිය වෙළෙඳපොලක් තුළ අලෙවි නොකල අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ සුදුසු ඇගයීමේ තාක්ෂණ භාවිතයෙනි. ඇගයීමේ තාක්ෂණයට වෙළෙඳපොල නිරීක්ෂණය කළ හැකි මිල ගණන් සඳහා සමාන උපකරණවලට සාපේක්ෂව වට්ටම්කළ මුදල් ප්‍රවාහ ක්‍රමය සහ අනෙකුත් අදාළ ඇගයීමේ ආදර්ශ ඇතුළත්ය.

සමහර මූල්‍ය උපකරණ පවත්නා වෙළෙඳපොල ගනුදෙනු හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල දත්ත ලබා ගත නොහැකි ඇගයීම් තාක්ෂණය භාවිතයෙන් සාධාරණ අගයේදී වාර්තා කරනු ලබයි. සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ වඩාත් සුදුසු ආදර්ශ උපකල්පන පිළිබඳ සමූහයේ උපරිම ඇස්තමේන්තුව සහිත ඇගයීම් ආදර්ශ භාවිතයෙනි.

3.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තා කරන දිනයකටම වත්කමක් හානිකරණය කළ හැකිද යන්න පිළිබඳ සමූහය ඇස්තමේන්තු කරයි. එවැනි යම් සඳහනක් ඇත්නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණය අවශ්‍ය වන විට, සමූහය වත්කමේ ආපසු අයකර ගත හැකි අගය පිළිබඳ ඇස්තමේන්තුවක් සිදු කරයි. වත්කමේ ආපසු අයකර ගත හැකි අගය යනු විකිණීමේ පිරිවැය සහ එහි භාවිත වටිනාකම අඩුකළ වත්කමක හෝ මුදල් ඉපයීමේ ඒකකයේ සාධාරණ අගයෙන් ඉහළ අගයයි. වත්කමක හෝ මුදල් ඉපයීමේ ඒකකයේ ඉදිරියට ගෙනා අගය, එහි ආපසු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේනම්, වත්කම හානිකරණය වූ ලෙස සලකා බලනු ලබන අතර එහි ආපසු අයකර ගත හැකි අගයට සටහන් කරනු ලැබේ.

භාවිත අගය ඇගයීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මුදලේ කාලීන අගය පිළිබඳ පවත්නා වෙළෙඳපොල ඇස්තමේන්තු සහ වත්කමට විශේෂිත අවදානම් පෙන්වනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් භාවිතයෙන් ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකිණීමේ පිරිවැයට අඩු සාධාරණ අගය තීරණය කිරීමේදී, මෑතකාලීන වෙළෙඳ පොල ගනුදෙනු ලබාගත හැකි නම් සලකා බලනු ලැබේ. එවැනි ගනුදෙනු කිසිවක් හඳුනාගත නොහැකිනම්, සුදුසු ඇගයීම් ආකෘතියක් භාවිතා කරයි. මෙවැනි ගණනය කිරීම් ඇගයීම් ගුණාකාර හෝ ලබාගතහැකි අනෙකුත් සාධාරණ අගය පිළිබඳ දර්ශක මගින් සනාථ කරයි.

හානිකරණ අලාභ ලාභය හෝ අලාභය තුළ ක්ෂණිකව හඳුනා ගනී. කීර්තිනාමය ඉවත්කළ වත්කම් සඳහා, පෙර හඳුනාගත් හානි හානිකරණ අලාභ තවදුරටත් පවතින්නේ නැතිද යන්න හෝ අඩුවී තිබිය හැකිද යන්න පිළිබඳ යම් සඳහනක් තිබේද යන්න පිළිබඳව වාර්තා කරන දිනයට ඇගයීමක් සිදු කෙරේ. එවැනි සඳහනක් පවතීනම්, සමූහය වත්කමේ හෝ මුදල් ඉපයීමේ ඒකකයේ ආපසු අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබයි. අවසන් හානිකරණ අලාභ හඳුනාගනු ලැබීමේ සිට වත්කමේ ආපසු අයකර ගත හැකි අගය තීරණය කිරීමට භාවිතා කළ උපකල්පනවල වෙනසක් සිදුවී ඇත්නම් පෙර හඳුනාගත් හානිකරණ අලාභ ආපසු හරවනු ලබයි. ආපසු හැරවීම වත්කමේ ඉදිරියට ගෙනා අගයට සීමා කෙරේ. එම අගය වත්කමේ ආපසු අයකර ගත හැකි අගය නොඉක්මවන, ශුද්ධ ක්ෂයකිරීම තීරණය කරනු ලැබිය හැකි ඉදිරියට ගෙනා අගය නොඉක්මන, පෙර වසරවල වත්කම සඳහා කිසිදු හානිකරණ අලාභයක් හඳුනාගෙන නොමැති අගයකි.

එවැනි ආපසු හැරවීමක් ලාභාලගාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

3.7 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇති විටක, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙන්කිරීමක් හඳුනා ගන්නා අතර ආර්ථික ප්‍රතිලාභවල පිටතට යාමක් වගකීම පියවීමට අවශ්‍ය කරන බව කිව හැකිය. වෙන්කිරීම් ප්‍රමාණය වෙන්කිරීම්, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 37ට අනුකූලව විශ්වාසී ලෙස අගය කළ හැකිය. වාර්තා කරන දිනයට හඳුනාගත් ප්‍රමාණය ලෙස වගකීමට අදාළ අවදානම් සහ අවිනිශ්චිතතාවන් සැලකිල්ලට ගෙන වගකීම පියවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිඵලයෙහි හොඳම ඇස්තමේන්තුව භාවිතා කරයි. වර්තමාන වගකීම් පියවීමට ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහ භාවිතයෙන් වෙන්කිරීමක් අගය කරන විට, එහි ඉදිරියට ගෙනා අගය එම මුදල් ප්‍රවාහවල වර්තමාන අගය මත පදනම්ව තීරණය කෙරේ.

3.8 ණය පිරිවැය

වත්කමක අපේක්ෂිත භාවිතය සහ විකිණීම සඳහා සූදානම් කිරීමට සාමාන්‍යයෙන් සැලකිය යුතු කාලසීමාවක් ගනු ලබන සුදුසුකම් ලබන වත්කමක් අත්පත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයකට සෘජුවම ආරෝපනය වන ණය පිරිවැය එම වත්කමේ අපේක්ෂිත භාවිතය සහ විකිණීම සඳහා සූදානම් කරන කාලය දක්වා එම වත්කම්වල පිරිවැයට එකතු කෙරේ. සුදුසුකම් ලබන වත්කමක් මත වියදම ඇති තාවකාලිකව ආයෝජනය කරන විශේෂ ණයගැනීම්වලින් උපයන ආදායම ඉදිරියට ගෙනා අගයට එකතු කිරීමට සුදුසු ණය පිරිවැයෙන් අඩු කරනු ලබයි. අනෙකුත් සියලුම ණය පිරිවැය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 23 - ණය පිරිවැයට අනුකූලව ඒවා දරනු ලබන කාලසීමාව තුළ ලාභ හෝ අලාභය තුළ හඳුනා ගනී. අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ආයතනය දරනු ලබන පොළී සහ අනෙකුත් පිරිවැයවලින් ණය පිරිවැය සමන්විත වේ.

3.9 පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගමේ (MBSLI) ව්‍යාපාරයන්ට විශේෂිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.9.1 විලම්භිත වියදම්

3.9.1.1. විලම්භිත අත්පත් කරගැනීමේ පිරිවැය(DAC)

නව ව්‍යාපාරයක නිෂ්පාදන සහ / හෝ අභිමතානුකූල සහභාගිත්ව ලක්ෂණ සහිත ආයෝජන ගිවිසුම්වලට වෙනස්වන සහ සෘජුවම සම්බන්ධවන කොමිස්, ප්‍රාරක්ෂණය, අලෙවිකරණය සහ ඔප්පු නිකුත් කිරීමේ වියදම් ඇතුළුව නව ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පිරිවැය අනාගත වාර්කවලින් ආපසු අයකර ගත හැකි පිරිවැයේ ප්‍රමාණයට විලම්භනය කරනු ලබයි.

අනෙකුත් සියලුම අත්පත් කර ගැනීමේ පිරිවැය දරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනා ගනී. මූලික හඳුනාගැනීමෙන් පසුව, සාමාන්‍ය රක්ෂණය සඳහා නොඉපයූ වාර්ක ක්‍රමක්ෂය කරනු ලබන පදනම මත කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ. විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයේ ප්‍රතිරක්ෂණ කොටස සමාන ආකාරයෙන් ක්‍රමක්ෂය කරන අතර එම ක්‍රමක්ෂය ලාභාලාභ ප්‍රකාශනය තුළ සටහන් කරනු ලබයි.

වත්කමක අපේක්ෂිත ජීවකාලය හෝ එයට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව තුළ වෙනස්වීම් ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කරමින් එම කාලසීමාව සඳහා ගණනය කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස සලකනු ලැබේ.

අදාළ ගිවිසුම් කල්පිරී හෝ අවලංගු වී ඇති විට විලම්භනය තුළ අත්පත් කර ගැනීමේ පිරිවැය බැහැර කිරීම සිදුවේ.

3.9.1.2 ප්‍රතිරක්ෂණ කොමිස්

බාහිර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ලැබිය යුතු කොමිස් විලම්භනය කර ක්‍රමක්ෂය කෙරේ.

3.9.2 ප්‍රතිරක්ෂණය

පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගම (MBSLI)

එහි සියලුම ව්‍යාපාර කටයුතුවලදී ව්‍යාපාරයේ සාමාන්‍ය රටාව තුළ රක්ෂණ අවදානම පවරා දේ. ප්‍රතිරක්ෂණ වත්කම් ප්‍රතිරක්ෂණ සමාගම්වලින් ලැබිය යුතු ශේෂ නියෝජනය කරයි. ප්‍රතිරක්ෂකයින්ගෙන් අයකරගත හැකි ප්‍රමාණයන් හිඟව ඇති හිමිකම් හෝ ප්‍රතිරක්ෂකයාගේ ඔප්පුවලට අදාළ පියවූ හිමිකම් වෙන්කිරීමට අනුරූප ආකාරයකින් සහ අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුකූලව ඇස්තමේන්තු කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ වත්කම් වාර්තාකරන දිනයට හෝ බොහෝ විට වාර්තාකරන වසර තුළ හානිකරණය පිළිබඳ සංඥාවක් ඇතිවන විට හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලබයි. පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගමට ගිවිසුමේ නියමයන් යටතේ ගෙවිය යුතු මුළු හිඟ මුදල නොලැබිය හැකි, සහ පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගමට ප්‍රතිරක්ෂකයාගෙන් ලැබෙන මුදල මත මැනිය හැකි බලපෑමක් ඇති ප්‍රතිරක්ෂණ වත්කම මූලික හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විෂයාත්මක සාක්ෂියක් ඇති විට හානිකරණය සිදු වේ. හානිකරණ අලාභය ලාභාලාභ ප්‍රකාශනය තුළ සටහන් කරනු ලබයි.

පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගමද අවශ්‍ය තැන්හිදී ජීවිත රක්ෂණය සහ ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ ප්‍රතිරක්ෂණ අවදානම් බාරග නී. බාරගත් ප්‍රතිරක්ෂණවල වාරික සහ හිමිකම්, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගීකරණය සැලකිල්ලට ගනිමින් ප්‍රතිරක්ෂණය සෘජු ව්‍යාපාරය සලකනු ලබන්නේනම් පමණක් ආදායම් හෝ වියදම් ලෙස සමාන ආකාරයෙන් හඳුනාග නී. ප්‍රතිරක්ෂණ වගකීම් ප්‍රතිරක්ෂණ සමාගම්වලට ගෙවිය යුතු ශේෂ නියෝජනය කරයි. ගෙවිය යුතු ප්‍රමාණයන් අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුරූප ආකාරයෙන් ඇස්තමේන්තු ගත කරයි.

වාරික සහ හිමිකම් පිළිගත් සහ පවරාගත් ප්‍රතිරක්ෂණ සඳහා දළ පදනමක් මත ඉදිරිපත් කරනු ලබයි.

ගිවිසුම්ගත හිමිකම් ශූන්‍ය හෝ කල්පිරෙන විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට මාරු කරන විට ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් හඳුනා නොගනී.

3.9.3 රක්ෂණ ගිවිසුම් වගකීම්

3.9.3.1 ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිවිසුමට ඇතුළත්වන විට සහ වාරික ලැබෙන විට ජීවිත රක්ෂණ වගකීම් හඳුනා ගනී. මෙම වගකීම් ශුද්ධ වාරික ක්‍රමය භාවිතයෙන් අගය කෙරේ. භාවිතා කරන ඇගයීම් උපකල්පන මත පදනම් වී අනාගත මුදල් ප්‍රවාහ සපුරාලීමට අවශ්‍ය විය හැකි අපේක්ෂිත වගකීම් තීරණය කරනු ලබන්නේ අපේක්ෂිත උපකල්පිත වාරිකවල වට්ටම්කල අගය අඩුකළ ගිවිසුමට සෘජුවම අදාළ වන අනාගත ප්‍රතිලාභ, හිමිකම් පාලනය සහ ඔප්පු පරිපාලන වියදම්, ඔප්පුහිමියන්ගේ කැමැත්ත සහ ඇප සහ එම වගකීම්වලට සහයවන වත්කම්වල ආයෝජන ආදායම්වල වට්ටම්කළ එකතුව ලෙසය. වගකීම පවත්නා උපකල්පන මත හෝ පදනම් වන අතර නැතිනම් ගිවිසුම නිකුත් කරන අවස්ථාවේදී ස්ථාපිත උපකල්පන භාවිතයෙන් ගණනය කරනු ලැබේ. මෙහිදී අවදානම සහ අහිතකර අපගමනයන් සඳහා ආන්තිකයක් පොදුවේ ඇතුළත් කරනු ලබයි. දීර්ඝ කාලය සඳහා වෙනම සංචිතයක් ස්ථාපිත කළ හැකි අතර වගකීම ඇගයීම් තුළ ඇතුළත් කළ හැක. එමෙන්ම, ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා වගකීම තුළ නොඉපයූ වාරික, සඳහා වෙන් කිරීම, කල් නොපිරුණු අවදානම්, මෙන්ම පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගම වෙත මෙතෙක් වාර්තා කර නොමැති දරන ලද හිමිකම්වල ඇස්තමේන්තුවක් ඇතුළත් හිඟ හිමිකම්වලින් සමන්විතය. වාර්තා කරන දිනයට වගකීම් සඳහා ගැලපීම් ලාභාලාභ ප්‍රකාශනය තුල සටහන් කරනු ලබයි. අතිරික්ත ගිවිසුම් මත අහිතකර අපගමන ආන්තිකවලින් ඇතිවන ලාභ ගිවිසුමේ කාලය පුරා ලාභාලාභ ප්‍රකාශනය තුල හඳුනාගන්නා අතර අලාභ අතිරික්ත පළමු වසර තුළ ලාභාලාභ ප්‍රකාශනය තුල සම්පූර්ණයෙන්ම හඳුනාගනී. ගිවිසුම කල්පිරුණ, මුදාහරින හෝ අවලංගු කරන විට වගකීම හඳුනා නොගනී.

වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය (LAT)

එක් එක් වාර්තා කරන දිනයට හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීම් පවත්නා වගකීම් ප්‍රමාණාත්මක පරීක්ෂණ භාවිතයෙන් ලබාගන්නා ශුද්ධ විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය හා අනාගත වාරිකවල ශුද්ධ වර්තමාන අගයට අදාළව ප්‍රමාණවත්ද යන්න හඳුනා ගනී.

වගකීමේ අගය අනාගත ප්‍රතිලාභ සහ වියදම් සපුරාලීමට ප්‍රමාණවත් නොවන ප්‍රමාණයට ගලපනු ලැබේ. ප්‍රමාණාත්මතා පරීක්ෂණය පැවැත්වීමේදී, හිමිකම් පාලනය සහ ඔප්පු පරිපාලන වියදම්, ඔප්පුහිමියන්ගේ කැමැත්ත සහ ඇප මෙන්ම එම වගකීම්වලට සහයවන වත්කම්වල ආයෝජන ආදායම් වැනි අදාළ මුදල් ප්‍රවාහ ඇතුළුව අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ හොඳම වර්තමාන ඇස්තමේන්තුව භාවිතා කරනු ලබයි. වට්ටම්කළ මුදල් ප්‍රවාහ, විකල්ප මිලකරණ ආදර්ශ සහ අනුමාන ආදර්ශකරණය ඇතුළුව ඇගයීම් ක්‍රම ගණනාවක් යොදා ගනී. මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගත් පොළී අනුපාතය පවත්නා වෙළෙඳපොල පොළී අනුපාත සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ දුරදක්නා අපේක්ෂාවන් මත පදනම් වේ. අනාගත වාරිකවලට අදාළ ශුද්ධ වර්තමාන අගය සහ විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැය හානිකරණය කරමින් සහ පසුව පවත්නා අලාභ සඳහා තාක්ෂණික සංචිතයක් පිහිටුවමින් මූලිකවම ලාභාලාභ ප්‍රකාශනය තුල සටහන් කරනු ලබයි.

පසු කාලසීමාවන් තුළ, ප්‍රමාණාත්මතා පරීක්ෂණය අසමත් වී ඇති ව්‍යාපාරයක අවහිරයක් සඳහා වගකීම අලාභය හඳුනාගන්නා අවස්ථාවේ පිහිටවනු ලබන උපකල්පන මත පදනම් වේ. උපකල්පනවලට අහිතකර අපගමන සඳහා ආන්තිකයක් ඇතුළත් නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

3.9.3.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිවිසුම්වලට ඇතුළත්වන විට සහ වාර්ක අයකරන විට ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් හඳුනාගනී. මෙම වගකීම් ගෙවීමට ඇති හිමිකම් වෙන්කිරීම ලෙස පොදුවේ හඳුන්වන අතර වාර්තා කරන දිනයට වාර්තා කර තිබුනද නොතිබුනද, දරන ලද එහෙත් පියවා නොමැති සියලුම හිමිකම්වල ඇස්තමේන්තුගත අවසාන පිරිවැය සමඟ අදාළ හිමිකම් පාලන වියදම්, සුන්බුන්වලින් සහ අනෙකුත් අයකරගැනීම්වලින් අපේක්ෂිත අගය සඳහා අඩුකිරීම මත පදනම් වේ. ඇතැම් වර්ගවල හිමිකම් දැනුම්දීම සහ නිරවුල් කිරීම සඳහා ප්‍රමාදයන් ඇතිවිය හැකි අතර එමනිසාම මේවායේ අවසාන පිරිවැය නිශ්චිතව වාර්තා කරන දිනයට දැනගත නොහැක.වාර්තා කරන දිනයට වගකීම් ගණනය කරනු ලබන්නේ අහිතකර අපගමන සඳහා ආන්තිකයක් ඇතුළත්කළ හැකි ප්‍රත්‍යක්ෂමූලක දත්ත සහ පවත්නා උපකල්පන මත පදනම් වී සම්මුත ජීවගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්පයක් භාවිතා කරමිනි. වගකීම මුදලේ කාලීන අගය සඳහා වට්ටම නොකරනු ලබයි. සමානකරණයන් සහ විපත්තීන් සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු නොකරයි. ගිවිසුම කල්පිරුණ, මුදාහරින හෝ අවලංගු කරන විට වගකීම් හඳුනා නොගනී.

වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය (LAT)

නොඉපයූ වාරික සඳහා වෙන්කිරීම තුළ මෙතෙක් කල් නොපිරුණු අවදානම් සඳහා ලද වාරික නියෝජනය කරයි. පොදුවේ, සංචිතය ගිවිසුම් කාලයෙන් පසු මුදාහරින අතර එය වාරික ආදායම ලෙස හඳුනා ගනී.

එක් එක් වාර්තා කරන දිනයට පරිපාලිත සමාගම වන රක්ෂණ සමාගම එහි කල් නොපිරුණු අවදානම් සමාලෝචනය කරන අතර නොඉපයූ වාරිකවල අපේක්ෂිත හිමිකම් සහ විලම්හිත අත්පත් කර ගැනීම පිරිවැයවල සමස්ත අතිරික්තයක් තිබේද යන්න තීරණය කිරීමට වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් පවත්වනු ලබයි. මෙම ගණනය කිරීම තුළ ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අදාළ වන්නා වූ වත්කම් මත ඇතිවේයයි අපේක්ෂිත ආයෝජන ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමෙන් පසු ආදාළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පිළිබඳ පවත්නා ඇස්තමේන්තු භාවිතා කරයි. මෙම ඇස්තමේන්තු මගින් නොඉපයූ වාරිකවල ඉදිරියට ගෙනා අගය (අදාළ විලම්හිත අත්පත්කර ගැනීම් පිරිවැයට අඩුකළ) ප්‍රමාණවත් නොවන බව පෙන්වන්නේනම්, වගකීම් ප්‍රණාත්මතාව සඳහා වෙන් කිරීමක් සිදුකරමින් ලාභාලාභ ප්‍රකාශනය තුළ ඌණතාවය හඳුනා ගනී.

3.9.3.3 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුකූල සහභාගීත්ව ලක්ෂණ (DPF) සහිත සහ රහිත ගිවිසුම් අතර වර්ගීකරණය කෙරේ. අභිමතානුකූල සහභාගීත්ව ලක්ෂණ සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති පීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් මෙන් සමාන වේ.

අභිමතානුකූල සහභාගීත්ව ලක්ෂණ රහිත ආයෝජන ගිවිසුම් වගකීම් ගිවිසුම්වලට ඇතුළත්වන විට සහ වාර්ක අයකරන විට හඳුනා ගනී. ගිවිසුමේ කරුණට සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැය රහිත ගනුදෙනුවක් වන මෙම වගකීම් ආරම්භයේදී සාධාරණ අගයට හඳුනාගනී. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, ආයෝජන, ගිවිසුම් වගකීම් ලාභ හෝ අලාභ තුළින් සාධාරණය අගයේදී අගය කෙරේ.

තැන්පතු සහ ආපසු ගැනීම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වගකීමට ගැලපීමක් ලෙස සෘජුවම සටහන් කරනු ලබයි. සාධාරණ අගය මත ගැලපීම් එක් එක් වාර්තා කරන දිනයට සිදුකරනු ලබන අතර ලාභාලාභ ප්‍රකාශනය තුල හඳුනා ගනී. සාධාරණ අගය නිර්ණය කරනු ලබන්නේ අනාගත වට්ටම්කළ මුදල් ප්‍රවාහ තාක්ෂණය මගිනි. චිකතුකළ ගිවිසුම් සඳහා, සාධාරණ අගය ගණනය කරනු ලබන්නේ වාර්තා කරන දිනයට එම අරමුදල්වල ඒකක මිලෙන් වැඩිකළ එක් එක් ඒකක සම්බන්ධ අරමුදල තුළ ඔප්පු හිමියාට වෙන්කළ ඒකක සංඛ්‍යාව ලෙස තීරණය කරනු ලබයි. වාර්තා කරන දිනයට ඒකක මිල තීරණය කිරීමට භාවිතා කළ අරමුදල් වත්කම් සඳහා අරමුදල් වගකීම් අරමුදලේ වත්කම් මත උපලබ්ධි නොවූ ලාභ මත විලම්හිත බදු වගකීම මත බලපෑම සැලකිල්ලට ගැනීම සඳහා ගලපන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඒවායේ ඇගයීම් පදනම අනුරූප පදනමක් මත අගයනු ලබයි.

චිකතු නොකළ ගිවිසුම් පසුකාලීනව සාධාරණ අගයට ගෙන යන අතර එය වට්ටම්කළ මුදල් ප්‍රවාහ සහ අනුමාන ආදර්ශකරණය භාවිතයෙන් තීරණය කෙරේ. ආදර්ශ සුදුසුකම්ලත් ස්වාධීන වෘත්තිකයකු විසින් වලංගු, ක්‍රමාංකනය කර කාලීනව සමාලෝචනය කරනු ලැබේ.

ගිවිසුම කල්පිරුණ, මුදාහරින හෝ අවලංගු කරන විට වගකීම හඳුනා නොගනී. ඔප්පුහිමියාට අවලංගු කළ හැකි ගිවිසුමක් සඳහා, සාධාරණ අගය පවාරණ අගයට අඩු නොවිය යුතුය.

ගිවිසුම්වල මූල්‍ය අවදානම් සංරචකයක් සහ වැදගත් රක්ෂණ අවදානම් සංරචකයක් යන දෙකම සමන්විත වන විට සහ සංරචක දෙකේ මුදල් ප්‍රවාහ විශ්වාසීව මැනිය හැකි වුවද වෙනස් වන විට, එකී ප්‍රමාණයක් චිකතු නොකෙරේ. රක්ෂණ අවදානම් සංරචකයකයට අදාළ වාරික රක්ෂණය පරිදි සමාන පදනමක් සඳහා ගණනය කෙරේ.

3.9.4 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (DPF)

අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණයක් (DPF) යනු ගිවිසුම්ගත අයිතියක් වන අතර ඉන් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ කළඹ තුළ දරන ලද වත්කම්වල කාර්යසාධනය මත පදනම් වන සහතික කළ ප්‍රතිලාභ, සැලකිය යුතු අමතර ප්‍රතිලාභ ලබාගැනීමේ අයිතිය මෙම ගිවිසුම්වල හිමිකරුවන් වෙත ලබා දේ. DPF අරමුදල්වල ගිවිසුම්ගත අතිරික්තවල නියමයන් පරිදි, 90/10ක පදනමක් මත ඔප්පුහිමියන්ට හා කොටස් හිමියන්ට බෙදාදිය හැකිය.

ගිණුම්කරණ ප්‍රමිති සාරාංශය	අවශ්‍යතාවය පිළිබඳ	මූල්‍ය ප්‍රකාශන කෙරෙහි විය හැකි බලපෑම
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති- SLFRS9–'මූල්‍ය උපකරණ'	2014 දී නිකුත් කළ SLFRS9, මගින් මූල්‍ය උපකරණ : හඳුනාගැනීම සහ අගය කිරීම පිළිබඳ LKAS39 හි පැවති මාර්ගෝපදේශ වෙනස් කරයි. SLFRS 9 තුළ මූල්‍ය වත්කම් මත හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභයක් ඇතුළුව මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ අගයකිරීම පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ ඇතුළත්ය. එමෙන්ම LKAS39 යෙන් මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ හඳුනා නොගැනීම පිළිබඳ මාර්ගෝපදේශය ඉන් ඉදිරියට ගෙන යයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS9 බලාත්මක දිනය 2018 ජනවාරි 01 දක්වා ප්‍රමාද කර ඇත.	සමූහය/ සමාගම SLFRS 9 යොදා ගැනීමෙන් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතිවිය හැකි බලපෑම තක්සේරු කරමින් සිටී
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමි; SLFRS15 – 'ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම'	SLFRS15 මගින් ආදායම හඳුනාගන්නා ප්‍රමාණය සහ කාලය තීරණය කිරීම සඳහා විස්තීර්ණ වැඩපිළිවෙලක් නියම කරයි. ආදායම පිළිබඳ LKAS18 සහ ඉදිකිරීම් ගිවිසුම් පිළිබඳ LKAS 11 ඇතුළුව පවත්නා ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශය වෙනස් කරනු ලබයි. SLFRS15 2017 ජනවාරි 01 හෝ එදිනෙන් පසු ආරම්භ වන කාලසීමාවන් සඳහා බලාත්මක වේ.	සමූහය/ සමාගම SLFRS 15 යොදා ගැනීමෙන් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතිවිය හැකි බලපෑම තක්සේරු කරමින් සිටී.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 16–'කල්බදු'	IFRS 16 කල්බදු මෙහෙයුම් හෝ මූල්‍ය ලෙස වර්ගීකරණය කර බවත් වී වෙනුවට තනි කල්බදු ගිණුම්කරණ ආකෘතියක් හඳුන්වා දේ. මෙම ආකෘතියෙන් කල්බද්ද ආරම්භයේදී වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ලබාගනිමින් සමාගමක් තුළ කල්බදු ඇතිවන බව පිළිබිඹු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, LKAS 17 යොදාගනිමින් මූල්‍ය කල්බද්දකට සලකනු ලබන ආකාරයට සමාන ආකාරයකින් බදු ගැණුම්කරුවන්ගේ කල්බදු සඳහා ගණන් දියයුතු බවට මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය කරයි. නව ප්‍රමිතිය වන SLFRS 16 මගින් LKAS 17 අවශ්‍යතාව සපුරාලන අතර 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක බවට පත්වේ.	සමූහය/ සමාගම SLFRS 16 යොදා ගැනීමෙන් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතිවිය හැකි බලපෑම තක්සේරු කරමින් සිටී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

4 ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගමට සහ සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒන සහ ආදායම විශ්වාසීව අගය කළ හැකි ප්‍රමාණයට ආදායම් හඳුනා ගනී. දළ ආදායමේ එක් එක් වර්ග සඳහා විශේෂ හඳුනා ගැනීමේ නිර්ණායක අදාළ ආදායම් සටහන් යටතේ දැක්වේ.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
පොළී සහ සමාන ආදායම	4,737,774	4,073,159	4,853,007	4,164,059
ගාස්තු සහ කොමිස් ආදායම	41,455	42,640	100,695	197,659
රක්ෂණ වාරික ආදායම	-	-	995,321	903,910
ශුද්ධ වෙළෙඳ ආදායම	10,072	46,862	5,612	48,531
ගනුදෙනු සඳහා තබා ඇති මූල්‍ය වත්කමක් මත ශුද්ධ ලාභය /(අලාභය)	(61,096)	(54,137)	(58,226)	(55,336)
අනෙකුත් මෙහෙයුම් ආදායම	159,950	108,467	203,589	170,672
	4,888,155	4,216,991	6,099,998	5,429,495

5 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආදායම් හා වියදම් හඳුනා ගැනීම

සමාගමට සහ සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒන සහ ආදායම විශ්වාසීව අගය කළ හැකි ප්‍රමාණයට ආදායම් හඳුනා ගනී. පහත විශේෂ හඳුනා ගැනීමේ නිර්ණායක ආදායම් හඳුනා ගැනීමට පෙර හඳුනාගත යුතුය.

පොළී සහ සමාන ආදායම හා වියදම්

ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ සියලුම මූල්‍ය උපකරණ, අලෙවිය සඳහා ඇති ලෙස වර්ගීකරණය කළ පොළිය දරන මූල්‍ය වත්කම්, සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නියම කළ මූල්‍ය උපකරණ සඳහා, පොළී ආදායම හෝ වියදම ඵලදායී පොළී අනුපාත (EIR) භාවිතයෙන් සටහන් කරනු ලබයි. ඵලදායී පොළී අනුපාතය යනු ණය උපකරණයක අපේක්ෂිත කාලය හෝ සුදුසු තැන්හිදී වඩා කෙටි කාලසීමාවක් තුළින් ආරම්භක හඳුනාගැනීම මත ඉදිරියට ගෙනා ශුද්ධ අගයට ඇස්තමේන්තු කළ අනාගත මුදල් ලැබීම් නිවැරදිව වට්ටම්කරන අනුපාතයයි. මෙම ගණනය කිරීමට මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගන්නා අතර, ඵලදායී පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන නමුත් අනාගත ණය අලාභ නොවන මූල්‍ය උපකරණයට සෘජුවම ආරෝපනය කළ හැකි යම් ගාස්තු සහ වර්ධක පිරිවැය ඇතුළත්ය.

සමූහය විහි ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන්නේනම්. මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වගකීමේ ඉදිරියට ගෙනා ප්‍රමාණය ගලපනු ලබයි. ගලපන ලද ඉදිරියට ගෙනා ප්‍රමාණය ප්‍රථම EIR මත පදනම් වී ගණනය කරන අතර ඉදිරියට ගෙනා ප්‍රමාණයේ වෙනස මූල්‍ය වත්කම් සඳහා පොළී ආදායම් සහ මූල්‍ය වගකීම් සඳහා පොළී වියදම් ලෙස සටහන් කරනු ලබයි. එසේවුවත්, සමාගම මුදල් ලැබීම්වල වර්ධිත ආපසු අයකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස විහි අනාගත මුදල් ලැබීම් ඇස්තමේන්තු වැඩිකරන නැවත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් සඳහා එම වැඩිකිරීමේ බලපෑම ඇස්තමේන්තුව වෙනස් වූ දිනයේ සිට EIR ට ගැලපීමක් ලෙස හඳුනා ගනී.

වාර්තා කළ පසු, මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණ අලාභ අගය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිතා කළ පොළී අනුපාත භාවිතයෙන් හඳුනා ගනු ලබන හානිකරණ අලාභයක්, පොළී ආදායමක් හේතු කොට ගෙන අඩුකරනු ලැබ ඇත.

කල්ගිය පොළී

කල්ගිය කුලීවලින් ඇතිවන පොළී මුදල් ලැබීමේ පදනමක් මත ගණනය කර ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016 රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
පොළී සහ සමාන ආදායම				
ගනුදෙනුකරුවන්ට දුන් ණය සහ අත්තිකාරම්	4,436,037	3,815,685	4,511,517	3,891,327
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින හා කල්පිරෙන තෙක් දරා සිටින	278,132	186,779	317,885	202,037
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නියම කළ මූල්‍ය ආයෝජන	-	199	-	199
බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු	23,605	70,496	23,605	70,496
	4,737,774	4,073,159	4,853,007	4,164,059
පොළී සහ සමාන වියදම				
බැංකුවලට ගෙවිය යුතු	289,460	67,258	289,556	67,285
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,705,850	1,145,128	1,705,850	1,145,128
නිකුත් කළ ණය සහ අනෙකුත් ණය අරමුදල්	684,919	892,393	684,919	892,393
වෙනත්	29,375	28,546	30,232	29,545
	2,709,604	2,133,325	2,710,557	2,134,351
ශුද්ධ පොළී ආදායම්	2,028,170	1,939,834	2,142,450	2,029,708

6 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගාස්තු සහ කොමිස් ආදායම

හිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් එහි ගනුදෙනුකරුවන්ට ලබාදෙන විවිධ සේවා රාශියක් තුළින් ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී. ගාස්තු සහ කොමිස් ආදායම පහත පරිදි ගණනය කෙරේ:

- වැදගත් කාර්යයක් ක්‍රියාත්මක කිරීම මත උපයන ආදායම එම කාර්යය සම්පූර්ණ කරන විට ආදායම ලෙස හඳුනා ගනී. , සහ
- සේවය ලබාදීමේදී සේවය ලබාදීම මගින් ඇතිවන ආදායම ආදායම ලෙස හඳුනාගනී.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016 රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ගාස්තු සහ කොමිස් ආදායම				
වෙළෙඳාම සහ අනෙකුත් අදාළ කටයුතු	41,455	42,611	24,572	42,611
ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම	-	-	61,214	136,190
තැරැව්කාර සේවය	-	29	-	29
වෙනත්	-	-	14,909	18,829
	41,455	42,640	100,695	197,659
ගාස්තු සහ කොමිස් වියදම්				
ගාස්තු	-	-	65,674	99,898
	-	-	65,674	99,898
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	41,455	42,640	35,021	97,761

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

7 රක්ෂණ වාරික ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දළ වාරික

අභිමාතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (DPF) සහිත ජීවිත සහ ආයෝජන ගිවිසුම්ගත දළ පුනරාවර්තන වාරික ඔප්පු හිමියෙකුගෙන් ලැබෙන අවස්ථාවේදී ආදායම ලෙස හඳුනා ගනී. තනි වාරික ව්‍යාපාර සඳහා, ඔප්පුව ක්‍රියාත්මක වන දිනය මත ආදායම හඳුනාගනී.

සාමාන්‍ය රක්ෂණ යේ දළ ලිඛිත වාරික තුළ ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතුළත් වන ගිවිසුම් මගින් ලබාදෙන සම්පූර්ණ කාලසීමාව සඳහා ලැබිය යුතු මුළු වාරික සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ කරන දිනය මත ආදායම හඳුනාගනී.

නොඉපයූ වාරික සංචිතය වසර තුළ ලියන ලද නමුත් කල්නොපිරුණු ආවරණ කාලයට අදාළ වාරිකවල කොටස නියෝජනය කරයි.

ප්‍රතිරක්ෂණ වාරික

ජීවිත සහ අයෝජන ගිවිසුම් මත දළ ප්‍රතිරක්ෂණ වාරික ඔප්පුව ක්‍රියාත්මක වන දිනයේ සිට වියදමක් ලෙස හඳුනාගනී.

ලියන ලද දළ සාමාන්‍ය ප්‍රතිරක්ෂණ වාරික තුළ කාලසීමාවට ඇතුළත් වූ ගිවිසුම් මගින් ලබාදෙන සමස්ත ආවරණය සඳහා ගෙවිය යුතු මුළු වාරික සමන්විත වන අතර ඔප්පුව ආරම්භවන දිනය අනුව හඳුනාගනී. ගිණුම්කරණ කාලසීමාවට පෙර ආරම්භ කරන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධව ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතිවන යම් ගැලපීම් වාරිකවල ඇතුළත්ය.

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික යනු වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලයට අදාළ වන වසර තුල ලියන ලද වාරිකවල කොටසයි. නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික අවදානම් සහිත ගිවිසුම් සඳහා පාදක සෘජු රක්ෂණ ඔප්පුවල කාලසීමාව පුරා සහ අලාභ ඇතිවන ගිවිසුම් සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් කාලය පුරා විලම්භිත කෙරේ.

ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම් හඳුනාගැනීම

දළ ප්‍රතිලාභ සහ හිමිකම්

DPF සහිත ජීවිත රක්ෂණ ගිවිසුම් සහ ආයෝජන ගිවිසුම් සඳහා දළ ප්‍රතිලාභ සහ හිමිකම් තුළ DPF ගිවිසුම් මත ප්‍රකාශිත හිමිකම් සහ ඔප්පුහිමියන්ගේ බෝනස් පිරිසැකසුම් කිරීම සහ නිරවුල්කිරීමට සෘජුවම අදාළ වන අභ්‍යන්තර හා බාහිර හිමිකම් පාලන පිරිවැය ඇතුළුව වසර තුළ ඇතිවන සියලුම හිමිකම් පිරිවැය මෙන්ම DPF සහිත රක්ෂණ සහ ආයෝජන ගිවිසුම් වගකීම්වල දළ ඇගයීම තුළ වෙනස්වීම් ඇතුළත්ය. මරණ හිමිකම් සහ පවාරණයන් ලැබෙන දැනුම්දීමේ පදනම මත සටහන් කරනු ලබයි. කල්පිරීම් සහ වාර්ෂික ගෙවීම් නිසි අවස්ථාවේදී සටහන් කෙරේ. අතුරු ගෙවීම් සහ පවාරණයන් නිරවුල් කරන අවස්ථාවේදි ගණනය කෙරේ.

සාමාන්‍ය රක්ෂණයට වාර්තා කලද නොකලද වසර තුළ සිදුවන සියලුම හිමිකම්, හිමිකම් පිරිසැකසුම්කිරීම සහ නිරවුල්කිරීමට සෘජුවම අදාළ වන අභ්‍යන්තර හා බාහිර හිමිකම් පාලන පිරිවැය. සුන්බුන්වල සහ අනෙකුත් අයකරගැනීම්වල අගය සඳහා අඩු කිරීමක්, සහ පසුගිය වසරේ හිඟව පවත්නා හිමිකම්වලට යම් ගැලපීම් ඇතුළත්ය.

හිඟව පවත්නා හිමිකම් සඳහා හිමිකම් වියදම් සහ වගකීම් සෘජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් හඳුනා ගනී. වගකීමේ ආවරණය කරන්නේ වාර්තා කරනු ලැබුවද නොගෙවූ හිමිකම් දරනු ලැබුවද වාර්තා නොකළ හිමිකම්, සහ එම හිමිකම් නිරවුල් කිරීමේදි අපේක්ෂිත සෘජු හා වක්‍ර පිරිවැය ඇතුළත්ය. හිඟව පවත්නා හිමිකම් තනි තනි හිමිකම් ගොනු සමාලෝචනය මගින් සහ හිමිකම් නිරවුල් කිරීමේ අවසාන පිරිවැය තුළ වෙනස්වීම් ඇස්තමේන්තු කරමින් අගය කෙරේ. දරනු ලැබුවද වාර්තා නොකළ හිමිකම් සම්බන්ධ වෙන්කිරීම අතීත පළපුරුද්ද සහ ප්‍රවනතා මත පදනම් වී අනාගත වගකීම පිළිබඳ වඩාත් යථාර්ථවාදී ඇස්තමේන්තුවක් සහතික කිරීමට වාර්ෂික පදනමක් මත පීවගණකව අගය කෙරේ.

හිමිකම් සඳහා වෙන්කිරීම පවත්නා තොරතුරු මත පදනම් ව සාධාරණව සටහන් කරන බවට අධ්‍යක්ෂවරු සලකා බලන අතර, අවසාන වගකීම පසුකාලීන තොරතුරු සහ සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වෙනස් වේ. මෙය සපයන ලද ප්‍රමාණ ගැලපීමට හේතු වේ. එවැනි ප්‍රමාණ එම කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි පිලිබිඹු කෙරේ. භාවිතාකළ ක්‍රම සහ සිදුකළ ඇස්තමේන්තු විධිමත් පරිදි සමාලෝචනය කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ හිමිකම්

අදාළ දළ රක්ෂණ හිමිකම අදාළ ගිවිසුමේ නියමයන්ට අනුව හඳුනාගනු ලබන විට, ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගනී.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමූහය	
	2016	**2015**
	රු.'000	රු.'000
ජීවිත නොවන රක්ෂණය	998,991	1,194,676
ජීවිත රක්ෂණය	235,533	203,235
මුළු දළ ලිඛිත වාරික	1,234,524	1,397,911
නොඉපයූ වාරික වෙන්කිරීම් තුළ වෙනස	29,441	94,851
දළ වාරික ආදායම	1,263,965	1,492,762
අඩුකළා : ප්‍රතිරක්ෂකයින්ට පවරා දුන් වාරික	268,644	588,852
ශුද්ධ වාරික ආදායම	995,321	903,910

8 ශුද්ධ වෙළෙඳ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳ කටයුතුවලින් ඇතිවන ප්‍රතිඵලවලට මූල්‍ය වත්කම්වලින් ලාභාංශ සහ ගනුදෙනු සඳහා තබා ඇති මූල්‍ය වත්කම් බැහැරකිරීමෙන් ඇතිවන ලාභ/ (අලාභ) ඇතුළත්ය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ලාභාංශ ආදායම	12,853	16,795	13,127	18,133
ලැයිස්තුගත කොටස් බැහැරකිරීම මත ලාභ / අලාභ	(2,781)	30,067	(7,515)	30,398
ශුද්ධ වෙළෙඳ ආදායම	10,072	46,862	5,612	48,531

9 අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් මත ලාභ/ (අලාභ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කළ ස්කන්ධ සහ ණය සුරැකුම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම්වලට ආරෝපනය කළ හැකි සාධාරණ අගයේ ලාභ හෝ අලාභ, වත්කමේ සාධාරණ අගයට වෙනස්වීමක් ඇති විට ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ගනුදෙනු සඳහා තබා ඇති මූල්‍ය වත්කම්	(61,096)	(54,137)	(58,226)	(55,336)
	(61,096)	(54,137)	(58,226)	(55,336)

10 අනෙකුත් මෙහෙයුම් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් මෙහෙයුම් ආදායම් තුළ දේපල හා උපකරණ බැහැරකිරීම මත ලාභ, ලාභාංශ ආදායම, නිශ්චල දේපලවලින් ලාභ හා අලාභ, විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් විකිණීමෙන් ලාභ ඇතුළත් වේ.

විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජනවලින් ලාභ

විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජනවලින් ලාභ යනු විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කළ ආයෝජන හඳුනා නොගැනීම පිළිබඳව ස්කන්ධයේ සිට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට මාරුකරන ප්‍රමාණයයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ලාභාංශ ආදායම

සමූහයට ගෙවීම් ලැබීම සඳහා අයිතිය නියම වන විට, ලාභාංශ ආදායම හඳුනා ගනු ලැබේ.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
වෙළෙඳ නොවන ආයෝජනවලින් ලද ලාභාංශ	-	(2,787)	-	(5,574)
පෙර වසන ලද දේපල ඇතුළුව දේපල හා උපකරණ විකිණීම මත ලාභ/(අලාභ)	32,909	4,781	35,990	4,781
අනෙකුත් ආදායම්	127,041	106,473	167,599	171,465
	159,950	108,467	203,589	170,672

11 ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

LKAS39– මූල්‍ය උපකරණ- හඳුනාගැනීම සහ අගය කිරීම අනුව අගයනු ලබන ණය හා ලැබීම් සඳහා හානිකරණ වෙන්කිරීම් තුළ වෙනස්වීම් සමාගම සහ සමූහය හඳුනා ගනී. සමාගම සහ සමූහය යොදගන්නා ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් 21 හි විස්තර කෙරේ.

		සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්					
ලැබියයුතු බිල්පත්	(සටහන 21.1.1)	16,018	6,873	16,018	6,873
ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	(සටහන 21.2.1)	(15,612)	233,822	(15,612)	233,822
ලැබියයුතු කල්බදු සහ කුලී සින්නක්කර වාරික	(සටහන 21.3.3)	23,833	221,456	23,833	221,456
ලැබියයුතු රක්ෂණ		-	-	3,720	12,467
		24,239	462,151	27,959	474,618

12 කාර්ය මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

කාර්ය මණ්ඩල වියදම්වලට වැටුප්, බෝනස්, අවසාන ප්‍රතිලාභ අයකිරීම් සහ අනෙකුත් අදාළ වියදම් ඇතුළත් වේ. බෝනස් සඳහා වෙන්කිරීම හඳුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත්වල පිටතට ගලායාමක් බැඳීමක් පියවීමට අවශ්‍ය කරන අවස්ථාවේදී වන අතර විශ්වාසී ඇස්තමේන්තුවක් බැඳීමේ ප්‍රමාණය මත සිදුකළ හැකිය.

නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල, සේවකයින්ගේ භාර අරමුදල (EPF හා ETF)

අදාළ නීති සහ රෙගුලාසි අනුව, සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවකයින්ගේ භාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. සමූහය සහ සේවකයින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට දළ පාරිශ්‍රමිකයෙන් 12% සහ 8%ක් දායක වේ. සමූහය සේවකයින්ගේ භාර අරමුදල වෙත සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 3%ක් දායක වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
සේවකයින්ගේ පාරිශ්‍රමික	629,301	549,122	783,808	681,242
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්මට සේවා යෝජක				
දායකත්වය සේවක අර්ථසාධක අරමුදල	59,175	49,186	79,345	66,676
සේවායෝජකයින්ගේ භාර අරමුදල	14,794	12,297	19,833	16,632
අනෙකුත් පිරිස් වියදම්	78,260	60,135	110,098	92,566
	781,530	670,740	993,084	857,116

13 අනෙකුත් මෙහෙයුම් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දරන ලද පිරිවැය සහ විශේෂ ආදායම් අයිතම්වල ඉපයීම් අතර සෘජු සම්බන්ධයක පදනමක් මත ලාභාලාභ ප්‍රකාශනය තුළ අනෙකුත් මෙහෙයුම් වියදම් හඳුනාගනී. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ කාර්යක්ෂම මට්ටමින් දේපල සහ උපකරණ පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වසරේ ලාභය ගණනය කිරීමේදි ලාභාලාභ ප්‍රකාශයට අය කර ඇත.

මූල්‍ය සේවා මත ජාතිය ගොඩ නැගීමේ බදු (NBT)

මූල්‍ය සේවා මත ජාතිය ගොඩ නැගීමේ බදු 2009 අංක 09 දරන ජාතිය ගොඩ නැගීමේ බදු පනතට සහ 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වීහි පසුකාලීන සංශෝධනවලට අනුකූලව ගණනය කරනු ලබයි. මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු (VAT) අරමුණ සඳහා භාවිතා කළ අගය එකතු කිරීමෙන් 2%ක් ලෙස මූල්‍ය සේවා මත ජාතිය ගොඩ නැගීමේ බදු ගණනය කෙරේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	4,123	6,299	7,367	13,346
විගණකවරයාගේ පාරිශ්‍රමිකය				
විගණන ගාස්තු	1,918	1,568	2,723	2,745
විගණන නොවන ගාස්තු	625	711	833	711
වෘත්තීමය හා නීතිමය ගාස්තු	27,537	26,302	42,283	31,195
පරිත්‍යාග	197	231	222	256
කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම්	241,974	211,027	318,268	290,125
වෙනත්	393,782	364,129	571,695	636,756
	670,156	610,267	943,391	975,134

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

14 ආදායම් බදු වියදම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වර්තන බදු

වර්තමාන වසරේ සහ පෙර වසරවල වර්තන බදු වත්කම් සහ වගකීම් බදු අධිකාරියෙන් අයකර ගැනීමට සහ ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණයට අගය කරනු ලබයි. ප්‍රමාණය ගණනය කිරීමට භාවිතා කළ බදු අනුපාත සහ බදු නීති වාර්තාකරන දිනයට පනවනු ලබන හෝ පනවන ලද නීති වේ.

ඒ අනුව, බදු සඳහා වෙන් කිරීම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එයට සිදුකළ සංශෝධනයන්ට අනුකූලව බදු අරමුණ සඳහා ගලපන ලද වසරේ ලාභය මත පදනම් වේ. සමාගම සහ එහි පරිපාලිත සමාගම 28%ක අනුපාතයකට ගණනය කරන මෙහෙයුම්වලින් ලාභ මත ආදායම් බද්දට යටත් වේ.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
වර්තන බදු				
වර්තන ආදායම් බදු	62,838	31,684	74,249	41,524
පෙර වසර සම්බන්ධ අධි බදු / අඩුවෙන් වෙන්කිරීම	-	-	-	-
බදු				
තාවකාලික වෙනස්වීම් උත්පාදනයට හා ආපසු හැරවීමට අදාළත්වය				
ලාභාලාභ ප්‍රකාශනය	91,409	11,194	91,409	11,194
අනෙකුත් විස්තීර්ණ ආදායම	1,810	11,072	1,810	11,072
	156,057	53,950	167,468	63,790
ලාභාලාභ ප්‍රකාශයනට අයකළ බදු	154,247	42,878	165,658	52,718
අනෙකුත් විස්තීර්ණ ආදායමට අයකළ බදු	1,810	11,072	1,810	11,072
	156,057	53,950	167,468	63,790
ඵලදායී බදු අනුපාතය (විලම්භිත බදු හැර)	26.20%	-	30.08%	-
ඵලදායී බදු අනුපාතය	64.30%	-	67.12%	-

අයකළ මුළු බදු සැසඳීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත බදු අනුපාතය මගින් ගුණකළ බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සැසඳීමක් පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සමාගම		සමූහය	
	2016 රු.'000	2015 රු.'000 සංශෝධිත*	**2016** රු.'000	2015 රු.'000 සංශෝධිත*
බදු පෙර ගිණුම්කරණ ලාභය	239,871	(35,428)	246,800	56,001
එකතුකළා : ඉඩ නොදුන් වියදම්	573,332	522,404	611,530	613,229
එකතුකළා : අයකරගත හැකි කල්බදු ප්‍රාග්ධනය	7,545,620	5,457,413	7,545,620	5,457,413
අඩුකළා : ඉඩදුන් වියදම්	5,865,789	4,755,036	5,981,532	4,776,249
අඩුකළා : නිදහස්කළ / ඉඩදුන් ආදායම	1,994,681	1,538,521	2,020,095	1,668,090
ව්‍යවස්ථාපිත ආදායම	498,353	(349,168)	402,323	(317,696)
අඩුකළා : බදු අලාභ හිලව් කිරීම	271,722	(464,099)	(93,883)	(654,278)
තක්සේරුකළ හැකි ආදායම	226,631	114,931	496,206	336,582
බදුකළ හැකි ආදායම	224,421	113,158	262,473	142,814
ඵලදායී ආදායම් බදු අනුපාතයට	62,838	31,684	73,492	39,987
වසර සඳහා ලාභ මත වර්තන බදු	62,838	31,684	73,492	39,987
වසර සඳහා අයකළ විලම්භිත බදු ආපසු හැරවීම	91,409	11,194	91,409	11,194
වසර සඳහා බදු වියදම	154,247	42,878	164,901	51,181
ආශ්‍රිත සමාගමේ වර්තන බදු කොටස්	-	-	757	1,537
අනෙකුත් විස්තීර්ණ ආදායමට අයකළ/ (ආපසු හැරවූ) විලම්භිත බදු	1,810	11,072	1,810	11,072
මුළු ආදායම් බදු වියදම	156,057	53,950	167,468	63,790

15 කොටසක ඉපයීම් / (අලාභ) සහ කොටසක ලාභාංශය

15.1 කොටසක මූලික/ තනුක ඉපයීම් /(අලාභ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වසර තුළ පවත්නා සාමාන්‍ය කොටස්වල බරතබන ලද සාමාන්‍ය සංඛ්‍යාව මගින් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ හැකි ලාභ හෝ අලාභ බෙදමින් කොටසක මූලික ඉපයීම් ගණනය කරනු ලබයි.

පාලනයට යටත් නොවන හිමිකම වීකාබද්ධ ලාභාලාභ ප්‍රකාශනය තුළ සහ වීකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ස්කන්ධය තුළ වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන අතර වර්තමාන ස්කන්ධයෙන් වෙන් කරයි. පාලනයට යටත් නොවන හිමිකම අදාළවන යම් අලාභ හිඟ ශේෂයකින් ඇතිවුවද පාලනයට යටත් නොවන හිමිකමේ අයිතීන්ට අනුව වෙන් කරනු ලබයි. පාලනයට යටත් නොවන හිමිකම අත්පත් කරගැනීම මව් සමාගමේ ව්‍යාප්ති ක්‍රමය භාවිතයෙන් ගණනය කෙරෙන අතර එහිදී අත්පත්කර ගත් ශුද්ධ වත්කම් කොටසේ ප්‍රතිශ්ඨාව සහ සාධාරණ අගය අතර වෙනස ස්කන්ධය ලෙස හඳුනා ගනී.

දෙසැම්බර් 31 දිනට					**සමාගම**			
					2016		2015	
	සංස්ථාපිත රට	මූලික කාර්යය	කොටස ගණන	අයිතිය %	පිරිවැය	අධ්‍යක්ෂවරු ඇගයීම	පිරිවැය	අධ්‍යක්ෂවරුන්ගේ ඇගයීම
					රු.'000	රු.'000	රු.'000	රු.'000
ලැයිස්තු ගත නොකළ								
MBSL රක්ෂණ සමාගම (සටහන 25.1)	ශ්‍රී ලංකාව	රක්ෂණ	475,697,403	84.12	516,096	77,306	516,096	310,197
අඩුකළා :හානිකරණ වෙන්කිරීම (සටහන 25.2)					438,790	-	205,899	-
දෙසැම්බර් 31 දිනට ශේෂය			475,697,403		77,306	77,306	310,197	310,197

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

25.1 MBSL **රක්ෂණ සමාගමේ සාරාංශ කළ මූල්‍ය තොරතුරු**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**2016** රු.'000	2015 රු.'000
ශුද්ධ මෙහෙයුම් ආදායම	296,067	485,772
අඩුකළා : මෙහෙයුම් වියදම්	(516,591)	(586,340)
ආදායම් බදු පෙර ලාභය /(අලාභය)	(220,524)	(100,568)
අඩුකළා : ආදායම් බදු වියදම / (ආපසු හැරවීම)	10,655	8,303
වසර සඳහා ලාභය /(අලාභය)	(231,179)	(108,871)
අනෙකුත් විස්තීර්ණ ආදායම් /(වියදම්)	(10,204)	(7,386)
බද්දෙන් ශුද්ධ වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	(241,383)	(116,257)

දෙසැම්බර් 31 දිනට	2016 රු.'000	2015 රු.'000
ණය හා ලැබීම්	675,495	1,049,695
ප්‍රතිරක්ෂණ වත්කම් - රක්ෂණ ගිවිසුම්	289,794	88,449
රක්ෂණ ලැබීම්	211,672	294,016
දේපල සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්	63,077	82,186
අනෙකුත් වත්කම්	534,732	405,994
මුළු වත්කම්	1,774,770	1,920,340
බැංකුවලට ගෙවිය යුතු	23,364	15,906
රක්ෂණ ගිවිසුම් වගකීම්	1,295,292	956,590
ගෙවිය යුතු රක්ෂණ	68,673	259,362
අනෙකුත් වගකීම්	295,293	354,951
මුළු වගකීම්	1,682,622	1,586,809
මුළු ස්කන්ධය	92,148	333,531
මුළු වගකීම් සහ ස්කන්ධය	1,774,770	1,920,340

25.2. **හානිකරණ වෙන්කිරීම**

වාර්තා කරන දිනය අවසානයට, සමාගම පරිපාලිත සමාගම වන MBSL රක්ෂණ සමාගමේ අයෝජනවල අයකරගත හැකි ප්‍රමාණය තක්සේරු කළ අතර, එය රුපියල් මිලියන 516.1ක් වූ අතර කීර්තිනාමයේ අයකරගත හැකි ප්‍රමාණය රුපියල් මිලියන 18.2ක් විය.

2016 දෙසැම්බර් 31 දිනට පරිපාලිත සමාගම තුළ ආයෝජනයේ අයකරගත හැකි ප්‍රමාණය රුපියල් මිලියන 77.3ක් ලෙස තීරණය කරනු ලැබූ අතර රුපියල් මිලියන 232.9ක (2015 රු.මි. 205.9) හානිකරණ අත්තිකාරම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හී 2016 වසර තුළ සිදු කරන ලදී. සමූහය එහි පරිපාලිත සමාගම තුළ ආයෝජන හා බැඳුණු කීර්තිනාමය රුපියල් මිලියන 18.2 (2015 රු.මි. 18.2)කින් සම්පූර්ණයෙන්ම හානිකරණය කරන බවට තීරණය කළේය.

පරිපාලිත සමාගම තුළ ආයෝජන හානිකරණය

පරිපාලිත සමාගම තුළ ආයෝජනයේ හානිකරණය ඇගයීම සඳහා සලකා බලන ලද ප්‍රධාන දර්ශකය වූයේ පරිපාලිතයේ ශුද්ධ වත්කම් ඉක්මවන සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හී ආයෝජනයේ ධාරණ අගය තුළ ඇතිවන වර්තමාන සහ පසුගිය වසරවල අඛණ්ඩ අලාභයයි.

පරිපාලිත සමාගම තුළ ආයෝජනයේ අයකරගත හැකි ප්‍රමාණය වටිනාකම් ක්‍රමය පදනම් කර ගෙන ශුද්ධ වත්කම භාවිතයෙන් තක්සේරු කරන ලදී. සමාගමේ ශුද්ධ වත්කම සමන්විත වන්නේ ජීවිත රක්ෂණ අරමුදල් සංචිතය සහ ශුද්ධ ස්කන්ධයෙනි. පසුගිය වසරවල පිරිවැයට විකිණීම් වටිනාකම් ක්‍රමයට අඩුකළ සාධාරණ අගය භාවිතයෙන් පරිපාලිත සමාගම තුළ ආයෝජනයේ අයකරගත හැකි ප්‍රමාණය සමාගම විසින් තීරණය කරනු ලැබූවද, මෙම වසරේ අනෙකුත් තරඟකරුවන් හා සැසඳීමට වඩාත් සුදුසු ප්‍රවේශයක් ලෙස පරිපාලිතයේ වර්තමාන තත්ත්වය සලකා බලමින් ශුද්ධ වත්කම් පදනම් ප්‍රවේශය භාවිතා කිරීමට කළමනාකාරිත්වය තීරණය කරන ලදී.

කළමනාකාරිත්වය දැනටමත් ආයෝජන පාලනය කිරීමට තීරණය කර ඇති බැවින්, භාවිතා කළ වටිනාකම් ආකෘතිය ආයෝජනයේ අයකරගත හැකි ප්‍රමාණය තීරණය කිරීමේ අරමුණ සඳහා සලකා බලා නොමැත.

හානිකරණ අලාභ ලාභාලාභ ප්‍රකාශනය තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

25.3 පරිපාලිත සමාගම තුළ කොටස් හිමිකාරත්වය පාලනය කිරීම

2016 සැප්තැම්බර් 23 වන දින පැවති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එහි පරිපාලිත සමාගම වන MBSL රක්ෂණ සමාගම තුළ 84.12% ක කොටස් හිමිකාරත්වය නිරායෝජනය කිරීමට එහි මූලික අනුමැතිය ලබාදුන්හ. මෙය කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් 8. 1 බී වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇත. නමුත් මෙම ගනුදෙනුව වසා දමන ලද මෙහෙයුමක් ලෙස සලකා බැලීම සඳහා වාර්තා කරන දිනයට අවසන් කර නොමැත.

26 ආයෝජන දේපල

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආයෝජන දේපල යනු කුළි ආදායමක් ඉපයීමට හෝ ප්‍රාග්ධන අගය කිරීමක් හෝ මේ දෙක සඳහා රඳවා ගන්නා දේපල වේ. නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ විකිණීම සඳහා නොවන අතර, භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම තුළ හෝ පරිපාලන සේවා සඳහා භාවිතා කෙරේ.

අගය කිරීමේ පදනම

ආයෝජන දේපලක් ආරම්භයේදී එහි පිරිවැයට අගය කරනු ලබයි. මිලදී ගත් ආයෝජන දේපලක පිරිවැය තුළ එහි මිලදී ගැනීමේ පිරිවැය, සහ සෘජුවම ආරෝපණය කළ හැකි වියදම අතුළත්ය. හඳුනාගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම් පිරිවැය දරන අවස්ථාවේදී පවත්නා ආයෝජන දේපලක ප්‍රතිෂ්ඨාපන කොටසක පිරිවැය ධාරණ අගයට ඇතුළත් කර එදිනෙදා දරන සේවා පිරිවැය ඉවත් කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 – ආයෝජන දේපල අනුකූලව ආයෝජන දේපලවල පසුකාලීන අගය කිරීම සඳහා පිරිවැය ආකෘතිය සමාගම විසින් යොදා ගනී. ඒ අනුව, ආයෝජන දේපල ලෙස වර්ග කළ ඉඩම් පිරිවැයට සටහන් කෙරෙන අතර, ආයෝජන දේපල ලෙස වර්ග කළ ගොඩනැගිලි සමුච්චිත ක්ෂයකිරීම සහ යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට සඳහන් කෙරේ. ආයෝජන දේපල ලෙස වර්ග කළ ගොඩනැගිලි සඳහා ක්ෂය සඳහා වෙන්කිරීම සරල මාර්ගික ක්ෂයකිරීමේ ක්‍රමය භාවිතයෙන් වසර 20 ක කාලසීමාවක් සඳහා සිදු කෙරේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා සමූහය විසින් අවම වශයෙන් වසර පහකට වරක් ආයෝජන දේපල ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

නැවත හඳුනා නොගැනීම

ආයෝජන දේපල බැහැර කර ඇති අවස්ථාවක හෝ ආයෝජන දේපල භාවිතයෙන් ස්ථිරවම ඉවත් කර ඇති අවස්ථාවක සහ එම බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන්නේ නම් ආයෝජන දේපල හඳුනා නොගනී. බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස හඳුනා නොගන්නා කාලසීමාව තුළ ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

දෙසැම්බර් 31 දිනට	සමාගම		සමූහය	
	2016 රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
පිරිවැය				
ජනවාරි 01 දිනට පිරිවැය	165,876	165,876	165,876	165,876
අඩුකළා : බැහැරකිරීම්	15,791	-	15,791	-
දෙසැම්බර් 31 දිනට පිරිවැය	150,085	165,876	150,085	165,876
දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයකිරීම්	22,415	20,036	22,415	20,036
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොතේ අගය	127,670	145,840	127,670	145,840
සමුච්චිත ක්ෂයකිරීම්				
ජනවාරි 01 දිනට ශේෂය	20,036	16,999	20,036	16,999
එකතුකළා : වසර සඳහා අයකිරීම	2,961	3,037	2,961	3,037
අඩුකළා : බැහැරකිරීම් මත	582	-	582	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	22,415	20,036	22,415	20,036
ආයෝජන දේපලෙන් ව්‍යුත්පන්න වූ කුලී ආදායම	නැත	නැත	**නැත**	නැත
කාලසීමාව තුළ කුලී ආදායම් උත්පාදනය කළ ආයෝජන දේපලවලින් ඇතිවන සෘජු මෙහෙයුම් වියදම්	නැත	නැත	**නැත**	නැත
කාලසීමාව තුළ කුලී ආදායම් උත්පාදනය නොකළ ආයෝජන දේපලවලින් ඇතිවන සෘජු මෙහෙයුම් වියදම්	902	867	902	867

26.1 සමාගම/ සමූහය විසින් තබාගෙන ඇති ආයෝජන දේපල

දෙසැම්බර් 31 දිනට					**2016**					
					පිරිවැය/ධාරණ අගය			සාධාරණ අගය		
	ගොඩනැගිල්ල ගණන	ගොඩනැගිලි වර්ග අඩි	ප්‍රමාණය පර්චස	සාධාරණ අගය	ඉඩම් රු.'000	ගොඩනැ. රු.'000	මුළු රු.'000	ඉඩම් රු.'000	ගොඩනැ රු.'000	මුළු රු.'000
නො:64 හා 66, නෝනාගම පාර, පල්ලේගම ඇඹිලිපිටිය			16.61p	මට්ටම 3	1,750	-	1,750	26,200	අ/නැ	26,200
නො: 385/1, කෝට්ටේ පාර පිටකෝට්ටේ	1	2,896	19.01p	මට්ටම 3	2,958	1,730	4,688	3,343	1,955	5,298
නො: 116/4, 116/7, 116/26, 116/27, 116/ 29, පළමු හරස් වීදිය, කොළඹ 11			12.35P	මට්ටම 3	1,249	-	1,249	2,602	අ/නැ	2,602
නො: 102 හා 104, වේල් වීදිය, කොළඹ 12 (සටහන 26.1.a)	1	20,368	1R-10.7P	මට්ටම 3	17,970	11,989	29,959	213,000	20,000	233,000
කුඹුත්තුකුලිය වත්ත, බංගදෙනිය පාර, පුත්තලම			2.0A	මට්ටම 3	600	-	600	3,400	අ/නැ	3,400
මිරිස්සවෙලවත්ත හේන. තේක්කවත්ත, දඹදෙනි			1A-0R-28.00P	මට්ටම 3	162	-	162	2,000	අ/නැ	2,000
නො: 64, ගබඩාව එස්ටේට් පිටිපන, හෝමාගම			10.00P	මට්ටම 3	686	-	686	1,400	අ/නැ	1,400
නො: 2, සැලසුම් අංක 1206, සිල්වර්බර්ස්ට් එස්ටේට් පිටිපන, හෝමාගම			0A-2R-20.70P	මට්ටම 3	991	-	991	2,014	අ/නැ	2,014
පින්ගරා ටවුන් සහ කන්ට්‍රි ක්ලබ්, නො: 50/21, පරණ කැස්බෑව පාර, බොරලැස්ගමුව	1		2A-1R-4.35P	මට්ටම 3	65,604	44,396	110,000	182,175	115,840	298,015
					91,970	58,115	150,085	436,134	137,795	573,929

26.1.අ 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපලවල සාධාරණ අගය වෙළෙඳපොල තක්සේරුව මත පදනම් වූ අතර එම තක්සේරුව සමාගම හා සම්බන්ධයක් නොමැති ස්වාධීන තක්සේරුකරුවන් විසින් 2011, 2013, 2014 හා 2016 යන වසර තුළ පවත්වන ලදී. ඒ සඳහා සහභාගිවූ අයගේ නම් මෙසේය. ඩී.එන්. ධම්මික බරණගේ මහතා RICS(UK),DIVAIS (SL) සහ එච්.ඒ.ඩබ්. පෙරේරා මහතා B.Sc.Estate Mgt & Valuation (Special), සමන්ත කුමාර මාදවන් ආරච්චි මහතා, Bs.(EMV),City Planning(JP), Dip(UPM) NI,AIREV, ඒ පී. ගුණරත්න මහතා, B.Sc. Estate Mgt&Valuation,F.I.V(SriLanka),L.G.TTungasiri(AIV).F.I.V(SriLanka).Dip.inValuation(S.LT.C) අධ්‍යක්ෂවරු 2016 දෙසැම්බර් 31 වන දිනට ආයෝජන දේපලවල අගය සමාලෝචනය කර ඇති අතර හානිකරණය වී නොමැති බවට නිගමනය කරන ලදී.

26.1.ආ සමාගම නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) අනුමැතියට යටත්ව කොළඹ 12, වේල්ල වීදියේ, අංක 102 හා 104 පිහිටි දේපලවල කල්බදු අයිතිය විකිණීම සඳහා කුලී නිවැසියන් 71 දෙනෙකු සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇත. මෙම විකිණීම අවසන් කරන දිනය සහ පරිශ්‍රයේ කල්බදු අයිතිය සම්බන්ධ මිලදීගන්නා වෙත සින්නක්කර ඔප්පු ප්‍රදානය කරන දිනය, සහාධිපත්‍ය චීකකයක් ලෙස එකී පරිශ්‍රය ලියාපදිංචි කිරීමෙන් පසුව සහ සහාධිපත්‍ය ඔප්පු ප්‍රකාශන කිරීමක් මත සහ එකී ගිවිසුම ක්‍රියාත්මක කිරීම වසර පහක් තුළ එම ලියාපදිංචිය සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අවශ්‍ය සියලුම අනුමැති ලබාගැනීමෙන් පසු නියම කරනු ලැබේ. කෙසේවෙතත්, සමාගම මෙතෙක් කල්බදු හිමිකම් ගිවිසුම විකිණීමට නාගරික සංවර්ධන අධිකාරියෙන් සහාධිපත්‍ය තත්ත්වය සහ අනෙකුත් අවශ්‍ය අනුමැති ලබාගෙන නොමැත. සහාධිපත්‍ය සැලැස්ම ලියාපදිංචිය ලබා ගැනීමෙන් පසු සහ නාගරික සංවර්ධන අධිකාරියෙන් අනෙකුත් ව්‍යවස්ථාපිත අනුමැති ලබාගැනීමෙන් පසු සහ මිලදී ගැනීම් ප්‍රතිෂ්ඨාව සම්පූර්ණයෙන්ම නිරවුල් කිරීමෙන් පසු MBSL විසින් ගිවිසුම මගින් ප්‍රකල්පිත සින්නක්කර ඔප්පු කඩිනම්ව ක්‍රියාත්මක කරයි.

27 දේපල හා උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීමේ පදනම

දේපල හා උපකරණ ස්පෘශ්‍ය වන අතර සේවය කිරීම සඳහා හෝ පරිපාලන අරමුණු සඳහා තබා ගන්නා අතර වසරකට වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබයි.

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒනම් සහ වත්කමේ පිරිවැය විස්වාශනීයව අගය කළ හැකිනම්, දේපල හා උපකරණ හඳුනා ගනී.

අගය කිරීමේ පදනම

වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් ආරම්භයේදී එහි පිරිවැයට හඳුනා ගනී. පිරිවැයට වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපනය කළ හැකි වියදම සහ එහි කොටසක් එකතු කිරීමට හෝ නැවත ස්ථාන ගත කිරීමට පසුව දරන ලද පිරිවැය ඇතුළත් වේ. ස්වයං නිර්මාණය කළ වත්කමක පිරිවැයට අමුද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට වත්කම් ගෙන ඒමට සෘජුවම ආරෝපනය කළ හැකි වෙනත් යම් පිරිවැය සහ අයිතමයේ කොටස් ගැලවීමට සහ ඉවත්කිරීමට සහ එය ස්ථානගත කරන ස්ථානයේ නැවත සවිකිරීමට යන පිරිවැය සහ ප්‍රාග්ධනීයකරණය කළ ණය පිරිවැය ඇතුළත්ය. උපකරණයට අදාළ කාර්යයේ අත්‍යවශ්‍ය කොටසක් වන මිලදීගත් මෘදුකාංග පරිගණක උපකරණයට කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ.

දේපල හා උපකරණ අයිතමයක කොටස්වලට විවිධ ප්‍රයෝජනවත් ජීවකාල ඇති විට, ඒවා දේපල හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණනය කෙරේ.

සමාගම සහ සමූහය දේපල හා උපකරණ සඳහා පිරිවැය ආකෘතිය යොදා ගන්නා අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමඟ සමුච්චිත ක්ෂයකිරීම් සහ යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ ඕනෑම අහඹු පිරිවැයක් සමඟ සටහන් කරනු ලබයි.

පසුකාලීන පිරිවැය

දේපල හා උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගය තුළ හඳුනා ගන්නේ එම කොටස හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලාඒනම් සහ එහි පිරිවැය විශ්වාසනීයව අගය කළ හැකිනම් පමණි. දේපල හා උපකරණ මත එදිනෙදා සේවය කිරීමේ පිරිවැය දරා ඇති ලෙස ලාභාලාභ ප්‍රකාශනයට අය කරනු ලබයි.

අලුත්වැඩියාවන් සහ නඩත්තුව

අළුත්වැඩියාවන් සහ නඩත්තුව වීවා දරනු ලබන මූදල් අදාළ කාලසීමාව තුළ ලාභාලාභ ප්‍රකාශනයට අය කරනු ලබයි. ප්‍රධාන අලුත්වැඩියා සඳහා පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුළත් කෙරේ. පවත්නා වත්කමේ කාර්යසාධනය පිළිබඳ වඩාත් මෑතකාලීනව තක්සේරු කළ ප්‍රමිතියේ අතිරික්තය තුළ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට සහ සමූහයට ගලාඒන විට සහ අළුත්කිරීම වත්කමේ හඳුනාගතහැකි කොටසක් ලෙස ප්‍රතිෂ්ඨාපනය කරයි. ප්‍රධාන අලුත්වැඩියාවන් අදාළ වත්කමේ පවත්නා ඵලදායී ජීවකාලය තුළ ක්ෂය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

හඳුනා නොගැනීම

දේපල හා උපකරණ බැහැරකිරීම මත හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරයි නම් දේපල හා උපකරණ හඳුනා නොගනී. දේපල හා උපකරණ මත ඇතිවන යම් ලාභ හෝ අලාභ (බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම හඳුනා නොගන්නා වසර තුළ ලාභාලාභ ප්‍රකාශනයෙහි අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගනී.

ක්ෂය කිරීම

දේපල හා උපකරණ පිළිබඳ එක් එක් අයිතමයක ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ගික පදනමක් මත ක්ෂය කිරීම ලාභාලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනී. සරල මාර්ගික පදනම තුළ වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය පිළිබඳ අපේක්ෂිත රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි. වත්කමක ක්ෂය කිරීම එම කාලයට පෙර නවත්වන්නේ එම වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ග කර ඇත්නම් පමණි. වත්කම සම්පූර්ණයෙන්ම ක්ෂයවී ඇත්නම් මිස වත්කම අක්‍රිය වන විට හෝ සක්‍රියකත්වයෙන් ඉවත්වන විට ක්ෂය කිරීම නවත්වනු නොලබයි.

පවත්නා සහ තුලනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පහත පරිදි වේ:

වත්කම් පන්තිය	වාර්ෂික ප්‍රතිශතය	කාලසීමාව
මොටර් රථ	20% -25%	04 - 05 වසර
පරිගණක හා උපාංග	20% -25%	04 - 05 වසර
ගොඩනැගිලි	5%	20 වසර
වෙනත් වත්කම්	10% -50%	02 - 10 වසර

ණය පිරිවැය

වසර තුළදී දේපල හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළව කිසිදු ණය පිරිවැයක් ප්‍රාග්ධනිත කර නොමැත.

27.අ

	සින්නක්කර ඉඩම් රු.'000	සින්නක්කර ගොඩනැගිලි රු.'000	මොටර් වාහන රු.'000	කල්බදු වාහන රු.'000	පරිගණක උපාංග රු.'000	කාර්යාල උපාංග රු.'000	මුළුගණන රු.'000
සමාගම							
පිරිවැය							
2015 ජනවාරි 01 දිනට ශේෂය	9,961	2,943	59,742	13,157	183,101	252,517	521,421
වසර තුළ එකතු කිරීම්	-	-	-	-	24,579	56,908	81,487
වසර තුළ බැහැර කිරීම්	-	-	(788)	(3,350)	-	(210)	(4,348)
වසර තුළ මාරු කිරීම්	-	-	5,222	(5,222)	-	-	-
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,961	2,943	64,176	4,585	207,680	309,215	598,560
වසර තුළ එකතු කිරීම්	-	-	23,339	-	104,810	26,088	154,237
වසර තුළ බැහැර කිරීම්	-	-	(7,000)	-	(3,789)	(876)	(11,665)
වසර තුළ මාරු කිරීම්	-	-	-	-	-	-	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,961	2,943	80,515	4,585	308,701	334,427	741,132
සමුච්චිත ක්ෂයකිරීම්							
2015 ජනවාරි 01 දිනට ශේෂය	-	1,312	39,570	7,871	149,031	129,868	327,652
වසර සඳහා අයකිරීම්	-	147	9,638	1,212	17,275	27,713	55,985
බැහැර කිරීම් මත	-	-	(788)	(3,350)	-	(199)	(4,337)
මාරු කිරීම් මත	-	-	4,205	(4,205)	-	-	-
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,459	52,625	1,528	166,306	157,382	379,300
වසර සඳහා අයකිරීම්	-	147	7,458	1,045	20,206	31,755	60,611
බැහැර කිරීම් මත	-	-	(7,000)	-	(3,789)	(327)	(11,116)
මාරුකි රීම් මත	-	-	-	-	-	-	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,606	53,083	2,573	182,723	188,810	428,795
ශුද්ධ පොතේ අගය							
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය							219,260
2016 දෙසැම්බර් 31 දිනට							312,337

27.ආ

	සින්නක්කර ඉඩම් රු.'000	සින්නක්කර ගොඩනැගිල්ල රු.'000	මොටර් වාහන රු.'000	කල්බදු වාහන රු.'000	පරිගණක උපාංග රු.'000	කාර්යාල උපාංග රු.'000	මුළුගණන රු.'000
සමූහය							
පිරිවැය							
2015 ජනවාරි 01 දිනට ශේෂය	9,961	2,943	67,113	13,157	237,129	341,555	671,858
වසර තුළ එකතු කිරීම්	-	-	-	-	28,459	61,344	89,803
වසර තුළ බැහැර කිරීම්	-	-	(788)	(3,350)	-	(210)	(4,348)
වසර තුළ මාරු කිරීම්/ හානිකරණය	-	-	5,222	(5,222)	-	-	-
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,961	2,943	71,547	4,585	265,588	402,689	757,313
වසර තුළ එකතු කිරීම්	-	-	23,388	-	108,165	28,542	160,095
වසර තුළ බැහැර කිරීම්	-	-	(11,000)	-	(3,789)	(876)	(15,665)
වසර තුළ මාරු කිරීම්/ හානිකරණය	-	-	-	-	-	(7,220)	(7,220)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,961	2,943	83,935	4,585	369,964	423,135	894,523
සමුච්චිත ක්ෂයකිරීම්							
2015 ජනවාරි 01 දිනට ශේෂය	-	1,312	42,164	7,871	184,673	175,647	411,667
වසර සඳහා අයකිරීම්	-	147	11,683	1,212	24,912	38,907	76,861
බැහැරකිරීම් මත	-	-	(788)	(3,350)	-	(199)	(4,337)
මාරුකිරීම් මත	-	-	4,205	(4,205)	-	-	-
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,459	57,264	1,528	209,585	214,355	484,191
වසර සඳහා අයකිරීම්	-	147	8,555	1,045	27,264	42,679	79,690
බැහැර කිරීම් මත	-	-	(9,447)	-	(3,789)	(327)	(13,563)
මාරු කිරීම් මත	-	-	-	-	-	(9,887)	(9,887)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,606	56,372	2,573	233,060	246,820	540,431
ශුද්ධ පොත් අගය							
2015 දෙසැම්බර් 31 දිනට							273,122
2016 දෙසැම්බර් 31 දිනට							354,092

සමාගමේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි හානිකරණය පිළිබඳ තොරතුරු

ස්ථානය	ගොඩනැගිලි සංඛ්‍යාව	ප්‍රමාණය (පර්චස්)	ගොඩනැගිලි (වර්ග අඩි)	සාධාරණ අගය තීරණය කිරීමේ ධුරාවලියේ මට්ටම	ප්‍රත්‍යහගණන අගයන් රු.'000	ගොඩනැගිලිවල ශුද්ධ පොත් අගය රු.'000	ඉඩම්වල ශුද්ධ පොත් අගය රු.'000	මුළු ශුද්ධ පොත් අගයේ ප්‍රතිශතයක් ලෙස
470, හැදල පාර, වත්තල	1	64	2,200	මට්ටම 3	79,400	1,337	9,961	703%
					79,400	1,337	9,961	

එස්. ඒ. එම්. ඒ පෙරේරා (FIV) විසින් 2016 මාර්තු සිදුකළ ඇගයීම පරිදි 2016 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල වෙළෙඳපොල අගය රුපියල් 79,400,000ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල අගයන් අධ්‍යක්ෂවරු සමාලෝචනය කර ඇති අතර හානිකරණය සිදු නොවුණු බවට නිගමනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

දේපල හා උපකරණ හිමිකම් සීමාකිරීම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට සමූහයේ දේපල හා උපකරණවල හිමිකම පිළිබඳ කිසිදු සීමාකිරීමක් නොවුණි.

වගකීම් සඳහා ඇප ලෙස දේපල හා උපකරණ
කල්බදු වත්කම් හැර වගකීම් සඳහා ඇප ලෙස ප්‍රතිඥා දුන් දේපල හා උපකරණ පිළිබඳ කිසිදු අයිතමයක් නොවුණි.

දේපල හා උපකරණ අයිතම සඳහා තෙවන පාර්ශවයන්ගෙන් වන්දි ගෙවීම
හානිකරණය වූ, හානි වූ හෝ අත්හල දේපල හා උපකරණ අයිතම සඳහා තෙවන පාර්ශවයන්ගෙන් ලද/ලැබිය යුතු කිසිදු වන්දියක් නොමැත.

සම්පූර්ණයෙන් ක්ෂයකළ දේපල හා උපකරණ
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට භාවිතයේ පවත්නා සම්පූර්ණයෙන් ක්ෂයකළ දේපල හා උපකරණවල පිරිවැය පහත පරිදි වේ.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
මෝටර් වාහන	34,639	31,543	34,639	31,543
පරිගණක උපකරණ	131,662	85,953	157,965	85,953
උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්	70,681	48,229	86,168	48,229
මුළු ගණන	236,982	165,725	278,772	165,725

තාවකාලිකව අක්‍රිය දේපල හා උපකරණ
වාර්තා කරන දිනයට තාවකාලිකව අක්‍රිය වූ දේපල හා උපකරණ කිසිවක් සමූහය තුළ නොමැත.

සක්‍රිය භාවිතයෙන් ඉවත්කළ දේපල හා උපකරණ
වාර්තා කරන දිනයට සක්‍රිය භාවිතයෙන් ඉවත් කරන ලද සමූහයේ දේපල හා උපකරණ කිසිවක් නොමැත.

28 අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනාගැනීමේ පදනම
අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 – 'අස්පෘශ්‍ය වත්කම්' අනුකූලව වත්කමක පිරිවැය පහසුවෙන් හඳුනාගත හැකි සහ එයට ආරෝපණය කළ හැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට සහ සමූහයට ගලා ඒනම් පමණක් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

වෙනම අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේදී පිරිවැයට හඳුනා ගනී. ව්‍යාපාර සංයෝගයක් තුළ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය යනු අත්පත් කර ගත් දිනයට ඒවායේ සාධාරණ අගයයි. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, අස්පෘශ්‍ය වත්කම් යම් සමුච්චිත ක්‍රමක්ෂයට සහ සමුච්චිත හානිකරණ අලාභ ඇත්නම් අඩුකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් කෙරේ.

පසුකාලීන වියදම
අස්පෘශ්‍ය වත්කම් මත පසුකාලීන වියදම ප්‍රාග්ධනීයකරණය වන්නේ එයට සම්බන්ධ විශේෂිත වත්කමේ ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉන් වැඩිකරන්නේනම් පමණි. අනෙකුත් සියලුම වියදම් ලාභාලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

ඵලදායී ආර්ථික ජීවකාලය, ක්‍රමක්ෂය සහ හානිකරණය
අස්පෘශ්‍ය වත්කමක ඵලදායී ආර්ථික ජීවකාලය ස්ථිර හෝ අස්ථිර වුවද අගය කෙරේ.

ස්ථිර ජීවකාලය සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායී ආර්ථික ජීවකාලය පුරා ක්‍රමක්ෂය කෙරේ. අස්ථිර ජීවකාලය සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අවම වශයෙන් එක් එක් වාර්තාකරන දිනයට සමාලෝචනය කෙරේ. අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ හෝ වත්කම තුළ ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය පිළිබඳ අපේක්ෂිත රටාව තුළ වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් ගණනය කෙරේ. ස්ථිර ජීවකාලය සහිත අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ක්‍රමක්ෂය පිරිවැය අස්පෘශ්‍ය වත්කමේ කාර්යයට අනුරූප වියදම් වර්ගීකරණය තුළ ලාභලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනී.

හඳුනා නොගැනීම

අස්පෘශ්‍ය වත්කම් බැහැරකරන විට හෝ එහි භාවිතයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකෙරේනම් අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම් ලාභ හෝ අලාභ වත්කම හඳුනා නොගන්නා වසර තුළ ලාභලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනී.

වත්කම් පන්තිය	වාර්ෂිකව ප්‍රතිශතය	කාලසීමාව
පරිගණක මෘදුකාංග	20% -25%	වසර 4-5

28.අ

දෙසැම්බර් 31 දිනට	පරිගණක මෘදුකාංග	චිකතුව
	රු.'000	රු.'000
සමාගම		
පිරිවැය		
2015 ජනවාරි 01 දිනට ශේෂය	111,098	111,098
වසර තුළ චිකතු කිරීම් සහ වැඩි කිරීම්	19,415	19,415
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	130,513	130,513
වසර තුළ චිකතු කිරීම් සහ වැඩි කිරීම්	12,987	12,987
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	143,500	143,500
සමුච්චිත ක්‍රමක්ෂය		
2015 ජනවාරි 01 දිනට ශේෂය	80,549	80,549
වසර තුළ ක්‍රමක්ෂය	11,148	11,148
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	91,697	91,697
වසර තුළ ක්‍රමක්ෂය	14,098	14,098
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	105,795	105,795
ශුද්ධ පොත් අගය		
2015 දෙසැම්බර් 31 දිනට		38,816
2016 දෙසැම්බර් 31 දිනට		37,705

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

28.ආ

දෙසැම්බර් 31 දිනට	පරිගණක මෘදුකාංග	කීර්තිනාමය	එකතුව
	රු.'000	රු.'000	රු.'000
සමූහය			
පිරිවැය			
2015 ජනවාරි 01 දිනට ශේෂය	156,817	18,193	175,010
වසර තුළ එකතුකිරීම් සහ වැඩිකිරීම්	22,879	-	22,879
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	179,696	18,193	197,889
වසර තුළ එකතු කිරීම් සහ වැඩි දියුණු කිරීම්	14,487	-	14,487
ගැලපීම්	(5,251)	-	(5,251)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	188,932	18,193	207,125
සමුච්චිත ක්‍රමක්ෂය හා හානිකරණය			
2015 ජනවාරි 01 දිනට ශේෂය	92,286	-	92,286
වසර තුළ ක්‍රමක්ෂය	20,269	-	20,269
වසර තුළ හානිකරණ වෙන්කිරීම්	-	18,193	18,193
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	112,555	18,193	130,748
වසර තුළ ක්‍රමක්ෂය	21,588	-	21,588
ක්‍රමක්ෂය නිසා ගැලපීම්	(4,239)	-	(4,239)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	129,904	18,193	148,097
ශුද්ධ පොත් අගය			
2015 දෙසැම්බර් 31 දිනට			67,141
2016 දෙසැම්බර් 31 දිනට			59,028

සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්

මෙතෙක් භාවිත සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කර ඇති අස්පෘශ්‍ය වත්කම්වල දළ ධාරණ අගය පහත පරිදි වේ

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016**	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
පරිගණක මෘදුකාංග	83,749	86,866	90,041	86,866

වාර්තා කරන දිනයට සමූහයේ අස්පෘශ්‍ය වත්කම්වල අයිතිය පිළිබඳ කිසිදු සීමා කිරීමක් නොවීය. එමෙන්ම වගකීම් සඳහා කිසිදු අයිතමයක් සුරැකුමක් ලෙස උකස් කර නැත.

29 අනෙකුත් වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම සහ සමූහය විහි අනෙකුත් සියලුම වත්කම් ප්‍රධාන වශයෙන් අත්තිකාරම් ගෙවීම්, වාණිජමය ලියවිලි සහ අනෙකුත් ලැබීම්වලින් සමන්විත වේ.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016**	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ලැබිය යුතු හිමිකම් සහ කොමිස්	18,508	15,142	18,508	15,142
ලැබිය යුතු	107,237	104,110	161,502	166,687
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	46,395	45,256	83,618	80,647
අනෙකුත් ගිණුම්	146,356	66,947	152,371	67,392
ප්‍රතිරක්ෂණ වත්කම් රක්ෂණ ගිවිසුම්	-	-	289,794	88,449
ලැබිය යුතු රක්ෂණය	-	-	211,672	294,016
වාණිජමය ලියවිලි	414,306	382,906	414,306	382,906
	732,802	614,361	1,331,171	1,095,239
අඩුකළා - හානිකරණය සඳහා අත්තිකාරම්	414,306	382,906	420,853	382,906
	318,496	231,455	910,918	712,333

30 බැංකුවලට ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුවලට ගෙවිය යුතු දෙයට සමාගම විසින් බැංකුවෙන් ලබාගත් බැංකු අයිරාවන් ඇතුළත්ය. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, ඵලදායී පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මේවා අගය කරනු ලබයි.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016**	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
බැංකු අයිරාවන්	201,635	258,062	224,997	273,968
	201,635	258,062	224,997	273,968

31 ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෙයට ස්ථාවර තැන්පතු, සහ ඉතුරුම් තැන්පතු ඇතුළත්ය. ඵලදායී පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මේවා අගය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ පොළී අනුපාත ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ඵලය සහ පිරිවැය මත යම් වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය ලාභාලාභ ප්‍රකාශනයේ පොළී වියදම් තුළ ඇතුළත් කරනු ලබයි. ලාභ සහ අලාභ හඳුනා ගනු ලබන්නේ වගකීම් හඳුනා නොගන්නා අවස්ථාවේදී මෙන්ම පොළී අනුපාත ක්‍රමක්ෂය ක්‍රියාවලිය තුළිනි.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016**	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ඉතුරුම් තැන්පතු	728,257	693,207	728,257	693,207
කාලීන තැන්පතු	17,790,162	15,153,099	17,790,162	15,153,099
	18,518,419	15,846,306	18,518,419	15,846,306

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

32 නිකුත්කළ ණය සහ අනෙකුත් ණය ගැනීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිකුත්කළ ණය සුරැකුම් තුළ දිගුකාලීන සහ කෙටි කාලීන ද්‍රවශීලතා අරමුදල් අවශ්‍යතා සඳහා සමාගම සහ සමූහය විසින් ණයට ගත් අරමුදල් නියෝජනය කරයි. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට මේවා අගය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීම සඳහා සළුල පොළී අනුපාතය තීරණය කිරීමේදී නිකුත් කිරීමට අදාළ වට්ටම් හෝ අධිමිලත්, පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ. ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය ලාභාලාභ ප්‍රකාශනයේ පොළී වියදම් තුළ ඇතුළත් කරනු ලබයි. ලාභ සහ අලාභ හඳුනා ගනු ලබන්නේ වගකීම් හඳුනා නොගන්නා අවස්ථාවේදී මෙන්ම පොළී අනුපාත ක්‍රමක්ෂය ක්‍රියාවලිය තුළිනි.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016**	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ණයකර (සටහන 32.1)	5,154,869	5,489,350	5,154,869	5,489,350
කෙටි කාලීන ණය ගැනීම	3,567,918	2,393,973	3,567,918	2,393,973
නිකුත්කළ මුළු ණය සහ ණය අරමුදල	8,722,787	7,883,323	8,722,787	7,883,323

32.1 ණයකර

ISIN No.	මූණත් අගය රු. '000	පොළී අනුපාතය	කොළඹ කොටස් හුවමාරුව ලැයිස්තුගත	ඇප	ගෙවිය යුතු පොළ වාරගණන	නිකුත්කළ දිනය	පරිනත කාලය	සමාගම / සමූහය දිනට අගය 2016 රු. '000	2015 රු. '000
ස්ථිර අනුපාතය									
ණයකර									
LK0186D19194	625,110	17.50%	ලැයිස්තුගත	නැත	වාර්ෂිකව	13 මාර්තු 28	18 මාර්තු 27	735,088	734,412
LK0186D19202	485,240	17.25%	ලැයිස්තුගත	නැත	වාර්ෂිකව	13 මාර්තු 28	18 මාර්තු 27	569,943	569,250
LK0186D19210	723,190	16.70%	ලැයිස්තුගත	නැත	කාර්තුමය	13 මාර්තු 28	18 මාර්තු 27	753,581	753,663
LK0186D19228	166,460	16.50%	ලැයිස්තුගත	නැත	මාසිකව	13 මාර්තු 28	18 මාර්තු 27	168,786	168,717
LK0186D20929	674,770	14.25%	ලැයිස්තුගත	නැත	වාර්ෂිකව	13 දෙසැ. 17	17 දෙසැ. 16	771,045	770,901
LK0186D20911	17,540	13.50%	ලැයිස්තුගත	නැත	කාර්තුමය	13 දෙසැ. 17	17 දෙසැ. 16	18,136	18,137
LK0186D20937	11,470	13.25%	ලැයිස්තුගත	නැත	මාසිකව	13 දෙසැ. 17	17 දෙසැ. 16	11,599	11,600
LK0186D22669	909,770	9.00%	ලැයිස්තුගත	නැත	වාර්ෂිකව	14 නොවැ.13	19 නොවැ 12	991,796	991,405
LK0186D22677	1,090,230	8.75%	ලැයිස්තුගත	නැත	අර්ධ වාර්ෂිකව	14 නොවැ.13	19 නොවැ 12	1,134,895	1,135,027
වසර තුළ නිදහස් කළ ණයකර									
ස්ථිර අනුපාතය									
LK0186D20945	296,220	13.50%	ලැයිස්තුගත	නැත	වාර්ෂිකව	17-දෙසැ.-13	16-දෙසැ.-16	-	336,238
මුළු ණයකර	5,000,000							5,154,869	5,489,350

2016 දෙසැම්බර් 31 දිනට ණයකරවල හිඟ සංඛ්‍යාව තුළ සමාගම විසින් නිකුත් කළ එක් එක් ඇපනොලත් මුදාහැරිය හැකි ණයකර 47,037,800ක් ඇතුළත් විය.

වසර තුළ (2015 නැත) සමාගමට අයත් ණයකර කිසිවක් නැවත මිලදී ගෙන නොමැත.

සමාගමට 2015 සහ 2016 තුළ සියලුම වගකීම් සම්බන්ධයෙන් මුදල්, පොළීහිඟ හෝ වෙනත් කඩකිරීම් කිසිවක් නොමැත.

33 රක්ෂණ ප්‍රතිපාදන

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් (DPF **සමඟ ආයෝජන ගිවිසුම් වගකීම් ඇතුලුව)**

ජීවිත රක්ෂණ ගිවිසුම් සහ DPF සමඟ ආයෝජන ගිවිසුම් සඳහා වගකීම අවදානම සඳහා ආන්තිකයක් සහ අහිතකර අපගමනයන් සහිත වැඩි කළ අවස්ථාවේදී හොඳම ඇස්තමේන්තුව පිළිබිඹු කරමින් පවත්නා උපකල්පන මත හෝ ගිවිසුම ආරම්භයේදී නියම කළ උපකල්පන මත පදනම් වේ. සියලුම ගිවිසුම් අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ කළමනාකාරිත්වයේ හොඳම පවත්නා ඇස්තමේන්තුව පිළිබිඹු කරන වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයකට යටත් වේ.

මර්ත්‍යතාව, රෝගාතුර බව, දීර්ඝායුෂ, ආයෝජන ඵල, වියදම්, ගෙවීයාම සහ පවාරණ අනුපාතයට අදාළව භාවිතා කළ ප්‍රධාන උපකල්පන වේ. පාලිත සමාගම ක්ෂේත්‍රයේ මර්ත්‍යතාව, රෝගාතුර බව මත පදනම් වේ.

සමාගම අවදානම් අනාවරණය, නිෂ්පාදන ලක්ෂණ, ඉලක්ක වෙළෙඳපොල සහ එයට අයත් හිමිකම් ඇති බව පෙන්නුම් කිරීමට සුදුසු පරිදි ඓතිහාසික අත්දැකීම් පිළිබිඹු කරන මර්ත්‍යතා වගු ගලපන ලදී. දීර්ඝායුෂට අදාළ අවදානම රක්ෂණය කරන මෙම ගිවිසුම් සඳහා, දුරදක්නා අත්තිකාරම් අපේක්ෂිත අනාගත මර්ත්‍යතා වර්ධනයන්ට සිදු කෙරේ. ජීවිත රක්ෂණ ගිවිසුම් හා බැඳුණු වත්කම්වලින් ඇතිවන අනාගත ආයෝජන ලෙස ඇස්තමේන්තු සිදු කෙරේ. මෙම ඇස්තමේන්තු වර්තමාන වෙළෙඳපොල වාර්තා සහ අනාගත ආර්ථික සහ මූල්‍ය සංවර්ධනයන් පිළිබඳ අපේක්ෂාවන් මත පදනම් වේ.

අනාගත වියදම් පිළිබඳ උපකල්පන අපේක්ෂිත වියදම් උද්ධමනයට සුදුසු පරිදි ගලපන ලද පවත්නා වියදම් මට්ටම් මත පදනම් වේ. පතන සහ පවාරණ අනුපාත ඒවායේ ඓතිහාසික පළපුරුද්ද මත පදනම් වේ. වට්ටම් අනුපාත සමාගමේ අවදානම් නිරාවරණයට ගලපන ලද වෙළෙඳපොල අවදානම් අනුපාත මත පදනම් වේ.

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිවිසුමට ඇතුළත් වන සහ වාරික අයකෙරෙන විට, ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් හඳුනා ගනී. මෙම වගකීම් නොගෙවූ හිමිකම් වෙන්කිරීම ලෙස හඳුන්වන අතර වාර්තා කළද නොකළද වර්තාකරන දිනයට පියවන ලද, අදාළ හිමිකම් පාලන පිරිවැය සහ සුන්බුන් සහ අනිකුත් අයකර ගැනීම්වලින් අපේක්ෂිත අගය අඩුකිරීම සහිතව දරන ලද සියලුම හිමිකම්වල ඇස්තමේන්තුගත අවසාන පිරිවැය මත පදනම් වේ. සමහර වර්ගයේ හිමිකම් දැනුම්දීම හා නිරවුල් කිරීමේදී ප්‍රමාදයන් ඇතිවිය හැකි අතර එමනිසාම මේවායේ අවසාන පිරිවැය වාර්තා කරන දිනයට හඳුනාගත නොහැක. වර්තා කරන දිනයට වගකීම ගණනය කරනු ලබන්නේ සම්මත ජීවගණක හිමිකම් ප්‍රක්ෂේපිත ශිල්පය භාවිතයෙනි. වගකීම් මුදලේ අගය සඳහා වට්ටම් කරනු නොලබයි. සමානතාව හෝ නිරවහනය සඳහා කිසිදු වෙන්කිරීමක් හඳුනා නොගනී. ගිවිසුම කල්පිරෙන, මුදාහරින සහ අවලංගුවන විට වගකීම් හඳුනා නොගනී.

නොඉපයූ වාරික සඳහා වෙන් කිරීම කල්පිරී නොමැති අවදානම් සඳහා ලද වාරික නියෝජනය කරයි. සාමාන්‍යයෙන්, සංචිතය ගිවිසුමේ කාලය තුළ මුදා හරින අතර වාරික ආදායම ලෙස හඳුනා ගනී. වර්තාකරන දිනයට, සමූහයට එහි කල් නොපිරුණු අවදානම් ලැබෙන අතර, අපේක්ෂිත හිමිකම්වල නොඉපයූ වාරිකවල විලම්භිත අත්පත්කර ගැනීම්වල පිරිවැය තුළ සමස්ත අතිරික්තයක් තිබේද යන්න තීරණය කිරීම සඳහා වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් පවත්වයි. මෙම ගණනය කිරීමට අදාළ ජීවිත නොවන රක්ෂණ තාක්ෂණික වෙන්කිරීම්වලට අදාළ වත්කම් මත ඇති වේයයි අපේක්ෂිත ආයෝජන ඵල සැලකිල්ලට ගැනීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල වර්තමාන ඇස්තමේන්තු භාවිතා කරයි. නොඉපයූ වාරිකවල ධාරණ අගය ප්‍රමාණවත් නොවන බව මෙම ඇස්තමේන්තුවලින් පෙන්වයි නම්, වගකීම් ප්‍රමාණාත්මතාව සඳහා වෙන්කිරීමක් සිදුකරමින් ආදායම් ප්‍රකාශනය තුළ හිඟය හඳුනා ගනී.

ජීවගණක ලෙස අගය කර ඇති ඔප්පු හිමියන් සම්බන්ධයෙන් වගකීම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට හිමිකම් නොපෑ ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ට ගෙවිය යුතු හිමිකම් /ප්‍රතිලාභ මෙම සටහනින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

33.1 රක්ෂණ වෙන්කිරීම - ජීවිත

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	425,231	335,256
ජීවිත අරමුදලේ වැඩිවීම	69,940	89,975
	495,171	425,231
සාධාරණ අගයේ සංචිතය	(16,803)	(1,152)
	478,368	424,079
හිමිකම් නොපෑ ප්‍රතිලාභ	35,890	20,178
දෙසැම්බර් 31 දිනට ශේෂය	514,258	444,257

රක්ෂණ වෙන්කිරීම - ජීවිත

දිගුකාලීන රක්ෂණ ගිවිසුම් වගකීම් සම්ප්‍රදායික සහභාගි නොවූ ජීවිත රක්ෂණ නිෂ්පාදනවලින් මූලිකවම ඇතිවන ජීවිත රක්ෂණ අරමුදල තුළ ඇතුළත්ය. කෙටිකාලීන ගිවිසුම් වගකීම් මූලිකවම අනතුරු සහ සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදනයන්ය. රක්ෂණ වෙන්කිරීම පහත කරුණු මත පදනම් වී නියම කර ඇත.

- නිෂ්පාදනය අනුව වෙනස් වන සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කළ රෙගුලාසිවලට අනුකූලව පොළී අනුපාත.
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කළ රෙගුලාසිවලට අනුකූලව සැබෑ පළපුරුද්ද සඳහා ගලපන ලද ප්‍රකාශිත මර්ත්‍යතා වගු මත පදනම් මර්ත්‍යතා අනුපාත.
- භූගෝලීය ප්‍රදේශය අනුව සැබෑ පලපුරුද්ද මත පදන්ම වූ සහ ඔප්පුවේ ආකෘතිය තුළ විවිධත්වය සඳහා ඉඩදීමට වෙනස් කළ පවාරණ අනුපාත.

33.2 අතිරික්තය/ හිඟය

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	425,231	335,256
ජීවිත අරමුදලේ වැඩිවීම	69,940	89,975
	495,171	425,231
සාධාරණ අගයේ සංචිතය	(16,803)	(1,152)
දෙසැම්බර් 31 දිනට ජීවිත අරමුදලේ ශේෂය	478,368	424,079
රක්ෂණ හිමිකම් වගකීම් (ජීවිත) - ශුද්ධ වාරික ඇගයීම් ක්‍රමය	-	377,909
රක්ෂණ හිමිකම් වගකීම් (ජීවිත) - දළ වාරික ඇගයීම් ක්‍රමය	422,005	-
2016 දෙසැම්බර් 31 දිනට අතිරික්තය/ හිඟය	56,363	46,170
ශු.වා.ඇ සිට ද.වා.ඇ දක්වා ඇගයීම් ක්‍රමය තුළ වෙනස්වීම නිසා අතිරික්තය (සටහන 33.3)	(35,431)	-
	20,932	46,170

වසර අවසානයට ජීවගණක උපදේශක තේජා රනදේ ගාඩිහෝක් විසින් නියමකරන ලද සහභාගිත්ව සහ සහභාගි නොවන ඔප්පු අරමුදල් සඳහා රක්ෂණ ගිවිසුම් වගකීම් මත සහභාගිත්ව සහ සහභාගි නොවන ඔප්පු අරමුදල් සඳහා වත්කම් සහ වියදම් සමාගම වෙන් කරයි.

33.3 ශු.වා.ඇ සිට ද.වා.ඇ දක්වා ඇගයීම් ක්‍රමය තුළ වෙනස්වීම නිසා අතිරික්තය

	සමූහය
දෙසැම්බර් 31 දිනට	2016
	රු.'000
ශු.වා.ඇ සිට ද.වා.ඇ දක්වා ඇගයීම් ක්‍රමය තුළ වෙනස්වීම නිසා අතිරික්තය	3,002
සහභාගි නොවන ඔප්පු	
ශු.වා.ඇ සිට ද.වා.ඇ දක්වා ඇගයීම් ක්‍රමය තුළ වෙනස්වීම නිසා අතිරික්තය	32,429
සහභාගි නොවන ඔප්පු	
	35,431

ජීවිත රක්ෂණ අරමුදලේ වටිනාකම

2016 දෙසැම්බර් 31 දිනට ජීවිත රක්ෂණ අරමුදල පිළිබඳ ඇගයීම සුදුසුකම්ලත් ජීවගණකවරියක් වන තේජා රනදේ ගාඩිහෝක් මහත්මිය විසින් සිදු කරන ලද අතර ඇය විසින් ශු.වා.ඇ සිට ද.වා.ඇ දක්වා ඇගයීමේ ක්‍රමය තුල වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය තීරණය කර සහතික කරන ලදී. වාර්තාවට අනුව, දළ වාරික ඇගයීම් ක්‍රමය මත පදනම් ප්‍රතිපත්ති වගකීම් රු. මිලියන 422ක් විය.

වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය

උපදේශක ජීවගණකවරියක් වන තේජා රනදේ ගාඩිහෝක් මහත්මියගේ මතය අනුව, වගකීමේ වටිනාකම අනාගත ප්‍රතිලාභ සහ වියදම් සපුරාලීමට ප්‍රමාණවත් වේ. එබැවින්, වාරික හිඟය සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු නොකරන ලදී.

33.4 රක්ෂණ වෙන්කිරීම - ජීවිත නොවන

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	2016	2015
	රු.'000	රු.'000
ඔප්පු හිමියන් විසින් වාර්තාකළ හිමිකම් සඳහා වෙන්කිරීම	408,237	115,520
IBNR හිමිකම් සඳහා වෙන්කිරීම	48,779	43,354
හිඟ හිමිකම් වෙන්කිරීම	457,016	158,874
නොඉපයූ වාර්ක සඳහා වෙන්කිරීම	324,018	353,459
මුළු ජීවිත නොවන රක්ෂණ වෙන්කිරීම	781,034	512,333

සමූහය

වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණය

ජීවිත නොවන රක්ෂණ වගකීම් සඳහා SLFRS 4-රක්ෂණ ගිවිසුම්වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට චන්චම්පී මූල්‍ය සේවා උපදේශන සමාගම වෙනුවෙන් මැතිවි මැගයර් FIAA මහතා විසින් වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂණයක් ("LAT") පවත්වන ලදී. ප්‍රතිරක්ෂණයේ ශුද්ධ පරිපාලිත සමාගම විසින් රුපියල් මිලියන 324ක UPR වෙන් කිරීම 2016 දෙසැම්බර් 31 දිනට MBSL රක්ෂණ සමාගමේ කල්නොපිරුණු අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විය. එමෙන්ම පරිපාලිත සමාගම විසින් හඳුනාගත යුතු වාරික හිඟ නොවුණි. ඊට අමතරව, උපදේශකගේ ජීවගණක වාර්තාව අනුව, රුපියල් මිලියන 48.8ක IBNR වෙන්කිරීම 2016 දෙසැම්බර් 31 දිනට MBSL රක්ෂණ සමාගමේ හිමිකම් වගකීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් විය.

34 වර්තන බදු වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම සහ සමූහය ආදායම් බදුවලට යටත් වේ. වර්තන, විලම්භිත සහ අනෙකුත් බදු සඳහා මුළු වෙන්කිරීම තීරණය කිරීමට සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන කාලය තුළ නීතිවලට අදාළත්වය පිළිබඳ අර්ථකථන සම්බන්ධව අවිනිශ්චිතතා පවතී.

වර්තන බදු වත්කම් හානිකරණය අඩුකළ චෛතිහාසික අගයන්ට හඳුනාගනී. ආදායම් බදු වගකීම් ගෙවීමට අපේක්ෂිත මුදලට සටහන් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

දෙසැම්බර් 31 දිනට	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000 සංශෝධිත*	රු.'000	රු.'000 සංශෝධිත*
ජනවාරි 01 දිනට ශේෂය	146,284	208,001	136,336	208,001
චිකතුකළා : බදු සඳහා වෙන්කිරීම	62,838	31,684	74,249	41,524
චිකතුකළා : සුපිරි ලාභ බද්ද	-	38,753	-	38,753
අඩුකළා : වසර තුළ ගෙවූ	27,906	80,162	27,906	81,699
අඩුකළා : වසර තුළ හිලව් කිරීම	30,088	10,010	41,499	28,261
අඩුකළා : ආර්ථික සේවා ගාස්තු හා අත්තිකාරම් සමාගම් බද්දේ ලැබිය යුතු ශේෂය	-	41,982	-	41,982
දෙසැම්බර් 31 දිනට ශේෂය	151,128	146,284	141,180	136,336

35 විලම්භිත බදු වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගය අතර වාර්තා කරන දිනයට තාවකාලික වෙනස මත විලම්භිත බදු වෙන් කරනු ලබයි. විලම්භිත බදු වගකීම් සියලුම බදුකළ හැකි තාවකාලික වෙනස්වීම් සඳහා හඳුනා ගන්නා අතර විලම්භිත බදු වත්කම් සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම්, භාවිතා නොකළ බදු බැරවල ඉදිරියට ගෙනා මුදල සහ භාවිතා නොකළ බදු අලාභ සඳහා අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම් සහ භාවිතා නොකළ බදු බැරවල ඉදිරියට ගෙනා මුදල සහ භාවිතා නොකළ බදු අලාභ භාවිතා කිරීම සඳහා ලබාගත හැකි බදුකළහැකි ලාභයේ ප්‍රමාණයට හඳුනා ගනී.

විලම්භිත බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරන අතර ප්‍රමාණවත් බදුකළහැකි ලාභය විලම්භිත බදු සියල්ලටම හෝ කොටසකට භාවිතා කිරීමට ඉඩදීමට හැකිවන ප්‍රමාණයට අඩුකරනු ලබයි. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයට නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදුකළ හැකි ලාභය විලම්භිත බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩදිය හැකි වන ප්‍රමාණයට හඳුනාගනී.

වාර්තා කරන දිනයට පනවා ඇති හෝ අපේක්ෂිත බදු අනුපාත (සහ බදු නීති) මත පදනම් වී වත්කම මුදාහරිනු ලබන හෝ වත්කම පියවනු ලබන අවස්ථාවේදී වසර තුළ යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතවලට විලම්භිත බදු වත්කම් සහ වගකීම් අගයනු ලැබේ.

ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් අයිතමයන්ට අදාළ වර්තන බදු සහ විලම්භිත බදු ආදායම් ප්‍රකාශනය තුළ නොව ස්කන්ධය තුළ හඳුනා ගනී.

වර්තන බදු වගකීම් සහ වීම බදුකළ හැකි ආයතනයට සහ වීම බදුකරණ අධිකාරියට අදාළ විලම්භිත බදුවලට වර්තන බදු වත්කම් හිලව් කිරීමට නීතියෙන් බලාත්මක හිමිකම ඇත්නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු වගකීම් හිලව් කෙරේ.

දෙසැම්බර් 31 දිනට	සමාගම		සමූහය	
	2016	2015	**2016**	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
විලම්භිත බදු වත්කම් (සටහන 35.2.1)	(434,082)	(465,723)	(434,082)	(465,723)
විලම්භිත බදු වගකීම් (සටහන35.2.2)	640,970	579,392	640,970	579,392
	206,888	113,669	206,888	113,669

35.1 විලම්භිත බදු වෙනස්වීම

ජනවාරි 01 දිනට ශේෂය	113,669	91,403	113,669	91,403
වසර සඳහා අයකිරීම	91,409	11,194	91,409	11,194
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සංරචකවලට අදාළව විලම්භිත බදු වෙනස්වීම	1,810	11,072	1,810	11,072
දෙසැම්බර් 31 දිනට ශේෂය	206,888	113,669	206,888	113,669

35.2 විලම්භිත බදු වගකීම් සැසඳීම

විලම්භිත බදු වත්කම් සහ වගකීම් පහත පරිදි බෙදිය හැකිය.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
35.2.1 විලම්භිත බදු වත්කම්				
ඉදිරියට ගෙනා බදු අලාභ	(374,333)	(396,974)	(374,333)	(396,974)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	(70,688)	(77,878)	(70,688)	(77,878)
අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් පීවගණක ලාභ/ (අලාභ)	10,939	9,129	10,939	9,129
	(434,082)	(465,723)	(434,082)	(465,723)
35.2.2 විලම්භිත බදු වගකීම				
කල්බදු වත්කම් සඳහා බදු අරමුණ සඳහා වැඩිකළ ක්ෂය දීමනාව	610,960	558,927	610,960	558,927
ස්ථාවර වත්කම් සඳහා බදු අරමුණ සඳහා වැඩිකළ ක්ෂය දීමනාව	30,010	20,465	30,010	20,465
	640,970	579,392	640,970	579,392
ශුද්ධ විලම්භිත බදු වගකීම්	206,888	113,669	206,888	113,669

විලම්භිත බදු 28% අනුපාතයට ගණනය කර ඇත.

36 අනෙකුත් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් වගකීම්වලට උපචිත ආදායම, උපචිත වියදම් සහ අනෙකුත් වෙන්කිරීම් ඇතුළත් වේ. මෙම වගකීම් වාර්තා කරන දිනයට ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණයට සටහන් කරනු ලබයි.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
උපචිත වියදම්	56,220	25,001	50,104	36,498
සේවකයින්ට හා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු	134,360	135,724	178,982	203,570
ගෙවිය යුතු රක්ෂණය	4,489	6,269	73,162	265,631
ආන්තික ගිණුම්	9,307	11,227	9,307	11,227
කල්බදු ණයහිමියන්				
මාස 12 තුළ	1,536	1,316	5,057	3,841
මාස 12 ට වැඩි	-	1,536	10,686	14,898
අනෙකුත් වගකීම්	198,262	175,767	424,736	420,945
	404,174	356,840	752,034	956,610

37 සේවක ප්‍රතිලාභ බැඳීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 - සේවක ප්‍රතිලාභවලට අනුකූලව ප්‍රක්ෂේපිත ඒකක බැර (PUC) ක්‍රමය භාවිතයෙන් ස්වාධීන වෘත්තීය පීවගණකයෙකුගේ උපදේශය සහිතව නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂික සඳහා පොරොන්දු විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය සමූහය විසින් තක්සේරු කරයි.

පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුකූලව, සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික සඳහා සේවාවෙන් පළමු වසරේ සිට වෙන් කිරීම් සිදු කරනු ලබයි.

ආයුගණක ලාභ අලාභ හඳුනා ගැනීම

අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සැලැස්ම සම්බන්ධයෙන් සමූහයේ බැඳීම ගණනය කිරීමේදී ඇතිවන මුළු ආයුගණක ලාභ සහ අලාභ වය සිදුවන කාලසීමාව තුළ හඳුනා ගනී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

අරමුදල් පිළියෙල කිරීම්
පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් ලබා නොගනී.

ගිණුම්කරණ ඇස්තමේන්තු
පීවගණක ඇගයීම පහත දක්වා ඇති ජනවිකාශ හා මූල්‍ය උපකල්පන සිදුකිරීම හා සම්බන්ධ වේ.

ජනවිකාශ උපකල්පන : මර්ත්‍යතා අනුපාත, කාර්ය මණ්ඩල ප්‍රමාණය, අබාධිතතාව, විශ්‍රාම වසය
මූල්‍ය උපකල්පන : වට්ටම් අනුපාතය, වැටුප් වැඩිවීම, පාරිතෝෂික වට්ටෝරුව, සේවක දත්ත, වත්කම්

ලන්ඩනයේ ආයුගණක ආයතනය විසින් නිකුත් කළ ප්‍රකාශිත මර්ත්‍යතා අනුපාත මත පදනම්ව දෙන ලද වයසක වසරක් තුළ සිදුවන මරණවල සම්භාවිතාව නියෝජනය කරයි.

වට්ටම් කළමනාකරණය පිළිබඳ සුදුසු දිගුකාලීන අනුපාතය තිරණය කිරීමේදී කෙටිකාලීන ආයතනික බැඳුම්කර/ රජයේ බැඳුම්කර මත වෙළෙඳපොළ පොළී අනුපාත සහ අපේක්ෂිත දිගුකාලීන උද්ධමන අනුපාතය සලකා ලබයි.

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	245,531	247,051	262,040	259,107
ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනාගත් වියදම් (සටහන 37.1)	40,464	42,648	45,697	47,751
වසර තුළ සිදුකළ ගෙවීම්	(33,539)	(11,564)	(35,733)	(13,603)
අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් පීවගණක ලාභ/(අලාභ)	(39,068)	(32,603)	(40,541)	(31,215)
දෙසැම්බර් 31 දිනට ශේෂය	213,388	245,532	231,463	262,040

37.1 ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනාගත් වියදම්

වර්තන සේවා පිරිවැය	15,911	20,413	19,338	24,250
පොළී පිරිවැය	24,553	22,235	26,359	23,501
මුළු මුදල	40,464	42,648	45,697	47,751

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම ආයුගණක ඇගයීමක් වෘත්තීය ආයුගණක ආයතනයක් වන ආයුගණක හා කළමනාකරණ උපදේශක පුද්ගලික සමාගම විසින් දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී. වගකීම ඇගයීමට ආයුගණක විසින් භාවිතා කළ ඇගයීම් ක්‍රමය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 සේවක ප්‍රතිලාභ අනුව හඳුනාගත් ක්‍රමයක් වන ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමයයි.

37.2 පීවගණක උපකල්පන

	2016 රු.'000	2015 රු.'000
වට්ටම් අනුපාතය	12.11%	10.00%

විශ්‍රාම වයස
සක්‍රීය සහභාගිකයින්ගේ අපේක්ෂිත සාමාන්‍ය වැඩකරන කාලය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වයස 7 - 8 කි.

37.3 පීවගණක ඇගයීම තුළ යොදාගත් උපකල්පනවල සංවේදීතාව
සේවක ප්‍රතිලාභ වගකීම ඇගයීමේදී ස්ථිරව පැවති අනෙකුත් විචල්‍යතා සමඟ යොදන ලද ප්‍රධාන උපකල්පන වල යුක්තිසහගතව වියහැකි වෙනසකට සංවේදීතාව පහත වගුවෙන් පෙන්නුම් කරයි.

ආදායම් ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංවේදීතාව වට්ටම් අනුපාතය තුළ සහ ලාභාලාභ මත සහ වසර සඳහා සේවක ප්‍රතිලාභ සැලැස්ම මත බලපෑම වේ.

වට්ටම් අනුපාතයෙහි වැඩිවීම / අඩුවීම	වසර සඳහා ඇති වූ ආදායම් ප්‍රකාශනයේ වැඩිවීම /(අඩුවීම) මත සංවේදී බලපෑම (රු.'000)	වගකීම් තුළ සේවක ප්‍රතිලාභ වැඩිවීම /(අඩුවීම) මත සංවේදී බලපෑම (රු.'000)
1%	(9.338)	(9.338)
(1%)	10.295	10.295

*වට්ටම් අනුපාතය නියම කළේ ;

2016 - 12.11%

38 ප්‍රකාශිත ප්‍රාග්ධනය

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	2,124,457	2,124,457	2,124,457	2,124,457
නව කොටස් නිකුතුව	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	2,124,457	2,124,457	2,124,457	2,124,457
නිකුත්කළ කොටස් ගණන				
ජනවාරි 01 දිනට ශේෂය	165,875	165,875	165,875	165,875
නව කොටස් නිකුතුව	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	165,875	165,875	165,875	165,875

39 සංචිත

39.1 ව්‍යස්ථාපිත සංචිත

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	140,544	140,544	140,544	140,544
වැකතුකළා : වසර තුළ මාරු කිරීම්	17,125	-	17,125	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	157,669	140,544	157,669	140,544

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2003 අංක 01 දරන මූල්‍ය සමාගම් (ප්‍රාග්ධන අරමුදල්) උපදේශයට අනුකූලව නිර්මාණය කළ සමාගමේ සංචිත අරමුදල ව්‍යස්ථාපිත සංචිත නියෝජනය කරයි.

39.2 රඳවාගත් ඉපයීම්

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	747,408	842,936	746,023	742,987
වැකතුකළා : වසර සඳහා ලාභය	85,624	(78,306)	117,853	22,152
ව්‍යස්ථාපිත සංචිතවලට මාරුකිරීම්	(17,125)	-	(17,125)	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	37,258	21,531	39,532	19,637
සුපිරි ලාභ බදු ගැලපීම්	-	(38,753)	-	(38,753)
දෙසැම්බර් 31 දිනට ශේෂය	853,165	747,408	886,283	746,023

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

39.3 විකිණීමට තබා ඇති සංචිත

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
ජනවාරි 01 දිනට ශේෂය	(4,350)	43,485	(8,920)	43,961
එකතුකළා : විකිණීමට තබා ඇති මූල්‍ය වත්කම් මත අලාභ	(17,452)	(47,835)	(27,275)	(52,881)
දෙසැම්බර් 31 දිනට ශේෂය	(21,802)	(4,350)	(36,195)	(8,920)

40 අමතර මුදල් ප්‍රවාහ තොරතුරු

	සමාගම		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
40.1 මුදල් හා මුදලට සමාන දෑ පිළිබඳ විශ්ලේෂණ				
මුදල් හා කෙටිකාලීන අරමුදල	401,301	380,830	441,357	432,947
බැංකුවලට ගෙවිය යුතු මුල් පරිනත කාලය මාස තුනට අඩු බැඳීම්	(201,635)	(258,062)	(224,997)	(273,968)
	199,666	122,768	216,360	158,979
40.2 මෙහෙයුම් වත්කම්වල වෙනස				
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	(3,826,220)	(2,521,649)	(3,799,444)	(2,412,260)
අනෙකුත් මෙහෙයුම් වත්කම්	(48,640)	(5,722)	(160,183)	(29,514)
හානිකරණය සඳහා ගැලපීම	(24,239)	(462,151)	(27,959)	(474,618)
	(3,899,099)	(2,989,522)	(3,987,586)	(2,916,392)
40.3 මෙහෙයුම් වගකීම්වල වෙනස				
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	2,672,113	4,521,286	2,672,113	4,753,663
අනෙකුත් මෙහෙයුම් වගකීම්	47,334	(104,694)	(204,576)	(81,189)
රක්ෂණ වෙන්කිරීම	-	-	338,702	(618)
	2,719,447	4,416,592	2,806,239	4,671,856
40.4 බදු පෙර ලාභයෙහි ඇතුළත් අනෙකුත් මුදල් නොවන අයිතම				
ලැයිස්තුගත කොටස් බැහැරකිරීමෙන් ලාභය/(අලාභය)	2,781	(30,067)	7,515	(30,398)
සුරැකුම්පත් මත උපචිත වූ පොළිය	(146,151)	(148,010)	(146,151)	(163,268)
දේපල හා උපකරණ විකිණීමෙන් ලාභය	(32,909)	(3,317)	(35,990)	(3,317)
සාධාරණ අගයට නියමකළ මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභය / (අලාභය)	61,096	54,137	58,226	55,336
හානිකරණ අයකිරීම්	257,130	668,050	27,959	492,811
ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය	77,670	70,170	104,239	100,166
	219,617	610,963	15,798	451,330

අනෙකුත් මූල්‍ය අනාවරණයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව අවශ්‍ය කරන පරිදි මෙම කොටසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සහ අනෙකුත් අනාවරණයන් ලබා දේ.

41 සම්බන්ධිත පාර්ශව අනාවරණයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - (LKAS 24) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අනුව, සමාගම/ සමූහය සම්බන්ධිත පාර්ශව ලෙස නියම කරනු ලබන පාර්ශවයන් සමඟ එහි සාමාන්‍ය ව්‍යාපාර රටාවේ ගනුදෙනු සිදුකරන ලදී.

41.අ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු (KMP)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 - (LKAS 24) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අනුව, ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය යනු ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම සහිත පුද්ගලයින්ය. ඒ අනුව, සමාගමේ/ සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරු ඇතුළුව) ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ සමාගමේ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය ලෙස වර්ග කර ඇත.

41.ආ සම්බන්ධිත පාර්ශව සමඟ ගිවිසුම්/ ගනුදෙනුවල අධ්‍යක්ෂවරුන්ගේ අයිතිය

ආචාර්ය සුපීව ලොකුහේවා, සී.එන් විජේවර්ධන මහතා, ඩී.එම්. ගුණසේකර මහතා, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා මහතා, කේ.බී.එස්. බණ්ඩාර මහතා, එන්. පෙරේරා මහතා, එස්.එන්. දයාරත්න මහතා, එස්.පී. අර්ෂකුලරත්න මහතා, එච්.ජේ.ඩී. ෆොන්සේකා මහතා, 2016 දෙසැම්බර් 31 දිනට සමාගම/ සමූහයේ අධ්‍යක්ෂවරු වූහ.

41.ඇ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු

		සමාගම		සමූහය	
	දෙසැම්බර් 31 දිනට	**2016** රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
(අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික				
	කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	4,123	6,299	7,367	13,346
		4,123	6,299	7,367	13,346
(ආ)	ආයතනික කළමනාකාරිත්වයේ පාරිශ්‍රමික				
	කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	69,146	66,807	90,814	85,811
	පශ්චාත් සේවක ප්‍රතිලාභ	18,977	-	18,977	-
		88,123	66,807	109,791	85,811

ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු වැඩපිළිවෙල සහ එකඟතාවන්

		සමාගම
		2016 රු.'000
(අ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතම	
	වත්කම් - ණය සහ ලැබීම්	17,296
	වගකීම් - ගනුදෙනුකරුවන්ට දුන් ණය	4,861
(ආ)	ලාභාලාභ ප්‍රකාශනයේ අයිතම	
	පොළී ආදායම	897
	පොළී වියදම	523

ඉහත කරුණුවලට අමතරව, සමාගම විසින් සමාගමේ අනුමත සේවක නියමයන්ට අනුකූලව සභාපතිතුමන්ට සහ ප්‍රධාන විධායක නිලධාරිතුමන්ට සමාගම විසින් නඩත්තු කරන මෝටර් රථ ලබා දී ඇත.

41.ඈ සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවල නියමයන් හා කොන්දේසි

සටහන 41හි දැක්වෙන ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාර රටාවෙන් ඇති වූ ඒවාය. සම්බන්ධිත පාර්ශවයන් වෙත සහ විසින් අයකළ පොළී නාමික වාණිජමය අනුපාත වේ. වසර අවසානයට හිඟ ශේෂයන් ලංකා බැංකුවෙන් ලබාගත් රුපියල් මිලියන 250ක කාලීන ණය සහ අයිරාව හැර සුරැකුම් නොලද ඒවාය. එම ණය සහ අයිරා පහසුකම කල්බදු සහ කුලී සින්නක්කර පහසුකම සහ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් මගින් ආරක්ෂා කරනු ලබයි. සම්බන්ධිත පාර්ශව ලැබීම් සහ ගෙවීම් සඳහා ලබාදුන් හෝ ලැබුණු ඇප නොමැත. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා, සමාගම/සමූහය සම්බන්ධිත පාර්ශවයන්ට අයත් ප්‍රමාණයන්ට අදාළව හානිකරණය සඳහා යම් වෙන් කිරීමක් සිදු කර නොමැත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (ඉතිරි කොටස)

41.ඉ ආයතනය සමඟ සමීප පදනමකින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබූ සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවල විස්තර පහත අනාවරණය කෙරේ.

	ගනුදෙනුවල ස්වභාවය	වසර තුළ හඳුනාගත් ආදායම / (වියදම)		දෙසැම්බර් 31 දිනට වත්කම් / (වගකීම්)	
		2016 රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
පාලක සමාගම වන ලංකා බැංකුව සමඟ ගනුදෙනු					
ලංකා බැංකුව	මූල්‍ය වෙළෙඳපොල ණය	(110,401)	(1,051)	(1,320,000)	(15,000)
	ගෙවූ ණයකර පොළී	(155,177)	(155,025)	(1,626,020)	(1,626,020)
	බැංකු ගාස්තු සහ අයකිරීම්, ලද පොළී	(2,819)	(116)	-	-
	ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්	2,162	1,911	263,466	-
	ගෙවූ පොළී- ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්	(62)	(3,233)	-	-
පාලිත සමාගම වන MBSL					
රක්ෂණ සමාගම සමඟ ගනුදෙනු	රක්ෂණ නියෝජිත කොමිස්	16,883	19,104	-	-
	ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	-	(12)	-	-
	රක්ෂණ වියදම්	(10,235)	(8,443)	-	-
ආශ්‍රිත සමාගම වන ලංකා සිකියුරිටීස් පුද්ගලික සමාගම සමඟ ගනුදෙනු	ලද ලාභාංශ	-	2,508	-	-
	ලද කල්බදු වාරික	-	282	-	-
අනෙකුත් සමාගම් සමඟ ගනුදෙනු					
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	ලද ලාභාංශ	234	216	-	-
	CRIB	(15,182)	(16,546)	-	-
ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය	සේවක පුහුණුව	(659)	(1,128)	-	-
	රැස්වීම් වියදම්	(229)	(244)	-	-
BOC දේපල සංවර්ධන සහ කළමනාකරණ සමාගම	ගෙවූ කුලිය	(55,383)	(43,883)	-	-
	විදුලිය, ජලය, කාර්යාල නඩත්තුව, වරිපනම්	(15,459)	(13,030)	-	-

	ගනුදෙනුවල ස්වභාවය	වසර තුළ හඳුනාගත් ආදායම / (වියදම)		දෙසැම්බර් 31 දිනට වත්කම් / (වගකීම්)	
		2016 රු.'000	2015 රු.'000	**2016** රු.'000	2015 රු.'000
සී බෑන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්	ස්ථාවර තැන්පතු මත ගෙවූ පොළිය සහ ඉතුරුම්	(79)	-	(14,036)	-
	මූල්‍ය වෙළෙඳපොල ණය මත පොළිය	-	(4)	-	-
ලංකා ක්ලියර් පුද්ගලික සමාගම	Slips පිරිසැකසුම් ගාස්තු	(240)	(118)	-	-
	මාර්ගගත දත්ත හුවමාරු ක්‍රියාවලිය සඳහා ගාස්තු	(14)	-	-	-
	ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්	(2,864)	-	(184,710)	-
	වාණිජ පත්‍රිකා මත පොළිය	-	(645)	-	-
සී/ස ෆයිනෑන්ෂල් ඔම්බුඩස්මන් ශ්‍රී ලංකා (ගැරන්ටි) සමාගම	සාමාජික ගාස්තු	(70)	-	-	-
සී බෑන්ක් හොලිඩේ හෝම්ස් පුද්ගලික සමාගම	සේවක පුහුණුව	-	(549)	-	-
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය	ව්‍යාපාර ප්‍රවර්ධනය	-	(20)	-	-
ලංකා බැංකුව සමඟ ගනුදෙනු	දළ වාරික	26,470	43,403		
	ලැබිය යුතු වාරික	-	-	785	5,981
	දරණ ලද හිමිකම	26,495	6,362	-	-

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

42 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණ

ඇගයීම් ශිල්ප භාවිතයෙන් සාධාරණ අගයේදී වාර්තා කරනු ලබන මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය තීරණය කරන ආකාරය පිළිබඳ විස්තරයක් පහත දැක්වේ. උපකරණ ඇගයීමේදී වෙළෙඳපොල තුළ සහභාගිවන්නෙක් සිදුකළ හැකි සමාගමේ/ සමූහයේ ඇස්තමේන්තුගත උපකල්පන මෙයට ඇතුළත්ය.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ මිලට මූල්‍ය වත්කම් - ගනුදෙනු සඳහා තබා ඇති

ඇගයීම් ශිල්ප භාවිතයෙන් අගයනු ලබන ගනුදෙනු සඳහා තබා ඇති මූල්‍ය වත්කම් මූලිකවම ලැයිස්තුගත ආයෝජනවලින් සමන්විත වේ. මෙම ලැයිස්තුගත වත්කම් එක් එක් සුරුකුම්වල සක්‍රීය වෙළෙඳපොලක ලැයිස්තුගත වෙළෙඳපොල මිල භාවිතයෙන් අගයනු ලබයි.

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සහ වගකීම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ ස්ථිර අනුපාත මූල්‍ය වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය වට්ටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රවේශය මත පදනම් වී ඇස්තමේන්තු කරනු ලබයි. මෙම ප්‍රවේශය සාධාරණ අගය මැනීමේදී සැලකිය යුතු නිරීක්ෂණය නොකළ යෙදවුමක් ලෙස සමාන මූල්‍ය උපකරණවල පවත්නා වෙළෙඳපොල පොළී අනුපාත යොදා ගනු ලබන අතර මේ නිසාම සාධාරණ අගය පිළිබඳ ධූරාවලියේ 3 මට්ටම යටතේ එය වර්ගීකරණය කරනු ලබයි.

ඇගයීම් ආකෘතිය

බාහිරව ලැයිස්තුගත මිල ගණන් යොමුකරමින් හෝ නිරීක්ෂණය කළ මිලකරණ යෙදවුම් මගින් සාධාරණ අගය තීරණය කරනු ලබන සියලුම මූල්‍ය වත්කම් සඳහා, ස්වාධීන මිල තීරණය කිරීම හෝ වලංගු කිරීම ලබා ගනී. සක්‍රීය වෙළෙඳපොලක් තුළ, ගනුදෙනුකළ මිලක සෘජු නිරීක්ෂණය සිදුවිය නොහැකිය. මෙවැනි වාතාවරණයක් තුළ, සමාගම/ සමූහය වඩාත් අදාළ සහ විශ්වාසනීය ලෙස සලකනු ලබන තොරතුරුවලට ඉහළ බර තබමින් මූල්‍ය උපකරණයේ සාධාරණ අගය වලංගු කිරීමට විකල්ප වෙළෙඳපොල තොරතුරු භාවිතා කරයි.

සාධාරණ අගය සහ සාධාරණ අගයේ ධූරාවලිය තීරණය කිරීම

ඇගයීම් ශිල්ප මගින් මූල්‍ය උපකරණවල සාධාරණ අගය තීරණය කිරීම සහ අනාවරණය කිරීම සඳහා සමාගම සහ සමූහය පහත දැක්වෙන ධූරාවලිය භාවිතා කරයි :

මට්ටම 1: සර්ව සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොල තුළ ලැයිස්තුගත (ගලපනලද) මිලගණන්

මට්ටම 2: වාර්තා කරන ලද සාධාරණ අගය මත සැලකියයුතු බලපෑමක් ඇති සියලු යෙදවුම් සඳහා අනෙකුත් ශිල්ප සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැක

